ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
தேசிய நீர் வழங்கல், வடிகாலமைப்புச் சபை
**National Water Supply & Drainage Board**

# වාර්ෂික වාර්තාව 2016
# ஆண்டு அறிக்கை 2016
# Annual Report 2016

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය
நகர திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சு
**Ministry of City Planning & Water Supply**

# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

# වාර්ෂික වාර්තාව 2016

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

## දැක්ම:

තාක්ෂණ හා සේවා විශිෂ්ඨත්වය තුලින් ශ්‍රී ලංකාවේ අභිමානවත්ම උපයෝගීතා සැපයීමේ ආයතනය බවට පත්වීම.

## මෙහෙවර:

පාරිභෝගික තෘප්තිමත්භාවය සහතික කෙරෙන තිරසාර විසඳුම් තුලින් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීමෙන් ජාතියට සේවය කිරීම.

## ඉලක්ක:

ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම.

ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.

වැඩි වගවීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම.

ග්‍රාමීය හා ඌණසේවිත ප්‍රජාවන් වෙත ආරක්ෂිත පානීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණ පහසුකම් සැලැස්වීම.

## අන්තර්ගතය


| | |
|---|---|
| නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශයේ ලේකම්තුමාගේ පණිවුඩය | IV |
| වාර්තාව පිළිබඳ දැනුම් දීම | 01 |
| සභාපතිවරයාගේ ප්‍රකාශය | 02 |
| **සංස්ථානික පාලනය හා සංඛ්‍යාලේඛනාත්මක සමාලෝචනය.** | |
| ප්‍රධාන භූමිකාධාරීන් | 06 |
| පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම | 10 |
| සාමූහික සැලසුම් | 11 |
| ජල සම්පාදනයේ ප්‍රධාන කාර්ය සාධනය | 14 |
| මළාපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය | 16 |
| මෙහෙයුම් සාරාංශය | 17 |
| ආයෝජන සාරාංශය | 21 |
| සේවක මණ්ඩලය | 25 |
| **තිරසාරත්ව වාර්තාව.** | |
| තොරතුරු තාක්ෂණය | 30 |
| වාණිජ කටයුතු | 31 |
| ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය | 34 |
| ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන | 34 |
| භූගත ජලය | 35 |
| බලශක්ති කළමනාකරණය | 36 |
| සමාජ විද්‍යාත්මක ක්‍රියාකාරකම් | 36 |
| ආදායම් නොලැබෙන ජලය අඩු කිරීම | 37 |
| සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය | 38 |
| පර්යේෂණ හා සංවර්ධනය | 38 |
| දේශගුණික විපර්යාසයන්ට අනුහුරු වීම හා ආපදා අවදානම අඩු කිරීම | 40 |
| හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩ සටහන. | 40 |
| ජල සුරක්ෂිතතා සැලැසුම් | 41 |
| **යටිතල පහසුකම් සංවර්ධනය** | |
| කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන | 44 |
| **ජල සම්පාදනය** | |
| විදේශීය/දේශීය බැංකු මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින ජල සම්පාදන ව්‍යාපෘතීන් | 58 |
| ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් | 73 |
| ඉදිරි ව්‍යාපෘතීන් (ජල සම්පාදන ව්‍යාපෘතීන්) | 78 |
| ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (ජල සම්පාදන ව්‍යාපෘතීන්) | 79 |
| **මළාපවහනය** | |
| පවත්නා මළාපවහන යෝජනා ක්‍රම | 83 |
| ක්‍රියාත්මක වෙමින් පවතින මළාපවහන ව්‍යාපෘති | 85 |
| ඉදිරි ව්‍යාපෘතීන් (මළාපවහන) | 89 |
| ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (මළාපවහනය) | 93 |
| **මූල්‍ය හා විගණන වාර්තා** | |
| විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 94 |
| මූල්‍ය ප්‍රකාශන | 96 |
| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව | 127 |
| කෙටි යෙදුම් | 156 |
| සංස්ථානික තොරතුරු - පසු කවරය ඇතුල් පැත්තේ | 159 |



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති තැන්පත්

**අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා**



නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය

**ගරු රවුෆ් හකීම් මැතිතුමා**



නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය

**ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය.**

# නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ පණිවුඩය.



ගත වූ වර්ෂයන් තුළදී මෙන්ම 2016 වර්ෂය තුළදී ද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් සමස්ත රට පුරාම වෙසෙන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය හා අපජලය බැහැර කිරීමේ පහසුකම් සපයා දීමේ වැදගත් කර්තව්‍යය ඉටු කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක්ව කටයුතු කිරීමෙහි යෙදී සිටින ලදි.

ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම පිණිස අමාත්‍යාංශය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, දේශීය බැංකු වල මූල්‍ය සහාය සහිතව දියත් කරන ලද කුඩා පරිමාණ හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හා මලාපවහන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම යනාදී වශයෙන් වූ ත්‍රිවිධාකාර ක්‍රමෝපාය ප්‍රවේශයක් අනුගමනය කරන ලදි.

මේ වන විට මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 19 ක් රටේ විවිධ ප්‍රදේශයන් තුළ ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත තවත් බොහෝ ජල සම්පාදන ව්‍යාපෘතීන් දැනට සැලසුම් කෙරෙමින් පවතී. මීට අමතරව, කොළඹ නගරය, මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය, කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය, ජාඇල / ඒකල ප්‍රදේශය, මොරටුව /රත්මලාන ප්‍රදේශය හා කතරගම ශුද්ධ නගර ප්‍රදේශය ද ආවරණය කරමින් විශාල පරිමාණයේ මලාපවහන ව්‍යාපෘතීන් 6 ක් ද 2016 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. එසේම මීගමුව, ගාල්ල, මහරගම, බොරලැස්ගමුව, පුත්තලම, හලාවත, වැලිකඩ - රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ, කාත්තන්කුඩි, කැළණිය, පෑලියගොඩ, ගම්පහ, මඩකලපුව, බදුල්ල හා හම්බන්තොට ආදී නල මාර්ග මලාපවහන පහසුකම් අවශ්‍ය නාගරික මධ්‍යස්ථානයන් ආවරණය කෙරෙන ව්‍යාපෘතීන් විශාල සංඛ්‍යාවක් මේ වන විට සැලසුම් අදියරයෙහි පවතී.

නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගය මුල් වරට හඳුනා ගනු ලැබූ 1991 වර්ෂයේ සිට මේ දක්වා එම රෝගයට ගොදුරු වූ රෝගීන් දිනෙන් දින වර්ධනය වෙමින් පවත්නා විශාල සංඛ්‍යාවක් වාර්තා වී ඇත.

ඒ අනුව, නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම සඳහා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒකාබද්ධ වී වැඩ කටයුතු කරන ලදි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වෛද්‍ය වෘත්තිකයින්ගේ මග පෙන්වීම් අනුව යමින් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රමෝපායයන් හා කාර්ය සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පෙළ ගස්වනු ලැබ ඇත. මේ අතර නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගය හා සම්බන්ධ කෙටි කාලීන හා මධ්‍ය කාලීන ක්‍රියාත්මක සැලසුම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

2016 වර්ෂයේදී මුළු වසර පුරාම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගය හා සම්බන්ධ ව්‍යාපෘතීන්ගේ මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 617.32 ක් විය. මීට අමතර ලෙස නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගයේ මූලික හේතුව හා නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත සපයනු ලබන ජලය තිරසාර ලෙස ප්‍රතිකාරක කිරීමේ ක්‍රම හඳුනා ගැනීමේ අරමුණින් චීන විද්‍යා ශාස්ත්‍ර පීඨය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දියත් කරන ලද ඒකාබද්ධ ව්‍යාපෘතිය වර්ෂය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි.

2016 වර්ෂය තුළදී අප වෙත සහාය ලබා දුන් බොහෝ අරමුදල් ප්‍රදායක හවුල් කරුවන් වෙත අමාත්‍යාංශයේ කෘතඥතාවය හිමි වන අතර, ඔවුන් අතුරින් ප්‍රධාන ස්ථානයක් ගන්නේ ශ්‍රී ලංකා ජන රජය හා ආසියානු සංවර්ධන බැංකුව, ඩැනිඩාව, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය, ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතාවය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හා ලෝක බැංකුව වැනි ආයතනයන් හා ඕස්ට්‍රේලියානු, ඕස්ට්‍රියානු, බෙල්ජියානු, චීන, ප්‍රංශ, හන්ගේරියානු, ඉන්දියානු, නෙදර්ලන්ත, දකුණු කොරියානු, ස්පාඤ්ඤ යන රජයන් හා එක්සත් ජනපද අපනයන ආනයන ආයතනයයි.

2020 වර්ෂය වන විට ජනගහණයෙන් 60% ක් වෙත නල ජලය සම්පාදනය කර දීම හා 3.3% ක් වෙත නල මලාපවහන පහසුකම් සම්පාදනය කර දීම සඳහා දැනටමත් පිහිටුවාගෙන ඇති ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් එළඹෙන වර්ෂයන් තුළදී ද අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක් වී අඛණ්ඩව කටයුතු කරනු ලබනවා ඇත.

අප වෙත දෙන ලද නායකත්වය හා මග පෙන්වීම් සම්බන්ධයෙන් නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය රවුෆ් හකීම් මැතිතුමන් වෙත හා නගර සැලසුම් හා ජල සම්පාදනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අපට හැකි වනු පිණිස අප සියළු දෙනා වෙත දෙන ලද සහයෝගිතාවය සම්බන්ධයෙන් නගර සැලසුම් හා ජල සම්පාදනය පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය වෙත ද කෘතඥතාවය පුද කර සිටීමට මම මෙම අවස්ථාව යොදා ගන්නෙමි.

මහ ජනතාව වෙත ඉහල ගුණාත්මයේ ජල සම්පාදන හා මලාපවහන සේවාවන් ලබා දීමට හා සිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා 2017 වර්ෂය වෙනුවෙන් හා ඉන් ඔබ්බට සැලසුම් කරනු ලැබ ඇති සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දරනු ලබන ප්‍රයත්නයන් සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවායැයි මම ඉත සිතින් ප්‍රාර්ථනා කර සිටිමි.

**ඩී.ජී.එම්.වී. හපුආරච්චි**
**ලේකම්**
**නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය.**





## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පානීය ජලය සැපයීමේ වගකීම මුලින්ම පැවරී තිබුණේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට වන අතර පසුව එය 1965 දී ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදි. ඉන් පසුව 1975 දී පාර්ලිමේන්තු පණතක් මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිහිටුවන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැනට ක්‍රියාත්මක වන්නේ ජල සම්පාදනය, මලාපවහනය හා නගර සැලසුම්කරණය යන විෂයයන් වෙන වෙනම ආවරණය කිරීම සඳහා 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේය.

ජනගහණයෙන් 87.8% කට පමණ ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව තිබෙන අතර ඒ අතරින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නල ජල සැපැයුම් පද්ධතීන් තුළින් ජලය ලබාගනු ලබන ජනගහණයෙන් 37.1% ක් ඇතුළුව 47.7% ක ජනතාවක් නල ජල සැපැයුම් පද්ධතීන් තුළින් පානීය ජලය ලබා ගනිති.

## වාර්තාව පිළිබඳ දැනුම් දීම.

නගර සැලසුම් හා ජල සම්පාදනය පිළිබඳ ගරු ඇමතිතුමා
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය
ලක්දිය මැදුර
අංක 35, සුනිල් මාවත
පැලවත්ත,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2016**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**

1971 අංක 38 දරණ මූල්‍ය පණතේ 14 (2) වගන්තිය අනුව 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔබතුමන් වෙත මෙයින් ගෞරවයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබේ.

මෙයට,
ඔබේ විශ්වාසී

**ඉංජිනේරු කේ.ඒ.අන්සාර්**
**සභාපති,**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**

# සභාපතිවරයාගේ ප්‍රකාශය.



"මෙම වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලැබූ සේවා සම්බන්ධතාවයන් මුළු සංඛ්‍යාව දස ලක්ෂ දෙකක් ඉක්ම යාම අපූර්ව තත්ත්වයකි. ඒ අනුව බලන විට 2016 වර්ෂයේ අවසානය වන විට සේවා සම්බන්ධතාවයන් 2092471 මගින් පානීය ජලය සම්පාදනය කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබී ඇත."

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2016 තුළදී තවත් සාර්ථක වර්ෂයක් සම්පූර්ණ කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 2016 වසර තුළ මුළු රට පුරාම ආරක්ෂිත පානීය ජලය හා මලාපවහන පහසුකම් සම්පාදනය කිරීමෙහි ලා විශාල ප්‍රයත්නයක යෙදුනේය. ප්‍රස්තුත වර්ෂය තුළදී විදේශීය අරමුදල් යටතේ වූ විශාල පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් පහක් හා වෙනත් සුළු පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් විශාල සංඛ්‍යාවක් ද නිම කරමින් මුළු රට පුරාම වෙසෙන දිළිඳු ජනතාව වෙත නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 138750 ක් සපයා දෙන ලද අතර රටේ විවිධ පෙදෙස් වල ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි සේවා තත්ත්වය නංවා ලීමට ද කටයුතු කරනු ලැබ ඇත. මීට අමතරව, විදේශ අරමුදල් යටතේ වූ එක් විශාල පරිමාණයේ මලාපවහන ව්‍යාපෘතියක් ද වර්ෂය තුළදී නිම කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මුළු රට පුරා ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රම 337 ක් හරහා පානීය ජලය ඝණ මීටර දස ලක්ෂ 649 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද අතර, එය 2015 වර්ෂය සමග සංසන්දනාත්මකව බලන කල්හී 8.2% ක වර්ධනයක් වේ. වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලැබූ සේවා සම්බන්ධතාවයන් මුළු සංඛ්‍යාව දස ලක්ෂ දෙකක් ඉක්ම යාම අපූර්ව තත්ත්වයකි. ඒ අනුව බලන විට 2016 වර්ෂයේ අවසානය වන විට සේවා සම්බන්ධතාවයන් 2092471 මගින් පානීය ජලය සම්පාදනය කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබී ඇත. සමාන්තර ලෙස ගත් කළ, 2016 වර්ෂය අවසාන වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලබන පානීය ජල පහසුකම් සතුව සිටින ජනගහණයේ ප්‍රතිශතය 37.1% දක්වා ඉහලට ගෙන එමින් රටේ මුළු නල ජල ආවරණය 47.7% ක් දක්වා ගෙන ඒමට දායකත්වය ලබා දී ඇති අතර, එය 2020 වර්ෂය වන විට අපේක්ෂිත ඉලක්කය වූ 60% ක නල ජල ආවරණය සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ සිදු වූවකි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වර්ෂය තුළදී සපයනු ලැබ ඇති නල මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව 19067 ක් දක්වා ඉහලට ගෙනැවිත් ඇති අතර ඒ මගින් ජනගහණ ආවරණය 2.08% ක් බවට වර්ධනය වී ඇත. 2015 වර්ෂය හා සංසන්දනාත්මක ලෙස බලන කළ එය 12% ක වැඩි වීමකි.

2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරගෙන එන පරිදි 2016 වර්ෂය තුළදී ද මණ්ඩලය විසින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ක්‍රියාවට නංවනු ලැබ ඇත. වැටුප් වැඩි කිරීම් මුළු පිරිවැය ව්‍යුහය මත විශාල බලපෑමක් ඇති කර තිබියදී හා එමෙන්ම විදුලි බලය හා රසායනික ද්‍රව්‍යයන්ට වැය වන වියදම වසරින් වසර ඉහල යන පසුබිමක වුවද 43% ක පමණ දළ ලාභ පරතරයක් පවත්වා ගන්නා ලද අතර 2016 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රුපියල් දස ලක්ෂ 2,926 ක බද්දෙන් පසු ශුද්ධ ලාභයක් උපයාගනු ලැබ ඇත. 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකරන ලද සෑම වර්ෂ තුනකට වරක්ම සිදු කළ යුතු ගාස්තු සංශෝධනය අනාගත මූල්‍ය ස්ථාවරභාවය වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතුව තිබේ.

2016-2020 සඳහා වන නව සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම මේ වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. ඒ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 2016-2020 සඳහා වන නව සංයුක්ත සැලැස්ම මගින් අපේක්ෂිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කටයුතු වල අඛන්ඩ ලෙස යෙදී සිටියේය.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණ ඉලක්කය සපුරා ගැනීම සඳහා (දේශීය බැංකු අරමුදල් යටතේ කරනු ලබන ව්‍යාපෘතීන් වෙනුවෙන් දේශීය බැංකු ණය පහසුකම් යටතේ ලබාගත් රුපියල් දස ලක්ෂ 11,076 ක ආයෝජනයන්ට අමතර වශයෙන්) රුපියල් බිලියන 30.9 ක ආයෝජනයන් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි. එකී අරමුදල් වැය කරන ලද්දේ ද

2015 වර්ෂයේ සිට ප්‍රගුණ කරන ලද ප්‍රාග්ධන වැඩ සඳහා අරමුදල් වැය කිරීමේ ක්‍රමයම අනුගමනය කරමිනි. 2016 වර්ෂය තුළ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රුපියල් දස ලක්‍ෂ 906 ක තමන්ගේම අරමුදල් උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ කටයුතු වල දිගටම යෙදී සිටියේය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත 2016 වර්ෂය තුළදී නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝග සහන ක්‍රියාකාරකම් වෙනුවෙන් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රාග්ධන අය වැය ප්‍රතිපාදනයෙන් රුපියල් දස ලක්‍ෂ 617 ක මුදලක් භාවිතා කරනු ලැබ ඇති අතර එම මුදල් භාවිතා කරනු ලැබ ඇත්තේ නොදන්නා හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීම සඳහා සකස් කරනු ලැබ ඇති මධ්‍ය කාලීන හා කෙටි කාලීන ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන්නේය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කලාපීය සහාය මධ්‍යස්ථාන මට්ටමින් ආදායම් රහිත ජලය අවම කිරීමේ කෙටි කාලීන හා දිගු කාලීන පියවර හඳුනාගැනීමේ හා ක්‍රියාත්මක කිරීමේ මෙහෙවරෙහි අඛන්ඩ ලෙස යෙදී සිටින ලදි. ආදායම් රහිත ජලය අවම කිරීම ඉලක්ක කර ගනිමින් සෑම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයකම බොහෝ කෙටි කාලීන ක්‍රියාකාර කම් ක්‍රියාත්මක කරන්නට යෙදුනි. මීට අමතර ලෙස ප්‍රස්තුත වර්ෂය තුළදී කොළඹ නගරය තුළ පැවැති ඉහල මට්ටමේ ආදායම් රහිත ජල තත්ත්වය අඩු කිරීම අරමුණු කර ගනිමින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ හා ආසියානු සංවර්ධන බැංකුවේ සහාය උපයෝගී කර ගනිමින් ජල පුනරුත්ථාපන / සේවා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදි. මෙම කෙටි කාලීන හා දීර්ඝ කාලීන පියවරයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් 2016 වර්ෂය අවසන් වන විට කොළඹ නගරය තුළ ආදායම් රහිත ජලය 45.7 ක් දක්වා සහ දීප ව්‍යාප්ත වශයෙන් එම තත්ත්වය 25.6% ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය.

2016 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් හා ක්‍රියාත්මක කිරීමේ සහාය සහිතව ජල සුරක්ෂිතතා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුත්තෙහි දිගටම නියැලී සිටියේය. ජල සම්පාදන යෝජනා ක්‍රම 87 ක් වෙනුවෙන් නාගරික ජල සුරක්ෂිතතා සැලසුම් ක්‍රියාත්මක කරන ලද අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගෙන් ආසන්න වශයෙන් 26% ක ප්‍රතිශතයකි. ඊට අමතරව වර්ෂය තුළදී සියළුම කලාපීය සහාය මධ්‍යස්ථානයන් වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලසුම් පිළිබඳ පුහුණු වැඩ සටහන් 11 ක් සංවිධානය කොට පවත්වන්නට යෙදුනි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය කලාපීය රසායනාගාරයන් සමග එක්ව සම්පාදනය කරනු ලබන ජලයෙහි ගුණාත්මය සහතික කිරීමේ කාර්යයෙහි නියැලී සිටියේය. ආරක්ෂිත පානීය ජල සම්පාදනය සහතික කරමින් දීප ව්‍යාප්ත ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ගේ ප්‍රභව ජලයේ ගුණාත්මක භාවය මසකට දෙවරක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ප්‍රතිකාරිත ක්‍රියාවලි ජලයේ ගුණාත්මය සතියකට වරක් විශ්ලේෂණයට භාජනය කරනු ලැබිණි.

සේවයේ උත්කෘෂ්ඨ භාවය සාක්ෂාත් කර ගැනීමේ හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් ව්‍යාපාර ක්‍රියාවලිය හා මෙහෙයුම් පටිපාටීන් අනුකූලනය කිරීම සඳහා නිවැරදි ලෙස සැලසුම් කරන ලද තොරතුරු තාක්‍ෂණවේදී විසඳුම් හඳුන්වා දීමේ කාර්යය ගත වූ වසර කිහිපය තුළදී මෙන්ම 2016 වසර තුළදී ද දිගටම ක්‍රියාත්මක කරගෙන යන ලදි.

එහි පද්ධතීන්ගේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ඉහල ශ්‍රේණිගත කිරීමත් සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බලශක්ති කළමනාකරණ වැඩ සටහන සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යාන්ත්‍රික හා විද්‍යුත් සේවා අංශය බලශක්ති කළමනාකරණ කාර්යයන් සඳහා සියළු ආකාරයේ බලශක්ති විගණනයන් සිදු කිරීම පිණිස අවශ්‍ය කරන මිණුම් උපකරණයන්ගෙන් සම්පූර්ණයෙන්ම සජ්ජිත වී තිබේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාර්ථක මෙහෙයුම් හා සංවර්ධන මූලාරම්භ ක්‍රියාවන් වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියළුම මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දෙන ලද දායකත්වය ඉතාමත්ම සුවිශේෂී තත්ත්වයක පැවැතිණි. ගෝලීය පාරිසරික බැඳීම් අවශ්‍යතාවයන් අනුව යමින් ආර්ථික මෙහෙයුම් සාක්‍ෂාත් කර ගැනීම සඳහා පරීක්‍ෂාකාරී ලෙස සැලකිලිමත් වෙමින් ක්‍රම සම්පාදන කටයුතු, සැලසුම් පිළියෙල කිරීම, විමර්ෂණ කටයුතු, සාධ්‍යතා අධ්‍යයනයන්, ඉදි කිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු, ක්‍රියාවලි පාලනය හා ප්‍රශස්තිකරණය හා බලශක්ති සංරක්ෂණ කටයුතු මෙම දායකත්වය තුළ තිබිණි.

වර්ෂය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රියාකාරකම් ලැබූ ජයග්‍රහණයන් සම්බන්ධයෙන් දෙන ලද සියළුම සහාය වෙනුවෙන් අපි නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු ඇමැතිතුමන් වෙත අපගේ කෘතඥතාවය පිරිනමමු. ජල හා මලාපවහන කටයුතු භාර ගරු ඇමැති තුමන් වශයෙන් එතුමන් වෙතින් ලැබුණ උපදෙස්, මග පෙන්වීම් හා සහාය අපට මිළ කළ නොහැකි තරම් අගනේ විය. වර්ෂය මුළුල්ලේම අප වෙත දුන් මග පෙන්වීම් හා සහාය වෙනුවෙන් නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය ඇමැති තුමිය වෙතද අපගේ අවංක ස්තූතිය හිමි වේ. තවද අවශ්‍ය වූ සෑම අවස්ථාවකදීම කරන ලද සම්බන්ධීකරණ කටයුතු හා අප වෙත දෙන ලද උදවු උපකාර හා සහාය වෙනුවෙන් නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්තුමන් වෙත හා සමස්ත කාර්ය මණ්ඩලය වෙත අපගේ කෘතඥතාවය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගන්නෙමු.

අපගේ සියළුම කර්තව්‍යයන්හි ප්‍රගතිය සාක්‍ෂාත් කර ගැනීමෙහි ලා ඔවුන් විසින් දෙන ලද අඛන්ඩ සහාය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමන්ට හා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ද අපගේ කෘතඥතාවය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමු.

ජල සම්පාදන හා සනීපාරක්‍ෂණ අංශයෙහි මුළු රට පුරාම අප විසින් කරනු ලැබ ඇති සංවර්ධන කටයුතු වෙනුවෙන් අප වෙත සහයෝගිතාවයේ හස්තය දිගු කිරීම සම්බන්ධයෙන් අප බහු ජාතික අනුග්‍රාහකයින් හා ද්විපාර්ශවික මූල්‍ය සම්පාදකයින් වෙත ද කෘතඥ වන්නෙමු. එම අංශයන්හි සංවර්ධන කටයුතු වලදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග අත් වැල් බැඳ ගැනීම කෙරෙහි ඔවුන් දැක්වූ උනන්දුව පිළිබඳව අප ඔවුනට ස්තූතිවන්ත වන්නෙමු.

ප්‍රස්තුත වර්ෂය තුළදී අප විසින් ලබාගෙන ඇති ප්‍රගතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ හා කාර්ය මණ්ඩලයේ කැප වීමේ හා ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයකි. ඔවුන්ගේ කැප වීම, අප්‍රතිහත ධෛර්යය හා පරිත්‍යාග යන් නොවන්නට අපගේ ජයග්‍රහණයන් සාක්‍ෂාත් කර ගැනීම කළ නොහැක්කක් විය හැකිව තිබිණි. ඉදිරි වර්ෂයන්හිදී ද ඔවුන්ගේ ආයාසයන් මගින් පාරිභෝගික තෘප්තියට හේතු වන පරිදි ජල සම්පාදන හා සනීපාරක්‍ෂණ සේවාවන් වැඩි දියුණු කිරීම හරහා රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ සෞඛ්‍ය, සමාජ හා ජීවන තත්ත්වයන් නංවා ලීමට හැකි වනු ඇතැයි යනු අපගේ අපේක්‍ෂාවයි. ඒ අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පාර්ශවයෙන් කිසියම් ප්‍රමාද දෝෂයන් සිදු වන්නේ නම් අප සමග ඒවා දරා ගනිමින් සේවා තත්ත්වයන් වැඩි දුරටත් දියුණු කිරීමට අපට හැකි වනු පිණිස ඒවා අප වෙත දැනුම් දීමට කාරුණික වන ලෙස අපි අපගේ හිතවත් ගණුදෙනු කරුවන්ගෙන් ඉල්ලා සිටින්නෙමු.



**ඉංජිනේරු කේ. ඒ. අන්සාර්**
**සභාපති**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**



‘ජීවය රහිතව ජලය බොහෝ ප්‍රමාණයක් විශ්වය තුළ තිබුණද ජලය රහිත ජීවයක් කිසිදු ස්ථානයක පවතින්නේ නැත’

සිල්වියා ඒ අර්ල්.

# සංස්ථානික පාලනය හා සංඛ්‍යා ලේඛනාත්මක සමාලෝචනය.



# සංවිධාන ව්‍යුහය




## අධ්‍යක්ෂ මණ්ඩලය

- 01 සභාපති
- 02 උප සභාපති
- 03 ක්‍රියාකාරී අධ්‍යක්ෂක
- 04 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 05 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 06 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 07 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

- 08 සාමාන්‍යාධිකාරී
- 09 අතිරේක සාමාන්‍යාධිකාරීන්
- 10 කොට්ඨාස භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
- 11 පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
- 12 ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ලෙස වැඩ කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

**අධ්‍යක්ෂ මණ්ඩලය**

**01. ඉංජිනේරු කේ.ඒ.අන්සාර්**
Chartered Civil Engineer / Lead Auditor (QMS)
MSc. (Delft)) B Sc Eng. (Hons)
Dip. H.E. (Delft) C. Eng. MIE (SL)
සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**02. එම්. ෂරීක් රාජබ්ඩීන් මහතා**
උප සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**03. පී.අයි.ටී. මහිලාල් සිල්වා මහතා**
BA.MA.M.S.Sc
ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**04. වෛද්‍ය පී.ජී. මහීපාල**
MBBS, MSc, MD, MBA, FCMA, DPM, DBS, DED, DMgt.
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සෞඛ්‍ය අමාත්‍යංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**05. ජේ.එම්.යූ.පී. ජයමහ මහතා**
DPFM, PGD (A&F), APFASL ආශ්‍රිත සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මහජන ව්‍යවසාය දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**06. ශාන්ත රත්නායක මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**07. කේ.ඒ.සුභද්‍රා වල්පොල මහත්මිය**
ශාස්ත්‍රපති
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
පලාත් පාලන හා පලාත් සභා අමාත්‍යංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය
B Sc Special (Hons)

අධ්‍යක්ෂ මණ්ඩලය 2016 වසර තුළදී 13 වතාවක් රැස් වන ලදි.

---

**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය.**

**08. සාමාන්‍යාධිකාරී**
ඉංජිනේරු ජී. ඒ. කුමාරරත්න
B Sc Eng. (Hons), M Sc (UK), C Eng, FIE (SL)
MICE (Lond), MIWEM (Lond), PG Dip in Industrial Eng.
(2016.07.02 සිට)

**09. සාමාන්‍යාධිකාරී**
ඉංජිනේරු බී.ඩබ්ලිව්.ආර්. බාලසූරිය
B Sc Eng (Hons), M Sc (UK), C Eng. FIE (SL)
(2016.07.01 දක්වා)

**10. අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්**
ඉංජිනේරු ජී. ඒ. කුමාරරත්න (මලාපවහන)
B Sc Eng. (Hons), M Sc (UK), C Eng, FIE (SL)
MICE (Lond), MIWEM (Lond), PG Dip in Industrial Eng.
(2016.07.01 දක්වා)

ඉංජිනේරු ඩී එස් ඩී ජයසිරිවර්දන (දකුණු / නැගෙනහිර)
B Sc Eng. (Hons), C Eng. FIE (SL)
M Phil (University of Hawaii)
(2016 10 17 දක්වා)

ඉංජිනේරු ඩී. යූ. සුමනසේකර (ජල සම්පාදන ව්‍යාපෘති)
B Sc Eng. C Eng. FIE (SL) M Sc (Struct E) UK

ඉංජිනේරු ආර්.එස්.සී. ජෝර්ජ් (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)
B Sc Eng. (Hons), C Eng. MIE (SL)
M Sc Eng., FRG MICE (UK)

ඉංජිනේරු ඩබ්ලිව්. බී. ජී.ප්‍රනාන්දු (සාමූහික සේවා)
B Sc Eng., PG Dip. (EWREM), C Eng., FIE (SL)

ඉංජිනේරු ජේ. ආර්. බී. නැදුරන (උතුරු මධ්‍යම)
B Sc Eng. (Hons), PG Dip Environmental Science & Tecnology (Delft)., C Eng., MIE (SL)

ඉංජිනේරු එල්. එල්. ඒ. පීරිස් (බස්නාහිර)
B Sc Eng. Civil Engineering (University of Moratuwa SL)
C Eng. FIE (SL), Int PE (SL), M Phil (IWRM), University of Peradeniya, PG Dip (Water) Waste Water Eng), AIT Bangkok.

ඉංජිනේරු එම්. කේ. හපුආරච්චි (මළාපවහන)
C Eng, MIE (SL), P.G. Dip. in Environmantal Engineering & Management, PG Dip. (L & WD), PG Dip. (Business Adm),
(2016.10.18 සිට)

ඉංජිනේරු ආර්. එච්. රුවිනිස් (දකුණු / නැගෙනහිර)
B Sc Eng. (Hons), PG Dip (App Hy), MBA,
C Eng. FIE (SL), MIE (Aust), CP Eng.,
(2016.10.18 සිට)

ඩී. තොටවත්ත මහතා (මූල්‍ය)
B Com (Sp), ACA MA (Fin Econ)

ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා (මානව සම්පත් කළමනාකරණය)
B Sc. (B Admin), Dip in Per Mgmt.
MA (Mgt & Admin) London

**10. අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් (2016 දෙසැම්බර් 31 වන විට)**

ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා (අභ්‍යන්තර විගණන)
B Com (Sp) PGDBM (Col), ACA

ඒ. පී. එස් ද සිල්වා මහත්මිය (පිරිවැයකරණය)
FCA

එන්. වයි. එස් . අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
BA, PG, Dip. in Management (PIM), Member (IMSL)

ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයුම්)
B Sc (Business Administration - Spl)
Diploma in Purchasing & Materials Mgt

එම්. එම්. එස්. පීරිස් (මූල්‍ය)
B Sc (Accountancy & Finance Mgt), ACA (SL)

ඉංජිනේරු එස්. පී. ජේ. රාජ්කුමාර් (සංවර්ධන)
C Eng, FIE (SL), M Sc in Sanitary Engineering,
M Sc in Environmental Engineering and Management.

ඉංජිනේරු එස්. පී. පී. රාජ්කුමාර් (වාණිජ)
B Sc Eng. (Hons), C Eng, FIE (SL), M Sc (Denmark),
MBA (PIM - USJ), M Eng (Moratuwa)

ඉංජිනේරු එස්. පී. ජයවර්ධන (මළාපවහන)
B Sc, PG Dip. in Sanitary Eng., MIE (SL)

ඉංජිනේරු තිලින එස්. විජේතුංග (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
B Sc Eng, C Eng., FIE (SL), MBA, M Sc (Planning),
MA (Financial Economics), MIM (SL), PG Dip. (Finance),
ICA (SL), Dip. (Mgt) - DK

ඉංජිනේරු එස්. සුමනවීර (නිෂ්පාදන - බස්නාහිර)
B Sc Eng, M Eng. (Env), AIT , C Eng, FIE (SL)

ඉංජිනේරු දුලිප් ගුණවර්ධන
(ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම)
B Sc Eng, C Eng., MIE(SL) FIE (SL), M Eng, (IHE - UNESCO)

ඉංජිනේරු යූ. රත්නපාල (ව්‍යාපෘති සමායෝජනය)
B Sc Eng, C Eng., FIE (SL), PG Dip. in Hydraulics Eng (Moratuwa)
PG Dip in Business & Financial Admin. (ICA)

ඉංජිනේරු කේ. ඩබ්ලිව්. ප්‍රේමසිරි (ක්‍රම සම්පාදන හා සැලසුම්)
B Sc Eng, M Eng. (Hydraulics), M Eng (Structural Eng. Designs),
Int. PE.C Eng. , FIE (SL) MSSE (SL)

ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (සංස්ථානික ක්‍රම සම්පාදනය)
M Sc (Env. Eng) Denmark, PG Dip (Const. Mgt) SL,
MIE (SL), Chartered Engineer,
(2016.10.28 සිට)

ඉංජිනේරු බී. එල්. ගුණරත්න (යාන්ත්‍රික හා විද්‍යුත්)
B Sc Eng, PG Dip (Sani. Eng) - Norway.

ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණ වේදය)
B Sc Eng, C. E B Sc Eng. MIE (SL)

**11. පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වරුන් (2016 දෙසැම්බර් 31 වැනි දිනට)**

ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා (බටහිර මධ්‍යම)
B Sc Eng (S B Sc Eng,Spl), Masters in Dev. Science, MIE (SL)

ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු (බටහිර දකුණ)
B Sc Eng, MPM PG Dip. (OSLO University)
MIE (SL), MIM (SL), C Eng, Chartered Eng.

ඉංජිනේරු ආර්. ඒ. බී. එස්. මෙන්ඩිස් (බටහිර උතුර)
B Sc Eng, C Eng., MIE (SL), M Sc in Sanitary Eng. (Netherlands)

ඉංජිනේරු එස්. ඒ. රෂීඩ් (නැගෙනහිර)
M Sc (Sanitary Engineering) - The Netherlands,
PG Dip (Structural Engineering Design) Sri Lanka
B Sc (Eng) - Sri Lanka, MIE (SL), C Eng.

ඉංජිනේරු එම්. එම්. උමා ලෙබ්බේ (උතුර)
IESL, PG Dip (Str. Eng' Design)
PG Dip (Water & Waste Water Treatment)

ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (මධ්‍යම)
M Sc (Water Supply Eng) - The Netherlands,
M Sc (Env Eng) Moratuwa, MIESL, AM (OACETT) Canada.

ඉංජිනේරු අයි. එම්. ඩබ්ලිව්. කේ. ඉලංගසිංහ (වයඹ)
B Sc (Eng), M Eng (Japan), C Eng, MIE (SL)

ඉංජිනේරු ජී. වී. විජේරත්න (උතුරු මැද)
B Sc (Eng), M Sc (WREM), C Eng, MIE (SL)

ඉංජිනේරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ලියනගේ (සබරගමුව)
M Eng, (Structural Eng. Design), M Sc (Environmental Eng. & Mgt), C. Eng. FIE (SL)

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (ඌව)
B Sc (Eng), C Eng. FIC (SL), PGD (Management), MIM,
M Sc. Eng (Water and Environmental Resources Management), MBA,
M Sc (Water Resources Management, Holland)

ඉංජිනේරු ජේ. කේ. එස්. පතිරණ (දකුණු)
B SC. Eng. (Hons) C Eng. MIE (SL), M Sc
(Sanitary) Delft.

**12 ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**

ඉංජිනේරු ආර්. කුලනාථ (රත්මලාන මොරටුව හා ජා ඇල / ඒකල ප්‍රදේශයන් සඳහා අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය)
B Sc (Eng), C Eng. MIE (SL)

ඉංජිනේරු බී. එස්. විජේමාන්න (මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතිය
B Sc (Eng), M Eng. Hydrology & Water Resources, IHE (Delft)
Dip in Construction Management, C Eng., MIE (SL)

ඉංජිනේරු කේ. ජේ. වී. ඒ. පෙරේරා (ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය
P.G Dip in Environmental Engineering ) Management,
B Sc (Eng), FIE (SL), M Eng (Sanitary), IHE (Delft)

ඉංජිනේරු ආර්. ඒ. බී. එස්. මෙන්ඩිස් (ආසියානු සංවර්ධන බැංකු 5 වැනි ව්‍යාපෘතිය)
B Sc Eng, C Eng., MIE (SL), M Sc in Sanitary Eng. (Netherlands)

ඉංජිනේරු කේ.පී.ආර්.එස්. සමරසිංහ (ලබුගම කලටුවාව ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය)
M Sc (Water Supply Eng) The Netherlands Msc (Eng) Moratuwa, MIESL, AM, (oAcett) Canada.

ඉංජිනේරු එස්. ඒ. රෂීඩ් (කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
M Sc (Sanitary Engineering) - The Netherlands,
PG Dip (Structural Engineering Design) Sri Lanka
B Sc (Eng) - Sri Lanka, MIE (SL), C Eng.

ඉංජිනේරු පී. පී. කහදූව (රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc (Eng), PD Dip (Water ) Waste Water Treatment), PG Dip (BA)
C Eng., MIE (SL).

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (මහියංගනය ජල සම්පාදන ව්‍යාපෘතිය හා බදුල්ල හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතිය)
BSc (Eng), C Eng. FIC (SL), PGD IP (Management), MIM,
M Sc. Eng (Water and Environmental Resources Management), MBA,
M Sc (Water Resources Management, Holland)

# පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම

| පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය | ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව. |
|---|---|
| මධ්‍යම | 48 |
| නැගෙනහිර | 41 |
| උතුරු මධ්‍යම | 28 |
| වයඹ | 29 |
| උතුරු | 34 |
| සබරගමුව | 20 |
| දකුණු | 54 |
| ඌව | 35 |
| බටහිර මධ්‍යම | 11 |
| බටහිර උතුරු | 21 |
| බටහිර දකුණු | 16 |
| එකතුව | 337 |



## සාමූහික සැලසුම්

**"2016 වර්ෂයේ අවසානය වන විට කළාපීය සේවා මධ්‍යස්ථානයන්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් විසින්, මහනුවර ස්ථාපිත කරනු ලැබ ඇති ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකයේ සහාය ඇතිව, දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කරනු ලබන, විවිධ ක්‍රියාත්මක අවස්ථාවන්හි පවත්නා නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් 82 ක් ක්‍රියාත්මක වෙමින් තිබේ"**



**2016 පවත්වන ලද තරගයේදී මධ්‍යම රසායනාගාරය විසින් ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදි.**

**2016 - 2020 සංස්ථාපිත සැලසුම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය.**

සමාලෝචනයට භාජනය වන වර්ෂය 2016 - 2020 සංස්ථාපිත සැලැසුමේ ප්‍රථම වර්ෂය විය. මෙම සංස්ථාපිත සැලැසුම පිළියෙල කරන ලද්දේ සාමාන්‍යාධිකාරී වරයා විසින් පත් කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 14 දෙනෙකුගෙන් සමන්විත වූ විශේෂ කමිටුවක් විසිනි.

පෙර සංස්ථාපිත සැලැසුමේ (2012-2016 සංස්ථාපිත සැලැසුම) ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රයන් අන්තර්ගත කිරීම මගින් විශේෂ කමිටුව විසින් අදාල ඉලක්කයන් යටතේ එන සෑම සියළු ක්‍රියාකාරකම ප්‍රගතිය වේගවත් ලෙස පසුවිපරම් කිරීමට හැකි වන පරිදි 2016 - 2020 නව සංස්ථාපිත සැලැසුමේ ඉලක්ක සංඛ්‍යාව 7 සිට 4 දක්වා අඩු කිරීමට තීරණය කරන ලදි.

සංස්ථාපිත සැලැසුම මගින් පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වර්ෂය තුළ අඛණ්ඩ ලෙස ක්‍රියා කරන ලදි. පිහිටුවනු ලැබ ඇති අරමුණු හා ඉලක්කයන් සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා කාලෝචිත ලෙස සමාලෝචනය කිරීමේ ඇති වැදගත් කම සැලැකිල්ලට බඳුන් කරන ලදි.

සංස්ථාපිත සැලැසුම යටතේ ඇති ක්‍රියාත්මක සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ත්‍රෛමාසික ප්‍රගතිය අදාල අරමුණ හෙවත් ඉලක්කය වෙනුවෙන් වගකීම දරණ සෑම කළමනාකරුවකු විසින්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කරන ලදි. (එවැනි අරමුණු හෝ ඉලක්කයන් හතරක් ඇති අතර, ඒ අරමුණු සෑම එකක්ම ඒ වෙනුවෙන් වග වීමට පත් කරනු ලැබ ඇති කළමනාකාර වරයකුගේ අභිප්‍රේක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ). ඒ අනුව, 2015 වර්ෂයේ සිව් වැනි කාර්තුව හා 2016 වර්ෂයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කාර්තු සඳහා වූ සංස්ථාපිත ක්‍රියාත්මක සැලැසුම් වලට අදාල ප්‍රගති වාර්තා 2016 වර්ෂය තුළ පවත්වන්නට යෙදුන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කරන ලදි.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගත් ක්‍රියාකාරකම් මුළු රට පුරාම ක්‍රියාත්මක කරන ලදි. ආදායම් රහිත ජලය හා බල ශක්ති පිරිවැය අඩු කර ගැනීම සඳහා 2016 වර්ෂය තුළ දරණ ලද විශේෂ ප්‍රයත්නයන් සැලැකිල්ලට ගැනීම වටනේය. කෙසේ වුවද, පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීම ප්‍රමුඛත්වයෙහි ලා සලකන ලදි.

ආයතනික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සංස්ථාපිත ඉලක්කයක කොටසක් වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, තෙලවල පරිශ්‍රය හා පොල්වත්ත පරිශ්‍රය තුළ ඇති සෑම අංශයකම එලදායී තාවය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් 5 S සංකල්පය ක්‍රියාත්මක කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ "යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාර කම් හඳුනාගැනීම" යටතේ 5 S වැඩ සටහන හොඳින්ම ක්‍රියාත්මක කරනු ලැබ ඇති අංශය තෝරා ගැනීම සඳහා තරඟයක් සංවිධානය කරන ලද අතර ප්‍රධාන කාර්යාලයේ මධ්‍යම රසායනාගාරය විසින් එම තරඟයේ ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදි.

"වඩාත් හොඳ වග වීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම" යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමෙහි ලා අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශය යන දෙ අංශයම විසින් වග වීම හා පාරදෘෂ්‍ය භාවය පිළිබඳ ගැටළු සම්බන්ධ ගැටළු පිළිබඳව නිසි පියවර ගනු ලැබිණි.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධන්ගත වකුගඩු රෝගයට භාජනය වී ඇති ප්‍රදේශයන් හා සුරක්ෂිත ජල සැපයුමක් රහිත ග්‍රාමීය ප්‍රජාවන් කෙරෙහි, පවත්නා සම්පත් අනුව හා ඒ තුළ ප්‍රමුඛත්වය ලබා දෙන ලදි.

ශ්‍රී ලංකාව තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශකත්වය හා ක්‍රියාත්මක කිරීමේ සහායද සහිතව 2016 වර්ෂය තුළ අඛණ්ඩ ලෙස සිදු කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රජාව විසින් පරිභෝජනය කරනු ලබන සෑම ජල බිඳුවක්ම සුරක්ෂිත බවට වගබලා ගැනීම සඳහා විශාල ප්‍රයත්නයක් දරයි. ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම සන්දර්භය යටතේය. 2016 වර්ෂයේ අවසානය වන විට කළාපීය සේවා මධ්‍යස්ථානයන්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් විසින්, මහනුවර ස්ථාපිත කරනු ලැබ ඇති ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකයේ සහාය ඇතිව, දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කරනු ලබන, විවිධ ක්‍රියාත්මක අවස්ථාවන්හි පවත්නා නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් 82 ක් ක්‍රියාත්මක වෙමින් තිබේ.

## ප්‍රකාශිත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය.

| ඉලක්කය | ප්‍රධාන අරමුණු | 2016 අවසානයට ඉලක්කය | 2016 අවසානයට සාක්ෂාත් වීම |
|---|---|---|---|
| 1. ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වැඩි කිරීම | 1.1 මුළු නල ජල සම්පාදන ආවරණය | 49.8 % | 47.7 % |
| | 1.2 නල මලාපවහන ආවරණය | 2.4 % | 2.08 % |
| | 1.3 සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය. | 89.3 % | 87.8 % |
| 2. ව්‍යාපාර කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම | 2.1 ආදායම් රහිත ජලය (දීප ව්‍යාප්ත) | 26.70 % | 25.55 % |
| | 2.2 සම්බන්ධතා 1000 කට මුළු සේවක සංඛ්‍යාව | 5.00 % | 4.95 % |
| | 2.3 මුළු ප්‍රවර්තන පිරිවැයට බල ශක්ති මත වියදම | 17.00 % | 19.01 % |
| | 2.4 මුළු ප්‍රවර්තන පිරිවැයට නඩත්තු වියදම් | 6.26 % | 5.87 % |
| | 2.5 මුළු ප්‍රවර්තන පිරිවැයට ආයතනික වියදම් | 11.19 % | 10.44% |
| | 2.6 මුළු බිල් සංඛ්‍යාවට ඇස්තමේන්තුගත බිල් | 1 % | 1.14 % |
| | 2.7 අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය | 100 % | 107 % |
| | 2.8 ලැබිය යුතු මුදල් - | | |
| | (අ) දේශීය හා වාණිජ ආයතනයන්ගෙන් | දින 30 | දින 20 |
| | (ආ) රාජ්‍ය ආයතනයන්ගෙන් | දින 40 | දින 05 |
| | 2.9 මානව සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම. | | |
| | (අ). අභ්‍යන්තරික පුහුණුව (සහභාගි වන්නන්ගේ සංඛ්‍යාව) | 4400 | 9007 |
| | (ආ) රට තුළ බාහිර පුහුණුව (පුද්ගලයින් සංඛ්‍යාව) | 180 | 197 |
| | (ඇ) විදේශීය පුහුණුව (පුද්ගලයින් සංඛ්‍යාව) | 80 | 236 |
| | 2.10 ගණුදෙනු කරුවන්ට සපයන සේවා වැඩි දියුණු කිරීම හා මහජන පැමිණිලි වලට ක්ෂණිකව අවධානය යොමු කිරීම. දිවයින පුරා පැවැත්වීමට නියමිත මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් (පාසැල් හා වෙනත්) | 100 | 137 |
| | 2.11 බල ශක්ති කාර්යක්ෂම ව්‍යාපෘතීන් නිසා වාර්ෂිකව ඉතිරි වන මුදල්. | මිලියන 36.7 | මිලියන 21.8 |
| | 2.12 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ක්‍රමවත්, විමර්ෂණාත්මක හා පරීක්ෂණාත්මක කටයුතු අඛන්ඩ ලෙස ඉටු කරමින් සිටින අතර එම කටයුතු කරනු ලබන්නේ ව්‍යාපාරික කටයුතු වල හා මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාර කම් වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් නව දැනුම ලබා ගැනීම සඳහා වේ. | | |
| | 2.13 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගණුදෙනු කරුවන් හා මණ්ඩලය | | |

| | | | |
|---|---|---|---|
| | අතර ඇති සංස්ථානික සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම වාසියට හරවා ගැනීමට සූදානම් අතර, ඊට පෑථුල තොරතුරු හා සන්නිවේදන සංවර්ධන ක්‍රියාකාර කම් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථයෙන් එහි ව්‍යාපාරික කටයුතු දියුණු කිරීම පිණිස වන වෙබ් ද්වාරයක් ඇතුලත් වනු ඇත. | | |
| 3. වඩාත් පුළුල් වග වීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම. | මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ව්‍යාපාරික සැලසුම මත පදනම් වූ කළමනාකරණ හා ව්‍යාපාරික මෙවලම් පුළුල් පරාසයක් සංවර්ධනය කිරීම සඳහා ආරම්භක කටයුතු කරනු ලැබ ඇත.<br>■ මූල්‍ය අධිකාරි බලය පැවරීම<br>■ අය වැය පාලනය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව.<br>■ වාණිජ මෙහෙයුම් විගණනයට භාජනය කිරීම.<br>■ ගබඩා හා සැපයුම් විගණනයට භාජනය කිරීම.<br>■ මුදලින් හා චෙක් පත් මගින් කරන ගෙවීම් විගණනයට භාජනය කිරීම.<br>■ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු විගණනයට භාජනය කිරීම.<br>■ වත්කම් ආගණනය කිරීම<br>■ වැඩි දියුණු කළ කළමනාකරණ තොරතුරු හා සමායෝජනය | | |
| 4. ග්‍රාමීය හා ඌණ සේවිත ප්‍රජාවන් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය පහසුකරණය කිරීම | 4.1. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රැකුල් දීම හා සහාය සහිතව ප්‍රජා මූල සංවිධානයන්, පලාත් පාලන අධිකාරීන් හා වෙනත් අය විසින් නඩත්තු කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම. | 10.6% | 10.6% |

## ජල සම්පාදනයේ ප්‍රධාන කාර්ය සාධනය

> **"සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2015 වර්ෂයේ පැවැති 5.24 සිට වර්ෂ 2016 දී 4.95 ක් දක්වා අඩු කරන ලදි"**

**ආරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය.**




- නල ජල සම්පාදනය
- සාරන ලද ආරක්ෂිත ළිං.
- නල ළිං / අත් පොම්ප
- වැසි ජලය එකතු කිරීම හා වෙනත් ක්‍රම
- ආරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාවක් නැත.

වර්ෂය තුළදී සේවා සම්බන්ධතාවයන් 138,750 ක් සැපැයීම හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය නල ජලය සම්පාදනය කිරීමෙන් ආවරණය කරනු ලබන ජන ගහණය 37.1% ක් බවට පත් කරන ලදි.

වර්ෂය තුළදී රටේ විවිධ ප්‍රදේශයන්හි ප්‍රධාන හා සුළු ජල සම්පාදන ව්‍යාපෘතීන් කිහිපයක් දියත් කොට ක්‍රියාත්මක කිරීම මගින් නව ජල සම්පාදන සම්බන්ධතාවයන් සැපැයීම හා එවිටමත් සිටි පාරිභෝගිකයින් වෙත සපයන ලද සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කරන ලදි. රටේ නල ජල සම්පාදන ආවරණය වැඩි කිරීම සඳහා දියත් කරන ලද බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් නිම වන අදියරෙහි තිබුණ අතර ඒවාට අමතර ලෙස විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 19 ක් හා දේශීය බැංකු අරමුදලින් ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතීන් 10 ක් ක්‍රියාත්මක වෙමින් තිබිණි.

සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2015 වර්ෂයේ පැවැති 5.24 සිට වර්ෂ 2016 දී 4.95 ක් දක්වා අඩු කරන ලදි.

ගාස්තු සංශෝධනය 2012 වර්ෂයේ සිට සිදු වෙමින් පැවැති මෙහෙයුම් වියදම් වර්ධනය හා ගැලපුනේ නැත. මේ හේතුව නිසා ගත වූ වසර පහ තුළ සිය මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීමෙහි ලා මණ්ඩලය විසින් දුෂ්කරතා අත් විඳින ලද්දේය. ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් මුළු හිග ණය සම කොටස් බවට පරිවර්තනය කිරීමට 2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය තිබියදී වුවද අළුත් ණය මුදල් වලට අදාල ණය බැඳීම් නිසා මේ තත්ත්වයෙහි දියුණුවක් ඇති නොවීය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහණ මණ්ඩලය විසින් 2014 වර්ෂයෙන් පසුව පිට පිට පැමිණි වර්ෂ තුන තුළ පිළිවෙලින් රු. 1,002,860,406 ක, රු.1,425,890,828 ක හා රු.2,914,135,395 ක බද්දෙන් පසු ලාභ වාර්තා කරන ලදි.

කලාපීය රසායනාගාරයන් සමග එක්ව ජාතික ජල සම්පාදන හා ජලාපවහණ මණ්ඩලයේ මධ්‍ය රසායනාගාරය විසින් සපයනු ලබන පානීය ජලයේ ගුණාත්මය සහතික කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලද්දේය. වර්ෂය තුළදී ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව පරීක්ෂණයට භාජනය කරන ලද පානීය ජල නියැදීන් 28021 අතුරින් අසතුටුදායක ප්‍රතිඵල පෙන්වන ලද්දේ නියැදීන්ගෙන් 0.89% ක් පමණකි. තවද, නියැදීන් 27217 ක් භෞතික හා රසායනික පරාමිතීන් සොයාගැනීම සඳහා පරීක්ෂණයට භාජනය කරන ලද අතර බොර භාවය, වර්ණය හා කඨිනත්වය පදනම්ව අසතුටුදායක ප්‍රතිඵල පෙන්වන ලද්දේ නියැදීන් අතුරින් 10% ක් පමණි. දිවයින පුරා පිහිටි ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 271 ක ප්‍රභව ජලයේ (අමු ජලයේ) ගුණාත්මය ශ්‍රී ලංකා ප්‍රමිති 722 මග පෙන්වීම් අනුගමනය කරමින් මසකට දෙවරක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ප්‍රතිකාරක ක්‍රියාවලියේ ජලයේ ගුණාත්මය සතියකට වරක් විශ්ලේෂණය කරන ලදි.

මහියංගනය, කිලිනොච්චිය හා කුණ්ඩසාලේ යන ස්ථානයන්හි කලාපීය රසායානාගාරයන් තුනක් සංවර්ධනය කරන ලදි. කලාපයන් තුළ පරීක්ෂණ පහසු කම් සංවර්ධනය කරන ලද අතර (යාපනය - බැර ලෝහ, අනුරාධපුරය - පලිබෝධ නාශක, අම්පාර - ඇල්ගී හා ඇල්ගී විෂ ද්‍රව්‍ය) මේ සඳහා (ඌෂ්මකයන්, උදුන් හා GC/MS ආදී) රසායනාගාර උපකරණ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හරහා ලැබිණි.

ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාර කම් කිහිපයක් වර්ෂය තුළදී ක්‍රියාවට නංවන ලද්දේය. කොළඹ නගරය තුළ, වසන ලද සීමාවන් ස්ථාපිත කිරීමෙන් අනතුරුව බල පෑමට බෙහෙවින් ලක් වී ඇති ප්‍රදේශයන් තෝරාගෙන තුළු ගැලීම් මිණුම් ගන්නා ලදි. දෘෂ්‍යමාන කාන්දු වීම් හඳුනා ගැනීම සඳහා රාත්‍රී සමීක්ෂණ, සොරොව් සමීක්ෂණ හා ගෙන් ගෙට කරන සමීක්ෂණ පවත්වන ලද්දේය. එම ප්‍රදේශයන්හි ආදායම් රහිත ජලය සැලකිය යුතු මට්ටමකින් අඩු විය. ඒ අනුව, බස්නාහිර පලාතේ හා දීප ව්‍යාප්ත ආදායම් රහිත ජලය පිළිවෙලින් 28.26% ක් හා 25.50% ක් දක්වා අඩු කරනු ලැබ ඇත.

**පොදු කරුණු.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහණ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ විශාල, මධ්‍ය පරිමාණ හා කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 337 ක් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ අතුරින් යෝජනා ක්‍රම 54 ක් විසින් ප්‍රධාන නගර ආවරණය කරනු ලබන අතර, යෝජනා ක්‍රම 283 ක් හරහා කුඩා නගර හා ග්‍රාමයන් ආවරණය කෙරේ.

ජන ගහණයෙන් 3.2% ක් අත් පොම්ප නල ළිං වලින් ජලය ලබා ගනිති. ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ප්‍රජාව විසින් කළමනාකරණය කරනු ලැබීම ප්‍රජා මූල සංවිධාන හරහා ප්‍රවර්ධනය කරනු ලැබේ. නිවැරදි ලෙස වර්ෂා ජලය රැස් කර ගැනීම පිළිගත හැකි පානීය ජල ප්‍රභවයක් වශයෙන් සැලකිල්ලට ගන්නා ලදි.

## ප්‍රධාන සංඛ්‍යා ලේඛන - ජල සම්පාදනය.

| | | 2015 | **2016** | වෙනස් වීම % |
|---|---|---|---|---|
| ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව | | 331 | **337** | 1.81 |
| නල ජල නිෂ්පාදනය (ඝණ මීටර දස ලක්ෂ) | | 600 | **649** | 8.17 |
| නල ජල පරිභෝජනය (ඝණ මීටර දස ලක්ෂ) | | 436 | **483** | 10.78 |
| ගෘහස්ත සම්බන්ධතා (සංඛ්‍යා) | (අ) බස්නාහිර පලාත | 804,082 | **857,647** | 6.66 |
| | (ආ) වෙනත් පලාත් | 1027,467 | **1073,609** | 4.49 |
| **මුළු ගෘහස්ත සම්බන්ධතා සංඛ්‍යාව** | | 1831,549 | **1931,256** | 5.44 |
| පොදු ජල කණු (සංඛ්‍යා) | (අ) බස්නාහිර පලාත | 503 | **470** | (6.65) |
| | (ආ) වෙනත් පලාත් | 1,182 | **1,159** | (1.95) |
| **මුළු පොදු ජල කණු සංඛ්‍යාව** | | 1,685 | **1,629** | (3.32) |
| **ගෘහස්ත නොවන සම්බන්ධතා සංඛ්‍යාව** | (අ) බස්නාහිර පලාත | 74,297 | **79,599** | 7.14 |
| | (ආ) වෙනත් පලාත් | 47,875 | **81,616** | 70.48 |
| **මුළු ගෘහස්ත නොවන සම්බන්ධතා සංඛ්‍යාව** (මුළු පොදු ජල කණු සංඛ්‍යාව ඇතුළුව) | | 122,172 | **161,215** | 31.96 |
| **සේවා සම්බන්ධතා මුළු සංඛ්‍යාව** | | 1,953,721 | **2,092,471** | 7.10 |
| සාමාන්‍ය ගෘහස්ත මාසික පරිභෝජනය (එක් ගෘහස්ත සම්බන්ධතාවයක් තුළ ඝණ මීටර) | (අ) බස්නාහිර පලාත | 17.29 | **18.12** | 4.80 |
| | (ආ) වෙනත් පලාත් | 12.48 | **13.62** | 9.13 |
| මසකට සාමාන්‍ය ගෘහස්ත අය පත් වටිනාකම (රු) | (අ) බස්නාහිර පලාත | 729.44 | **829.92** | 13.77 |
| | (ආ) වෙනත් පලාත් | 405.85 | **474.76** | 16.98 |
| මුළු ආදායම (රු. දස ලක්ෂ - අගය එකතු කළ බද්ද සමග) | | 20,472 | **23,975** | 17.11 |
| මුළු ප්‍රවර්තන වියදම් (රු. දස ලක්ෂ) | | 19,549 | **21,034** | 7.00** |
| ආදායම් රහිත ජලය (%) | (අ) බස්නාහිර පලාත | 30.31 | **28.26** | (6.76) |
| | (ආ) වෙනත් පලාත් | 23.39 | **22.18** | (5.17) |
| | (ඇ) දීප ව්‍යාප්ත | 27.30 | **25.55** | (6.41) |
| මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000 කට | | 4.41 | **4.14** | (6.12) |
| මුළු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000 කට | | 5.24 | **4.95** | ((5.53) |
| ජල නිෂ්පාදනයේ ප්‍රවර්තන පිරිවැය සාමාන්‍යය (ඝණ මීටරයකට රුපියල්) | | 32.57 | **32.23** | (1.04) |
| අලෙවි කළ ඒකකයක මුළු පිරිවැය සාමාන්‍යය (ඝණ මීටරයකට රුපියල්) | | 48.81 | **47.19** | (3.32) |
| ඒකකයකට ලැබුණ ආදායම් සාමාන්‍යය (අයපත් නිකුත් කිරීම / පරිභෝජනය) (ඝණ මීටරයකට රුපියල්) | | 46.92 | **49.62** | 5.75 |
| අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය | | 1.03 | **1.00** | (2.91)** |
| ගැඹුරු ළිං (සංඛ්‍යා) | (අ) සාරන ලද | 179 | **299** | 67.04 |
| | (ආ) සාර්ථක වූ | 162 | **265** | 63.58 |
| සංවර්ධන වියදම් (රුපියල් දස ලක්ෂ) | | 27,544.18 | **30,902.42** | 12.19 |

** සැලකිල්ලට ගන්නා ලද ප්‍රධාන සාධකයේ වෙනස් වීම අහිතකර වේ.

# මලාපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය.




- ස්ථානීය සනීපාරක්ෂණය
- නල මලාපවහනය
- නොදන්නා මලාපවහනය (වැසිකිළි භාවිතා නොකිරීම)
- වෙනත් ආකාරයන්ගේ සනීපාරක්ෂණ ක්‍රම (හවුල්, පොදු හා මහජන වැසිකිළි)

## ප්‍රධාන සංඛ්‍යා ලේඛන - මලාපවහනය.

| | | 2015 | 2016 | වෙනස් වීම (%) |
|---|---|---|---|---|
| ගෘහස්ත සම්බන්ධතා | බස්නාහිර පලාත<br>වෙනත් පලාත් | 12,380<br>886 | 13,757<br>886 | 11.12<br>0.00 |
| ගෘහස්ත නොවන සම්බන්ධතා | බස්නාහිර පලාත<br>වෙනත් පලාත් | 964<br>181 | 1,332<br>185 | 38.17<br>2.20 |
| නිවාස යෝජනා ක්‍රම සම්බන්ධතා (තොග) | බස්නාහිර පලාත<br>වෙනත් පලාත් | 2,624<br>- | 2,907<br>- | 1.70<br>- |
| මුළු මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව | දීප ව්‍යාප්ත<br>බස්නාහිර පලාත<br>වෙනත් පලාත් | 17,035<br>15,968<br>1,067 | 19,067<br>17,996<br>1,071 | 12.00<br>13.00<br>0.40 |

## මෙහෙයුම් සාරාංශය

"ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කළුතර කෙත්හේන යන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරනු ලබන ජල ප්‍රමාණය හරහා නිෂ්පාදනයෙහි ප්‍රධාන පංගුවට බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය හිමිකම් කියන අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු ජල ප්‍රමාණයෙන් 55% ක් වේ"

**ජල සම්පාදනය.**

**පානීය ජල නිෂ්පාදනය.**

2016 වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු ජල ප්‍රමාණය ඝණ මීටර දස ලක්ෂ 649 ක් විය. ගත වූ වසර 10 තුළදී පානීය ජලය නිෂ්පාදනය කිරීමේ ප්‍රවණතාවය මෙහි පහත ප්‍රස්තාර සටහන තුළ පෙන්නුම් කරනු ලැබ ඇත. ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කළුතර කෙත්හේන යන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරනු ලබන ජල ප්‍රමාණය හරහා නිෂ්පාදනයෙහි ප්‍රධාන පංගුවට බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය හිමිකම් කියන අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු ජල ප්‍රමාණයෙන් 55% ක් වේ.




පලාත් අනුව ජල නිෂ්පාදනය



**නිෂ්පාදන පිරිවැය.**

2015 වර්ෂය හා සාපේක්ෂකව මුළු නිෂ්පාදන පිරිවැය (රුපියල් දස ලක්ෂ) මෙහි පහත දක්වනු ලැබ ඇත.




**නිෂ්පාදන පිරිවැය ඝණ මීටරයකට රුපියල්**

| 2015 | 2016 |
|---|---|
| 48.81 | 48.04 |

**නිෂ්පාදන පිරිවැය** = මුළු පිරිවැය / අලෙවි කළ ඒකක
= (මුළු ප්‍රවර්තන පිරිවැය + ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතීන් මත පොලිය + ක්ෂය කිරීම් / (අලෙවි කළ ප්‍රමාණය)

## සේවා සම්බන්ධතාවයන් සංසන්දනය කිරීම

| පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය | පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය අනුව සම්බන්ධතා සංඛ්‍යාව | | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාපය | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාප අනුව සම්බන්ධතා සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | 2015 දෙසැම්බර් අවසානයට | 2016 දෙසැම්බර් අවසානයට | වෙනස % | | 2015 දෙසැම්බර් අවසානයට | 2016 දෙසැම්බර් අවසානයට | වෙනස % |
| බස්නාහිර / මධ්‍යම | 421,319 | 443,998 | 5.4 | ප්‍රමුඛතා<br>කොළඹ නගරය<br>කෝට්ටේ<br>මහරගම | 2,290<br>138,100<br>154,809<br>126,120 | 2293<br>140,841<br>160,781<br>140,083 | 0.1<br>2.0<br>3.9<br>11.1 |
| බස්නාහිර / උතුරු | 237,261 | 256,513 | 8.1 | කැළණිය<br>ගම්පහ | 169,717<br>67,544 | 183,519<br>72,994 | 8.1<br>8.1 |
| බස්නාහිර / දකුණු | 219,799 | 236,735 | 7.7 | දෙහිවල<br>කළුතර<br>පානදුර | 102,479<br>60,345<br>56,975 | 105,136<br>63,912<br>67,687 | 2.6<br>5.9<br>18.8 |
| මධ්‍යම | 236,052 | 248,735 | 5.4 | මහනුවර උතුර<br>මහනුවර දකුණ<br>මහනුවර<br>නැගෙනහිර | 88,434<br>75,593<br>72,025 | 93,804<br>80,366<br>74,565 | 6.1<br>6.3<br>3.5 |
| වයඹ | 69,182 | 73,782 | 6.6 | කුරුණෑගල | 69,182 | 73,782 | 6.6 |
| උතුරු මැද | 100,668 | 107,686 | 7.0 | අනුරාධපුර | 100,668 | 107,686 | 7.0 |
| සබරගමුව | 94,784 | 100,957 | 6.5 | රත්නපුර<br>කෑගල්ල | 43,219<br>51,565 | 47,489<br>53,468 | 9.9<br>3.7 |
| දකුණු | 293,217 | 303,423 | 3.5 | හම්බන්තොට<br>මාතර<br>ගාල්ල | 97,728<br>91,709<br>103,780 | 102,406<br>94,646<br>106,371 | 4.8<br>3.2<br>2.5 |
| ඌව | 81,307 | 86,273 | 6.1 | බණ්ඩාරවෙල<br>මොණරාගල | 46,213<br>35,094 | 48,706<br>37,567 | 5.4<br>7.0 |
| උතුරු | 14,834 | 17,817 | 20.1 | යාපනය<br>මන්නාරම<br>වවුනියාව | 14,834 | 17,817 | 20.1 |
| නැගෙනහිර | 185,298 | 216,552 | 16.9 | අම්පාර<br>ත්‍රිකුණාමලය<br>අක්කරෙයිපත්තු<br>මඩකලපුව | 38,891<br>47,756<br>63,892<br>34,759 | 50,967<br>55,902<br>68,935<br>40,748 | 31.1<br>17.1<br>7.9<br>17.2 |
| **එකතුව** | **1,953,721** | **2,092,471** | **7.1** | **එකතුව** | **1,953,721** | **2,092,471** | **7.1** |

සම්බන්ධතා වර්ධනය




වාර්ෂික අයපත්කරණය හා මුදල් අය කරගැනීම් සංසන්දනය කිරීම




මාසික ගෘහස්ත පරිභෝජන සාමාන්‍යය (සම්බන්ධතාවයකට ඝණ මීටර)




ගෘහස්ත මාසික අය පතෙහි සාමාන්‍යය




## අයපත්කරණ සංඛ්‍යා ලේඛන.

| විස්තරය | 2015 (රුපියල් දස ලක්ෂ) | 2016 (රුපියල් දස ලක්ෂ) |
|---|---|---|
| අයපත්කරණ ඉලක්කය (අගය එකතු කළ බද්ද සමග) | 21,694 | **22,380** |
| සැබෑ අයපත්කරණය (අගය එකතු කළ බද්ද සමග) | 20,472 | **23,975** |
| මුදල් අය කර ගැනීමේ ඉලක්කය (අගය එකතු කළ බද්ද සමග) | 21,477 | **22,156** |
| සැබවින්ම අය කළ මුදල (අගය එකතු කළ බද්ද සමග) | 21,157 | **23,971** |

## පාරිභෝගික වර්ගය අනුව අලෙවි කරන ලද ජල ප්‍රමාණය හා ආදායම (2016).

| පාරිභෝගික වර්ගය | අලෙවි කළ ප්‍රමාණය | | ආදායම | |
|---|---|---|---|---|
| | ඝණ මීටර 000 | % | රුපියල් දස ලක්ෂ | % |
| සෘජු අයපත්කරණය | 359,917 | 72.80 | 14,535 | 60.63 |
| පාඨශාලා | 5,661 | 1.14 | 129 | 0.54 |
| කුලී නිවාස වතු | 2,170 | 0.44 | 80 | 0.33 |
| පොදු ජල කණු සැපයුම | 497 | 0.10 | 17 | 0.07 |
| රජයේ ආයතන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පරිශ්‍ර | 34,449 | 6.97 | 2,419 | 10.09 |
| වාණිජ හා කාර්මික | 55,198 | 11.16 | 5,378 | 22.43 |
| සංචාරක හෝටල් | 2,986 | 0.60 | 274 | 1.14 |
| නැව් කටයුතු | 132 | 0.03 | 72 | 0.30 |
| ආයෝජන මණ්ඩලය | 9,330 | 1.89 | 650 | 2.71 |
| ආගමික පරිශ්‍රයන් | 5,703 | 1.15 | 134 | 0.56 |
| **උප එකතුව** | **476,043** | **96.28** | **23,688** | **98.81** |
| තොග අයපත්කරණය | 14,431 | 2.92 | 275 | 1.15 |
| වෙනත්* | 3,942 | 0.80 | 9.5 | 0.04 |
| **මුළු එකතුව** | **494,416** | **100.00** | **23,973** | **100** |

### පාරිභෝගික වර්ගයන් අනුව ජලය භාවිතා කිරීමේ ප්‍රතිශතය.




### පාරිභෝගික වර්ගයන් අනුව ආදායම් ප්‍රතිශතය.



## ආයෝජන සාරාංශය.

"2016 වර්ෂය තුළ මහා පරිමාණ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් වූ සංවර්ධන කාර්යයන් සඳහා බාධාවකින් තොරව ගෙවීම් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි විය."

**මූල්‍ය ප්‍රභවයන්.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත දේශීය ඒකාබද්ධ අරමුදල් වෙන් කර දෙන ලද්දේ මතු වෙමින් පවතින සුළු නගරයන් සඳහා දියත් කරනු ලබන (කුඩා හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් පමණකි. තෝරා ගන්නා ලද මහා පරිමාණ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතීන් 3 ක් සඳහා විදේශ ආධාර දීමනා හා ආපසු ගෙවිය යුතු විදේශ ආධාර දීමනා වෙන් කරන ලදි. මහා පරිමාණ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් විදේශ ණය ගෙවීම් කිරීම සඳහා රුපියල් බිලියන 25 ක තවත් වෙන් කිරීමක්ද තිබිණි.

2016 වර්ෂය තුළ මහා පරිමාණ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් වූ සංවර්ධන කාර්යයන් සඳහා බාධාවකින් තොරව ගෙවීම් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි විය.

මේ අතර 2016 වර්ෂය තුළදී දේශීය බැංකු වලින් ණය පදනම මත ලබාගත් රුපියල් දස ලක්ෂ 11,076 ක මුදල යොදාගනිමින් (නව ව්‍යාපෘතීන් 9 ක් හා 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘතීන් 6 ක් ඇතුළු) ජල සම්පාදන ව්‍යාපෘතීන් 15 ක් ක්‍රියාත්මක කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි විය.

ජල අංශයේ ප්‍රජා පහසුකරණය කිරීමේ පරමාර්ථය සඳහා දේශීය අරමුදල් වලින් රුපියල් දස ලක්ෂ 1,942.49 ක වෙන් කිරීමක් හා රුපියල් දස ලක්ෂ 18 ක විදේශ ආධාර දීමනා අතිරේක වෙන් කිරීමක් ද සපයන ලදි.

**ප්‍රාග්ධන අයවැය වෙන් කිරීම්.**




2013 වර්ෂය හා සසඳා බලන විට 2014 වර්ෂයේදී ජල සම්පාදනය හා මලාපවහනය වෙනුවෙන් වෙන් කරන ලද මුළු වෙන් කිරීමේ සුළු අඩු වීමක් තිබුණද, ඉන් පසුව ඒ වෙනුවෙන් වූ වෙන් කිරීම ක්‍රම ක්‍රමයෙන් වැඩි කරන ලද අතර 2016 වර්ෂයේදී එය රුපියල් බිලියන 37 ක් විය. ප්‍රාග්ධන වැඩ සඳහා අරමුදල් සැපැයීමේදී 2015 වර්ෂයේදී පටන් අනුගමනය කරන ලද නව ක්‍රමය නිසා (දේශීය බැංකු අරමුදල් වලින් කරන ලද ව්‍යාපෘතීන් හැරෙන්නට) රුපියල් බිලියන 30.9 ක ආයෝජනයන් කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි.

**ප්‍රාග්ධන අරමුදල් ප්‍රයෝජනයට ගැනීම.**

2016 වර්ෂයේදී ප්‍රාග්ධන අරමුදල් ප්‍රයෝජනයට ගැනීම 83.55% ක පැවැතිනි.




**2015/2016 ප්‍රාග්ධන අරමුදල් ප්‍රයෝජනයට ගැනීමේ සංසන්දනය.**

| විස්තරය | **2015** | | 2016 | |
|---|---|---|---|---|
| විදේශීය සහභාගය (රුපියල් දස ලක්ෂ) | 20,247 | 79.8 % | 24,335 | 91.8% |
| විදේශ ආධාර හා සම්බන්ධ දේශීය සහභාගය (රුපියල් දස ලක්ෂ) | 5,507 | 91.0 % | 4,640 | 66.31% |
| දේශීය ව්‍යාපෘති සඳහා වූ ඒකාබද්ධ අරමුදල් (රුපියල් දස ලක්ෂ) | 1,791 | 60.35% | 1,927 | 55.95% |
| **එකතුව** | 27,544 | 80.1% | 30,902 | 83.6% |

**කුඩා පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපන හා ඉහළ ශ්‍රේණිගත කිරීමේ ව්‍යාපෘතීන් හරහා ශ්‍රී ලංකා රජයේ අරමුදල් යෙදවීම.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රම සම්පාදනය කර, සැලසුම් කර වියදම් දරනු ලබන දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් තිබේ. එකී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම අදාල පලාත් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබන අතර ඒවා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පලාතේ මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය විසින් භාරගනු ලැබේ.

දේශීය ලෙස අරමුදල් සැපයෙන ප්‍රාග්ධන කාර්ය වැඩ සටහන යටතේ 2016 වර්ෂය තුළදී නව ජල සම්පාදන ව්‍යාපෘතීන් 24 ක් නිම කිරීමේ හා ඊට අමතරව ජල සම්පාදන ව්‍යාපෘතීන් 21 ක් වර්ධනය කිරීමේ කටයුතු කරගෙන යන ලද්දේය. වර්ෂය තුළදී එකී වෙන් කිරීමෙන් 68% ක ප්‍රතිශතයක් ප්‍රයෝජනයට ගනු ලැබ ඇත.

දේශීය ලෙස අරමුදල් සැපයෙන ව්‍යාපෘතීන් වැඩි සංඛ්‍යාවක් වසර

**අනුග්‍රාහකයින් හා අදාල ශ්‍රී ලංකා රජයේ අරමුදල් හරහා ලැබුණ විදේශ ආධාර දායකත්වයන්.**




කිහිපයකට පෙර ආරම්භ කරන ලද ඒවා වේ. අය වැය ලේඛනයෙන් සුළු මුදල් ප්‍රමාණයන් වෙන් කරනු ලැබීම හේතුවෙන් එකී ව්‍යාපෘතීන්ගේ කාලය දීර්ඝ වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඒවායේ මුළු පිරිවැය ඇස්තමේන්තු මිළ වැඩි වීම් නිසා ඉහළ ගොස් ඇත. මීට අමතර වශයෙන් සම්පූර්ණ කරන ලද වැඩ සඳහා කොන්ත්‍රාත් කරුවන්ගේ ගෙවීම් කිරීම පිණිස කලට වේලාවට අරමුදල් මුදා හරින ලද්දේද නැත.

2015 වර්ෂයේ සිට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘතීන් සඳහා වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ වෙන් කිරීම් අඩු කරනු ලැබ ඇත. මෙම වර්ෂයේදී මෙම වර්ගීකරණය යටතේ උපයෝජ්‍යතාවයන් වෙනස් කිරීම සඳහා වෙන් කරන ලද රුපියල් දස ලක්ෂ 500 ද ඇතුළුව රුපියල් දස ලක්ෂ 1,500 ක් වෙන් කරනු ලැබ ඇත.

දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2016 වසර තුලදී රුපියල් දස ලක්ෂ 906 ක තමන්ගේම මූලය සම්පත් වෙන් කිරීම් යොදා ගනිමින් පවත්නා ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම අඛණ්ඩ ලෙස කරගෙන යන ලදි, මෙම අරමුදල් යොදා ගන්නා ලද්දේ ජල සම්පාදනයෙහි ගුණාත්මය හා ප්‍රමාණවත් බව පවත්වාගෙන යාමට හා මලාපවහන යෝජනා ක්‍රමයන් පවත්වාගෙන යාමටත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වත් කම් නඩත්තු කරගෙන යාමට හා මෙහෙයුම් ක්‍රියාකාර කම් තුළ අදාල සහාය සේවාවන් ඉටු කර ලීමටත්ය.

එහි අර්ථය වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පුනරුත්ථාපණය සඳහා රුපියල් දස ලක්ෂ 445.75කද, ආදායම් රහිත ජලය අඩු කිරීම සඳහා රුපියල් දස ලක්ෂ 101.42 ක් ද, බල ශක්ති සංරක්ෂණය සඳහා රුපියල් දස ලක්ෂ 69.40 ක මුදලක් හා ප්‍රාග්ධන වත් කම් ප්‍රතිසම්පාදනය සඳහා රුපියල් දස ලක්ෂ 13.68 ක මුදලක්ද වැය කරනු ලැබ ඇති බවයි. අනුග්‍රාහකයින්ගේ සහායක් නොලැබෙන හෝ ප්‍රධාන අරමුදල් සැපැයීමක් නොලැබෙන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදි.

### ප්‍රාග් ධන කාර්ය වැඩසටහන් දිස්ත්‍රික්ක අනුව - 2016

| දිස්ත්‍රික්කය | 2016 වෙන් කිරීම රුපියල් දස ලක්ෂ | වෙන් කිරීම මත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අම්පාර | 19.65 | 2 | 30,000 |
| අනුරාධපුර | 14.36 | 2 | 155,855 |
| බදුල්ල | 22.18 | 2 | 16,000 |
| කොළඹ | 18.93 | 2 | 30,300 |
| ගාල්ල | 87.86 | 3 | 71,700 |
| ගම්පහ | 3.30 | 1 | 20,000 |
| කළුතර | 30.46 | 1 | 120,000 |
| මහනුවර | 66.46 | 4 | 187,000 |
| කෑගල්ල | 66.30 | 4 | 58,675 |
| කුරුණෑගල | 73.21 | 4 | 106,185 |
| මාතලේ | 27.96 | 1 | 400,000 |
| මාතර | 58.59 | 2 | 10,000 |
| මොනරාගල | 0.40 | 2 | 16,000 |
| නුවරඑළිය | 89.64 | 2 | 5,000 |
| පොලොන්නරුව | 39.92 | 2 | 74,800 |
| යාපනය | 1.38 | 1 | 200,000 |
| රත්නපුර | 73.99 | 6 | 152,900 |
| ත්‍රිකුණාමලය | 8.81 | 1 | 25,000 |
| හම්බන්තොට | 33.72 | 3 | 35,500 |
| **එකතුව*** | 736.52 | 45 | 1,714,915 |

**මීට අමතරව, උපයෝජ්‍යතාවයන් වෙනස් කිරීම ඇතුළු අන්තර් පලාත් කටයුතු සඳහා රුපියල් දස ලක්ෂ 763.48 ක් වෙන් කරනු ලැබ ඇත.**

# 2016 වර්ෂය තුළදී නිම කරන ලද ව්‍යාපාති වල විස්තර.

| කලාපීය සේවා මධ්‍යස්ථානය | ව්‍යාපෘති නාමය | අරමුදල් ඒජන්සිය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය - රුපියල් දස ලක්ෂ | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| මධ්‍යම | විසල් මහනුවර ජල සම්පාදන - අදියර 1, පියවර 11 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය | 4,164.00 | ප්‍රතිලාභීන් 183,000 සේවා වැඩි දියුණු කිරීම් 432,800 |
| | ශ්‍රී පාද ස්ථානය | ශ්‍රී ලංකා රජය | 210.00 | වන්දනා කරුවන් |
| ඌව | මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතිය | ඔස්ට්‍රියාව | 2,743.56 | 33,300 |
| බස්නාහිර | කොළඹින් උතුර නගර - පියවර 11 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය | 6,490.00 | 400,000 |
| | කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1, පියවර 11 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය | 10,846.00 | 400,000 |
| | ජල්තර - රනාල ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 329.90 | 7,100 |
| | කොලොන්නාව මලාපවහන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 121.00 | 20,000 |
| | රත්මලාන, මොරටුව හා ජාඇල, ඒකල අපජල බැහැර කිරීමේ යෝජනා ක්‍රමය | ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය | 17,471.00 | 94,500 |
| සබරගමුව | විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | ස්පාඤ්ඤය | 4,202.63 | 140,000 |
| | ඇඹිලිපිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 810.20 | 84,000 |
| | ගොඩකවෙල ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 288.80 | 22,500 |
| උතුරු මැද | මින්නේරිය ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර 11 | ශ්‍රී ලංකා රජය | 100.00 | 2,800 |
| | ඉපලෝගම ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 798.00 | 152,000 |
| | පරසන්ගස්වැව ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 31.60 | 1,000 |
| නැගෙනහිර | දෙහිඅත්තකණ්ඩිය ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 300.00 | 16,000 |
| වයඹ | දිවුලගම ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 46.67 | 1,950 |
| දකුණු | කතරගම ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 137 | 24,000 |
| | හරිතගම ජල සම්පාදන ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | 30.2 | 1,500 |

## සේවක මණ්ඩලය.

මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් පෙර පරිදිම සේවකයින් වෙත පුහුණු අවස්ථා ලබා දීම අඛන්ඩව කරගෙන යන ලදි. 2016 වර්ෂය තුළදී නව පුහුණු වැඩ සටහන් / වැඩ මුළු / දැනුවත් කිරීමේ වැඩ සටහන් 41 ක් හඳුන්වා දෙන්නට යෙදුනි.

**කාර්ය මණ්ඩල සංඛ්‍යාව.**

| කාර්ය මණ්ඩල විවිධත්වය | 2015 | 2016 | (%) |
|---|---|---|---|
| (අ) ස්ථිර* | 9,439 | 10,110 | 7.1 |
| (ආ) අනියම් | 09 | 3 | (66.7) |
| (ඇ) කොන්ත්‍රාත් | 756 | 215 | (71.6) |
| (ඈ) යන්ත්‍රාගාර කාර්මික ආධුනික හා GT | 41 | 24 | (41.5) |
| **එකතුව** | 10,245 | 10,352 | (1.0) |

* විදේශීය අරමුදල් යොදාගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් සඳහා බඳවාගෙන ඇති කාර්යමණ්ඩල ස්ථිර කාර්යමණ්ඩල සංඛාවෙන් ඉවත් කරනු ලැබ ඇත.

## ප්‍රධාන කාර්ය කෘත්‍යයන් බෙදී ගොස් ඇති අන්දම.




2016 වර්ෂයේ අවසානය වන විට 10110 ක ස්ථිර කාර්ය මණ්ඩලයට අමතර වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 215 ක් ද, අනියම් සේවකයින් තිදෙනෙක් හා යන්ත්‍රාගාර තාක්ෂණවේදී ආධුනිකයින් 24 දෙනෙක්ද මණ්ඩලය තුළ සේවයේ යෙදී සිටියහ. කොන්ත්‍රාත් පදනම මත සේවයට ගත්තවුන්ගෙන් වැඩි දෙනෙක් බඳවා ගන්නා ලද්දේ විදේශ අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්ගේ කටයුතු සඳහාය.

2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී විවිධ කාර්ය මණ්ඩල වර්ගයන් වෙනුවෙන් ස්ථිර පදනම මත 1225 ක් ද, කොන්ත්‍රාත් පදනම මත 25 ක් හා යන්ත්‍රාගාර තාක්ෂණවේදී ආධුනිකයින් 22 ක්ද බඳවා ගැනීම් සිදු කරනු ලැබ ඇත. එම කාලය තුළදීම ස්ථිර සේවකයින් 554 ක ගේද, අනියම් සේවකයින් 6 දෙනෙකුගේ ද, කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 566 දෙනෙකුන්ගේ හා යන්ත්‍රාගාර තාක්ෂණවේදී ආධුනිකයින් 39 දෙනෙකුගේ සේවා අවසන් වීම් සිදු වී ඇති අතර විවිධ වර්ගයන්ගේ කාර්ය මණ්ඩලයන් තුළ සිදු වූ එම සේවා අවසන් වීම් වලට විශ්‍රාම ගැන්වීම්, ඉල්ලා අස්වීම්, සේවය අත හැර යාම් හා මරණ ඇතුලත් වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත කාර්ය මණ්ඩලය 107 කින් වැඩි වී ඇත. යන්ත්‍රාගාර තාක්ෂණවේදී ආධුනිකයින් 24 දෙනා ඉදිරියේදී ස්ථිර කරනු ලැබීමේ හැකියාව ඇත.

## ස්ථානය අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම.



**කාර්ය මණ්ඩල ප්‍රතිලාභ.**

- වර්ෂය තුළදී එලදායිත්ව දිරිගැන්වීමක් ඇතුළුව රුපියල් 37,500.00 ප්‍රසාද දීමනාවක් ගෙවන ලදි.
- පෙර වසර වලදී මෙන්ම ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ලබා දීම කරන ලදි.
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නොකැලැල් සේවාවක් ඉටු කළ සේවකයින් වෙත ලෝක ජල දිනය සමරමින් 2016 මාර්තු මාසයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී උත්සවාකාරයෙන් සතුට පළ කර සිටින ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සහන මිළ ගණන් වලට ප්‍රවාහන පහසු කම් සපයන ලදි.
- සේවයේ යෙදී සිටින කාලයේදී මිය ගිය ස්ථිර සේවකයින් වෙනුවෙන් මරණ ප්‍රදානයන් දීම සිදු කරන ලදි.
- සේවක මණ්ඩල සාමාජිකයින් වෙත දේශීය හා විදේශීය පුහුණු පහසුකම් ලබා දෙන ලදි.
- සේවකයින් වෙත රුපියල් 650.00 ක තේ දීමනාවක් ප්‍රදානය කරන ලදි.
- (මහජන බැංකුව වෙතින් හා ලංකා බැංකුව වෙතින් පිළිවෙලින් නිවාස ණය හා වාහන ණය ආදී වශයෙන්) රාජ්‍ය බැංකු හරහා සේවක මණ්ඩලය වෙත ණය පහසු කම් ලබා දෙන ලදි.
- සේවකයින් වෙත රුපියල් 10,000.00 ක උත්සව අත්තිකාරම් මුදලක් ලබා දෙන ලදි.
- 2016 වර්ෂය තුළදී සේවක මණ්ඩල සාමාජිකයින් 120 දෙනෙකු අතර මාස 12 ණය මුදල් වශයෙන් රුපියල් 58,333,165.00 ක මුදලක් හා සේවක මණ්ඩල සාමාජිකයින් අතර මාස 10 ණය මුදල් වශයෙන් රුපියල් 435,980, 920.00 ක මුදලක් ද සහන අනුපාතිකයක් මත බෙදා දෙනු ලැබීය.
- (පවුලේ සාමාජිකයින්ද ඇතුළු) සේවක මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා (දල වශයෙන්) රුපියල් දස ලක්ෂ 53 ක වියදමක් දරන ලදි. ඊට අමතරව, ඉතා බරපතල රෝගයන් සඳහා වූ වියදම්ද දරන ලදි.

## කාර්ය මණ්ඩලයේ පඩි නඩි හා ප්‍රතිලාභ.

**2015 හා 2016 වර්ෂයන්හි කාර්ය මණ්ඩල පඩි නඩි සසඳා බැලීම.**

| **විස්තරය** | **2015 රුපියල් දසලක්ෂ** | **2016 රුපියල් දසලක්ෂ** |
|---|---|---|
| වැටුප් | 9,925 | 10,104 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 856 | 902 |
| සේවක භාර අරමුදලට දායකත්වය | 214 | 226 |
| එකතුව | 10,995 | 11,232 |

**මිනිස් බල සංවර්ධනය හා පුහුණුව.**

මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් පෙර පරිදිම සේවකයින් වෙත පුහුණු අවස්ථා ලබා දීම අඛණ්ඩව කරගෙන යන ලදි. 2016 වර්ෂය තුළදී නව පුහුණු වැඩ සටහන් / වැඩ මුළු / දැනුවත් කිරීමේ වැඩ සටහන් 41 ක් හඳුන්වා දෙන්නට යෙදුනි. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හා රේඛීය කළමනාකරුවන් මගින් හඳුනාගනු ලබන පුහුණු අවශ්‍යතා ප්‍රමුඛතාවයන් පදනම් කර ගනිමින් විධිමත් අභ්‍යන්තර පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩ මුළු යන ප්‍රවේශයන් ත්‍රිත්වය හරහා සියළුම වර්ගයන්ට අයත් සේවක මණ්ඩල සාමාජික සාමාජිකාවන් වෙත පුහුණුව ලබා දෙන ලදි. ඊට අමතරව රට තුළ ක්‍රියාත්මක වන වෙනත් පුහුණු ආයතනයන් තුළ පුහුණුව ලබාගැනීමේ අවස්ථාවන් හා විදේශීය පුහුණු හා නිල සංචාරයන් ලබා දෙන ලදි.

2016 වර්ෂය තුළදී මෙම අංශය විසින් අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් 229 ක් පවත්වමින් කළමනාකාරිත්වයට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 922 දෙනෙකුන්ද, විධායක ශ්‍රේණිගේ 2768 දෙනෙකුන්ද, අධීක්ෂණ මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයින් 2068 දෙනෙකුන්ද, ලිපිකාර හා ඒ හා සම්බන්ධ සේවාවන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 2095 දෙනෙකුන් හා මෙහෙයුම් කටයුතු වල යෙදෙන්නන් 1154 දෙනෙකුන්ද වශයෙන් විවිධ අංශයන්ට අයත් මුළු සංඛ්‍යාව වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 9007 දෙනෙකුන් වෙත පුහුණුව ලබා දෙනු ලැබ ඇත. අලුතින් හඳුන්වා දෙන ලද වැඩ සටහන් වලට අමතර ලෙස මෙම කාලය තුළදී තවත් පුහුණු වැඩ සටහන් 46 ක් අභ්‍යන්තරික ලෙස පවත්වන ලදි. රට තුළ පිහිටි වෙනත් පුහුණු ආයතනයන් වල පුහුණුව ලබා දීම යටතේ මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් දේශීය පුහුණු කිරීම් මධ්‍යස්ථාන හරහා පුහුණු දින 2429 ක් ආවරණය කරමින් සේවක මණ්ඩල සාමාජිකයින් 197 දෙනෙකුන් වෙත බාහිර වශයෙන් පුහුණුව ලබා දීමට කටයුතු කරන ලද්දේය. දේශීය විශ්ව විද්‍යාලයයන් විසින් පවත්වනු ලබන දර්ශනපති, ශාස්ත්‍රපති හා පශ්චාත් උපාධි වැඩ සටහන්ද, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය, සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආයතනය, ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය, ලංකා ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනය හා නිවාස සැලැසුම් කිරීමේ හා නිර්මාණය කිරීමේ මධ්‍යස්ථානය වැනි විවිධ පිළිගත් ආයතනයන් විසින් පවත්වනු ලබන ඩිප්ලෝමා හා සහතික පාඨමාලාවන්ද මෙයට ඇතුලත් විය. මීට අමතරව මානව සම්පත් කළමනාකරණය, සැපයුම් දාම කළමනාකරණය, ඉදි කිරීම් කළමනාකරණය, යාන්ත්‍රික හා විද්‍යුත් ක්ෂේත්‍ර හා යන්ත්‍ර ක්‍රියා කරවීම හා නඩත්තුව යන ක්ෂේත්‍රයන්හි කෙටි කාලීන පාඨ මාලා කිහිපයක් සඳහා සේවක මණ්ඩල සාමාජිකයින් නම් කරන ලදි.

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාරයෙන් හා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, ඉන්දියානු තාක්ෂණික ආර්ථික සහයෝගිතාවය, ආසියානු තාක්ෂණවේදී ආයතනය සමග එබාරා ආයතනය, ආසියානු එලදායිතා සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය, සිංගප්පූරු සහයෝගිතා වැඩ සටහන හා චීන විද්‍යා විද්‍යායතනය යන ආයතනයන් විසින් පිරිනමන ලද ද්වි පාර්ශවික අධි ශිෂ්‍යත්වයන් හරහා මණ්ඩලයේ සේවක මණ්ඩල සාමාජිකයින් 88 දෙනෙකුන් වෙත කෙටි කාලීන විදේශ පුහුණු

අවස්ථාවන් ලබා දෙන ලදී.

මීට අමතර ලෙස මිනිස් බල සංවර්ධන හා පුහුණු අංශය විසින්, 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘතීන් හරහා නැව් ගත කිරීමට පෙර පරීක්ෂණ, කර්මාන්ත ශාලා පරීක්ෂණ, කොන්ත්‍රාත්තු ගිවිස ගැනීම් සහ ඒකාබද්ධ වීමේ වැඩ සටහන් සඳහා නිල සංචාරයන්හි යෙදීමට නිලධාරීන් 145 දෙනෙකු වෙත පහසුකම් සලස්වා දෙන ලදී.

2016 වර්ෂය තුළදී දීර්ඝ කාලීන අධි ශිෂ්‍යත්ව වැඩ සටහන් යටතේ නෙදර්ලන්ත අධි ශිෂ්‍යත්ව වැඩ සටහනේ අනුග්‍රහයෙන් පවත්වන ලද ජල විද්‍යා හා ඉංජිනේරු විශේෂඥතාවය, ද්‍රාව ඉංජිනේරු විද්‍යාව හා ගංගා ද්‍රෝණි සංවර්ධනය පිළිබඳ විද්‍යාපති වැඩ සටහන් වලටද, නෙදර්ලන්ත අධි ශිෂ්‍යත්ව වැඩ සටහනේ අනුග්‍රහයෙන් පවත්වන ලද ජල කළමනාකරණ විශේෂඥතා වැඩ සටහනට හා ජල ප්‍රභව කළමනාකරණ වැඩ සටහනටද හා ඊට අමතරව ලෝක බැංකුව හා ඒකාබද්ධ ජපන් උපාධි ශිෂ්‍යත්ව වැඩ සටහන විසින් එක්ව අනුග්‍රහය දක්වන ලද සනීපාරක්ෂණ ඉංජිනේරු වැඩ සටහනටද සහභාගි වී පූර්ණ කාලීනව විදෙස අධ්‍යයනය කිරීමේ අවස්ථාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉංජිනේරුවන් වෙත උදා විය.

## අභ්‍යන්තරික කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ලද පුහුණුවේ සාරාංශය.

| අංක | පුහුණු වර්ගය | පුහුණු ලාභීන් සංඛ්‍යාව | | | මිනිස් දින |
|---|---|---|---|---|---|
| | | වැඩ සටහන | ප්‍රගතිය | | |
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | |
| 1 | විධිමත් අභ්‍යන්තර පුහුණුව | 4,400 | 9,700 | 205 | 13,092 |
| 2 | විදේශීය පුහුණුව හා සංචාර | 80 | 236 | 295 | 4,212 |
| 3 | රට තුළ බාහිර පුහුණුව | 180 | 197 | 109 | 2,429 |
| 4 | බාහිර ආයතනයන් විසින් පවත්වන ලද. | 240 | 480 | 200 | 480 |
| **එකතුව** | | **4,900** | **9,920** | **202** | **20,213** |

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉහත කී වර්ග ත්‍රිත්වයට අයත් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වන ලද මෙම වැඩ සටහන් සියල්ලටම අමතර වශයෙන් (උපාධි අපේක්ෂකයින්, තාක්ෂණවේදී ජාතික ඩිප්ලෝමා / උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ශිල්පීය ආධුනිකයින් හා තාක්ෂණික විද්‍යාලයයන්හි හා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගණකාධිකරණ තාක්ෂණ ශිල්පීන්ගේ ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්, වෘත්තීය පුහුණු අධිකාරියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු) ආධුනකයින් වෙත සේවාස්ථ පුහුණුව ලබා දෙන ලදී.

## බාහිර ආයතනයන් හා සම්බන්ධ ආධුනිකයින් වෙත ලබා දෙන ලද සේවාස්ථ පුහුණු වැඩ සටහන් වල සාරාංශය.

| අංක | වර්ගය | පුහුණු ලාභීන් සංඛ්‍යාව | මිනිස් දින |
|---|---|---|---|
| 1 | උපාධි අපේක්ෂකයින් | 134 | 12,573 |
| 2 | තාක්ෂණික පුහුණු ලාභීන් | 25 | |
| 3 | ගණකාධිකරණ පුහුණු ලාභීන් | 02 | |
| 4 | ලිපිකාර හා වෙනත් පුහුණු ලාභීන් | 11 | |
| එකතුව | | 172 | |

## මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් ලබා දෙන ලද පුහුණුවේ සාරාංශය.





“ජීවිතයේ සාරය වන්නා වූ හා සෑම සියළු දෙනෙකුම උපතින් ලබන හිමිකමක් වූ පිරිසිදු ජලය දැන් සියළු මිනිසුන් විසින් ලබා ගත හැකි තත්ත්වයක තිබිය යුතු වන්නේය”

ජීන් මිචෙල් කොස්ටෘ.



# තිරසාරත්ව වාර්තාව

කලටුවාව වාතකය

## සේවාවේ උත්කෘෂ්ඨ භාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම.

සංවිධානයේ සේවා උත්කෘෂ්ඨ භාවය සාක්ෂාත් කර ගැනීමෙහි හා මෙහෙයුම් කාර්යක්ෂම තාවය නංවා ලීමෙහි ලා නව්‍යකරණය වූ තොරතුරු තාක්ෂණ විසඳුම් මගින් අති විශාල ලෙස දායකත්වය ලබා ගැනීමේ හැකියාවක් තිබෙන බවට වූ අවබෝධයත් සමග ගත වූ වසර කිහිපය මුළුල්ලේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය අවධානය ප්‍රධාන වශයෙන්ම තොරතුරු තාක්ෂණය දියුණු කිරීම කෙරෙහි යොමු කරන ලදි. වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ අංශයේ ඉහලම ප්‍රමුඛත්වය හිමි වුනේ ව්‍යාපාරික ක්‍රියාවලීන් හා මෙහෙයුම් ක්‍රියා පටිපාටීන් අනාකූලනය කිරීම සඳහා නිවැරදි ලෙස සැලසුම් කරන ලද තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුන්වා දීම කෙරෙහිය. මූල්‍ය, මානව සම්පත් කළමනාකරණ හා වට්ටෝරු පොත් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පවත්නා පෙර සිට පැවැති ක්‍රමයන් පවත්වාගෙන යන අතර සංවිධානයේ වාණිජ මෙහෙයුම් සඳහා පරිග්‍රාහක විසඳුමක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට තොරතුරු තාක්ෂණ අංශයට හැකි විය. අතිශයින්ම අත්‍යවශ්‍ය ශ්‍රීතීයතාවයන් සමග 2015 වර්ෂයේ සිට ආරම්භ කරන ලද මෙම විසඳුම අනාකූල වාණිජ මෙහෙයුම් සඳහා තීරණාත්මක ලෙස අත්‍යවශ්‍ය වන්නා වූ තව තවත් කෘත්‍යයන් ආවරණය කිරීම සඳහා තව දුරටත් දීර්ඝ කරන ලදි. පරිනාමය වෙමින් පවතින්නා වූ විද්‍යුත් පාලන සංකල්පයන් හා අනුකූල වෙමින් ගණු දෙනු කරුවන්ට අන්තර්ජාලය හරහා වැදගත් වාණිජ සේවාවන් ලබා ගැනීමට පහසු කම් සැලැස්වෙන පරිදි ජාලගත ගණු දෙනු කාර ද්වාරයක් දියත් කරන ලදි.

### වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය.

දශක ගණනාවක් පැරණි පෙර සිට පැවැති වාණිජ අයපත් ක්‍රමය වෙනුවට වෙනත් ක්‍රමයක් හඳුන්වා දීම සංවිධානයේ දැවෙන අවශ්‍යතාවයක් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් තොරතුරු තාක්ෂණ අංශය 2015 මැද භාගයේදී වාණිජ මෙහෙයුම් සඳහා නව විසඳුමක් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කළේය. මාස 4 ක් වැනි කෙටි කාල සීමාවක් තුළ එකී සංවර්ධන කටයුතු නිම කිරීමෙන් අනතුරුව මාස 2 ක කාලයක් තුළ එම විසඳුම දෙහිවල කලාපයේ ක්ෂේත්‍ර පරීක්ෂණයට භාජනය කරන ලදි. එම ක්‍රමය 2016 ජනවාරි මාසයේ සිට දීප ව්‍යාප්ත ලෙස සිය සජීවි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදි.

විසඳුම සැලසුම් කරන ලද්දේ මධ්‍යම දත්ත සංචිතයක් සහිත ජාලය පදනම් වූ උපයෝගයක් වශයෙනි. විසඳුමට අදාල සංග්‍රාහකයා වන්නේ ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානය වන අතර භාවිතා කරන්නන්ට ප්‍රධාන වශයෙන්ම IP VPN පෞද්ගලික ජාලය හරහා ඊට සම්බන්ධ විය හැකි අතර ඊට අමතරව ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කරනු ලැබ ඇති දුරස්ථ පිවිසුම් සේවාව භාවිතා කරමින් අන්තර්ජාලය හරහා ඊට ප්‍රවිෂ්ඨ විය හැකි වේ. මධ්‍යම දත්ත සංචිතය තුළ ගණුදෙනු කරුවන් දස ලක්ෂ 2 කට අධික සංඛ්‍යාවකට අදාල, කරන ලද ගෙවීම්, අය පත් හා වෙනත් ගණුදෙනු වල ඓතිහාසික සටහන් ඇතුලත් කරනු ලැබ ඇත.

විසඳුම ප්‍රධාන මොඩියුල 7 ක් සමග අතිරේක මොඩියුල 3 කින් සමන්විත වේ. ප්‍රධාන මොඩියුල හත වන්නේ (අයපත් කරණයට අදාල සියළුම ක්‍රියාකාර කම් පිළිබඳව කටයුතු කරන) අයපත්කරණ ක්‍රමය, (සියළුම ගෙවීම් අයකර ගැනීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් කටයුතු කරන) ගෙවීම් පද්ධතිය, (සියළුම ගණුදෙනු කරුවන්ගේ පැතිකඩයන් සම්බන්ධයෙන් කටයුතු කරන) පැතිකඩ කළමනාකරණ පද්ධතිය, (සියළුම නෛතික අය කර ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කරන) නෛතික ක්‍රමය, (ජාලගත සේවාවන් යොදාගැනීම හරහා ගණුදෙනු කරුවන් වෙත ජාලය හරහා ලබා දෙනු ලබන ගණුදෙනුකාර සේවාවන් පිළිබඳව කටයුතු කරන) විද්‍යුත් සේවා මොඩියුලය, (සියළුම පද්ධති පරිපාලන කෘත්‍යයන් සම්බන්ධයෙන් කටයුතු කරන) පරිපාලන මොඩියුලය හා (ගණුදෙනු කරුවන්ගේ පැමිණිලි කළමනාකරණය කිරීම හා ආදායම් රහිත ජලය සම්බන්ධ ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන) මෙහෙයුම් හා නඩත්තු සේවා මොඩියුලයද වේ.

අතිරේක මොඩියුලයන් වන්නේ (වෙනම සංග්‍රහණය කරමින් ගණුදෙනු කරුවන් වෙත ජාලගත සේවාවන් ලබා දෙන) ජාලගත සේවා යෙදවුම, (සංදර්භ විෂයක, ප්‍රස්තාරික හෝ උපකරණ පුවරු ස්වරූපයන්ගෙන් කළමනාකරණ තොරතුරු ජනනය කරන) කළමනාකරණ තොරතුරු ද්වාරය හා (විසඳුම භාවිතා කරන පාරිභෝගිකයින්ගේ සහායට තිබෙන්නා වූ) පාරිභෝගික සහාය ද්වාරයද වන්නේය.

වාණිජ මෙහෙයුම් කළමනාකරණ ක්‍රමය සංවිධානයේ ඉතාම වැදගත් තොරතුරු තාක්ෂණික විසඳුම මෙන් සලකනු ලබන අතර, එහි සාර්ථකත්වය වෙනුවෙන් එය සංවර්ධනය කිරීමෙහි ලා කැප වීමෙන් කටයුතු කළ සංවර්ධන කණ්ඩායමට හා ඉහල කළමනාකරණයෙන් සහ විශේෂයෙන්ම වාණිජ අංශයෙන් හා වෙනත් පරදු ධාරීන්ගෙන් ලැබුන ප්‍රශංසනාත්මක සහයෝගයට ස්තුති කළ යුතු වන්නේය.

මෙම විසඳුම සතුව ජව සම්පන්න සංවර්ධන සංකල්පයන් මත පදනම්ව වර්ධනය වෙමින් පවත්නා ක්‍රමෝපායයක් පහසුකරණය කෙරෙන අනුපමේය මුඛ්‍ය තාක්ෂණයක් ඇත්තේය. මෙය අඛන්ඩ ලෙස වැඩි දියුණු කරමින් පවතින අතර වසර පුරාම එයට බොහෝ නව ශ්‍රිතියතාවයන් එකතු කරන ලදි.

මනු කියවීම් ග්‍රහණය කර ගනිමින් ගණක යන්ත්‍රයක් භාවිතා නොකර අය පත ගණනය කිරීමට හැකි වන පරිදි මනු කියවන්නන් වෙනුවෙන් ජංගම උපයෝගයක් නිපදවන ලදි. අයපත් කරණයෙහි නිරවද්‍යතාවය වැඩි කිරීම හා කලාපීය කාර්යාලයේ දත්ත ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය නැති කිරීමත් මෙම උපකරණයෙන් අපේක්ෂා කරනු ලැබේ. මෙම පහසුකම දෙහිවල කලාපය තුළ ක්ෂේත්‍ර පිරික්සුමට භාජනය කරන ලද අතර නුදුරු අනාගතයේදී එය දීප ව්‍යාප්ත ලෙස භාවිතයෙහි යොදවනු ලබනවා ඇත.

**විසඳුමෙහි නව මොඩියුල පෙන්නුම් කරන තිර ඡායාරූපය.**




### නව්‍යකරණය වූ තාක්ෂණවේදයන් මගින් ගණුදෙනු කරුවන්ගේ පහසුව.

මහජන සේවය වැඩි දියුණු කිරීමට දායක වන ප්‍රධාන සාධකය නව්‍යකරණයයි. වැඩි දියුණු කළ රාජ්‍ය සේවා ලබා දීමේ යාන්ත්‍රණයන්ගේ පිටුපස ඇති බලය ලෙස විද්‍යුත් පාලන සංකල්පයන් ඉස්මතු වෙමින් පවතින අතර ලෝකය පුරා මහජන උපයෝගිතා අංශය තුළ නව්‍යකරණය වූ විසඳුම් ලබා දෙන්නා වූ වේදිකාවන් වශයෙන් භූගෝලීය තොරතුරු පද්ධතීන් (GIS), අධීක්ෂණාත්මක පාලන හා දත්ත ප්‍රතිග්‍රහණ පද්ධතීන් (SCADA), කෙටි පණිවුඩ හා වෙනත් ජංගම දුරකථන මත පදනම් වූ තාක්ෂණවේදයන් වේගයෙන් මතු වෙමින් පවතී. වර්ෂය මුළුල්ලේම මෙම නව ප්‍රවණතාවයන් හා කරට කර සිටිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වඩාත් ඉහල ගණුදෙනුකාර තෘප්තියක් සහතික කිරීම සඳහා මෙහෙයුම් කාර්යක්ෂමතාවය, සේවා ගුණාත්මය හා ගණුදෙනු කරුවන්ගේ ඕනෑ එපාකම් සොයා බැලීමේ තත්ත්වය නංවා ලීම සඳහා මතු වෙමින්

පවත්නා මෙම තාක්ෂණවේදයන් උපයෝගී කර ගැනීමේ අරමුණ ඇතිව විශිෂ්ඨ ප්‍රයත්නයක යෙදුනේය.

**ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම්.**

ගණුදෙනු කරුවන්ට තමන්ගේ පැමිණිළි හා දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සහාය වීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අංක 1939 දරන සෘජු දුරකථන මාර්ගය මගින් පැය 24 පුරාම ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි. ඇමතුම් මධ්‍යස්ථාන පහසු කම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මෘදුකාංග මොඩියුල සංවර්ධනය කරමින් ක්‍රියාත්මක කරන ලද්දේ තොරතුරු තාක්ෂණ අංශය විසිනි. ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුමෙහි ඇති වැදගත්ම අංගය වන්නේ ගණුදෙනු කරුවන්ගේ පැමිණිලි ප්‍රතිග්‍රහණය කර ගෙන කෙටි පණිවුඩ සේවාව මගින් ක්ෂණයකින් ගණුදෙනු කරු වෙත ප්‍රතිපෝෂණය හා පණිවුඩද, අදාල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නිලධාරීන් වෙත පණිවුඩද ලබා දෙන මෘදුකාංග පැකේජයයි. මෙම විසඳුම ගත වූ 6 වසර මුළුල්ලේ ක්‍රියාත්මක වූ අතර, වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමත් සමග මෙම මෘදුකාංග විසඳුම ප්‍රධාන ඉහළ ශ්‍රේණිගත කිරීමකට පත් කරන ලදි. ඇමතුම් මධ්‍යස්ථානයේ මෘදුකාංගය දැනට නව වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියට ඇතුලත් මොඩියුලයකි.

**වෙනත් මෘදුකාංග විසඳුම්.**

මූල්‍ය කෘත්‍යයන් (පොදු ලෙජර පද්ධතිය), මානව සම්පත් කළමනාකරණ / වැටුප් පත් ක්‍රියාකාර කම් හා වට්ටෝරු කළමනාකරණ කෘත්‍යයන් වැනි වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබන පෙර සිට එන මෘදුකාංග විසඳුම් කිහිපයක් තිබේ. වෙනස් වෙමින් පවතින ව්‍යාපාරික අවශ්‍යතාවයන්ට සරි ලන පරිදි 2016 වර්ෂය තුළදී මෙම පද්ධතීන්ට අඛන්ඩ ලෙස වැඩි දියුණු කිරීම් කරන ලදි.

**නිල වෙබ් අඩවිය.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය සංවිධානයේ ඉතාම නවතම ප්‍රතිරූපය පිළිබිඹු වන පරිදි නිරන්තරයෙන්ම යාවත්කාලීන කරන ලදි. සංවිධානය සම්බන්ධ ඉතාම යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කරන අතරම ගණුදෙනු කරුවන්ගේ අන්තර්ක්‍රියාවන් නංවා ලීම සඳහා ඇතැම් අන්තර්ක්‍රියාකාරී සේවාවන් අඩවිය හා එක් කරන ලදි. භාවිතා කරන්නන් හට බා ගැනීම සඳහා අයැදුම් පත්‍ර ආකෘතීන්, සේවා ඉල්ලා සිටීමේ ආකෘතීන්, අත් පත්‍රිකා හා පළ කිරීම් ආදිය එහි තිබේ. වැදගත් සිදු වීම් සම්බන්ධ විස්තර, දැන්වීම් හා ප්‍රවෘත්ති අයිතමයන් නිරන්තරයෙන්ම යාවත්කාලීන කිරීම සිදු වේ.

මෙම අඩවියෙහි අන්තර්ගත වඩාත්ම ජනප්‍රිය අංගයන් වන්නේ ටෙන්ඩර් දැන්වීම්, රැකියා අවස්ථාවන් හා ප්‍රතිසම්පාදන දැන්වීම් ආදියයි. ගණුදෙනු කරුවන්ගේ ප්‍රතිපෝෂණ එවීමට හා පැමිණිළි / දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසු කම් සලස්වා තිබේ. වඩාත් ඵලදායී අන්තර්ගතය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක් පහසුකරණය කිරීම සඳහා විවෘත ප්‍රභව වෙබ් සැලැසුම් හා සංවර්ධන ක්‍රම වේදයන් උපයෝගී කර ගනිමින් නිල වෙබ් අඩවිය අන්තර්ගත කළමනාකරණ විසඳුමක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත.

ණය කාඩ් පත් භාවිතා කරමින් ජාලය හරහා කරනු ලබන ජල අයපත් ගෙවීම් භාර ගැනීමේ පහසු කම් නව වෙබ් අඩවිය සතුව ඇත.

**තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් (බටහිර උතුරු) කඩවත කලාපීය සේවා මධ්‍යස්ථානයෙහි පිහිටා ඇති ආපදා ප්‍රතිප්‍රාප්ති පහසු කමකද සහිතව අතිශයින්ම නවීනතම දත්ත මධ්‍යස්ථානයක් ප්‍රධාන කාර්යාලයෙහි ඉදි කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියළුම ප්‍රධාන ස්ථානයන් ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් සපයා දෙනු ලැබ ඇති IP VPN පෞද්ගලික ජාලය හරහා ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති දත්ත මධ්‍යස්ථානය හා සම්බන්ධ වී තිබේ. ප්‍රධාන කාර්යාලය තුළ තන්තු පද්ධතියකින් හා CAT 6 සංදාමකරණයකින් සමන්විත සම්පූර්ණයෙන් ව්‍යුහගත වූ සංදාමකරණය විසඳුමක් ස්ථාපිත කරනු ලැබ තිබේ. පෞද්ගලික පරිගණක 3000 කට අධික සංඛ්‍යාවක් හා පර්යන්ත උපකරණයන් විශාල සංඛ්‍යාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දීප ව්‍යාප්ත අභ්‍යන්තරික ජාලය හා සම්බන්ධ වී තිබේ.

ජංගම දුරකථන හා වෙනත් තැන තැන ගෙන යා හැකි උපකරණ භාවිතා කරන්නන්ට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ විසඳුම් වෙත ප්‍රවේශ වීම පහසුකරණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය තුළ සම්පූර්ණ වයි ෆයි ජාලයක් ස්ථාපිත කරනු ලැබ ඇත. තමන්ගේ එදිනෙදා කටයුතු සඳහා අන්තර්ජාල පහසුකම් හා විද්‍යුත් තැපැල් පහසු කම් අවශ්‍ය සියළුම නිලධාරීන් වෙත එබඳු පහසු කම් සලස්වා දෙනු ලැබ ඇත.

## වාණිජ කටයුතු

සෑම පරිශ්‍රයකම ජල මනුවක් ස්ථාපිත කිරීම 1980 ගණන් වල මුල් භාගයේදී ආරම්භ කරන ලද අතර පරිභෝජනය කරනු ලබන ජලය සඳහා අය පත් නිකුත් කිරීම ආරම්භ කරන ලද්දේ 1984 වර්ෂයේදීය. විවිධ පුද්ගලයින් ඒ දෙස විවිධ කෝණයන්ගෙන් බලන හෙයින් ජලය මිළ කිරීම තරමක් දුරට මත භේදයට තුඩු දෙන කාරණයකි. ජල සම්පාදනය හා මලාපවහනය සඳහා කරන මූලික ආයෝජනය ඉතා ඉහල මට්ටමක පවතී. එහි ප්‍රතිලාභ බොහෝ වසර ගණනාවක් මුළුල්ලේ භුක්ති විඳිය හැකිය. සම්පාදනයේ පිරිවැය සම්බන්ධයෙන් බොහෝ දෙනා දන්නේ නැත. නාගරික ජනතාව පැය 24 ක ජල සම්පාදන හා මලාපවහන පහසුකමක් අපේක්ෂා කරති. සේවාව දීමේ පිරිවැය විවිධ ස්ථානයන් අනුව වෙනස් වේ. ගාස්තු ක්‍රමය සංවිධානයේ මූල්‍ය ස්ථාවර භාවයට හේතු වන පරිදි ප්‍රමාණවත් ආදායමක් ලබා දිය යුතු වේ. තමන්ගේ ජල අවශ්‍යතාවය දැරිය හැකි මිළකට ලබා ගැනීමට අඩු ආදායම් ලාභී නිවාසයකට හැකි තත්ත්වයක් තිබිය යුතුය. මෙම අවශ්‍යතාවය තෘප්තිමත් කිරීම සඳහා විවිධ ගාස්තු ක්‍රමයන් භාවිතා කළ යුතු වන්නේය.

ගෘහස්ත ජල අලෙවිය 74% ක් වන අතර ඊට අනුරූපී ආදායම 61% කි. ගෘහස්ත ගණුදෙනු කරුවන්ගෙන් 56.5% ක් ජලය පරිභෝජනය කරන්නේ දිනකට ජලය ලීටර 100 කට අඩුවෙන් වන අතර එය සැලැසුම්ගත ප්‍රක්ෂේපණයන්ට බොහෝ සෙයින් අඩු වේ. තවද 97.6% ක් මසකට ජල ඒකක 40 කට අඩුවෙන් පරිභෝජනය කරනු ලබන අතර 74.6% ක් මසකට ජල ඒකක 20 කට අඩුවෙන් පරිභෝජනය කරති. පරිභෝජනය ශුන්‍යයක් වන ගණුදෙනු කරුවන් 188,000 ක් සිටින අතර ඒ අතරින් 36,500 ක් වාණිජ සම්බන්ධතාවයන් වේ. මනුකරණය හඳුන්වා දුන් කාලයේ සිට පරිභෝජන ගාස්තු අඩු මට්ටමක පවතී. ගාස්තු ක්‍රමය ප්‍රතිශෝධනය කිරීම නිසා පරිභෝජන රටාව මත ඇති වූයේ සුළු බල පෑමකි. ගෘහස්ත නොවන ගණුදෙනු කරුවන් 160,000 ක් සිටින අතර ජලයෙන් 26% ක් පරිභෝජනය කරන ඔවුන් 39% ක ආදායමක් ගෙන එති. ඒ අනුව ගෘහස්ත ගණුදෙනු කරුවන්ගෙන් සිදු වන පාඩුව ගෘහස්ත නොවන පාරිභෝගිකයින්ගෙන් කැපී යයි.

## වර්ෂය සඳහා වූ ප්‍රධාන කාර්ය සාධනය.

**නව අයපත් ක්‍රමය.**

නව අයපත් ක්‍රමයේ ක්ෂේත්‍ර පරීක්ෂණයක් තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව දෙහිවල මෙහෙයුම් හා නඩත්තු කාර්යාලයේදී සාර්ථක ලෙස නිම කරන ලදි. නව අයපත් කිරීමේ මෘදුකාංගය

මධ්‍යගත කරනු ලැබ ඇති හෙයින් එය ඉතා කඩිනම් මෙන්ම දියුණු ගුණාත්මයකින්ද යුක්තය.

වාර්තා කිරීමේ ක්‍රමයට අනුව භෞතික මුදල් ලැබීම නිසා ආදායම් ජනනය කිරීමේ වර්ධනයක් දක්නට ඇත. දින 30 කට අඩු අනුපාතානුකූලනය හා ප්‍රමාද ගාස්තු අය කිරීමේ දියුණු කළ ක්‍රම වේදය නිසා ගාස්තු අය කර ගැනීමේ වර්ධනයක් සිදු විය. එය යොදා ගැනීම ඉතා කඩිනම් හා භාවිතා කරන්නාට හිතකරද වේ. සියළුම අනු කාර්යාලයයන් වෙත තනි ගෙවීමක් මගින් ගෙවීම් කිරීමට කණ්ඩායම් අයපත්කරණ වාර්තාව නිසා ආයතනයේ ප්‍රධාන කාර්යාලයට හැකියාව ලැබේ. නව අයපත්කරණ ක්‍රමය සංවර්ධනය කිරීමෙහිලා තොරතුරු තාක්ෂණ කණ්ඩායම දැක්වූ කැපවීම සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

මනු කියවීම් ග්‍රහණය කරගනිමින් පද්ධතිය තුළට ඇතුළු කිරීම සඳහා ජංගම උපයෝගය පරීක්ෂණයට භාජනය කෙරෙමින් පවතී. මේ නිසා සේවා මට්ටම වැඩි දියුණු වන අතර ආදායම් රහිත ජලය හා සම්බන්ධ පරිපාලන දෝෂයන්ද අඩු වනු ඇත.

**ගාස්තු ක්‍රම සංශෝධනය.**

වසර තුනකට වරක් ගාස්තු ක්‍රම සංශෝධනයක් යෝජනා කරනු ලබන අතර ඒ අනුව ගාස්තු සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. දැනට පවත්නා විෂමතාවය එකිනෙකින් කැපී යන අන්දමේ ගාස්තු ක්‍රම යෝජනාවක් කරා ළඟා විය හැකි පරිදි ඓතිහාසික පරිභෝජන රටාව හා ආදායම් රටාව ගැඹුරින් අධ්‍යයනය කරන ලදි. යෝජනාව සකස් කරනු ලැබ ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ඊට විධිමත් අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. සාමාන්‍යාධිකාරී වරයා විසින් පත් කරන ලද කමිටුවේ සමාලෝචනය හා මග පෙන්වීම යටතේ තනිකරම වාණිජ අංශය විසින් ගාස්තු ක්‍රම යෝජනාවක් පිළියෙල කළ මුල් වතාව මෙය විය. ගැසට් නිවේදනයක් නිකුත් කරන ලද අතර, සංශෝධන කිරීමට ඇති හෙයින් එය ක්‍රියාත්මක කිරීම අත් හිටුවනු ලැබ ඇත.

**ජල අයපත් ගෙවීම් කිරීම.**

ජල අයපත් ගෙවීම් රැස් කර ගනු ලබන්නේ අයකැමීන්, බැංකු හා නියෝජිතයින් විසිනි. ප්‍රධාන කාර්යාලයේ සේවය කරන අය කැමීන් ගණුදෙනු කරුවන් 11,700 කට සේවය සපයන අතර මසකට රුපියල් දස ලක්ෂ 48 ක මුදලක් රැස් කරති. බැංකු විසින් ගණුදෙනු කරුවන් 81,000 කට පමණ සේවය සපයමින් මසකට රුපියල් දස ලක්ෂ 81 ක මුදලක් රැස් කරති. සුපිරි වෙළෙඳ පොළවල් ගණුදෙනු කරුවන් 200,000 කට සේවය සපයන අතර මුළු රැස් කිරීමෙන් 50% ක මුදලක් රැස් කරමින් වඩාත් ලොකු භූමිකාවක් ඉටු කරති. දැන් ඕනෑම ගෙවීම් රැස් කිරීමේ මධ්‍යස්ථානයකදී තම මාසික අයපත් ගෙවීමේ හැකියාව ගණුදෙනු කරුවන් වෙත උදා වී ඇත.

## ගණුදෙනු කරුවන් සඳහා වූ ගෙවීම් විකල්ප

| | ප්‍රධාන කාර්යාලයේ අයකැමි | බැංකු | සුපිරි වෙළෙඳ පොල | විද්‍යුත් මුදල් | ජාල ගෙවීම් |
|---|---|---|---|---|---|
| මසකට ගෙවීම් සංඛ්‍යාව | 11,700 | 81,100 | 212,740 | 74,700 | 751 |
| රැස් කිරීමේ සාමාන්‍යය (රුපියල් දස ලක්ෂ / මසකට | 45.7 | 81.2 | 321.3 | 88.8 | 1.6 |

ආර්පිකෝ සුපිරි වෙළඳපොල විසින්ද ජල අයපත් ගෙවීම් භාර ගැනීම ආරම්භ කරනු ලැබ ඇත. ජල අයපත් ණය කාඩ් පත් මගින් ගෙවීම 2016 මාර්තු 22 වැනි දින ලෝක ජල දිනය හා සමගාමී ලෙස ආරම්භ වූ අතර දැනට ගණුදෙනු කරුවන් 1500 කට වැඩි සංඛ්‍යාවක් තමන්ගේ ගෙවීම් ණය / හර කාඩ්පත් මගින් පියවීමේ යෙදී සිටිති. තැපැල් දෙපාර්තමේන්තුව විසින්ද ජල අය පත් භාර ගැනීම සඳහා වූ තමන්ගේ කැමැත්ත හා උනන්දුව ප්‍රකාශ කරනු ලැබ ඇත. අය කැමියන් හැර අන් සියළුම ස්ථානයන් විසින් අයපත් ගෙවීම් භාර ගැනීමේදී කිසියම් කොමිස් මුදලක් අය කරන අතර පහසුවෙන් ගෙවීම් කිරීමේ ක්‍රමයක් පිළිබඳව ගණුදෙනු කරුවන් සෙවිල්ලෙන් සිටින බව පෙනෙන්නට ඇත.

**ආදායම් රැස් කිරීමේ රටාව.**

ආදායම් රැස් කිරීම ඊට කලින් වර්ෂයන්ගේ රටාව හා සමාන රටාවක් අනුගමනය කළේය. යෝජනා කරන ලද ගාස්තු ක්‍රම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වන පසු බිමක් යටතේ වැඩි වැඩියෙන් ආදායම් ගෙන ඒමේ වැදගත් කර්තව්‍යය වාණිජ අංශය වෙත පැවරී තිබුණේය.

2016 වර්ෂය තුළදී ආදායම් රැස් කිරීමේ සැලැකිය යුතු වර්ධනයක් සිදු වී ඇති බව හා ඒ සම්බන්ධයෙන් ගත වූ වර්ෂයන්ට සංසන්දනාත්මක ලෙස විශාල විචලනයක් සිදු වී ඇති බව ගාස්තු රැස් කිරීමේ ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරනු ලබයි.



**ණය කාඩ් පත් මගින් ගෙවීම දියත් කිරීම**

**මණ්ඩලය විසින් රැස් කරන ලද මුළු මුදල (රුපියල් බිලියන)**




# හිඟ මුදල් අය කර ගැනීම.

නිරන්තරයෙන් සිදු කරන ලද වැටුප් සංශෝධනයන් හේතු කොට ගෙන ඇති වූ වැය බර නිසා මණ්ඩලයේ ආදායම් උත්පාදනය වැඩි කිරීම අවශ්‍ය විය. සම්බන්ධතාවයන් විසන්ධි කරනු ලැබ ඇති පරිශ්‍රයන්ගෙන් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟ හිට පවත්නා හිඟ මුදල් අයකර ගැනීමට අමතර ප්‍රයත්නයන් දරන ලදි. රුපියල් 100,000 කට වැඩි හා රුපියල් 200,000 කට වැඩි හිඟ මුදල් අය කර ගැනීම සඳහා විශේෂ වැඩ සටහනක් දියත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් දස ලක්ෂ 7.34 ක මුදලක් අය කර ගත හැකි විය. දැනට හිඟ හිටවා ඇති මුදල් හා දීර්ඝ කාලයක් තිස්සේ හිඟ හිටවා ඇති මුදල් අය කර ගැනීම සඳහා කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති වරයා සමග විශේෂ හමුවක් පවත්වන ලදි. රුපියල් දස ලක්ෂ 25 ක හිඟ මුදල් සම්බන්ධ තොරතුරු ඒවා අය කර ගැනීමට පොලිසියේ හා හමුදාවේ සහාය ලබා ගැනීම සඳහා එම අංශයන් වෙත භාර දෙන ලද අතර ඒ අනුව රුපියල් දස ලක්ෂ 2 ක හිඟ මුදල් අය කර ගැනීමට හැකි විය. මේ වසර තුළදී ගණුදෙනු කරුවන් 1781 දෙනෙකු විසින් තමන්ගේ හිඟ මුදල් පියවනු ලැබ ඇති අතර ඒ අනුව රැස් කර ගත හැකි වූ මුදල රුපියල් දස ලක්ෂ 47.6 ක් පමණ වේ.

නෛතික ක්‍රියා මාර්ග ගැනීමේ ආරම්භයක් වශයෙන් එන්තරවාසි ලිපි 2395 ක් හා දැන්වීම් හා සහතික 903 ක් යවනු ලැබ ඇත. හිඟ හිටවීමේ අවස්ථා 44 ක් වෙනුවෙන් නීති පති වරයා ලවා නෛතික ක්‍රියා මාර්ග ආරම්භ කරවීමට අවශ්‍ය ලිපි ලේඛන පිළියෙල කරන ලද අතර ඒ අනුව දැනටමත් නඩු 11 ක් ගොනු කරනු ලැබ ඇත. මෙම කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව ගොනු 3233 ක් කලාපයන් වෙත ආපසු යවනු ලැබ ඇත.

කලාප මට්ටමේද හිඟ මුදල් අය කර ගැනීම කෙරෙහි වැඩි අවධාරණයක් කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නෛතික ක්‍රියාවලින් ආරම්භ කිරීම සඳහා ගොනු 1839 ක් ලැබී ඇත. විසන්ධි කරනු ලැබ ඇති ගණුදෙනු කරුවන්ගෙන් හිඟ මුදල් අය කර ගැනීම මගින් අමතර ආදායමක් රැස් කර ගැනීම සඳහා විවිධ ක්‍රමෝපායයන් යොදා ගනිමින් සියළුම කලාප කාර්යාලයන් විසින් මෙහිදී ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ලදි.

**කළමනාකරණ තොරතුරු වාර්තා.**

මාසික අයපත්කරණ මෙහෙයුම් රැස්වීම සාමාන්‍යාධිකාරී වරයා විසින් පවත්වනු ලබන අතර එහිදී කලින් නියම කරගත් ඉලක්කයන් සාක්ෂාත් කරගෙන තිබීමේ ප්‍රගතිය සොයා ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු වාර්තාවන් සමාලෝචනයට භාජනය කරනු ලැබේ. ප්‍රවර්තන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි පසු විපරම් ක්‍රමවේදය සංශෝධනය කරන ලදි. දින 30 ක් මත අයපත්කරණය කිරීමේ යෝග්‍යතාවය අවධාරණය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් කලාපයන්හි 34% සිට 59% දක්වා වූ දියුණුවක් ඇති වී තිබෙන බව නිරීක්ෂණය කරන ලදි. මේ තත්ත්වය ආදායම වර්ධනය කිරීමට මෙන්ම ආදායම් රහිත ජලය (පරිපාලන පාඩු) අඩු කිරීමටද දායක විය. නව සම්බන්ධතා පසු විපරම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දෙනු ලබන සම්බන්ධතාවයන්ගේ ප්‍රතිශතය වැඩි විය. ගණුදෙනු කරුවන් සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා අනාගතයේදී විද්‍යුත් සංනිවේදන ක්‍රම භාවිතා කිරීමට අපේක්ෂිතය. අයපත්කරණ හා මුදල් අය කර ගැනීම් සම්බන්ධ වාර්තාව මගින් පනවනු ලැබ ඇති ඉලක්කයන් මාසිකව සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ණය වයස දැනට 0.67 මට්ටමට අඩු වී තිබේ.

ප්‍රගතිය හා තත්ත්වය පිළිබඳව කළමනාකරණය වෙත වාර්තා කිරීම සඳහා සංස්ථානික සැලසුම් අංශය වෙත ත්‍රෛමාසික වාර්තා යවනු ලැබේ. අතිරේක සාමාන්‍යාධිකාරී (මලාපවහන) විසින් මලාපවහන මෙහෙයුම් සම්බන්ධයෙන් මාසික රැස්වීම් පවත්වනු ලබන අතර, උත්පාදනය වූ ආදායම හා දෙන ලද සම්බන්ධතාවයන් පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාවන් පිළියෙල කොට ඊට ඉදිරිපත් කරනු ලැබේ.

**කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් හිතකර පරිසරයක්.**

**කාර්යාල කාර්ය පරිසරය වැඩි දියුණු කිරීම.**

නවතම අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කාර්යාලය නව්‍යකරණය කොට නැවත සකස් කිරීම සම්පූර්ණ කරන ලදි. එසේම ගණුදෙනු කරුවන්ගේ ඕනෑ එපාකම් පිළිබඳව කටයුතු කරන ස්ථානයද නව පෙනුමක් හා නව පහසුකම් සහිතව නව ප්‍රවණතාවයන්ට අනුව නව්‍යකරණය කොට නැවත සකස් කිරීම නිම කරනු ලැබ ඇත. ගණුදෙනු කරුවන්ගේ පොරොත්තු ලේඛනය කළමනාකරණය කිරීම හා සේවා මට්ටම් පසු විපරම ජාලය හරහා සිදු කරනු ලබනවා ඇත.

**ඵලදායිතාවය නංවා ලීම.**

'වඩාත් හොඳින් සේවය කිරීම සඳහා ධනාත්මක චින්තනය' යන මැයින් වාණිජ අංශයේ නිලධාරීන් සියළුම දෙනා වෙනුවෙන් එක් දිනක දේශනයක් පවත්වන ලදි. ඵලදායිතාවය නංවා ලීම සඳහා අවධානය යොමු කළ යුතු කාරණා හඳුනා ගැනීම පිණිස කාර්ය මණ්ඩලයේ හරස්කඩකගේ සහභාගිත්වයෙන් කුඩා කණ්ඩායම් රැස්වීම් පවත්වනු ලැබීය. වැඩ කණ්ඩායම් විසින් කරන ලද යෝජනාවන් සාකච්ඡාවට බඳුන් කරන ලද අතර පුහුණුව මගින් හා දැනුවත් පුද්ගලයින් වෙත ප්‍රවේශ වීම හරහා දැනුම ලබා ගැනීම මගින් ඔවුන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. දැනුම බෙදා හදා ගැනීම හරහා බොහෝ ගැටළු නිරාකරණය කර ගත හැකි විය.

# ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය.

**ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ කාර්ය සාධනය හා ප්‍රධාන ක්‍රියාකාර කම්.**

2016 වර්ෂය තුළදී ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් ඉටු කරන ලද කාර්ය සාධනය හා ප්‍රධාන ක්‍රියාකාර කම් අතර වූ ප්‍රධානතම සිදු වීමක් වූයේ ලෝක ජල දින සැමැරුමයි. ලෝක ජල දින සැමැරුම් උත්සවය 2016 මාර්තු 22 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අතර, එය පවත්වන ලද්දේ “අළුත් ජලය හා රැකියා” යන තේමාව යටතේය. මෙම ප්‍රධාන සිදු වීමට සමාන්තර ලෙස හොඳම කුඩා පරිමාණ ප්‍රජා මූල සංවිධාන තේරීම සැලසුම් කොට සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක වන ප්‍රජා මූල සංවිධාන වෙත ගිය අතර ඒවා අතුරින් හොඳම යෝජනා ක්‍රම තුනක් තෝරා ගන්නා ලදි. මීට අමතර වශයෙන් ලෝක ජල දින උත්සව සැමැරුමට සමාන්තර ලෙස පවත්වන ලද 2016 පර්යේෂණ හා අධ්‍යයන සම්මන්ත්‍රණය, පාසැල් ළමයින් අතර පවත්වන ලද (පෝස්ටර් / චිත්‍ර / රචනා) තරඟය හා ප්‍රධාන සිදු වීම තුළදී සංගරාවක් දියත් කිරීම වැනි සිද්ධීන් සම්බන්ධයෙන්ද ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් ප්‍රධාන සහායක භූමිකාවක් ඉටු කරන ලදි.

ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් 2016 වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩ සටහන් හා ක්ෂේත්‍ර චාරිකා විශාල සංඛ්‍යාවක් පවත්වන ලද්දේය. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ වාර්ෂික වැඩ මුළුව ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතියේ පුහුණු වැඩ සටහන සමග ඒකාබද්ධ වී 2016 ඔක්තෝබර් මස 6 වැනි දින සිට 8 වැනි දින දක්වා පස්සර, පලගහතැන්නේ පිහිටි ඌව කළමනාකරණ සංවර්ධන ආයතනයේදී පවත්වන්නට යෙදුනි. රඟන්ගල බොරලන්දේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යෝජනා ක්‍රමය තුළ හා රත්නපුර උතුම්පුල්ලිගොඩ තුෂාර ප්‍රජා මූල සංවිධානයේ යෝජනා ක්‍රමය තුළ පිළිවෙලින් ඝණ මීටර 60 ක හා ඝණ මීටර 40 ක ධාරිතාවයකින් යුත් පයනියර් වානේ වතුර ටැංකි දෙකක් ස්ථාපිත කරන ලදි. මහවැව, පුත්තලම හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ප්‍රජා මූල සංවිධාන සංසද රැස්වීම් පවත්වනු ලැබිණි. 2016 වර්ෂය තුළදී ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ දිස්ත්‍රික් ඒකක හයක් හා ප්‍රජා මූල සංවිධාන 27 ක් බැලීමට යන ලද්දේය. කලාපීය සේවා මධ්‍යස්ථානයන් 6 ක හා වතු මානව සංවර්ධන භාරය වෙනුවෙන්ද ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙනුවෙන්ද සරල ජල සුරක්ෂිතතා සැලැසුම් පුහුණු වැඩ සටහන් පවත්වනු ලැබිණි. ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා උචිත තාක්ෂණ ක්‍රම වේදයන් තෝරා ගැනීම පිළිබඳව වැඩ මුළුවක් පවත්වන ලදි.

ලෝක බැංකුවේ ප්‍රාරම්භක වැඩ යටතේ දිස්ත්‍රික්ක 7 ක් තුළ ක්‍රියාත්මක වන ලෝක බැංකු ව්‍යාපෘතීන් වෙත ප්‍රධාන සහායක් දෙන ලද අතර බොහෝ ප්‍රධාන ක්‍රියාකාර කම් වර්ෂය තුළදී නිම කරන ලදි. “ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයන් පිළිබඳ සාකච්ඡාව” යන මැයින් රන්දෙනිගලදී පෙල ගැස්වීමේ වැඩ සටහනක් පවත්වනු ලැබිණි. නව ජල සම්පාදන යෝජනා ක්‍රම දියත් කිරීම හා ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම සඳහා තෝරාගැනීමේදී ප්‍රමුඛත්වය තීරණය කිරීමේදී අනුගමනය කළ යුතු නිර්නායකාත්මක මග පෙන්වීම් ගොඩ නංවන ලදි. දැනුවත් භාවය නංවා ලීම සඳහා වන අත් පත්‍රිකා සකස් කොට සිංහල භාෂාවෙන් මුද්‍රණය කරන ලදි. ග්‍රාම නිලධාරි වසම් නම් සහිතව අන්තර්ගත සංඛ්‍යාංක සිතියම් පිළියෙල කොට ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ වෙබ් අඩවිය තුළට ඇතුළු කරන ලදි.

වර්ෂය තුළදී ඉටු කරන ලද වෙනත් කාර්යයන් වන්නේ ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් සකස් කරන ලද ජල සුරක්ෂිතතා සැලැසුම් පෝස්ටර 3 ක් ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කිරීම, ආදර්ශ නිෂ්පාදන හා සැපයුම් වගුවේ (MPDT) සහාය ඇතිව 2017 වර්ෂය සඳහා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ පුහුණු මොඩියුලය පිළියෙල කිරීම, කළමනාකරණය කරනු නොලැබ තිබුණ වසර 25 ක් පමණ පැරණි ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ලේඛනාගාරය තෝරා බේරා සකස් කිරීම සහ ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොදාගත හැකි අධ්‍යාපනික වීඩියෝ පට සිංහල භාෂාවට පරිවර්තනය කොට ඒවාට සිංහල උප ශීර්ෂ යෙදීමද වේ.

සනීපාරක්ෂණය සම්බන්ධයෙන් වූ දකුණු ආසියානු සමුළුව (SACOSAN vi) සම්බන්ධයෙන් ගත් කල්හී තොරතුරු හා සංනිවේදන කාර්ය කණ්ඩායමේ (ICWG) 9 වැනි රැස්වීමේදී සාකච්ඡා කරගත් පරිදි ශ්‍රී ලංකාව තුළ සනීපාරක්ෂණය සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය දියත් කිරීමේ කටයුත්ත දැනට සිදු කෙරෙමින් පවතී. වැසි ජලය රැස්කිරීම යටතේ, වැසි ජලය රැස්කිරීමට අදාල වන ප්‍රතිපත්තිය හා නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ මුළු හතරක් දිස්ත්‍රික්ක 4 ක පළාත් පාලන නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලැබිණි.

ඉන්දියානු සාගර සීමා සංගමයේ ජල විද්‍යා හා තාක්ෂණවේද මධ්‍ය කණ්ඩායමේ දෙවැනි සම්මන්ත්‍රණය යටතේ “සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙනුවෙන් වර්ධනය වෙමින් පවත්නා තාක්ෂණවේදයන් මගින් ආර්ථික මට්ටමින් කර දියෙන් ලවන ඉවත් කිරීමේ තාක්ෂණ වේදයන්” යන මැයින් දින 2 ක විශේෂඥ වැඩමුළුවක් නොවැම්බර් මාසයේදී කොළඹ හිල්ටන් නේවාසික මන්දිරයේදී පවත්වන්නට යෙදුනි.

දත්ත රැස්කිරීමේ මාර්ග තව තවත් විවෘත කිරීමට හා දත්ත ඇතුළු කිරීම වේගවත් කිරීමට ගත් ක්‍රියාමාර්ගයන් හේතු කොට ගෙන ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ප්‍රධාන දත්ත සංචිතයේ පූර්ණ භාවය සම්පූර්ණ කිරීමේ හැකියාව ලැබුණි. 2016 වර්ෂයේ අවසානයේදී එක් රැස්කරන ලද දත්තයන්ට අනුව ප්‍රජා මූල සංවිධානයන් විසින් ආවරණය කරනු ලබන ග්‍රාමීය නල ජල සම්පාදනය 10.6% තත්ත්වයේ පවතී. ප්‍රජා මූල ජල සම්පාදනය පිළිබඳ සංඛ්‍යා ලේඛනාත්මක මග පෙන්වීම් ග්‍රන්ථයක් සම්පාදනය කිරීම නිම වෙමින් පවතී.

# ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන.

මහජන සම්බන්ධතා ඒකකය විසින් ගණුදෙනු කාර කණ්ඩායම්, පාසැල් ළමුන් හා පාරිභෝගික සංගම් ඉලක්ක කර ගනිමින් විවිධ අධ්‍යාපනික හා දැනුවත් කිරීම් වැඩ සටහන් පවත්වන්නට කටයුතු කරන ලදි. මෙහිදී ප්‍රධාන අවධානය රඳවන ලද්දේ ජල සංරක්ෂණය, පාරිසරික පැතිකඩ හා ජලාශ ආරක්ෂා කිරීම ආදිය මත වේ. මෙම වැඩ සටහන් පාසැල් ළමුන් වෙනුවෙන් වැඩ සටහන් 48 ක් හා රජයේ ආයතන හා පෞද්ගලික අංශය වෙනුවෙන් වැඩ සටහන් 9 ක් ද වශයෙන් රට පුරාම පවත්වන්නට යෙදුනි.

2016 ලෝක ජල දිනය සැමැරීම සඳහා විවිධ උත්සව පවත්වන ලදි. ගම්පහ, පොලොන්නරුව හා මාතර දිස්ත්‍රික්කයන්හි පාසැල් ළමුන් සඳහා කථික තරඟ හා චිත්‍ර තරඟ පවත්වනු ලැබිණි.

සනීපාරක්ෂණය සඳහා වූ දකුණු ආසියානු සම්මන්ත්‍රණය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශයේ මග පෙන්වීම හා වෙනත් උනන්දුව දක්වන පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් මහජනතාව අතර දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් පවත්වන්නට යෙදුනි.

මහජන සම්බන්ධතා ඒකකය ජල සම්පාදන සේවාවන්ට අදාල බොහෝ අංශයන් පිළිබඳව ඉලක්ක කණ්ඩායම දැනුවත් කිරීම සඳහා වාර ප්‍රකාශන පළ කිරීමෙහි යෙදුනේය. 2016 'ජලය' නමැති වාර ප්‍රකාශනයේ කලාපයන් මාර්තු මාසයේදී 'ජලය හා රැකියා' යන මැයින් සහ ජුනි මාසයේදී 'සුවබර දිවියකට සුවැති ජලය' යන මැයින්ද පළ කරන ලදි. ජලය සඟරාවේ සැප්තැම්බර් කලාපය වර්ෂය අවසාන වන විට නිකුත් වී තිබුනේ නැත. සැප්තැම්බර් කලාපයේ තේමාව ඵලදායිතාවය හා ජලයී යන්නයි.

වර්ෂය තුළදී මහජන සම්බන්ධතා ඒකකය විසින් රුපියල් 270,502.75 ක් වැය කරමින් අත් පත්‍රිකා හා පොත් පිංච බෙදා දෙන ලද අතර ජල සංරක්ෂණයෙහි වැදගත් කම පිළිබඳව උනන්දුවක් දක්වන අය වෙනුවෙන් වැඩ සටහන්ද පවත්වන ලද්දේය.

මහජන සම්බන්ධතා ඒකකය ජන මාධ්‍ය ප්‍රචාරක වැඩ සමගද සම්බන්ධ විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා සම්බන්ධ වැදගත් තොරතුරු මුද්‍රිත හා විද්‍යුත් යන ජන මාධ්‍ය දෙවර්ගයම වෙත උචිත පරිදි නිකුත් කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වනු ලැබූ පුවත් පත් සාකච්ඡා ඒ අතර සිදු කරන ලද ප්‍රධාන කර්තව්‍යයක් විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සම්බන්ධයෙන් පළ කරන ලද නොමග යවනසුළු වාර්තා හා ලිපි නිවැරදි කිරීමද තවත් වැදගත් කර්තව්‍යයක් විය.

මහජන පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා මහ ජනතාව හෝ ජල පාරිභෝගිකයින් විසින් මතු කරන්නට යෙදුන විවිධ ගැටළු හා සම්බන්ධ කාරණාවන් සම්බන්ධයෙන් නොපමාව කටයුතු කිරීමට පියවර ගන්නා ලදි. රට පුරා සිටින ශිෂ්‍යයින් වෙත අධ්‍යාපනය ලබා දීම සඳහාද අවශ්‍ය මග පෙන්වීම් කරන ලදි.

වැඩ කරන පරිසරය සියළු දෙනාටම හිතකර එකක් වන අතර කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් එකා මෙන් එකිනෙකාට හිතවත්ව තම තමන්ගේ රාජකාරි කටයුතු වල යෙදී සිටිති.

## භූගත ජලය.

භූගත ජල අංශය පලාත් මට්ටමින් බෙදී ගොස් ඇති කලාපීය භූගත ජල ඒකක නවයකින් හා මධ්‍යගත විමර්ශණ අංශයකින්ද සමන්විතව ක්‍රියාත්මක වෙයි.

2016 වර්ෂය තුළදී භූගත ජලය හා සම්බන්ධ ක්‍රියාකාර කම් වලට ජල භූ විද්‍යාත්මක විමර්ශණයන්, ගැඹුරු හා නොගැඹුරු මිහිවිදමන් නිර්මාණය කිරීම, ජලධරයන් හා ළිං තක්සේරු කිරීම, ගැඹුරු හා නොගැඹුරු මිහිවිදමන් ළිං දෝර යවමින් සංවර්ධනය කිරීම, අත් පොම්ප සවි කිරීම, අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කිරීම හා පුනරුත්ථාපනය කිරීම, අත් පොම්ප නල ළිං නඩත්තු කිරීම සඳහා තට්ටු තුනේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, යටි පාෂාණ ලක්ෂණ හඳුනා ගැනීම හා ජල ප්‍රවාහ මැනීම, භූගත ජල අධ්‍යයනයන් හා පසු විපරම් කිරීම්ද ඇතුලත් විය.

වර්ෂය ඇතුලත ජල භූ විද්‍යාත්මක විමර්ශණයන් 664 ක් ද, විදුම් (ගැඹුරු හා නොගැඹුරු මිහිවිදමන් නිර්මාණය කිරීම්) 301 ක් ද, අත් පොම්ප සවි කිරීම් 54 ක් ද, අත් පොම්ප අළුත්වැඩියා කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් 725 ක් ද, ළිං දෝර හැරීම් හා සංවර්ධනය කිරීම් 431 ක් ද, පොම්ප පරීක්ෂණ 123 ක් ද, **jetting** 4 ක් හා ප්‍රවාහ මිණුම් 04 ක් ද යන කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ඉහත සඳහන් ක්‍රියාකාර කම් ඉටු කිරීම තුළින් භූගත ජල අංශයට 2016 වසර සඳහා රුපියල් දස ලක්ෂ 198.2 ක් උපයා ගැනීමේ හැකියාව ලැබිණි.

වයඹ පලාතේ නාරම්මල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා දිනකට ජලය ඝණ මීටර 576 ක් ලැබෙන භූගත ජල ප්‍රභවයක් හා ආනමඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා දිනකට ජලය ඝණ මීටර 100 ක් ලැබෙන භූගත ජල ප්‍රභවයක් ද, බස්නාහිර පලාතේ යක්කල - ගම්පහ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා දිනකට ජලය ඝණ මීටර 696 ක් ලැබෙන භූගත ජල ප්‍රභවයක් ද, උතුරු මධ්‍යම පලාතේ හබරන, මැදවච්චිය හා ගල්නෑව යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සඳහා නව භූගත ජල ප්‍රභවයන් හා දකුණු පලාතේ තංගල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා දිනකට ජලය ඝණ මීටර 1500 ක් ලැබෙන භූගත ජල ප්‍රභවයක් ද වශයෙන් නව භූගත ජල ප්‍රභවයන් එකතු කරනු ලැබ ඇත. දකුණු පලාතේ තිහගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා එක් භූගත ජල ප්‍රභවයක් සහ උතුරු පලාතේ යෝජිත මුලන්කාවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා (දිනකට ජලය ඝණ මීටර 1350 ක් ලැබෙන) එක් ජල ප්‍රභවයක්ද සංවර්ධනය කරන ලදි. ඊට අමතර ලෙස උතුරු මැද පලාතේ වෙස්සගිරිය - තිසා වැව, හබරන, මැදවච්චිය, ගල්නෑව, තලාව, හොරොව්පොතාන, මිහින්තලේ, ඔයාමඩුව, කැබිතිගොල්ලෑව හා පදවියේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේද, දකුණු පලාතේ හක්මන, උඩුගම සහ කිරින්ද ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ හා මධ්‍යම පලාතේ ඇල්පිටියේ වෙලම්බොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සහ බස්නාහිර පලාතේ මිනුවන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයේද දැනට පවත්නා තුළු ළිං සංවර්ධනය කිරීමද සිදු කරන ලදි.

තවද වයඹ පලාතේ තෝරයාය නව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා දිනකට ජලය ඝණ මීටර 864 ක් ලැබෙන නව භූගත ජල ප්‍රභවයක් සොයා ගනු ලැබූ අතර, එම පලාතේම හිරිපිටිය (මිහිවිදමන් දෙකක් විදිනු ලැබ ඇති) නව ජල සම්පාදන යෝජනා ක්‍රමය හා ආඩිගම (සෑරු ළිඳ) ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන්ද නව භූගත ජල ප්‍රභවයන් සොයාගනු ලැබ ඇත. මීට අමතරව නිධාන්ගත වකු ගඩු රෝග අරමුදලින් රුපියල් දස ලක්ෂ 15 ක මුදලක් යොදා ගනිමින් එකී රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ අත් පොම්ප නල ළිං 122 ක් පුනරුත්ථාපනය කරන ලදි.

අම්පාර, මඩකලපුව හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි සේවයේ නියුතු තාක්ෂණික නිලධාරීන්, යාන්ත්‍ර ශිල්පීන් හා භාර කරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා ජ්ලෑන් ජාත්‍යන්තර සංවිධානයේ සහායෙන් 'පොදු අත් පොම්ප නල ළිං නඩත්තු කිරීම' යන මැයින් වූ පුහුණු වැඩ සටහන් පහක් පවත්නු ලැබිණ. තවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල භූ විද්‍යාඥයින් සඳහා "දැනුම බෙදා හදා ගැනීම හා ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ (ISO) ප්‍රමිතීන්ට අනුව පොම්ප කිරීමේ පරීක්ෂණ කිරීම" යන මැයින් වූ එක් දින වැඩසටහන් පහක් ද පවත්වන ලදි.

2017 වර්ෂය සඳහා පුරෝකථනය කරනු ලැබ ඇති නියං තත්ත්වයට මුහුණ දීමේ සූදානමක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට බොහෝ ක්‍රියාකාරකම් ගණනාවක් භූගත ජල අංශය විසින් සැලසුම් කරනු ලැබ ඇත.

**2016 වර්ෂය තුළදී පහත සඳහන් භූගත ජලය හා අදාල වන අධ්‍යයනයන්ද දිගටම කර ගෙන යන ලදි.**

- පිළිවෙලින් මන්නාරම් හා මාතලේ දිස්ත්‍රික්කයන්හි පිහිටි මුරුන්කන් ද්‍රෝණියේ හා විල්ගමුව ප්‍රදේශයේ භූගත ජල ගතිකයන් හඳුනාගැනීම සඳහා පාරිසරික සමස්ථානික අධ්‍යයනයන් සිදු කිරීම.
- මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පොම්ප කරන ළිං හා භූගත ජලය ජලධරයන්ගෙන් හානියට පාත්‍ර වීමේ අවදානම තක්සේරු කිරීම. ජාලගත භූගත ජල මට්ටම් මිණීම සඳහා දත්ත ලඝුරයන් දෙකක් මාලිගාවිල හා බුත්තල ස්ථාපිත කරන ලදි.

## බලශක්ති කළමනාකරණය.

යාන්ත්‍රික හා විද්‍යුත් සේවා අංශය යටතේ ඒකක හතරක් ක්‍රියාත්මක වේ. ඒවා නම්, බලශක්ති කළමනාකරණ ඒකකය, යාන්ත්‍රික හා විද්‍යුත් සේවා සහාය සේවා ඒකකය, ප්‍රවාහන අංශය හා ගොඩනැගිලි නඩත්තු අංශය ද වේ.

**බලශක්ති කළමනාකරණ ඒකකය.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වාර්ෂිකව විදුලි පරිභෝජනය වෙනුවෙන් දරනු ලබන පිරිවැය ආසන්න වශයෙන් රුපියල් දස ලක්ෂ 3,840 ක් වන අතර එයින් 93% ක්ම වැය කරනු ලබන්නේ ජලය නිෂ්පාදනය කිරීමට හා පොම්ප කිරීමට වේ. එය රුපියල් දස ලක්ෂ 3,600 කි. මේ හේතුව නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධානතම පාරිභෝගිකයා බවට පත් වී ඇත. මේ නිසා 2004 වර්ෂයේදී මෙම දැවැන්ත විදුලි බල පරිභෝජනය අඩු කිරීමේ අරමුණින් බල ශක්තිය ඉතිරි කර ගැනීමේ වැඩ සටහනක් හඳුන්වා දෙන ලදි. එම වැඩ සටහන මේ වන විට සෑහෙන ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන ඇති අතර ගත වූ වසර 12 මුළුල්ලේ එහි ක්‍රියාකාරකම් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ඉහල මට්ටමකට ශ්‍රේණිගත කරනු ලැබ ඇත. යාන්ත්‍රික හා විද්‍යුත් අංශය පොම්ප කිරීමේ පද්ධතීන් සඳහා මෙන්ම බල ශක්ති කළමනාකරණ කාර්යයන් සඳහා ඕනෑම ආකාරයක බල ශක්ති විගණනයක් කිරීමට අවශ්‍ය බල ශක්ති මැණීමේ උපකරණයන්ගෙන් සජ්ජිතව සිටියි. වර්ෂ 2004 සිට 2016 අතර කාලය තුළ නිම කරන ලද ගාස්තු ක්‍රම වර්ගයන් නිවැරදි කිරීම්, යාන්ත්‍රික හා විද්‍යුත් අංශය දියුණු කිරීමේ ක්‍රියාකාර කම් හා බල ශක්තිය ඉතිරි කර ගැනීමේ වැඩ සටහන් වල ප්‍රතිඵලයක් වශයෙන් විශාල අන්දමින් බල ශක්තිය හා පිරිවැය ඉතිරි කර ගැනීමේ හැකියාව ලැබී ඇත. මෙම කාලය තුළ ක්‍රියාත්මක කරන ලද බල ශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය හේතු කොට ගෙන ඉතිරි කර ගැනීමට හැකි වී ඇති මුළු මුදල රුපියල් දස ලක්ෂ 481.4 ක් බවට වාර්තා වී තිබේ.

2016 වර්ෂය තුළදී බල ශක්ති විගණන 30 ක් සිදු කරන ලද අතර ඒ අතුරින් ව්‍යාපෘති 20 ක් නිම කරනු ලැබ තිබේ. මෙම ව්‍යාපෘති හේතුවෙන් සාක්ෂාත් වී ඇති පිරිවැය ඉතිරි කිරීම රුපියල් දස ලක්ෂ 18.2 ක් වන අතර ඒ වෙනුවෙන් වැය වූ වියදම රුපියල් දස ලක්ෂ 73.5 ක් වේ. එසේම 2017 වර්ෂයේදී ද නව ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබ ඇති අතර 2016 දී ආරම්භ කොට දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘතීන්ද ඇතුලත්ව මෙම ව්‍යාපෘතීන් සඳහා වන පිරිවැය ආයෝජනය ආසන්න වශයෙන් රුපියල් දස ලක්ෂ 163 ක් වනු ඇත.

එසේම දැනට ක්‍රම සම්පාදන හා සැලසුම් පියවරෙහි ඇති නව යෝජනාවන් සඳහා නව යොමු සළකුණක් යොදා ගැනීමටද යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් සැලසුම් කරනු ලැබ ඇත. මේ සඳහා සැලසුම් කිරීමේ හා මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලට සම්බන්ධ වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ වඩාත් හොඳ, බල ශක්ති කාර්යක්ෂම පද්ධතීන් තිබීමේ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කළ යුතු වේ. 2017 වර්ෂය තුළදී දැනුවත් භාවය නංවා ලීමේ හා පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීමට යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් සැලසුම් කරනු ලැබ ඇත.

**යාන්ත්‍රික හා විද්‍යුත් සහාය සේවා ඒකකය.**

වාහන, ජල මනු, මිණුම් උපකරණ හා වෙනත් යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ සඳහා ටෙන්ඩර් කැඳවීමේ ලිපි ලේඛන හා පිරිවිතර සකස් කිරීම මෙන්ම මට්ටම් මන්ත්‍ර කිරීමේ පද්ධතීන් ස්ථාපිත කොට නඩත්තු කිරීමද මෙම අංශය විසින් ඉටු කරනු ලැබේ.

**ප්‍රවාහන අංශය.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව වාහන 1749 ක් තිබෙන අතර ඒවායේ වාහන බල පත්‍ර, රක්ෂණ, හදිසි අනතුරු නිසා ඒවාට සිදු වන හානි අළුත්වැඩියා කිරීම හා පැවරීම ආදී සියළුම පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරනු ලබන්නේ ප්‍රවාහන අංශය විසිනි.

**පරිශ්‍ර කළමනාකරණය.**

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හා බඩෝවිට නිල නිවාස (නිල නිවාස 7 යි), සොයිසා පුර (B20,B23) නිල නිවාස (නිල නිවාස 32 යි), සොයිසා පුර (C23, C24) නිල නිවාස (නිල නිවාස 16 යි), සොයිසා පුර අවිවාහක නිල නිවාස (නිල නිවාස 64 යි) හා රාවතාවත්ත නිල නිවාස (නිල නිවාස 7 යි) ඇතුළු නිල නිවාසයන්ගේ සියළුම අළුත්වැඩියාවන්, නඩත්තු කටයුතු හා මෙහෙයුම් කටයුතු කරනු ලබන්නේ මෙම අංශය විසිනි.

## සමාජ විද්‍යාත්මක ක්‍රියාකාරකම්.

මුළු ඵලදායිතාවය හා ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා පුහුණු කිරීම් කමිටුවේ පහසුකාරකයා වශයෙන් සමාජ විද්‍යා අංශය ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා අංශ ප්‍රධානීන් සමග සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියා කරන ලදි. මීට අමතරව ඵලදායිතා සංවර්ධනය හා සමාජ විද්‍යාඥයින්ගේ හැකියා වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිලිබඳව ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලදි.

සංවර්ධන ක්‍රියාකාර කම් වශයෙන් කලාපීය සේවා මධ්‍යස්ථානයන් කිහිපයක ක්‍රියාත්මක වන කුඩා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් සමාජ බල පෑම් තක්සේරුව, සාධ්‍යතා හා පෙර සාධ්‍යතා අධ්‍යයනයන් හා බල පෑම් තක්සේරු අධ්‍යයනයන් සිදු කරන ලදි. ඊට අමතරව හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයට (CKDu) ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍ර භාවිතා කිරීමේ හා අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන් තුළ ක්‍රියාත්මක කරනු ලබන වැසි ජලය රැස්කිරීමේ වැඩ සටහන් වල බල පෑම තක්සේරු කිරීමේ අධ්‍යයනයන්ද කරන ලද්දේය.

ජල ගුණාත්මය ප්‍රවීක්ෂණය කිරීම හා ජල සුරක්ෂිතතා සැලසුම් සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම අංශය විසින් වන අතර ජල ගුණාත්මය ප්‍රවීක්ෂණය කිරීම හා ජල සුරක්ෂිතතා සැලසුම් හා සම්බන්ධ වැඩ සටහන්, රැස්වීම් හා වැඩ මුළු ගණනාවකටද අංශය සම්බන්ධ විය. හඟුරන්කෙත, දිවුල හා කිතුල්ගල ප්‍රජාමූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජලාධාර ආරක්ෂා කිරීමේ ක්‍රියාකාර කම් ක්‍රියාත්මක කිරීමට ද සම්බන්ධ වූ මෙම අංශය මහනුවර කලාපීය සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ ජල සුරක්ෂිතතා සැලසුම් සම්බන්ධයෙන් දියත් කරන ලද දැනුවත් කිරීමේ වැඩ සටහන් වලට හා ක්ෂේත්‍ර චාරිකාවන්ටද සහභාගි විය. ජල සුරක්ෂිතතා සැලසුම් සම්බන්ධයෙන් ගෘහස්ත සමීක්ෂණයන් හා බල පෑම් තක්සේරු කිරීමේ අධ්‍යයනයන්ද සිදු කරන ලදි. SDG රැස්වීම් පැවැත්වීම සඳහා පරදු ධාරීන් සංවිධානය කරමින් සමායෝජන කටයුතු සිදු කරන ලද අතර දෙවැනි ඉන්දියානු සාගර රීම් සංගමයේ ජල විද්‍යා හා තාක්ෂණවේද මධ්‍ය කණ්ඩායමේ වැඩ මුළුවටද සහභාගි වන ලදි.

ප්‍රජා සජීවිකරණ ක්‍රියාවලිය නංවා ලීම සඳහා කලාපීය සමාජ විද්‍යාඥයින් හා එක්ව කලාපීය මට්ටමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කරන ලද අතර, ග්‍රාමීය ජල සම්පාදන අංශය යටතේ වූ ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රම ජාලය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවරද ගන්නා

ලදි. මෙම සංවිධානයන්ගේ සාමාජික සාමාජිකාවන්ගේ ක්‍රියාශීලී සහභාගිත්වය සහිතව ජලාධර ආරක්ෂාවට අදාල ක්‍රියාකාර කම් සම්බන්ධයෙන් ජල සුරක්ෂිතතා සැලැසුම් වැඩ සටහන් පවත්වන ලදි. ගැටළු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව අළුතින් බිහි වන හා දැනටමත් පවත්නා ප්‍රජා මූල සංවිධානයන් වෙනුවෙන් ග්‍රාමීය තේරීම් නිර්නායක ආකෘතීන් පිළියෙල කරන ලදි.

ආයතන සංවර්ධන ක්‍රියාකාර කම් වශයෙන් වර්ෂය තුළදී සමාජ විද්‍යාත්මක ක්‍රියාකාර කම් වලට අදාල බොහෝ මාණ්ඩලික පත්‍රිකා, යොමු නියමයන් හා චක්‍ර ලේඛන පිළියෙල කරන ලදි.

## ආදායම් රහිත ජලය අවම කිරීම.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම) ගේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන ආදායම් රහිත ජල අංශය විසින් ඉලක්ක කරන ලද්දේ නොමිළයේ ජලය පිටතට ගලා යන පිටමුව තුළින් සිදු වන අනවශ්‍ය පාඩුව අඩු කරමින්, බලය නොලත් පරිභෝජනය අවම කරමින් හා ප්‍රජාවන් වෙත ස්ථාවර ජල සම්පාදනයක් ලබා දීම සඳහා ප්‍රතිපත්තීන් සකස් කරමින් ජලයෙන් ලැබෙන ආදායම වැඩි කිරීමටය.

ජල පාඩු කළමනාකරණ අංශය ආදායම් රහිත ජලය කළමනාකරණය කිරීම හා පාලනය කිරීම සඳහා විවිධ ක්‍රමයන් ඔස්සේ ආදායම් රහිත ජලය වෙත අවධානය යොමු කළේය. කොළඹ නගරය තුළ ඇති ඇතැම් පැරණි නල ජාලයන් වෘද්ධ වයසට පැමිණ තිබීමේ හේතුවෙන් ඒවායේ ධාරක හැකියාව දුර්වල වී ඇති අතර ජල කාන්දු විශාල සංඛ්‍යාවක් ඇති වී තිබෙන හෙයින් ඉහල ආදායම් රහිත ජල මට්ටමක් සහිතව පද්ධතිය අසාර්ථකත්වයට පත් වී ඇත. මේ හේතුව නිසා සම්පාදනය කරනු ලබන ජලයේ පීඩනය පහත වැටී ඇති හෙයින් පීඩනය වැඩි කිරීම සඳහා කටයුතු කිරීමට ඉහල කළමනාකරණය විසින් තීරණය කරන ලද අතර එය ආදායම් රහිත ජලයේ මට්ටම තව දුරටත් ඉහල නැංවීමට තුඩු දුන්නේය.

කළමනාකරුවන් විසින් ආදායම් රහිත ජලය පිළිබඳ ගැටළුව විශ්ලේෂණය කොට එහි ප්‍රධාන සංරචකයන් හඳුනා ගැනීම අත්‍යවශ්‍ය කාරණයකි. ආදායම් රහිත ජලයේ මට්ටම ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන දත්තයන් අතිශයින්ම නිරවද්‍ය බවට වග බලා ගැනීමද ඒ ලෙසින්ම අතිශයින්ම වැදගත් වේ.

නිෂ්පාදන මනු ඇසුරින් හා ගණුදෙනු කරුවන්ගේ මනු ඇසුරින් දත්ත ලබා ගැනීම ආදායම් රහිත ජලයේ නිරවද්‍ය මට්ටම ගණනය කිරීමට උපකාරී වන අතර ඒ මගින් ක්‍රියාකාරී කාන්දු පාලන ක්‍රියාකාර කම් පහසුකරණය කරනු ලබයි.

වර්ෂ 2008 සිට වර්ෂ 2016 අතර කාල සීමාව තුළදී කොළඹ නගරයේ ආදායම් රහිත ජලය 53.96% සිට 45.42% දක්වා අඩු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් එම ජල ප්‍රමාණයම කොළඹ නගරය වෙත සපයනු ලබන තත්ත්වයක් යටතේද ජල අලෙවිය 20.3% කින් වර්ධනය වී ඇත.

**ඌණ සේවිත ජනාවාසයන් වෙත ජලය සම්පාදනය කිරීම.**

ඌණ සේවිත ජනාවාසයන් වෙත දෙනු ලැබ ඇති පොදු පිටමුව සම්බන්ධතාවයන් විසන්ධි කරමින් සහනදායක නියමයන් යටතේ පෞද්ගලික සම්බන්ධතාවයන් ලබා දීම හඳුන්වා දෙනු ලබන්නේ රන් දිය වැඩ සටහන යනුවෙනි. ජල කණු විසන්ධි කරමින් සහනදායී පදනමක් මත පෞද්ගලික සම්බන්ධතාවයන් දීම ආරම්භ කරන ලද්දේ 1990 වර්ෂයේදීය. කෙසේ වුවද විවිධ හේතූන් නිසා සියළුම දෙනාට පෞද්ගලික සම්බන්ධතා ලබා ගැනීමට නොහැකි වූ අතර, ඒ හේතුව නිසා පොදු පිටමුව සම්බන්ධතාවයන් තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

කොළඹ නගරය තුළ ඌණ සේවිත ජනාවාසයන් 1571 ක් තිබේ. රජයේ නවතම සැලැසුම අනුව සිදු කිරීමට අදහස් කරන්නේ එම ජනතාව කොළඹ නගරයෙන් බාහිර ස්ථානයන්හි ප්‍රති ස්ථාන ගත කිරීමයි. පෞද්ගලික ජල සම්බන්ධතාවයන් තිබීම නිසා ස්වස්ථතාත්මක තත්ත්වය දියුණු වන අතර ජීවන තත්ත්වයද ඉහල නැංවෙනු ඇත.

පොදු පිටමුව සම්බන්ධතාවයන් මනුකරණය කරනු ලබන්නේ කුඩා ප්‍රජා කණ්ඩායම් පිහිටුවීම තුළින් වන අතර ඒ අනුව ආදායම් එකතු කරනු ලැබේ. අයැදුම් පත්‍රය සම්පූර්ණ කර අවශ්‍ය ගෙවීම සමග ඉදිරිපත් කිරීමෙන් පෞද්ගලික ජල සම්බන්ධතාවයන් ලබා ගත හැකි වේ. මෙම වර්ෂය තුළදී පොදු පිටමුව සම්බන්ධතාවයන් 58 ක් විසන්ධි කිරීමෙන් අනතුරුව පෞද්ගලික ජල සම්බන්ධතාවයන් 234 ක් ලබා දෙන ලදි.

**ගණුදෙනු කරුවන්ගේ සමිතිය (අයපත්කරණය නොකරන ලද අනවසර ජල පරිභෝජනය අඩු කිරීම නොමිලේ ලැබෙන ජලය).**

2011 වර්ෂයේදී ගණුදෙනු කරුවන්ගේ සමිති පිහිටුවා ලීම මගින් පොදු පිටමුව සම්බන්ධතාවයන් තුළින් පරිභෝජනය කරනු ලබන ජල ප්‍රමාණය මිණීමට නව්‍ය වැඩ සටහනක් ආරම්භ කරන ලද අතර, එසේ පිහිටුවන ලද සමිති විසින් පිටමුව සම්බන්ධතාවයන් භාවිතා කරන්නන් හඳුනාගනිමින් එම පිටමුව සම්බන්ධතාවයන් නඩත්තු කිරීම කළහ. එම ජලය පරිභෝජනයට ගැනීම වෙනුවෙන් නාමික ගාස්තුවක් අය කරන ලද්දේය.

දැනටමත් එවැනි සමිති 1762 ක් සංවිධානය කරනු ලැබ ඇති අතර, ඒවායේ මාසික පරිභෝජනය ජලය ඝණ මීටර 135,282 ක් වන අතර, එය කොළඹ නගරය විසින් පරිභෝජනය කරනු ලබන මුළු ජල ප්‍රමාණයෙන් 3% ක් නියෝජනය කරයි. සමිති සංවිධාන කිරීම හා කොළඹ නගරය තුළ පරිභෝජනය අංක 1 දරන වගුවෙන් පෙන්නුම් කෙරෙයි. මෙම වැඩ සටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රුපියල් 2,000 කට වැඩි මුදලක් හිඟ හිටවනු ලැබ ඇති සමිති වෙත නිරන්තරයෙන් යාම සිදු කරනු ලැබේ. රුපියල් 2,000 කට වැඩි මුදල් ප්‍රමාණයක් හිඟ හිටවා ඇති ගණුදෙනු කරුවන් එම හිඟ මුදල් ගෙවීම සඳහා පෙළඹවීම පිණිස සමාජ විද්‍යාඥයින් යොදා ගනිමින් විශේෂ වැඩ සටහනක් දියත් කරන ලද අතර එම වැඩ සටහන සාර්ථක ප්‍රතිඵල ගෙන දී ඇත.

**වගුව 1 සමිති සංවිධානය කිරීම හා පරිභෝජනය.**

| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| අයපත්කරණය කරන ලද සමිති සංඛ්‍යාව | 1,578 | 1,735 | 1,756 | 1,762 |
| අයපත්කරණය කරන ලද මාසික පරිභෝජනය (ඝණ මීටර) | 166,103 | 159,445 | 147,923 | 135,282 |
| ආදායම (රුපියල්) | 576,609 | 624,438 | 584,933 | 478,796 |

**බලය නොලත් පරිභෝජනය අඩු කිරීම.**

බලය නොලත් ජල පරිභෝජනය හඳුනාගනු ලබන්නේ පොදු මහ ජනතාවගෙන් ලැබෙන තොරතුරු වලට ප්‍රතිචාර දැක්වීම මගින්, ප්‍රදේශය තුළ ඇති වාණිජ පරිශ්‍රයන් තුළ සිදු වෙමින් පවතින බලය නොලත් ජල පරිභෝජනය සොයා ගැනීම සඳහා දියත් කරනු ලබන වැඩ සටහන්ගත සෝදිසි මෙහෙයුම් මාර්ගයෙන් හා සමස්ත කොළඹ නගරය ආවරණය කිරීම සඳහා සැලැසුම් කරන ලද ආකාරයකට හඳුනා ගත් ප්‍රදේශයන්හි සෑම පරිශ්‍රයක්ම සෝදිසි කිරීමට භාජනය කිරීමත් මගිනි.

වර්ෂය තුළදී සොයා ගැනීම් 804 ක් කරන ලද අතර රුපියල් දස ලක්ෂ 33.55 ක මුදලක් ඒ අනුව අය කරගනු ලැබ ඇත. 2 වැනි වගුව මගින් පෙන්නුම් කරනු ලබන්නේ බලය නොලත් පරිභෝජනය සොයා ගැනීමේ වෙනස් වෙමින් පවතින රටාවයි. දැනුවත් භාවය ඇති කිරීම හා අඩු ආදායම් ලබන ජනාවාස වැසියන් වෙත මනුකරණය කරන ලද ජලය ලබා දීම වැනි හේතූන් නිසා බලය නොලත් ජලය

පරිභෝජනය කිරීම් සොයා ගැනීම් සංඛ්‍යාව අඩු වී ඇති බව පැහැදිලිව පෙනෙන්නට තිබේ.

**වගුව 2 බලය නොලත් පරිභෝජනය සොයා ගැනීම.**

| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| **සෝදිසියට භාජනය කරන ලද පරිශ්‍ර සංඛ්‍යාව** | 13,343 | 12,812 | 12,250 | 13,417 |
| **සොයා ගැනීම් සංඛ්‍යාව** | 1,661 | 1,521 | 1,196 | 804 |
| **අය කර ගනු ලැබූ මුදල් ප්‍රමාණය (රුපියල් දස ලක්ෂ)** | 69.64 | 54.77 | 42.19 | 33.55 |

**ආදායම් රහිත ජල කළමනාකරණය.**

කොළඹ නගරය තුළ පිහිටි තීරණාත්මක ප්‍රදේශයන් තෝරාගෙන මායිම් වසා දැමීමෙන් අනතුරුව තුළු ගැලීම් මිණුම් ගන්නා ලදි, දෘෂ්‍යමාන කාන්දු වීම් හඳුනා ගැනීම පිණිස රාත්‍රී සමීක්ෂණ, බෝක්කු සමීක්ෂණ හා ගෙන් ගෙට සමීක්ෂණ පවත්වනු ලැබිණි.

කාන්දු වීම් හඳුනා ගැනීමට අමතර වශයෙන් ගලනය හා පීඩනය මැණීම, සෑම 6 මසකටම වරක් ප්‍රාදේශීය ඉංජිනේරු මට්ටමින් ආදායම් රහිත ජලය පසු විපරමට භාජනය කිරීම, භූ ගත තොරතුරු සොයා ගැනීම, වෑල්ව පිහිටා ඇති ස්ථාන හඳුනා ගැනීම, කාන්දු සමීක්ෂණය හා කාන්දු පසු විපරම් කිරීමේ පහසුකම සංවර්ධනය කිරීමද සිදු කරන ලද්දේය.

කොළඹ දැනට පවත්නා පැරණි ජල සම්පාදන ජාලය වෙනුවට අළුත් නල යොදමින් කොළඹ නගරය තුළ ආදායම් රහිත ජලය 18% න් පහතට අඩු කිරීම සඳහා DMA/GIS පදනම් වූ ආදායම් රහිත ජලය කළමනාකරණය කිරීමේ ක්‍රමය හඳුන්වා දීමේ පරමාර්ථයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර සහිතව දියත් කරන ලද විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණ දියුණු කිරීම් ආයෝජන වැඩසටහන දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

ව්‍යාපෘතිය විසින් ආදායම් රහිත ජලය හා අදාලව කරගෙන යනු ලබන වැඩ කටයුතු හරහා නියමිත ආදායම් රහිත ජලය හා සම්බන්ධ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි එම වැඩ කටයුතු සමීප ලෙස පසු විපරමට භාජනය කරනු ලැබේ.

2016 වර්ෂය තුළදී කොළඹ නගරය තුළ හා බටහිර මධ්‍යම කලාපීය සේවා මධ්‍යස්ථානයේ ආදායම් රහිත ජලය පිළිවෙලින් 0.44% කින් හා 1.2% කින් අඩු වී ඇත.

- කොලොන්නාව ප්‍රදේශයේ දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් දෙකක් තුළ ආදායම් රහිත ජලය කළමනාකරණය කිරීමට අදාල ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදි.
- කාන්දු සොයා දැන ගැනීමේ පහසුකමක් සංවර්ධනය කිරීම.

## සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමස්ත මෙහෙයුම් කටයුතු වලදී සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය වැදගත් ක්‍රියාකාර කම් දෙකක් වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත හැකි ආකාරයට තිබිය යුතුවාක් මෙන්ම ද්‍රව්‍යයන් ප්‍රතිසම්පාදනය කිරීමේදී හා එම අයිතමයන් ගබඩා කිරීමේදීද නිවැරදි මිළ දී ගැනුම් ප්‍රතිපත්තීන් හා ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීම අවශ්‍ය වන්නේය.

2016 වර්ෂය මුළුල්ලේම කිසිදු බාධාවකින් තොරව අවශ්‍ය කරන රසායන ද්‍රව්‍ය සපයා දීමට හැකි විය. සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ විෂයට සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් වර්ෂය තුළ සියළුම නව සම්බන්ධතා ලබා දීම පිණිස සහාය ලබා දෙන ලද අතර කිසියම් තීරණාත්මක හෝ අවදානම් තත්ත්වයක් ඇති වුව හොත් ඊට මුහුණ දීම සඳහා ස්වාරක්ෂක තොගයක් පවත්වාගෙන යාමටද කටයුතු කළහ.

නැව් භාණ්ඩ තොග 300 කට වැඩි සංඛ්‍යාවක් ගණුදෙනු පියවා නිදහස් කර ගැනීම සම්බන්ධයෙන් ද පහත සඳහන් ආයතනයන් හා එක් වී ඉතා ඉහල ප්‍රමිති තත්ත්වයකින් යුතුව කටයුතු කිරීමේ හැකියාව සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයට තිබිණි. එම ආයතනයන් නම් නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශය, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, බැංකු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ නැව් සමාගම් ආදිය වේ. ඊට අමතර ලෙස නිෂ්කාශන නියෝජිත ආයතනයන්ට අදාල විධිමත් නියමයන් පිළිපැදීම හරහා ව්‍යාපෘති හා මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලට අදාල නැව් බඩු නිශ්කාෂණය කර ගැනීම සඳහා කාර්යක්ෂම ලෙස වැඩ කිරීම නිසා ප්‍රමාද ගාස්තු ගෙවීම වලක්වා ගැනීමට හැකි විය.

වර්ෂය තුළ දී අවශ්‍ය ද්‍රව්‍ය අළුතින් මිළ දී නොගෙන කලාපිය සේවා මධ්‍යස්ථානයන් තුළ රැඳී තිබුණ අතිරික්ත ද්‍රව්‍යයන් නැවත බෙදා හැරීම මගින් රුපියල් දස ලක්ෂ 150 කට අධික මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට හැකි වූයේය.

දිවයින පුරා ගබඩා වල භාවිතයට නොගෙන එක් රැස් වී තිබෙන ද්‍රව්‍ය පහසුවෙන් හඳුනා ගෙන භාවිතයට අවශ්‍ය වන විට ලබා ගැනීමට හැකි වන පරිදි එ වැනි ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඇතුලත් සංයුක්ත තැටියක් හා පොත් පිංචක් නිෂ්පාදනය කොට බෙදා හැරීමට කටයුතු කරන ලදි. මුළු දිවයින පුරාම තිබෙන ගබඩාවන් 332 වට්ටෝරු පොත් මෘදුකාංගයක් මගින් සම්බන්ධ කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එම වැඩ පිළිවෙළ පියවර 3 කින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක තත්ත්වයට පත් වන තෙක් දැනට ගබඩා වල ඇති භාවිතයට නොගැනෙන ද්‍රව්‍ය තොග යන් ඒවා අවශ්‍ය කරන කලාපීය සේවා මධ්‍යස්ථානයන් වෙත ලබා ගැනීමට පහසු වන පරිදි කෙටි පණිවුඩ ක්‍රමයක් හඳුන්වා දීමට සැලැසම් කරමින් පවතී. ඊට අමතරව රුපියල් බිලියන 6 ක් වටිනා තොග විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය විස්තර ලබා ගැනීම පිණිස කටයුතු කරනු ලබමින් තිබෙන අතර, ඒ අතුරින් රුපියල් බිලියන 1.8 ක් වටිනා ද්‍රව්‍ය දැනට නිම කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්ගෙන් හා සුනාමි ආධාර වලින් හා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදලින් ලැබුණ ආධාර වලින් ඉතිරි වී ඇති ඒවා බව පෙනී ගොස් ඇත. ඊට අමතර වශයෙන් රුපියල් දස ලක්ෂ 803 ක් වටිනා කොන්ත්‍රාත්තු 22 ක් සඳහා 2016 වසර තුළදී පිළියෙල කරන ලදි. මෙම වර්ෂය තුළදී ද, සියළුම ගබඩාවන් 332 න්ම අතිරික්ත හා ඵලදායී නොවන ද්‍රව්‍ය එක් රැස් කිරීමට කටයුතු කරන ලද අතර ඒවා අලෙවි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම 2017 වර්ෂයේ ජනවාරි මාසයේදී සිදු කිරීමට නියමිතය. මෙම වර්ෂය තුළදී ලෝක ජල දිනය සැමරුම් උත්සවයේ දී පවත්වන ලද වාර්ෂික ඵලදායිතා තරඟයේ දී මෙම අංශයට 3 වැනි ස්ථානය හිමි කර ගත හැකි විය. මෙම 2016 වසර තුළ දී තමන්ට වෙන් කරනු ලැබ තිබි අය වැය ප්‍රතිපාදනයන් තුළ කටයුතු කරමින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට මෙම අංශයට හැකි වූ අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයේ සමස්ත කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට තිබිණි.

## පර්යේෂණ හා සංවර්ධනය.

**යාපනයේ චුන්නාකම් ප්‍රදේශයේ අපවිත්‍ර තෙල් හේතු කොට ගෙන දූෂණයට පත් වූ භූගත ජලයේ දැන් (2016 / 2017) ගුණාත්මය සොයා දැන ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණය (11 වැනි පියවර).**

2013 හා 2014 යන වර්ෂයන් තුළදී පවත්වන්නට යෙදුන මේ හා සමාන පර්යේෂණය මගින් හෙලි වන ලද්දේ මෙම අපවිත්‍රනය කිලෝ මීටර 1.5 ක් දක්වා පැතිර ගොස් ඇති බව හා විදුලි බලාගාරය අසල ප්‍රදේශයේ ඉහල මට්ටමේ සාන්ද්‍රණයක් නිරීක්ෂණයට ලක් වුන බවයි. 2014 වර්ෂයේ මෝසම් වර්ෂා පතනයෙන් පසුව තෙල් පැතිර යාමේ රටාව වෙනස් වූ අතර බලාගාර ප්‍රදේශයේ සිට කිලෝ මීටර් 6 ක ප්‍රදේශයක් පුරා පැතිර ගොස් තිබුණ නමුත් අපවිත්‍රනය වීමේ සාන්ද්‍රනය අඩු වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරනු ලැබ ඇත. දැනට තෙල් වලින් අපවිත්‍රනය වී ඇති ප්‍රදේශයන්ගේ හා සාන්ද්‍රනයන්ගේ නිවැරදි හෝ කෙනෙකු දන්නා මායිම් කිසිවක් නැත. මේ හේතුව නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ප්‍රදේශය වෙත දිගින් දිගටම බවුසර යොදා ගනිමින් ජලය බෙදා හැරීම සිදු කරයි.

**මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵල වන්නේ**

1). මුලින් ඉතාමත්ම ඉහල මට්ටමකට අපවිත්‍රනය වී ඇති බවට හඳුනා ගෙන තිබී, මීට පෙර පවත්වන ලද අධ්‍යයනයේදී තෝරා ගෙන තිබුණ ළිං සියයේ හා තවත් ළිං 50 ක අපවිත්‍රනය වී ඇති ප්‍රමාණය විශ්ලේෂණය කිරීම.

2). චුන්නාකම් ජලධරය වෙත අපවිත්‍ර තෙල් කාන්දු වී ඇති ප්‍රමාණය අධ්‍යයනය කොට අපවිත්‍රනය වී ඇති ප්‍රදේශයේ මායිම් නිර්නය කිරීම.

3). එහි ප්‍රතිඵල කලින් කරන ලද අධ්‍යයනය හා සංසන්දනය කිරීම.

4). අපවිත්‍රනයට භාජනය වී ඇති පර්යන්ත ළිං වල ජලයේ ඇති තඹ හා කැඩ්මියම් වැනි බැර ලෝහ දූෂණය හඳුනා ගැනීම.

5). අපවිත්‍රනයේ ප්‍රමාණය පිළිබඳව අවසන් නිගමනයකට පැමිණ පානීය පරමාර්ථයන් සඳහා අධ්‍යයන ප්‍රදේශයේ ඇති භූගත ජලයෙහි ඇති සුදුසු භාවය පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම. පර්යේෂණය සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 2.117 ක් වේ.

**මුරුන්කන් ද්‍රෝණිය තුළ භූගත ජලයේ ගතිකයන් සම්බන්ධ පර්යේෂණය දිගටම පවත්වාගෙන යාම. මුරුන්කන් ළිං ක්ෂේත්‍රය සාධනීය ලෙස කළමනාකරණය කිරීම සඳහා කරනු ලබන පාරිසරික සමස්ථානික අධ්‍යයනයක්.**

භූගත ජලය ප්‍රති ආරෝපණය වීමේ ප්‍රභවයන්, ප්‍රදේශයන් හා භූගත ජලය මිශ්‍ර වීම ආදිය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයකින් තොරව විශාල ප්‍රමාණයෙන් භූගත ජලය නිස්සාරණය කර ගැනීම භූ ගත ජලයේ ගුණාත්මය හා ප්‍රමාණය හා සම්බන්ධ ගැටළු වලට තුඩු දිය හැකි වේ. මෙම පර්යේෂණය පවත්වන ලද්දේ භූගත ජලය හා මතු පිට ජලාශයන් අතර ඇති සම්බන්ධතාවය, භූගත ජලය ප්‍රති ආරෝපණය වීමෙහි ලා යෝධ වැව හා මල්වතු ඔය දෙන දායකත්වය හා භූ ගත ජලය නිස්සාරණය කර ගැනීමේදී මුහුදු ජලය ඊට මිශ්‍ර වීමේ විභව හැකියාව අවබෝධ කර ගැනීමට වේ. මෙම පර්යේෂණය සඳහා වන මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් දස ලක්ෂ 1.256 ක් වනු ඇත.

රසායනික පරාමිතීන් විශ්ලේෂණය කිරීම හා (වර්ෂා ජලය, මුහුදු ජලය, භූගත ජලය හා මතු පිට ජලය යන) ජල නියැදීන් පිළිබඳ සමස්ථානික විශ්ලේෂණය කිරීම සෘතු අනුව වර්ෂ දෙකක් තුළ පවත්වන ලදි. ජල නියැදීන් රැස් කිරීම හා පරීක්ෂණයට භාජනය කිරීම නිම කරනු ලැබ ඇත. දත්ත පිරිසැකසුම් කරණය හා වාර්තා සකස් කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.

**මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පොම්ප කරන ළිං මත හා ජලධරයන්ගේ භූ ගත ජල අනතුරට බඳුන් විය හැකි වීමේ අවදානම් තක්සේරුව දිගටම සිදු කිරීම.**

වර්ෂා කාලයන් තුළදී කෘෂි රසායන ද්‍රව්‍යයන්ගේ ඉතිරි අවශේෂයන් ජලධරයන් තුළට හා පොම්ප කරන ළිං තුළට කාන්දු වීමේ හැකියාව ඇති අතර මේ හේතුවෙන් එකී ජලධරයන්ගේ හා ළිං වල ගුණාත්මය අවදානම් තත්ත්වයක පවතිනු ඇත. මීට අමතර වශයෙන් නාගරික හා ගෘහස්ත අපද්‍රව්‍ය බැහැර කිරීම් හේතු කොට ගෙන එකී දූෂණය වර්ධනය වීමේ හැකියාව ද ඇත. මෙම පර්යේෂණයේ ඉලක්කය වන්නේ සැලැසුම්සහගත නොවන සේ කරනු ලබන ජලය පොම්ප කිරීම හා බැඳී පවතින අවදානම හඳුනා ගැනීම, එම අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය පියවරයන් සංවර්ධනය කිරීම හා පොම්ප කරන ළිං වල ජලයේ ගුණාත්මය හා ප්‍රමාණාත්මක තත්ත්වය තිර සාර මට්ටමක රඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමත් වේ. මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා වූ මුළු ඇස්තමේන්තු කරන ලද පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 3.933 ක් වේ. වසර දෙකක් මුළුල්ලේ සෘතු අනුව භූගත ජල නියැදීන් පරීක්ෂණයට භාජනය කරන ලදි. ජල නියැදි රැස් කිරීම හා පරීක්ෂණ කටයුතු කිරීම නිම කරනු ලැබ ඇත. දත්ත පිරිසැකසුම් කරණය හා වාර්තා සකස් කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.

**පාරිසරික හා සමාජ සාධකයන් මත පදනම් වූ ජීවන රටාව අනුව නිධාන්ගත වකුගඩු රෝගය හා සම්බන්ධ ඓතිහාසික සාක්ෂි පිළිබඳ පර්යේෂණය දිගටම පවත්වාගෙන යාම.**

මෙවැනි පර්යේෂණයක් ආරම්භ කිරීමට එක් හේතුවක් වූයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා ඒ අවට වෙනත් ප්‍රදේශයන්හි වර්ධනය වෙමින් පැවැති වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව වේ. නිධාන්ගත වකුගඩු රෝගය ඇති වීමට හේතු හා පානීය ජලය අතර ඇති සම්බන්ධතාවය සහ භූගත ජලය දූෂණයට ලක් වීම ජීවන ශෛලිය මත බලපාන ආකාරය අධ්‍යයනය කිරීමට සැලැසුම් කරනු ලැබ ඇත්තේය. පර්යේෂණය සඳහා වූ මුළු ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දස ලක්ෂ 2.102 ක් වේ. මේ සඳහා වර්ෂ දෙකක් ඇතුලත සෘතු අනුව භූ ගත ජල නියැදි පරීක්ෂණයට භාජනය කළ යුතු වේ. ජල නියැදිකරණය හා පරීක්ෂණයට භාජනය කිරීම සිදු කෙරෙමින් පවතී. මීට අදාලව ප්‍රශ්නාවලී සමීක්ෂණයක් ද සිදු කළ යුතුව ඇත.

තිරසාර භාවය හා විවිධාංගිකරණය සඳහා ප්‍රජා මූල සංවිධාන ශාස්තෘ ක්‍රමයේ ඇති ප්‍රමාණවත් භාවය හා සඵල තාවය අගැයීමට ලක් කිරීමේ පර්යේෂණය අඛණ්ඩ ලෙස කරගෙන යාම.

වර්තමානය වන විට රටේ ජන ගහණය වෙත පානීය ජලය සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය තුළ ප්‍රජා මූල සංවිධානයන් විසින් වැදගත් භූමිකාවක් ඉටු කරමින් පවතී. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ වඩාත් හොඳින් ක්‍රියාත්මක වීම සඳහා මෙන්ම තිරසාර භාවය පවත්වාගෙන යාම සඳහාද ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම පවත්වාගෙන යනු ලබන ප්‍රජා මූල සංවිධානයන්ගේ මූලයමය හැකියාවන් ප්‍රමාණවත් වන්නේද යන්න තක්සේරු කර බැලීම වේ. තෝරාගත් ප්‍රජා මූල සංවිධානයන්හි ප්‍රශ්නාවලී සමීක්ෂණයන් පවත්වන ලදි. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1.27 ක් වන අතර දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම නිමවනු ලැබ ඇත. වාර්තාව ලිවීම දැනට සිදු කරමින් පවතී.

**නුවරඑළිය, වැලිමඩ හා බණ්ඩාරවෙල පානීය ජල ප්‍රභවයන් තුළ ඇති ඕර්ගනෝක්ලෝරීන හා ඕර්ගනෝෆොස්ෆේට් පලිබෝධ නාශක අවශේෂයන් විශ්ලේෂණය කිරීම දිගටම කරගෙන යාම.**

මෙම අධ්‍යයනයේ අරමුණ වන ලද්දේ නුවරඑළිය හා වැලිමඩ ප්‍රදේශයන්හි ජල ප්‍රභවයන් තුළ ඇති පලිබෝධ නාශක අවශේෂයන්ගේ ප්‍රමාණය තීරණය කිරීම හා ඉන් පසු එම තොරතුරු යොදා ගනිමින් එම ප්‍රදේශයන් තුළ භාවිතා කරනු ලබන පලිබෝධ නාශකයන් පිළිබඳ දත්ත සංචිතයක් නිර්මාණය කිරීම වේ. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 2.30 ක් වන අතර ජල නියැදි රැස් කිරීම හා දත්ත විශ්ලේෂණය කිරීම නිමවනු ලැබ ඇත. ප්‍රශ්නාවලී සමීක්ෂණයක් පැවැත්වීම හා වාර්තාව ලිවීම සිදු කළ යුතුව ඇත.

පලිබෝධනාශක අවශේෂයන් සොයා ගැනීම සඳහා පරීක්ෂණයට භාජනය කිරීම පිණිස ජල නියැදි රැස් කරන ලද්දේ රික්ත පෙරණයක් යොදා ගනිමිනි.

**බදුල්ල දිස්ත්‍රික්කයේ දෙමෝදර පිහිටි දෙමෝදර වතු යාය වෙත විශේෂ අවධානය යොමු කරමින් වතු අංශයේ සනීපාරක්ෂණ ගැටළු පිළිබඳ පර්යේෂණය දිගටම පවත්වාගෙන යාම.**

සනීපාරක්ෂණය සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට බෙහෙවින්ම අත්‍යවශ්‍ය වන මූලික අංගයකි. එම නිසා මෙම අධ්‍යයනය පවත්වන ලද්දේ වතු අංශයේ සනීපාරක්ෂණ ගැටළු වලට හේතු වන සාධක හඳුනා ගැනීමට මෙන්ම සෞඛ්‍ය සම්පන්න සනීපාරක්ෂණ තත්ත්වය යනු කුමක්ද යන්න පිළිබඳව වතුකරයේ ජනතාව දරන මතයන් හා ආකල්පයන් විශ්ලේෂණය කර බැලීමට හා ගැටළු අභිභවා යාම සඳහා යොදා ගත හැකි විකල්ප මාර්ගයන් සොයා ගැනීමටත්ය. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් 1,77,000 ක් වන අතර පර්යේෂණය අඛණ්ඩ ලෙස සිදු කෙරෙමින් පවතී.

**ප්‍රතිලෝම ආශ්‍රැතික ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පසු විපරම් කිරීම දිගටම කරගෙන යාම.**

ප්‍රතිලෝම ආශ්‍රැතික ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර භාවිතා කරනු ලබන්නේ නොදන්නා හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝග යට ගොදුරු වී ඇති ප්‍රදේශයන්හි වෙසෙන ජනතාව වෙත හොඳ ගුණාත්මයෙන් යුත් පානීය ජලය සම්පාදනය කර දීම සඳහාය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දැනටම අනුරාධපුර හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන් තුල ප්‍රතිලෝම ආශ්‍රැතික ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 63 ක් ස්ථාපිත කරනු ලැබ ඇත. මේ අතුරින් ප්‍රතිලෝම ආශ්‍රැතික ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 32 ක ජලයේ ගුණාත්මය පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් අඛණ්ඩ ලෙස පසු විපරමට භාජනය කරනු ලබන අතර, වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම පවත්නා ගැටළු වලට පිළියම් වශයෙන් ගත හැකි පියවර සම්බන්ධයෙන්ද අවශ්‍ය උපදෙස් නිකුත් කරනු ලැබේ.

**දෝෂ ඇති වීමට තුඩු දුන් හේතු සොයා ගැනීම පිණිස හා එසේ දෝෂ ඇති නොවන පිණිස ගත හැකි ආරක්ෂාකාරී ක්‍රියා මාර්ග සොයා ගැනීම සඳහා දෝෂ සහිත ජල මනු පිළිබඳව කරනු ලබන අධ්‍යයනය දිගටම පවත්වාගෙන යාම.**

මෙම අධ්‍යයනය ආරම්භ කරන ලද්දේ ජල මනු දෝෂ සහගත වීමට තුඩු දෙන හේතු පිළිබඳව සොයා බැලීමට හා එම ගැටළුව අවම කිරීමේ මාර්ග හඳුනා ගැනීමටක් තත්ත්වය දියුණු කිරීමට විසඳුම් සොයා ගැනීමටත් වේ. මෙම අධ්‍යයනය යටතේ මහරගම හා හෝමාගම ප්‍රදේශයන්ගෙන් දෝෂ සහගත මනු 215 ක් එකතු කර ගත් අතර ඒවා පොල්වත්තේ වැඩ පොළ තුලදී ගලවා ඇතුලත පරීක්ෂා කර බලා එසේ දෝෂ සහගත වීමට තුඩු දී ඇති හේතු සටහන් කර ගන්නා ලදි. අධ්‍යයනය හා අදාල දත්ත පිරිසැකසුම හා වාර්තා පිළියෙල කිරීම සිදු කෙරෙමින් පවතී.

**පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර සැලැසුම් කිරීම හා පසු විපරම් කිරීම දිගටම කරගෙන යාම.**

කලාපීය සේවා මධ්‍යස්ථානයන් වෙතින් ලැබුණ ඉල්ලීම් අනුව චිත්‍ර සටහන් සඳහා සැලැසුම් හා ක්‍රම සම්පාදන අංශයේ සහාය සහ එකලස් කිරීම සඳහා වැඩ පොලේ සහායද ලබා ගනිමින් පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වලට අදාලව කරනු ලබන සැලැසුම් කිරීම් හා ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම් දැනට කරගෙන යමින් පවතී. නව යන්ත්‍රාගාරයන්ගේ තත්ත්වය හා දැනට ඇති ගැටළු පහත සඳහන් පරිදි වේ.

1. **නීලපොල** - යන්ත්‍රාගාරය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. කලාපීය සේවා මධ්‍යස්ථානය (නැගෙනහිර) විසින් අමු ජල සම්බන්ධතාවය ලබා දිය යුතුව ඇත.
2. **සිතුල්පව්ව** - යන්ත්‍රාගාරය සවි කිරීම නිම කරනු ලැබ ඇත. රසායන ද්‍රව්‍ය කුටියේ ඉදි කිරීම නිම වෙමින් පවතී. කලාපීය සේවා මධ්‍යස්ථානය විසින් ඉහල ඔසොව් පොම්ප ස්ථාපිත කළ යුතුව ඇත.
3. **මුතු කණ්ඩිය** - මුතු කණ්ඩිය සඳහා වූ අවසන් රූප සටහන් නිම කරනු ලැබ ඇත. කෙසේ වුවද කලාපීය සේවා මධ්‍යස්ථානය විසින් එය ස්ථාපිත කරනු ලබන ස්ථානය සියඹලාන්ඩුව වෙත වෙනස් කරනු ලැබ ඇත.
4. **යටියන්තොට** - යන්ත්‍රාගාරය එකලස් කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.
5. **උල්හිටිය** - සැලැස්ම සම්පූර්ණ කරනු ලැබ තිබේ.
6. **මතුරට** - දිනකට ජලය ඝණ මීටර 250 ක ධාරිතාවයකින් යුත් යන්ත්‍රාගාරය සඳහා වූ සැලැසුම පිළියෙල කිරීම සම්පූර්ණ කොට ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙත භාර දෙනු ලැබ ඇත.

දිනකට ජලය ඝණ මීටර 250 ක ධාරිතාවයකින් යුත් යන්ත්‍රාගාරය නව සැලැසුමකි. පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර සඳහා පිළියෙල කරන ලද මෙහෙයුම් හා නඩත්තු අත් පොතෙහි සිංහල පරිවර්තනය සම්පූර්ණ කරනු ලැබ ඇති අතර සිංහල හා ඉංග්‍රීසි යන සංස්කරණ දෙකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය තුළට ඇතුළු කරනු ලැබ ඇත. එසේම සැලැසුම් සංග්‍රහය පිළියෙල කිරීමද මේ වන විට සිදු වෙමින් පවතී. නිත්‍ය ශීර්ෂ - ගලන රසායනික පෝෂණය හා අල්ගේ හේතු කොට ගෙන පෙරණයන් අවහිර වීම වැනි ගැටළු අධ්‍යයනය කරමින් පවතී.

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවාවන් ඉහල ශ්‍රේණිගත කිරීම සඳහා ගණුදෙනුකරුවන්ගේ තෘප්ති මට්ටම විශ්ලේෂණය කිරීම පිණිස නව සම්බන්ධතාවයන් මත සිදු කරනු ලබන සමාජ සමීක්ෂණය.**

සේවා ආවරණය ඉහල නැංවීමේ අරමුණින් තව තවත් නව සම්බන්ධතාවයන් සැපැයීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සැලැසුම් කරයි. එම නිසා, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් හා අනිකුත් අදාල නිලධාරීන් විසින් දෙනු ලබන නව සම්බන්ධතා සේවාව නංවා ලීම කළ යුතුව ඇත. ඒ හේතුව නිසා පවත්නා ක්‍රමයේ හිතකර හා හිතකර තත්ත්වයන් හඳුනාගැනීම සඳහා දැනට ඇති නව සම්බන්ධතා සේවය තක්සේරු කර බැලීම අවශ්‍ය වනු ඇත. එම නිසා, නව සමීක්ෂණයක් දියත් කිරීමට පෙර පාද රේඛා දත්ත වශයෙන් භාවිතා කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් කලින් කරන ලද සමීක්ෂණයන්ගේ ප්‍රතිඵල පිළිබඳව සොයා බැලීමක් සිදු කරන ලද්දේය. කෙසේ වුවද, නව සම්බන්ධතා සැපැයීමේ ක්‍රියාවලිය තුළදී පාරිභෝගිකයින්ගේ තෘප්තිය අගැයීම සඳහා එවැනි සමාජ සමීක්ෂණයක් හෝ කිසියම් අධ්‍යයනයක් කර නොමැති බව දැනගන්නට ලැබිණි. ඊට අමතර ලෙස බලන කල, පද්ධතිය කෙරෙන් නව සම්බන්ධතා ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම් තත්ත්වය ඉහළ නැගීමේ හැකියාව ඇත. අනිත් අතින් බලන කල, පාරිභෝගික තෘප්තිය නංවා ලීම පණාවා ගනු ලැබ ඇති ඉලක්කයන් සපුරා ගැනීම කෙරෙහි සැලැකිය යුතු අන්දමින් දායක වනු ඇත.

මෙම පැවරුමේ අරමුණ වූයේ පහතට ගලා යන වග වීම දියුණු කරන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිරූපය තව දුරටත් නංවා ලීමේ පරමාර්ථයෙන් නව සම්බන්ධතාවයන් සැපැයීමේ ක්‍රියාවලිය හා ඇති වන ගණු දෙනු කාර තෘප්තියේ මට්ටම මැණ බැලීම වේ. ඉහතින් සඳහන් කරන ලද සමීක්ෂණය මහරගම, පානදුර, ජා ඇල හා බියගම යන ප්‍රදේශයන්හි පවත්වන ලද අතර විශ්ලේෂණය කිරීම්, කළමනාකරණය වෙත ඉදිරිපත් කිරීම් හා අවසන් වාර්තාව සැකසීම නිම කරනු ලැබ ඇත.

**විශේෂ සිදුවීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2016 වාර්ෂික පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන සම්මන්ත්‍රණය.**

දෙවැනි වාර්ෂික පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන සම්මන්ත්‍රණය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් මෙන්ම ඉන් බාහිර සංවිධානයන් හා සම්බන්ධිත විශේෂඥයින් හා වෘත්තිකයින් 400 කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් 2016 මාර්තු 18 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථක අන්දමින් පවත්වන ලදි. මෙම අවස්ථාවට තාක්ෂණික ලිපි 32 ක් ඉදිරිපත් කරන ලද අතර ඒවා අතර පහත සඳහන් තේමා අට යටතේ විශ්ව විද්‍යාලයයන් විසින් ඉදිරිපත් කරන ලද ලිපි සතරක් ද විය. ජල ප්‍රතිකර්මය, සමාජයීය හා ආර්ථික පැතිකඩයන්, අපජල කළමනාකරණය හා ස්වස්ථතාව, තිරසාර වර්ධනය, භූ ගත ජලය, කාර්යක්ෂමතා වැඩි දියුණුව, ජල සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සහ ආදායම් රහිත ජලය යනුවෙනි. මෙම ලිපි ජල හා අපජල අංශයන්හි ඒ ඒ අය විසින් රැස් කර ගන්නා ලද අත් දැකීම් සාකච්ඡා කිරීමට හා බෙදා හදා ගැනීමට උපකාරී විය.

මෙම සම්මන්ත්‍රණය ප්‍රථම වරට පවත්වන ලද්දේ 2015 වර්ෂයේ වන අතර සම්මන්ත්‍රණය ලෝක ජල දිනය හා සමගාමී ලෙස සෑම වර්ෂයකම නොකඩවා පැවැත්වීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අපේක්ෂා කරන අතර ඒ හරහා ඉලක්ක කරනු ලබන්නේ තමන්ගේ සොයා ගැනීම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හමුවේ තැබීමට විද්වතුන් හා පර්යේෂකයින් වෙත වේදිකාවක් සපයා දීම වන අතර එයින් සංවිධානය වෙත මෙන්ම සමස්ත රට වෙතම ප්‍රතිලාභ සැලැසෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. ඊට අමතරව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ පර්යේෂණ හා සංවර්ධන සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමේ හා එයට සහාය දීමේ අවශ්‍යතාවය මෙම සම්මන්ත්‍රණය මගින් අවධාරණය කෙරේ.

## දේශගුණික විපර්යාසයන්ට අනුහුරු වීම හා ආපදා අවදානම අඩු කිරීම

ජලාධර ආරක්ෂා කිරීමේ ක්‍රියාකාර කම් හා ආපදා තත්ත්වයන්ට සූදානම් වීමේ ක්‍රියාකාර කම් ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම යටතේ පවත්වන ලදි.

## හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගය පිළිබඳ වැඩ සටහන.

**හැඳින්වීම.**

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සෞඛ්‍ය ගැටළුවක් බවට පත් වී ඇත. මුල් අවදි තුළදී එය උතුරු මැද හා ඌව යන පලාත් වලට සීමා වී තිබිණි. එහෙත් දැන් එය වයඹ, උතුරු, මධ්‍යම, නැගෙනහිර, සබරගමුව හා දකුණු යන පලාත් වලද ව්‍යාප්ත වී තිබේ. මෙම රෝගයට ගොදුරු වී ඇති අයගෙන් වැඩි කොටස ගොවීන් හා කෘෂිකාර්මික කම්කරුවන් වෙති. කෙසේවුවද, රෝගයට ගොදුරු වන කාන්තාවන්ගේ හා ළමයින්ගේද වර්ධනය වෙමින් පවතින සංඛ්‍යාවන් වාර්තා වෙමින් තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව උතුරු මැද හා ඌව පලාත් තුළ වයස අවුරුදු 15 සිට 70 දක්වා වයස් කාණ්ඩයේ ජනයා අතුරින් සියයට 15 කට වැඩි ප්‍රතිශතයක් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත

වකුගඩු රෝගයට ගොදුරු වී ඇත. 1991 වර්ෂයේදී මුල් වරට හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගය හඳුනාගනු ලැබීමෙන් පසුව උතුරු මැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මෙම රෝගය නිසා 35000 කට වැඩි ජන සංඛ්‍යාවක් මරණයට පත් වී සිටියහ.

**යෝජිත ක්‍රමෝපාය.**

ඒ අනුව, ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වෛද්‍ය වෘත්තිකයින්ගේ නිර්දේශ අනුව, හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයේ බල පෑමට යටත් වී ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂිත පානීය ජලය සැපැයීමේ අරමුණ සහිතව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රමෝපායක් හා කාර්ය සැලැසුම් සංවර්ධනය කරන ලදි. මීට කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමෝපායයන් ඇතුලත් වේ.




**2 වැනි පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන සම්මන්ත්‍රණය 2016**

මෙම කාර්ය සැලැසුම් පාර්ලිමේන්තුවේ හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගය හා සම්බන්ධ අනු කමිටුව විසින් අනුමත කරන ලද අතර, 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙමින් පවතී. මෙම වැඩ සටහන බල පෑමට යටත් වී ඇති සෑම පලාතකම ඇති හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයට ගොදුරු වී ඇති සෑම ප්‍රදේශයක්ම ආවරණය කරනු ලබයි.

**දීර්ඝ කාලීන විසඳුම.**

- රෝගයේ බල පෑමට හසු වී ඇති සෑම ප්‍රදේශයකටම නව ජල සම්පාදන ව්‍යාපෘතීන් ලබා දීම මේ යටතේ ආවරණය කෙරේ.

**මධ්‍ය කාලීන විසඳුම්.**

- දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ සිට හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝග යේ බල පෑමට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත ජල සම්පාදන දිගු ලබා දීම මේ යටතේ ක්‍රියාත්මක වේ.

**කෙටි කාලීන විසඳුම්.**

- හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත බවුසර මගින් ජලය සපයා දීම.
- භූ ගත ජලය පවිත්‍ර කිරීම සඳහා කුඩා ප්‍රතිලෝම ආශ්‍රැති ප්‍රතිකාරක යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම හා ප්‍රජාවන් වෙත එම ජලය පානීය හා ආහාර පිසීමේ පරමාර්ථයන් සඳහා පමණක් සැපැයීම.
- වර්ෂා ජලය රැස් කිරීම.

**වත්මන් ප්‍රගතිය.**

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝග යට අදාල ක්‍රියාකාරකම් සඳහා රුපියල් දස ලක්ෂ 1,000 ක් වෙන් කරනු ලැබ ඇති අතර මෙම වෙන් කිරීම හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත මධ්‍ය කාලීන හා කෙටි කාලීන විසඳුම් ලබා දීම සඳහා භාවිතා කරනු ලැබ ඇත.

මීට අමතරව 2016 වර්ෂය තුළදී පෞද්ගලික අංශයේද සහාය ලබා ගනිමින් ප්‍රතිලෝම ආශ්‍රැති ප්‍රතිකාරක යන්ත්‍රාගාර ඒකක 71 ක් ස්ථාපනය කරනු ලැබ ඇත.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝග යේ රෝග නිධානය පිළිබඳව විමර්ශණය කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයේ බලපෑමට යටත් වී ඇති ප්‍රදේශයන් වෙනුවෙන් තිරසාර ජල ප්‍රතිකාරක ක්‍රමයක් හඳුනා ගැනීම සඳහාද 2015 වර්ෂයේදී චීන විද්‍යා පීඨය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඒකාබද්ධව දියත් කරන ලද ව්‍යාපෘතිය මේ වර්ෂය තුළදී ද දිගටම ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය විසින් පුළුල් ලෙස අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයේ බල පෑමට යටත් වී ඇති ප්‍රදේශයන් වෙනුවෙන් ස්ථාවර ජල ප්‍රතිකාරක තාක්ෂණවේදයන් හඳුනාගෙන ආරක්ෂිත, දරාගත හැකි හා තිරසාර ජල සම්පාදනයක් සැපැයීම කෙරෙහි වේ.

චීන විද්‍යා පීඨය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. ඒ අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ ඉංජිනේරු පීඨ පරිශ්‍රය තුළ ඉඩමක් තෝරා ගන්නා ලදි. චීන සැලසුම් කණ්ඩායම මේ දින වල වැඩි දියුණු කළ රසායනාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය සැලැසුම් පිළියෙල කිරීමෙහි නිරතව සිටියි. මෙහි ඉදි කිරීම 2019 වර්ෂය වන විට නිම කරනු ලැබීමට අපේක්ෂා කෙරේ.

ස්ථිර රසායනාගාරය ඉදිකර අවසන් වන තෙක් ආරම්භක විමර්ශණයන් කරගෙන යාම සඳහා මහනුවර තාවකාලික රසායනාගාරයක් ඉදි කරන ලදි.

## ජල සුරක්ෂිතතා සැලැසුම්.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ පානීය ජලයේ ගුණාත්මය පිළිබඳ මඟ පෙන්වීම් මගින් පානීය ජල සැපැයුමක සුරක්ෂිතතාවය ස්ථාවර ලෙස සහතික කිරීමේ ඉතාමත්ම ඵලදායී මාර්ගය ලෙස නිර්දේශ කරන ලද්දේ ජල සුරක්ෂිතතා සැලැසුම් වේ. ශ්‍රී ලංකාවේ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් හා ක්‍රියාත්මක කිරීම් සහාය සහිතව 2015 වර්ෂයේ සිට අඛණ්ඩ ලෙස සිදු කෙරෙමින් පවතී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මිනිස් බල සංවර්ධන අංශය යටතේ සියළුම කලාපීය සේවා මධ්‍යස්ථානයන් වෙනුවෙන් නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් පුහුණු වැඩ සටහන් එකොළහක් පවත්වන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කැප වීමත් සමග නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම 87 ක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කළ හැකි වනු අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් මුළු සංඛ්‍යාවෙන් 26% ක් පමණ වේ. තවද එකී ජල සම්පාදන යෝජනා ක්‍රම 26% තුළට බියගම, අඹතලේ, කඳාන, විසල් මහනුවර, මහනුවර දකුණ, තුරුවිල, ගල්ලෑල්ල, කොන්ඩුවටවන, විසල් මාතර හා විසල් ගාල්ල වැනි රට තුළ ඇති සියළුම ප්‍රධාන නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඇතුලත් වේ. මෙම යෝජනා ක්‍රමයන් මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාවෙන් 60% ක ප්‍රතිශතයක් නියෝජනය කෙරේ. ඊට අමතරව, ජාත්‍යන්තර ජල සුරක්ෂිතතා විගණන වැඩසටහන් මගින් ජල සම්පාදන යෝජනා ක්‍රම 16 ක් අගැයීමට භාජනය කරන ලදි. ඒ අනුව, තිරසාර හා කාර්යක්ෂම ජල උපයෝජ්‍ය තාවයක් සාක්ෂාත් කර ගනු පිණිස වර්ෂ 2020 වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ඉටු කර ගැනීමේ වැඩ සටහන පිළිබඳව ජල සුරක්ෂිතතා සැලසුම් ක්‍රමෝපාය සැලසුම් වැඩමුළුවේදී එකඟත්වයට පැමිණෙන ලදි.



“ජලය එහි ඉතිහාසය අනුව නිශ්චය නොකළ යුතු අතර එය නිශ්චය කළ යුත්තේ එහි ගුණාත්මය අනුව වේ”

ආචාර්ය ලූකස් වෑන් වූරන්.

# යටිතල පහසුකම් සංවර්ධනය



විසල් දඹුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ තුළු මුව හා පොම්පාගාරය.

## කලාපීය සභාය සේවා මධ්‍යස්ථාන.




| පලාත/ කලාපීය සේවා මධ්‍යස්ථානය | සම්බන්ධතා සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 248,735 |
| නැගෙනහිර | 216,552 |
| උතුරු මැද | 107,686 |
| වයඹ | 73,782 |
| උතුරු | 17,817 |
| සබරගමුව | 100,957 |
| දකුණු | 303,423 |
| ඌව | 86,273 |
| බටහිර මධ්‍යම | 443,998 |
| බටහිර උතුරු | 256,513 |
| බටහිර දකුණු | 236,735 |
| එකතුව | 2,092,471 |

## කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන 11 විසින් නව ව්‍යාපෘතීන් බිහි කරනු ලබයි. ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ නියෝජිතයින් වශයෙන් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් නව ව්‍යාපෘති වලට අදාල සැලසුම් කටයුතු හා නියාමක පටිපාටීන් සමීප ලෙස සම්බන්ධීකරණය කරනු ලබයි. එසේම, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල සම්පාදන යෝජනා ක්‍රම හා මලාපවහන යෝජනා ක්‍රම මෙහෙයවීමින් නඩත්තු කරගෙන යනු ලබන්නේද ඔවුන් විසිනි. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අදාල යටිතල පහසු කම් සංවර්ධනය, ආදායම් රහිත ජලය අවම කිරීම, බලශක්ති කළමනාකරණය, හා ආයතනික සංවර්ධනය සහ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්හි ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයන්ගේ කාර්ය සාධනය ඒ ඒ උචිත අංශයන් යටතේ ක්‍රියාත්මක කෙරේ. ඉහත සඳහන් වී නොමැති වෙනත් වැදගත් තොරතුරු මෙහි පහත සාරාංශ කොට දක්වනු ලැබ ඇත.

**බටහිර - මධ්‍යම**

බටහිර - මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය කොළඹ නගරය උතුර, කොළඹ නගරය දකුණ, කෝට්ටේ හා මහරගම කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වේ. 2016 වර්ෂය තුළදී, සාමාන්‍යයෙන් එම ප්‍රදේශයෙහි සිදු වන පරිදි විශේෂ සමාජමය සිදු වීම් බොහෝ සංඛ්‍යාවක් සිදු විය. සිංහළ සහ හින්දු අළුත් අවුරුද්ද සැමැරීමේ උත්සව වැඩ සටහන් ද, ජනවාරි 1 වැනි දින නව ලිත් වර්ෂය ආරම්භ වීම සැමරීමේ උත්සව ද, වෙසක් හා පොසොන් වෙනුවෙන් උත්සවද පිළියෙල කර පවත්වන ලදි. බටහිර * මධ්‍යම සහාය සේවා මධ්‍යස්ථානයට අනුබද්ධ සුබ සාධක සමිතිය විසින් ධර්ම දේශනා පැවැත්වීම වැනි ආගමික කටයුතුද සංවිධානය කරන ලදි.

ආදායම් රහිත ජලය අවම කිරීමට හා බල ශක්ති සංරක්ෂණයට අදාල බොහෝ වැඩ කටයුතු මෙම වර්ෂය තුළදී බටහිර - මධ්‍යම සහාය සේවා මධ්‍යස්ථානය තුළ සිදු කරන්නට කටයුතු කෙරිනි. වර්ෂය තුළදී කරන ලද වෑල්ව ගවේෂණ කටයුතු, නල මාර්ග ගවේෂණ කටයුතු, නීති විරෝධී ලෙස ජල පරිභෝජනය කිරීම අල්ලා ගැනීම්, කාන්දු සමීක්ෂණ, අභ්‍යන්තරික වශයෙන් සිදු වන කාන්දු සොයා ගැනීම, දෝෂ සහිත මනු වෙනුවට නව මනු සවි කිරීම හා කාන්දු වන ස්ථානයන් අළුත්වැඩියා කිරීම වැනි ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ කටයුතු නිසා කොළඹ නගරයේ ආදායම් රහිත ජලය 44.6% ක් දක්වා අඩු කර ගත හැකි විය. බටහිර * මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අදාල නව ආදායම් රහිත ජල ප්‍රතිශතය වන්නේ 34.3% ක් වන අතර එය ගත වූ වර්ෂයට වඩා 0.6% ක අඩු අගයක් පෙන්නුම් කරයි.

ආදායම් රහිත ජල ප්‍රමාණය අඩු කිරීමම බල ශක්ති සංරක්ෂණයට තුඩු දෙන ක්‍රියාවකි. තවද, අඹතලේ පොම්ප කිරීමේ පිරිවැය අඩු කිරීම සඳහා වැසි දින වල හා විශේෂ නිවාඩු දිනයන්හි රාත්‍රී කාල වලදී මාලිගාකන්ද ජලාශයේ පොම්ප කිරීමේ නල වල වෑල්ව තුළනය කිරීම සිදු කරන ලදි. බල අර්බුදයක් පවතින අතරතුරදී බල ශක්ති සංරක්ෂණය කිරීම සඳහා ගන්නා ලද වෙනත් ඇතැම් පියවර වූයේ පොම්පාගාරයන් තුළ වෙනස් කළ හැකි ප්‍රේරණයන් ස්ථාපිත කිරීම (මාදිවෙල), ප්‍රතිදීපන හා සීඑෆ්එල් පහන් වෙනුවට එල්ඊඩී පහන් යෙදීම, පොම්පාගාරයන්හි පොම්ප කරනු ලබන කාල වේලාවන් ඉල්ලුම අඩු කාල වේලාවන්ට මාරු කිරීම (මහරූෆ් කුළුණ - කොළඹ නගරය දකුණ), පැලන්වත්ත හා පන්නිපිටිය පොම්පාගාරයන්හි අකාර්යක්ෂම පැරණි පොම්ප වෙනුවට නව පොම්ප සවි කිරීම (දැනට සිදු කෙරෙමින් පවතී) සහ සියළුම බල ශක්ති පරිභෝජනය කරනු ලබන ස්ථානයන්හි නාස්තිය වැලැක්වීමේ ක්ෂණික නඩත්තු කටයුතු කිරීම යනාදිය වේ.

**නල මාර්ග දීර්ඝ කිරීම / අඩුව පිරවීමේ නල.**

මහරගම කළමනාකරණ ප්‍රදේශයේ මිලි මීටර් 63 ට වැඩි විෂ්කම්භයකින් යුත් නල මාර්ග සඳහා කරන ලද නල මාර්ග දීර්ඝ කිරීම් හා පොදු නල මාර්ගයන්හි කරන ලද වැඩි දියුණු කිරීම් වල මුළු දිග කිලෝ මීටර 110.8 ක් වේ. කෝට්ටේ කළමනාකරණ ප්‍රදේශයේ එසේ කරන ලද නල මාර්ගයන්ගේ මුළු දිග කිලෝ මීටර 87.4 කි. කොළඹ නගර කළමනාකරුවන් විසින් තමන්ගේ ප්‍රදේශ තුළ කිලෝ මීටර 4.1 ක වාත්තු කළ යකඩ නල මාර්ගයන්හි ඇතුලත බැඳී තිබුණ මලකඩ පොතු ගැලවීම සිදු කරනු ලැබ ඇත. මීට අමතර වශයෙන්, කළුගඟ ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ කොළඹ නගර දකුණු ප්‍රදේශය ඇතුලත මිලි මීටර 110 ක හා ඊට වැඩි විෂ්කම්භයකින් යුත් නල මාර්ග කිලෝ මීටර 62.4 ක් අළුතින් එලනු ලැබ ඇති අතර පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවේ තත්ත්වය වැඩි දියුණු කරමින් මෙම වැඩ කටයුතු කරන අතර තුර දැනට ක්‍රියාත්මක වන සම්බන්ධතාවයන් 13,750 ක් මෙම නව නල මාර්ග වෙත මාරු කරනු ලැබ ඇත.

ජලය බෙදා හැරීම වැඩි දියුණු කිරීමේ අරමුණින් දියත් කරන ලද **LBF** ව්‍යාපෘති දෙකක් හබරකඩ හා කොරතොට දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර ඒ සඳහා වැය වන පිරිවැය පිළිවෙලින් රුපියල් දස ලක්ෂ 167. 5 ක් හා රුපියල් දස ලක්ෂ 173.3 ක් වේ. මේ හරහා ව්‍යාපෘති විෂය පථයට ඇතුලත් වන වෙනත් යටිතල පහසුකම් අතර මිලි මීටර 63 කට හා ඊට වැඩි විෂ්කම්භයකින් යුත් නල මාර්ග කිලෝ මීටර 10.2 ක ප්‍රමාණයක් පද්ධතියට එකතු වනු ඇත.

**නව සම්බන්ධතා.**

වර්ෂය තුළදී බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ නව සම්බන්ධතා 22,126 ක මුළු සංඛ්‍යාවක් ලබා දී ඇත. සැලසුම් කර තිබුනේ සම්බන්ධතා 14,160 ක් ලබා දීමට හෙයින් මෙය ඉලක්කය 156% කින් සාක්ෂාත් කර ගැනීමක් වේ. කොළඹ නගරය උතුර කළමනාකරණ ප්‍රදේශය තුළ නව සම්බන්ධතා 943 ක් ද, කොළඹ නගරය දකුණ කළමනාකරණ ප්‍රදේශය තුළ නව සම්බන්ධතා 1365 ක් ද, කෝට්ටේ කළමනාකරණ ප්‍රදේශය තුළ නව සම්බන්ධතා 6123 ක් හා මහරගම කළමනාකරණ ප්‍රදේශය තුළ නව සම්බන්ධතා 14,125 ක් ද ලබා දීම මගින් මෙසේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ හැකියාව ලැබිණි.

**යටිතල පහසුකම් හා ආයතනික සංවර්ධනය.**

2016 වර්ෂය තුළ කරන ලද බොහෝ සුළු සංවර්ධන ක්‍රියාකාර කම් වලට අමතරව කරන ලද යටිතල පහසුකම් හා ආයතනික සංවර්ධන ක්‍රියාකාරකම් වශයෙන් එලි හවුස් ජලාශ ඒකකයේ ක්ලෝරිනීකරණ කුටිය සඳහා වායු පිරිසිදු කිරීමේ උපකරණ ඒකකයක් ස්ථාපිත කිරීමද, මාලිගාකන්ද ජලාශයේ නව වෑල්ව කුටිය ඉදි කිරීම නිම වෙමින් පැවතීම හා මෙහෙයුම් හා නඩත්තු කළමනාකරුවන් විසින් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා තමන් වෙත ලැබුණ අරමුදල් භාවිතා කරමින් කොළඹ නගර උතුර කළමනාකරු යටතේ වූ මාලිගාකන්ද ගබඩාව වැඩි දියුණු කිරීම හා මාලිගාකන්ද පොම්පාගාරය නවීකරණය කිරීමද පෙන්වා දිය හැකි වේ.

**ජල සුරක්ෂිතතා වැඩ සටහන / ඵලදායිතා වැඩි දියුණු කිරීම.**

කෝට්ටේ, කොලොන්නාව, බත්තරමුල්ල හා කොළඹ නගරය උතුර යන ප්‍රදේශයන් වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුම් කෙටුම්පත් කර ක්‍රියාත්මක කරන ලදි. මේ වැඩ සටහන යටතේ සීඅයි/ජීඅයි නල මාර්ග වෙනුවට පොලි එතිලින් නල ආදේශ කිරීම, ජලය බෙදා හැරීමේ නල මාර්ගයන් තුළට කුණු හරහා ක්ෂීරණය වන ජලය කාන්දු වීම වැලැක්වීම සඳහා කුණු කඳු අසල ඇති නල මාර්ග ඈතට ගෙන යාම, සංවාතන සිදුරු ආරක්ෂක දැල් යොදා ආවරණය කිරීම වැනි ජලය දූෂණය වීම වැලැක්වීමේ කටයුතු ගබඩා කරන ජලාශයන් තුළ සිදු කිරීම වැනි ක්‍රියාකාර කම් සිදු කරන ලද්දේය.

වැඩ කටයුතු කරන අතර තුර තමන්ගේ ඵලදායි තාවය වැඩි දියුණු කිරීම සඳහා සියළුම වර්ගයන්ට අයත් තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් උපලේඛනගත අභ්‍යන්තරික, බාහිර හා විදේශීය පුහුණු වැඩ සටහන් වෙත යොමු කරනු ලැබිණ. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විශාල පිරිසකට සහභාගි විය හැකි වන පරිදි මේ පරමාර්ථය සඳහා බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින්ද ඵලදායිතා සංවර්ධන වැඩ මුළු දෙකක් සංවිධානය කරන ලදි.

අයපත්කරණයේ නිරවද්‍ය තාවය වැඩි දියුණු කිරීම සඳහා සහ පාරිභෝගිකයින් වෙත ලබා දෙනු ලබන සේවාවේ

ගුණාත්මය වැඩි දියුණු කිරීම සඳහා ද කලාපය පුරාම මනුකියවීම් විගණනයන් හා දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු යෙදීම සිදු කරන ලද්දේය.

**බටහිර - දකුණ**

බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය, බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලයෙන් හා කළමනාකරු (දෙහිවල) ප්‍රදේශය, කළමනාකරු (පානදුර - හොරණ) ප්‍රදේශය හා කළමනාකරු (කළුතර) ප්‍රදේශය භාර කළමනාකරුවන්ගේ කාර්යාල 3 න් සමන්විත වේ.

2016 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ විශේෂ සිදු වීම් ගණනාවක් සිදු විය. 2015 වර්ෂය සඳහා ජාතික ඵලදායිතා මහ ලේකම් කාර්යාලය විසින් පවත්වන්නට යෙදුන 2015 ජාතික ඵලදායිතා ප්‍රදාන තරඟයෙන් බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය මධ්‍ය පරිමාණ සේවා අංශයෙන් 2 වැනි ස්ථානය දිනා ගත් අතර දෙහිවල කළමනාකාර කාර්යාලය කුඩා පරිමාණ සේවා අංශයෙන් ප්‍රශංසා ප්‍රදානයක් දිනා ගත්තේය.

ධනාත්මක චින්තනය, ආකල්ප වෙනස් කිරීම හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා වූ තත්ත්ව පාලන කව මෙවලම් ආදිය පිළිබඳ විශේෂ වැඩ සටහන් සහ ජනවාරි 1 වැනි දින පිරිත් සජ්ඣායනා උත්සවය සහ ඊට අමතර ලෙස අලුත් අවුරුදු, වෙසක්, පොසොන් හා නත්තල් උත්සවය වැනි අවස්ථාවන්ද පවත්වන ලද්දේය. තවද අඟුලාන පොදු ජය විද්‍යාලයයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් අභ්‍යාස පොත්, පාසැල් බෑග් හා වෙනත් අධ්‍යාපනික උපකරණ බෙදා දීම ද, කඩුවෙල ප්‍රදේශයේ ගං වතුර උවදුරට ගොදුරු වූවන් වෙනුවෙන් ආහාර මුල් හා ඇඳුම් බෙදා දීම ද වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදි.

කලාපය තුළ ආදායම් රහිත ජලය අඩු කිරීමේ බොහෝ ක්‍රියාකාර කම් සිදු කරන ලද අතර පානදුර - හොරණ ප්‍රදේශයේ ආදායම් රහිත ජලය 3.7% කින් අඩු කිරීමට හැකි විය. 2016 වර්ෂය තුළදී සිදු කරන ලද බොහෝ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතීන් මධ්‍යයේ වුවද දෙහිවල හා කලූතර ප්‍රදේශයන්හි ආදායම් රහිත ජලය පිළිවෙලින් 30% කට හා 18% කට අඩු මට්ටමකින් පවත්වා ගැනීමට හැකි විය.

ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් ද ඇතුළු ප්‍රදේශ කිහිපයක් තුළ ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ කටයුතු හා ජල සුරක්ෂිතතා ක්‍රියාකාර කම් සිදු කරන ලදි. ජල සම්පාදන යෝජනා ක්‍රම 08 ක් වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුමෙහි සියළුම මොඩියුලයන් ද, ජල සම්පාදන යෝජනා ක්‍රම 2 ක් සඳහා මොඩියුල 6 දක්වා සහ ජල සම්පාදන යෝජනා ක්‍රම 4 ක් වෙනුවෙන් මොඩියුල 4 දක්වා ද වර්ෂය තුළ දී සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලදි. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජල සම්පාදන යෝජනා ක්‍රම දෙකක් තාක්ෂණික විගණනයට භාජනය කරන ලද අතර ඒ යෝජනා ක්‍රම දෙකම සාමාන්‍ය තත්ත්වයෙන් පවතින බවට එම සංවිධානය විසින් තහවුරු කරන ලද්දේය. කලාපය තුළ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 125 මගින් සම්බන්ධතා 13,160 ක් හරහා ප්‍රතිලාභී පවුල් 65,000 කට වැඩි සංඛ්‍යාවක් වෙත සේවය සපයනු ලබයි.

තවද කිලෝ මීටර් 103.5 ක මුළු දිග ප්‍රමාණයක නල මාර්ග දීර්ඝ කිරීම් නිම කරනු ලැබ ඇති අතර ඊට කළුතර ප්‍රදේශයේ කිලෝ මීටර 19 ක් ද, පානදුර - හොරණ ප්‍රදේශයේ කිලෝ මීටර 81 ක් හා දෙහිවල ප්‍රදේශයේ කිලෝ මීටර 3.5 ක් ඇතුලත් වේ. බොහෝ ප්‍රතිරෝපණ හා පුනරුත්ථාපන ක්‍රියාකාර කම් ද වර්ෂය මුළුල්ලේම සියළුම ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කරන ලදි. එ සේම දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන රුපියල් බිලියන 3.5 ක සම්බන්ධතා නගා සිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ලැබුණ මුදල් හා කළුගඟ ව්‍යාපෘතියෙන් ඉතිරි කර ගත් මුදල් ද උපයෝගී කර ගනිමින් බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් කඩිනම් නව සම්බන්ධතා දීමේ හා පයිප්ප එලීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කරමින් පවතී.

වියලි කාලගුණික තත්ත්වය හේතු කොට ගෙන කළුතර කළමනාකරණ ප්‍රදේශය දරුණු ලවණතා ආක්‍රාන්ති ගැටළුවකට මුහුණ පෑවේය. මෙම ගැටළුවට තාවකාලික විසඳුමක් වශයෙන් මුළු කළුතර කළමනාකරණ ප්‍රදේශය ආවරණය වන සේ බවුසර මගින් ජලය සම්පාදනය කිරීම ආරම්භ කරන ලද අතර කළු ගඟ හරහා ස්ථාවර ලවණතා බාධකයක් ඉදි කිරීම පිණිස එල්එච්අයි විසින් පාරිසරික බල පෑම් තක්සේරු වාර්තාවක් පිළියෙල කරන ලදි. දෙහිවල කළමනාකරණ ප්‍රදේශයේ පිහිටි සීඑම්සී ජලාශය ජලය කාන්දු නොවන සේ නවීකරණය කිරීම ජල සම්පාදනය සම්බන්ධයෙන් කිසිදු බාධාවකින් තොරව හා පාරිභෝගික ජනතාවට අවම අපහසු තාවයක් ඇති වන පරිදි මාස 3 ක් ඇතුලත නිම කරන ලද්දේය.

2016 වර්ෂය තුළදී මග්ගොන පොම්පාගාරයේ සිට මග්ගොන නගරය වෙත මිලි මීටර 250 ක විෂ්කම්භයකින් යුත් පොම්ප කිරීමේ ප්‍රධාන මෘදු යකඩ නල මාර්ගයක් එලීම ආරම්භ කරන ලද අතර එම කර්තව්‍යය දැන් එහි අවසාන අදියරට පැමිණ තිබේ. (දුම්රිය මාර්ගය හරහා යාම, විෂ බීජ නාශනය, නල මාර්ගය සෝදා හැරීම හා දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ කිරීම ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා ඉතිරි වී තිබේ). මේ සඳහා භාවිතා කරනු ලබන්නේ හරි වැරදි බැලීමේ සමීක්ෂණ හා කම්බි යොදා දැඩි කළ කොන්ක්‍රීට් ටැංකි සඳහා වන අරමුදල් වේ. කළුතර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - පියවර 11 යටතේ වූ බේරුවල කම්බි යොදා දැඩි කළ කොන්ක්‍රීට් ටැංකි ඉදි කිරීමේ කටයුතු හා අළුත්ගම - මතුගම මාර්ගයේ මිලි මීටර් 150 විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ නල එලීමේ කටයුතු ද 2016 වර්ෂය තුළදී නිම කරන ලදි.

වසර තුළදී විශේෂ විමර්ෂණ ඒකකය විසින් සැක සහිත නීති විරෝධී සම්බන්ධතාවයන් 1608 ක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ඒ අතරින් සම්බන්ධතාවයන් 186 ක් නීති විරෝධී සම්බන්ධතාවයන් වශයෙන් තහවුරු කර ගැනීමට හැකි විය. එම නීති විරෝධී සම්බන්ධතාවයන් 186 අතරින් සම්බන්ධතාවයන් 61 ක් සොයා ගන්නා ලද්දේ දෙහිවල ප්‍රදේශයෙනි (දෙහිවල කලාපයේ සම්බන්ධතාවයන් 454 ක් විමර්ශණයට භාජනය කරන ලදි).

**බටහිර - උතුර.**



**බියගම - මාබිම ජලනල ඇතිරීම**

ප්‍රාග්ධන අය වැය භාවිතා කරමින් නගර සභා හා ප්‍රාදේශීය සභා පාරවල් උපයෝගිතා සීරු මාරු කිරීම සිදු කෙරෙමින් පවතී. බියගම, කැළණිය, මහර හා ජා ඇල ප්‍රදේශයන්හි මහා මාර්ග ප්‍රතිස්ථාන ගත කිරීම් 8 ක් හා මීගමුව ප්‍රදේශයේ මහා මාර්ග ප්‍රතිස්ථාන ගත කිරීම් 11 ක් උපයෝගිතා සීරු මාරු කිරීම් අරමුදල් යටතේ ආරම්භ කරනු ලැබ ඇත.

සෝන්ඩර්ස් පෙදෙසේ බිම් ජලාශයෙහි කාන්දු අළුත්වැඩියාව හා බම්බුකුලිය ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ගබඩාව හා වැඩ පොළ ඉදි කිරීමේ කටයුතු බීඅයි ජල අරමුදල යටතේ සිදු කරන ලදි.

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ අරමුදල් යොදා ගනිමින් කරන ලද කටුනායක ගුවන් තොටු පොල / ආයෝජන මණ්ඩල ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ ජලය ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජලාශය ඉදි කිරීමේ හා පොම්පාගාරය ඉදි කිරීමේ කටයුතු නිම කරනු ලැබ ඇත. පොම්ප පරීක්ෂණයට භාජනය කිරීම හා ජලාශයේ විෂ බීජ නාශක කටයුතු සිදු කළ යුතුව තිබේ.

2016 වර්ෂය තුළදී මෙහෙයුම් හා නඩත්තු අරමුදල් හා ආදායම් රහිත ජලය අඩු කිරීම සඳහා වූ අරමුදල් යොදා ගනිමින් ඉටු කරන්නට යෙදුන ඇතැම් ආදායම් රහිත ජලය අඩු කිරීම හා සම්බන්ධ ක්‍රියාකාර කම් වූයේ දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම, බෙදා හැරීමේ පද්ධතීන් තුළ වාර්තා කරනු ලැබ ඇති ජල කාන්දු වීම් අළුත්වැඩියා කිරීම, වාර්තා කරනු ලැබ තිබී සේවා කාන්දු වීම් අළුත්වැඩියා කිරීම, රද්දොලුවේ පැහැදුම් ජල දෙණෙහි කාන්දු අළුත්වැඩියා කිරීම හා මීගමුවේ ජල කුළුණු වල අළුත්වැඩියා කටයුතු කිරීම ද වේ.

පුනරුත්ථාපන අරමුදල යටතේ මෙම වර්ෂය තුළදී සිදු කරනු ලබමින් තිබුණ ක්‍රියාකාර කම් වල ප්‍රගතිය වශයෙන් කැළණිය ශුද්ධ නගරය ආශ්‍රිත සිවිල් වැඩ කටයුතු හා ටීඑන්සී කලාපයේ ගබඩාව ඉදි කිරීම, කඩවත ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ කොන්ක්‍රීට් පාර ඉදි කිරීම, කඩවත ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ රැඳැවුම් බැම්ම ඉදි කිරීම (මෙය ඉදි කරන ලද්දේ මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය විසිනි), රද්දොලුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ, රන් පොකුණ ගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ හා මීගමුව නිෂ්පාදන අංශයේ නිල නිවාස අළුත්වැඩියා කිරීම, මීගමුව රසායනාගාරයේ, යක්කල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ, රන් පොකුණ ගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ හා කිරිඳිවල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බැඳුන පුරුක් දැල, ගේට්ටුව හා ආරක්ෂක කුටිය ඉදි කිරීම හා මිනුවන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බැඳුන පුරුක් දැල ඉදි කිරීම ද පෙන්වා දෙනු ලැබේ. මීට අමතරව, කටානේ ගබඩාව ඉදි කොට නිම කරන ලද්දේද පුනරුත්ථාපන අරමුදල් යටතේ වේ.

මංගලතිරිය තුළු මුව සඳහා තල බමර පොම්ප කිරීමේ කට්ටල 4 ක් ස්ථාපිත කිරීමද, ගම්පහ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා යක්කල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ද ගෑස් ක්ලෝරිනේටර 4 ක් ස්ථාපිත කිරීම ද, රන්පොකුණ වත්ත ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට කිලෝ වෝල්ට් ඇම්පියර 250 විදුලි ජනක යන්ත්‍රයක් සපයා දීම ද, දිවුලපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා මිහි විදමන් පොම්ප 3 ක් සවි කර දීම හා මිනුවන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා මිහි විදමන් පොම්ප 3 ක් සවි කර දීමද පුනරුත්ථාපන අරමුදල් භාවිතා කරමින් සිදු කරන ලදි. රද්දොලුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පැරණි කිලෝ වෝල්ට් ඇම්පියර 400 විදුලි ජනක යන්ත්‍රය සේවා කර අළුත්වැඩියා කොට සවි කිරීම ද, දෙකටන ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් පැරණි ජල පොම්පය ඉවත් කොට එය හුවන පොම්පයක් වශයෙන් (මෙහෙයුම් හා නඩත්තු අරමුදල් භාවිතා කරමින්) ශ්‍රී බෝධි කුළුණට සවි කිරීම හා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ අරමුදල් භාවිතා කරමින් බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලයට සංවෘත පරිපථ රූප වාහිනී කැමරා සවි කිරීමද මෙම වර්ෂය තුළදී බල ශක්ති සංරක්ෂණ හා ආයතනික සංවර්ධන ක්‍රියාකාර කම් වශයෙන් නිම කරන ලද්දේය.

ප්‍රති ආරෝපණ අරමුදල් යොදා ගනිමින් කොළඹ - කටුනායක අධි වේගී මාර්ගය සඳහා නල මාර්ග ප්‍රති ස්ථාන ගත කිරීම හා කොටදෙනියාව - මීරිගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හා අදාල බෝක්කු හරස් මාරුවේ නල එලීම ද 2016 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. තවද, කුරණ දුම්රිය රක්ෂිතයේ නල මාර්ග ප්‍රති ස්ථාන ගත කිරීම හා දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ කටයුතු නිසා නායක පාරේ මිලි මීටර් 600 මෘදු යකඩ ප්‍රධාන පොම්ප කිරීම් නල මාර්ගය ප්‍රති ස්ථාන ගත කිරීම ද, ගනේමුල්ල ගුවන් පාලම පිහිටි ස්ථානයේ හා කඩුවෙල පාලමේ නල මාර්ග ප්‍රති ස්ථාන ගත කිරීම ද සිදු කරන ලදි. පිටත වටරවුම් මහා මාර්ගයේ නල මාර්ග තාවකාලික ලෙස ප්‍රති ස්ථාන ගත කිරීම හා මහනුවර මහා මාර්ගය දිගේ හා මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ හරස් මාරු සඳහා නල මාර්ග ප්‍රති ස්ථාන ගත කිරීමේ කටයුතු ද ප්‍රති ආරෝපණ අරමුදල් යටතේ දැනට සිදු කෙරෙමින් පවතී.

යක්කල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ තුළු මුව වැඩි දියුණු කිරීම, මල්වාන ප්‍රදේශයේ ජලය බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මිලි මීටර 400 ක විෂ්කම්භයෙන් යුත් නල මාර්ග එලීම, පමුණුගම පාරේ මිලි මීටර් 110 ක විෂ්කම්භයකින් යුත් නල මාර්ග නැවත එලීම, බියගම ප්‍රදේශයේ දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම, මටගොඩ මාර්ගය දිගේ නල මාර්ග එලීම, රද්දොලුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ගල්ලවත්ත කුළුණෙහි මිලි මීටර් 160 පීවීසී සෝදාව නල මාර්ගය එලීම, වේයන්ගොඩ මංගලතිරිය නල මාර්ග එලීම, රද්දොලුගම ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ තොග මනු හා වාතන වෑල්ව සවි කිරීම හා මිනුවන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ තොග මනු සවි කිරීම ප්‍රති ආරෝපන ඉතිරි කිරීම් යොදා ගනිමින් සිදු කරන ලදි.

පහල යාගොඩ ප්‍රදේශය වෙත ජල සම්පාදනය කිරීම, දිවුලපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය, බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සඳහා ප්‍රතිකාරක යන්ත්‍රාගාර, සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධති වැඩි දියුණු කිරීම් සහ මීරිගම ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි පියවර ද වර්ෂය තුළදී ව්‍යාපෘති අගැයුම් කමිටුවේ අනුමැතිය ලැබූ ව්‍යාපෘතීන් වේ.

කිරිඳිවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා රන්පොකුණගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සඳහා වූ සවිස්තරාත්මක සැලැසුම් නිම කරනු ලැබ ඇති අතර, ගම්පහ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා දිවුලපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සඳහා වූ සවිස්තරාත්මක සැලැසුම් අඩ වශයෙන් නිම කරනු ලැබ ඇත. මීරිගම ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 වැනි පියවර සඳහා යෝජනා ඉල්ලා සිටීමේ ලේඛනය ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සකස් කරනු ලැබ ඇති අතර එය 2016 වර්ෂය අවසානයේදී ප්‍රලේඛන අගැයීමේ කටයුතු සඳහා නිකුත් කරනු ලැබ ඇත්තේය. සවිස්තරාත්මක සැලැසුම් පිළියෙල කර ඇත. පහල මට්ටමේ ප්‍රවාහ තත්ත්වයන් හේතු කොට ගෙන මා ඔයෙන් ජලය ලබා ගැනීමට වාරිමාර්ග අනුමැතිය ලබා ගැනීමේ ගැටළුව හා අරමුදල නොමැති කම නිසා ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත් පත් කර ගැනීමට ඇති දුෂ්කර තාවය මේ සම්බන්ධයෙන් මුහුණ දීමට සිදු වී ඇති ප්‍රධාන ගැටළු වේ.

තවලම්පිටිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා කේන්ද්‍රාපසාරී පොම්ප කට්ටලයක් හා පනේල පුවරුවක් සැපැයීම වැනි ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ක්‍රියාකාර කම් නිම කරන ලද අතර, මීතිරිගල හා අකරගම ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ යෝජනා ක්‍රමයන් වෙනුවෙන් නව මිහි විදමනක් නිර්මාණය කිරීම, ඝණ මීටර 40 ක ධාරිතාවයකින් යුත් දැඩියම් කළ සිමෙන්ති ටැංකියක් සැපැයීම, පාලන කුටියක් ඉදි කිරීම, නල මාර්ග එලීම හා පොම්පයක් හා පනේල පුවරුවක් සපයා සවි කිරීම දැනට 85% ක් නිම කරනු ලැබ ඇත. හපනාකන්ද ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් ප්ලාස්ටික් නොකළ පිවීසී පයිප්ප හා සවි කිරීම් සැපයීම 40% ක් නිම කරනු ලැබ ඇත. නිකහැටිකන්ද ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයෙන් විදුලි බලය ලබා දීම, පොම්ප අළුත්වැඩියා කිරීම හා ටැංකියේ කාන්දු අළුත්වැඩියා කිරීම 20% ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. තරාල, කුට්ටිවිල, දංගල්ල සහ උඩුගොඩ ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ යෝජනා ක්‍රම ව්‍යාපෘති සඳහා අරමුදල් ලැබී ඇති අතර 2017 වර්ෂය තුළදී වැඩ කටයුතු කරනු ලබනවා ඇත (අරමුදල් ලැබී ඇත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලිනි).

බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයේ චර්ච් හිල්හි පිහිටි ඝණ මීටර 18,000 ක ධාරිතාවයකින් යුත් නව ජලාශය පිරිසිදු කිරීමේ කටයුතු ද 2016 වර්ෂය තුළදී සිදු කොට නිම කරන ලදි.

2016 වර්ෂය තුළ සපයන ලද සම්බන්ධතා 18,495 ද ඇතුළුව බටහිර උතුර සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානයට සපයනු ලැබ ඇති මුළු සම්බන්ධතා සංඛ්‍යාව 256,312 ක් වේ.

නිරන්තර ජල නියැදි වැඩ සටහන හා නල මාර්ග සෝදා හැරීමේ වැඩ සටහන අඛන්ඩව කරගෙන යන ලද අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුව ජලයේ ගුණාත්මය පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි.

ගං වතුර උවදුරට ගොදුරු වූ ප්‍රදේශයන්හි පිහිටි ළිං පිරිසිදු කිරීමේ කටයුතු වලට බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය දායකත්වය ලබා දුන්නේය. බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්යාලය හා අනුබද්ධ ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය දැනට 95% ක් නිම කරනු ලැබ ඇත.

**දකුණ.**



**බද්දේගම හික්කඩුව අධිවේගී මාර්ග ප්‍රවේශ මාර්ගයේ නල මාර්ග එලීම.**

2016 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සෞඛ්‍ය වැඩසටහන්, 'ධනාත්මක චින්තනය' පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්, මහාරෝග්‍ය ශාලාවේ ආරෝග්‍ය ශාලා ගොඩනැගිල්ල නවීකරණය කිරීම, සුහද හමුව, කොළඹ ප්‍රදේශයේ ගං වතුරට මුහුණ දුන් අය සඳහා ආධාර ලබා දීම, ක්‍රිකට් තරග සංවිධානය, දිළිඳු පවුලක් වෙනුවෙන් නිවාසයක් ඉදි කර දීම හා පාසැල් දරුවන් වෙනුවෙන් දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් කිහිපයක් පැවැත්වීම වැනි විශේෂ සිදු වීම් සංවිධානය කරන ලදි.

ජල මනු ප්‍රති ස්ථාන ගත කිරීම හා දෝෂ සහිත මනු මුද්‍රා තැබීම, නව සම්බන්ධතා සැපැයීමේ ක්‍රියාවලිය දියුණු කිරීම, ප්‍රමාණවත් නිරවද්‍ය තාවයකින් යුක්තව ආදායම් රහිත ජලය තක්සේරු කිරීම, ජලය කාන්දු වීම් අවම කිරීම, ජලය බෙදා හැරීම වැඩි දියුණු කිරීම, භාවිතා කරනු ලබන ද්‍රව්‍යයන්ගේ ගුණාත්මය සහතික කිරීම හා නීති විරෝධී සම්බන්ධතාවයන් විසන්ධි කිරීම වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාර කම් වලින් සමහරක් වේ.

බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාර කම් යටතේ, ගිල්විය හැකි ප්‍රණාල පාද වර්ගයේ පොම්ප කිරීමේ කට්ටල 3 ක් ස්ථාපිත කිරීම, රන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කට්ටකඩුව තුළු මුව සඳහා ප්‍රණාල පාද වර්ගයේ පොම්ප කිරීමේ කට්ටල ක්‍රියාත්මක කිරීම පිණිස බිම සවි කරන ලද වීඑෆ්ඩී තුනක් සහිත මෝටර පාලනය කිරීමේ පනේලයක් හා වෙනත් උපාංග සැපැයීම, අඟුනකොලපැලැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් කෙළවර චූෂණ සිරස් පමුණු බහු පියවර කේන්ද්‍රාපසාරී පොම්ප කිරීමේ කට්ටල හා උපාංග සපයා ස්ථාපිත කිරීම හා ගාල්ල කලාපය සඳහා මං මාරු ආකාරයේ විදුලි බල ධාරක පුවරු ස්ථාපිත කිරීම නිමවනු ලැබ ඇත. දුර්වල බල සාධක නිවැරදි කිරීම සඳහා කද්දුවේ, උයන්වත්තේ හා ඉසදීන් නගරයේ පිහිටි පොම්පාගාර වෙනුවෙන් විදුලි බල ධාරක පුවරු සපයා ස්ථාපිත කිරීම හා දුර්වල බල සාධක සහිත ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් විදුලි බල ධාරක පුවරු සපයා ස්ථාපිත කිරීම සිදු කරමින් පවතින අතර එම කටයුතු නිම කළ යුතුව ඇත.

තංගල්ල, කිරින්ද, පුහුල්වැල්ල, මාතර කණ්ඩායම හා පිටිගල යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල ගුණාත්ම ප්‍රවීක්ෂණය, ජල ආරක්ෂක ක්‍රියාකාර කම් හා ජල සුරක්ෂිතතා සැලැසම් ක්‍රියාත්මක කරන ලදි. මීට අමතර ලෙස කිලෝ මීටර් 57 ක නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර ඊට ගාල්ල කලාපයේ දීර්ඝ කිරීම් කිලෝ මීටර 21 ක් ද, මාතර කලාපයේ දීර්ඝ කිරීම් කිලෝ මීටර් 8ක් හා හම්බන්තොට කලාපයේ දීර්ඝ කිරීම් කිලෝ මීටර 28 ක් ද ඇතුලත් වේ.

ගාල්ල කලාපයේ සංවර්ධන ක්‍රියාකාර කම් යටතේ පෙරණයන් 3 ක් අළුත්වැඩියා කිරීම, හපුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත පෙරණ නොසල සැපැයීම, ආර්එච් අරමුදල් යටතේ පෙරණ මාධ්‍යයන් සැපැයීම හා කිලෝ මීටර 21 ක් දිග බෙදා හැරීමේ නල මාර්ග එලීම ද මෙම වර්ෂය තුලදී ඉටු කරන ලදි.

වර්ෂය තුළදී මාතර කලාපය තුළ බොහෝ සංවර්ධන කටයුතු සිදු කරනු ලැබිණි. දිනකට ඝණ මීටර 2500 - 3000 ක් අතර අතිරේක ධාරිතාවයක් පද්ධතිය තුළට එකතු කිරීමෙන් හා නාදුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට තුඩාව ප්‍රදේශය වෙත මිලි මීටර 225 ක විෂ්කම්භයෙන් යුත් කිලෝ මීටර 3 ක් දිග ප්‍රධාන බෙදා හැරීමේ නල මාර්ගයක් එලනු ලැබීමෙන් නාදුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරන ලදි. දිනකට ඝණ මීටර 800 ක අමතර ධාරිතාවයක් ලබා ගනු පිණිස හල්ලාල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ අමු ජල ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා කනන්කේ තුළු මුව පිහිටි ස්ථානයේ අමු ජල ප්‍රධාන මාර්ගය නැවත සකස් කරන ලදි. ලැබෙන ජල ප්‍රමාණය වර්ධනය කිරීම පිණිස හා අමු ජල ගුණාත්මයේ යකඩ සංයුතිය අඩු කිරීම සඳහා වාර්ෂික වැඩ සටහනට අනුව කරගොඩ - උයන්ගොඩ, තිහගොඩ, හක්මන හා මාකඳුර ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි නල ළිං සංවර්ධනය කරන ලදි.

කරගොඩ - උයන්ගොඩ නව ගැඹුරු නල ළිඳක් ඉදි කිරීම, අමු ජල ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා තිහගොඩ අළුත් නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම හා අකුරැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සිට මාලිම්බඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත දිනකට ජලය ඝණ මීටර 1000 ක් ගෙන යාම සඳහා අමලගොඩ හන්දියේ සිට දම්පැල්ල දක්වා අකුරැස්ස - මාතර මහා මාර්ගය දිගේ පයිප්ප එලීම ද මෙම කලාපය තුළ සිදු කරන ලදි.

විසල් ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය, නාගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත ජල සම්පාදනය කිරීම, වඳුරඹ ජල සම්පාදන යෝජනා ක්‍රමය, දෙයියන්දර ජල සම්පාදන යෝජනා ක්‍රමය, ලුනුගම්වෙහෙර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම, කිරින්ද ජල සම්පාදන යෝජනා ක්‍රමය හා බුන්දල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා සාධ්‍යතා වාර්තා පිළියෙල කරන ලදි.

පිටිගල ජල ගුණාත්මය පිළිබඳ වාර්තාව හා ව්‍යාපෘති අගැයීම් කමිටු වාර්තාව ප්‍රතිකාරක ක්‍රියාවලීන් අවසන් කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශයේ ප්‍රධාන ඉංජිනේරු වරයා වෙත යොමු කරන ලදි. නෙලුව, ගාල්ල මහ නගර සභා ප්‍රදේශයේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, ඉමදුව ජල සම්පාදන යෝජනා ක්‍රමය හා කරන්දෙනිය ප්‍රදේශය වෙත ජල සම්පාදනය කිරීම සම්බන්ධ යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇත. යක්කලමුල්ල හා ගොඩදෙනිය නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කරනු ලබනවා ඇත. විසල් ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ 111 වැනි පියවර සඳහා වූ නව ඇස්තමේන්තුව ව්‍යාපෘති අගැයීම් කමිටුව විසින් අනුමත කරනු ලැබ ඇති අතර එම යෝජනාව අනුමැතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. ඌරුබොක්ක ජල සම්පාදන යෝජනා ක්‍රමය, දෙනියාය ජල සම්පාදන යෝජනා ක්‍රමය හා මොරවක ජල සම්පාදන යෝජනා ක්‍රමය, මිද්දෙනිය අඟුනකොලපැලැස්ස ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය, වීරකැටිය 11 වැනි පියවර ජල සම්පාදන යෝජනා ක්‍රමය (මුරුතවෙල ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම, තුළු මුව ඉදි කිරීම හා බෙදා හැරීම වැඩි දියුණු කිරීම), බරවකුඹුර සහ රෝටේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, කිරම කටුවන ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය (කැකිරිඕබඩ ජලාශය යොදා ගනිමින්) හා රුහුණු පුර ජල සම්පාදන යෝජනා ක්‍රමය 11 වැනි පියවර (දිනකට ඝණ මීටර 17,500 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් රිදියගම ඉදි කිරීම සඳහා සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම) සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය යාවත්කාලීන කළ යුතු අතර තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ගුණාත්මය හා ධාරිතාව වැඩි දියුණු කිරීම සාධ්‍යතා අවස්ථාවේ පවතී.

බොහෝ ව්‍යාපෘතීන් සැලැසුම් කිරීමේ අවස්ථාවේ ඇති අතර ඒවා නම් ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1,595 කි), වක්වැල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1,265 කි), හපුගල ජල ප්‍රතිකාරක

යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1,579 කි), බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1,368 කි), හම්බන්තොට වරාය පරිශ්‍රය වෙත ජලය සම්පාදනය කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 122 කි), කද්දුව තුළු මුව ක්‍රියාත්මක කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 241 කි), වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් හල්ලල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 256 කි), ඇල්ලකන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 433 කි), මාතර ජල සම්පාදන ව්‍යාපෘතියේ **vi** වැනි පියවර (බල ශක්ති තොරතුරු පරිපාලන වාර්තාව පිළියෙල කිරීම හා ලවණතා බාධකය අධ්‍යයනය හා සැලසුම් කිරීම සඳහා උපදේශකත්වය - ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 20 කි) හා සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 22.208 කි), වීරකැටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ඝණ මීටර 5000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා පා වෙන තුළු මුවක් ඉදි කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 513 කි), අඟුනකොලපැලැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 483 කි), රන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් තුළු මුව පොම්පය වෙනුවන නව පොම්පයක් සවි කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 358 කි) හා තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ගුණාත්මය හා ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනාව පිළියෙල කිරීම (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 392 කි) ද වෙති.

2016 වර්ෂය තුළදී ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ කටයුතු රාශියක් ඉටු කරන ලදි. අකුරැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමය නියමු ව්‍යාපෘතියක් වශයෙන් තෝරා ගන්නා ලද අතර ධ්වනිය අනුව කාන්දු සොයා ගැනීමට හා ඒ අවස්ථාවේදීම එම කාන්දු අළුත්වැඩියා කිරීම සඳහා කණ්ඩායමක් පත් කරන ලදි. මාතර කලාපයේ සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල සිතියම් පිළියෙල කිරීම යාවත්කාලීන කිරීම 100% ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. එක් එක් ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාලව දිස්ත්‍රික් මනුකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැසුමක් පිළියෙල කරන ලදි. ප්‍රධාන අමු ජල නල මාර්ගයේ හා ප්‍රධාන ප්‍රතිකාර කරන ලද ජල නල මාර්ගයේ ප්‍රවාහ වේගය මැණීමේ කටයුතු 75% ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. මාතර කලාපය තුළ මට්ටම් මන්තු කිරීමේ ක්‍රමයක් සවි කරනු ලැබ ඇත. ශුන්‍ය අගයකින් යුත් අයපත් හා ඇස්තමේන්තු කරන ලද අය පත් පරීක්ෂා කිරීම අඛන්ඩව කරගෙන යන ලද අතර ඒවාට අදාල විසන්ධි කිරීමේ වැඩ සටහන් මාසික පදනමක් මත ක්‍රියාත්මක කරන ලදි. ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ සටහන වැඩි දියුණු කිරීම සඳහා කාන්දු පරීක්ෂා කරන උපකරණයක් හා නල මාර්ග සොයා ගන්නා උපකරණයක් මිළ දී ගන්නා ලදි. කාන්දු වීම වැලැක්වීමේ නඩත්තු කටයුතු සිදු කරන ලදි. මාලිම්බඩ, වැලිගම, කරගොඩ උයන්ගොඩ හා මාකඳුර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ රාත්‍රි කාලයේදී සිදු වන කාන්දු වීම් සොයා ගැනීමේ සමීක්ෂණයක් පවත්වන ලදි. සෑම යෝජනා ක්‍රමයක් තුළම නීති විරෝධී සම්බන්ධතා සොයා ගැනීමේ පරීක්ෂණ දියත් කරන ලදි.

**උතුරු මැද.**

2016 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ සිදු වූ විශේෂ සිදු වීම් වන ලද්දේ අළුත් අවුරුදු උත්සවය, ධර්ම දේශනා වැඩ සටහන්, සංස්කෘතික සමිති වැඩ සටහන්, සුහද හමුව, වවුනියාව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සමග පවත්වන ලද ක්‍රිකට් තරඟය හා අම්පාර ප්‍රදේශය වෙත ගිය වාර්ෂික විනෝද චාරිකාවද වේ.

විශේෂයෙන්ම ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ 11 වැනි අදියර යටතේ වූ නව ව්‍යාපෘතීන් හා පොලොන්නරුව නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා කරන ලද ඉඩම් අත් පත් කර ගැනීම් ද ඇතුළුව ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු කිසිදු දුෂ්කරතාවයකින් තොරව කළ හැකි විය. ඉහත සඳහන් කළ ව්‍යාපෘතීන් වෙනුවෙන් අත් පත් කර ගැනීම සඳහා දැනටමත් ඉඩම් කොටස් හතලිස් හතක් හඳුනාගනු ලැබ ඇත. අත් පත් කර ගන්නා ලද අනිකුත් ඉඩම් වෙනුවෙන් කලින් තීරණය කර ගත් පරිදි දීර්ඝ කාලීන බදු ගෙවනු ලැබේ.

විසල් අනුරාධපුර උතුර ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා පිබිදෙමු පොලොන්නරුව යන ව්‍යාපෘතීන් සඳහා 2016 වර්ෂය තුළදී ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය ලැබිණි.

ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්‍ෂණ ක්‍රියාකාරකම් යටතේ රුපියල් දස ලක්‍ෂ 175 ක මුළු පිරිවැයක් දරමින් නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශයෙන් සහ උතුරු මැද පලාත් සභාවෙන් ලැබුණ අරමුදල් භාවිතා කරමින් උතුරු මැද පලාතේ ග්‍රාම නිලධාරි වසම් 63 ක් තුළ ප්‍රතිලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ස්ථාපිත කරන ලදි. උතුරු මැද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ඇති මුළු වත් කම් ප්‍රමාණය රුපියල් දස ලක්‍ෂ 9,977 ක් නියෝජනය කරනු ලබයි.

උතුරු මැද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ඉටු කරන ලද ප්‍රති ආරෝපණ වැඩ කටයුතු වූයේ ප්ලාස්ටික් නොකළ පීවීසී නල මාර්ග හා සවි කිරීම් එලීම සහ කුරුන්දන්කුලම කුළුණේ සිට විශ්ව විද්‍යාලයයේ දෙණ දක්වා දිවෙන ගුරුත්වාකර්ෂණ නල මාර්ග යට වැල්ව සවි කිරීම පමණක් වන අතර එම වැඩ කටයුතු වර්ෂය අවසාන වන විට 25% ක ප්‍රගතියක් සාක්ෂාත් කරගනු ලැබ ඇත.

ආයතන සංවර්ධන ක්‍රියාකාර කම් වශයෙන් සහභාගි වන්නන් 47 දෙනෙකු වෙනුවෙන් භූගෝලීය තොරතුරු පද්ධති උපයෝගි කරගනිමින් සිතියම් සකස් කිරීම පිළිබඳ (දින 2 ක) පුහුණු වැඩ මුළුවක් පැවැත්වීම ද, 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලද නගෝයා ජල නල මාර්ග පුහුණු වැඩ සටහනක් පැවැත්වීම ද, 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වට්ටෝරු පොත් කළමනාකරණ ක්‍රම පුහුණු කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම ද, කලාපීය සහාය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් ජාතික ඵලදායිතා වැඩ සටහන පැවැත්වීම ද, සහභාගි වන්නන් 50 දෙනෙකු වෙනුවෙන් මානව සම්පත් ක්‍රියාකාර කම් පිළිබඳ වැඩ මුළුවක් පැවැත්වීම ද, කලාපයේ සියළුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල සාමාජිකයින් හා මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩ මුළුවක් පැවැත්වීම හා කාර්ය මණ්ඩල සාමාජිකයින් 98 දෙනකුගේ සහභාගිත්වයෙන් පෞද්ගලික තේතුව හා සමාජ සහ ව්‍යාපාරික ආචාර රීතීන් යන මැයින් පුහුණු වැඩ සටහනක් පැවැත්වීම ද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් වර්ෂය තුළදී සිදු කරන ලදි.

2016 වර්ෂය අවසාන වන විට උතුරු මැද පලාත තුළ ජල සම්පාදන යෝජනා ක්‍රම 30 ක් ක්‍රියාත්මක වෙමින් තිබුණ අතර එම යෝජනා ක්‍රමයන් විසින් ජල සම්පාදන සම්බන්ධතාවයන් 107,686 ක් හරහා ජලය සම්පාදනය කිරීමෙහි යෙදී සිටින ලදි. 2016 වර්ෂය තුළ දී පමණක් නව ජල සම්පාදන සම්බන්ධතා 8772 ක් දෙනු ලැබ ඇත. 2016 නොවැම්බර් මාසය දක්වා අයපත් කිරීමේ ඉලක්කය රුපියල් 828,487,000.00 ක් වූ අතර එය සාක්ෂාත් කර ගැනීම රුපියල් 1,002,485,000.00 ක් විය. 2016 නොවැම්බර් මාසය දක්වා මුදල් අය කර ගැනීමේ ඉලක්කය රුපියල් 876,288,000.00 ක් වූ අතර එය සාක්ෂාත් කර ගැනීම රුපියල් 986,077,000.00 ක් විය.

2016 වර්ෂයේ ලෝක ජල දින සමරු වැඩ සටහනේදී ගල්ලෑල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පළමු වැනි ස්ථානය දිනා ගත්තේය. ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධාන 17025 ලබා ගැනීම සඳහා රසායනාගාර පහසුකම් හා ජලයේ ගුණාත්මය හා සම්බන්ධ කටයුතු වැඩි දියුණු කරන ලදි. උතුරු මැද පලාතේ උතුරු කොටසේ ක්‍රියාත්මක වන සියළුම යෝජනා ක්‍රමයන් භූ ගත ජල ප්‍රභවයන්ගෙන් හා මල්වතු ඔයේ මතුපිට ජලයෙන් පෝෂණය වන හෙයින් (උදාහරණ වශයෙන් ක්ෂාරීයතාවය, කඨිනත්වය හා ෆ්ලූඔරයිඩ් ආදී) ඇතැම් ජල ගුණාත්මය හා සම්බන්ධ පරාමිතීන් ඉඩ දිය හැකි මට්ටම් වලට වඩා ඉහල මට්ටමක පවතී. නියං සමයේදී ළිං වලින් ලබාගත හැකි වූ ජලය ප්‍රමාණවත් නොවූ හෙයින් පැය 24 ක ජල සැපයුමක් සහතික කිරීමට බොහෝ ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට නොහැකි විය. තුරුවිල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වූ ජල සුරක්ෂිතතා

සැලැසුම් හා ජල සුරක්ෂිතතා සැලැසුමේ පශ්චාත් තක්සේරුව නිම කරනු ලැබ ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහාය ලබා ගනිමින් තුරුවිල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජල සුරක්ෂිතතා සැලැසුම් විගණනය නිම කරන ලද අතර, ගල්ලෑල්ල, නුවර වැව, ඉහලගම, ශුද්ධ නගරය හා එප්පාවල යෝජනා ක්‍රමයන් සම්බන්ධයෙන් වූ ජල සුරක්ෂිතතා සැලැසුම් සකස් කරමින් තිබෙන අතර අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අවශ්‍ය පුහුණුව එක දිගට දින 3 ක් තුළ අනුරාධපුරයේදී ලබා දෙන ලදි. ඉහත සඳහන් කර්තව්‍යය සඳහා අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් හඳුනා ගෙන ඔවුන් වෙත මූලික පුහුණුව ලබා දෙන ලදි. තුන් මසකට වරක් බැර ලෝහ හා අල්ගේ පැලෑටි පිළිබඳව පිරික්සා බැලීම පිණිස වැව් ජලය ගුණාත්ම විශ්ලේෂණයට භාජනය කිරීම ඇතුළු මූලික භෞතික, රසායනික හා බැක්ටීරියාවේදීය ජල ගුණාත්ම විශ්ලේෂණය කිරීම් කලාපය පුරාම සිදු කරන ලදි.

රසායනාගාරය වැඩි දියුණු කිරීම හා කලාපීය ගබඩාව අළුත්වැඩියා කිරීම වැනි ඵලදායිතාව නංවා ලීමේ ක්‍රියාකාර කම් සිදු කරන ලදි. පොම්ප කිරීමේ ධාරිතාවය හා ප්‍රතිකාරක පහසු කම් වර්ධනය කිරීමේ ක්‍රියාකාර කම් උතුරු අනුරාධපුරයේ, ශුද්ධ නගරයේ, තඹුත්තේගම හා මින්නේරියේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. කාන්දු වීම් 12623 ක් හඳුනා ගෙන ඒ සියල්ලම නිවැරදි කිරීමෙන් ද, දෝෂ සහිත මනු 6190 ක් හඳුනා ගෙන ඒ අතුරින් 6156 ක් නිවැරදි කිරීමෙන් ද, ඇස්තමේන්තු කළ අයපත් 2907 ක් හා ශූන්‍ය අයපත් 6293 ක් නිවැරදි කිරීමෙන් හා රුපියල් 50,000.00 කට වැඩියෙන් හිඟහිටවා තිබුණ සම්බන්ධතා 60 ක් විසන්ධි කිරීමද නිසා 2016 වර්ෂය තුළ ආදායම් රහිත ජලය 18.4% කින් අඩු විය.

**වයඹ.**

වර්ෂ 2016 තුළදී වයඹ සහාය සේවා මධ්‍යස්ථානය විසින් 2014 ඵලදායිතා ප්‍රදාන උත්සවයේදී ලබා ගන්නා ලද ජයග්‍රහණ සැමරීම සඳහා උප සභාපති, සාමාන්‍යාධිකාරී හා අතිරේක සාමාන්‍යාධිකාරී වරුන්ගේ සහභාගිත්වයෙන් විශේෂ උත්සවයක් සංවිධානය කරන ලදි. අප විසින් අභ්‍යන්තර හා බාහිර වෘත්තීය සම්පත් දායකයින්ගේ සහාය ලබා ගනිමින් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් විවිධ මාතෘකාවන් මත පුහුණු සැසි කිහිපයක් ද පවත්වන ලදි.

නල මාර්ග එලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ හා පලාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අවසර ලබා ගැනීම අප විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටළුවක් වශයෙන් හඳුන්වා දිය හැකි වේ. මහා මාර්ග අංශයේ සංවර්ධනයත් සමග බොහෝ මහා මාර්ගයන් පුනරුත්ථාපනය කරනු ලැබ හෝ ගල්තාර තට්ටු වලින් ආවරණය කරනු ලැබ ඇත. එම නිසා නල මාර්ග එලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ හා පලාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරය ලබා ගැනීම බෙහෙවින් දුෂ්කර කාර්යයකි. තවත් ගැටළුවක් වන්නේ ඉඩම් අත් පත් කර ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම් කිරීමයි. බොහෝ අවස්ථාවන්හිදී ඉඩම් අත් පත් කර ගැනීම සඳහා මුදල් ගෙවීම පිණිස අප සතුව ප්‍රමාණවත් අරමුදල් ඇත්තේ නැත.

ප්‍රතිකාර කරන ලද ජලයේ ගුණාත්මය සම්බන්ධයෙන් කිව යුතුව ඇත්තේ 2016 වර්ෂය තුළදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රම 22 කින් ලබා ගත් ජල නියැදි 1026 ක් පරීක්ෂණයට භාජනය කරන ලද බවත්, පරීක්ෂා කරන ලද නියැදීන් අතුරින් බැක්ටීරියාවේදාත්මක ලෙස අනාරක්ෂිත තත්ත්වයක් පෙන්වන ලද්දේ 0.77% ක් පමණක් බව හා නිවැරදි පියවර ගැනීමෙන් එම තත්ත්වය ද නිවැරදි කළ බවත් ය. ප්‍රතිකාරිත ජල නියැදීන් 1026 අතුරින් නියැදීන් 23.19% ක් භෞතික හා රසායනික වශයෙන් අසතුටුදායක තත්ත්වයක පැවැතිනි. එසේ වීමට ප්‍රධාන හේතුව වූයේ ප්‍රතිකාරිත ජලයේ ඉහල වර්ණය හා බොර ස්වභාවය හා මැන්ග නීස් අන්තර්ගත වීම වැනි රසායනික ගැටළු විය. මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 22 අතුරින් සම්පූර්ණ ප්‍රතිකාරක පහසු කම් තිබෙන්නේ ජල සම්පාදන යෝජනා ක්‍රම 5 ක් සතුව පමණකි. අනිකුත් ජල සම්පාදන යෝජනා ක්‍රම සතුව තිබෙන්නේ අර්ධ හෝ සරල ප්‍රතිකාරක පහසු කම් පමණකි. කුරුණෑගල, ගිරිඋල්ල, වාරියපොල හා ගොකරැල්ල යෝජනා ක්‍රමයන්ගේ නිෂ්පාදන ධාරිතාවයන් වර්ධනය කිරීම හා ගුණාත්මය වැඩි දියුණු කිරීමේ කටයුතු 2016 වර්ෂය තුළදී ද අඛණ්ඩ ලෙස කරගෙන යන ලදි.

මතු පිට තුළු මූවයන්හි ජලයේ ගුණාත්මය පසු ගිය වසරේ මෙන්ම මේ වසර තුළදී ද පවත්වාගෙන යන ලදි. වර්ෂයේ අවසාන භාගය වන විට නිරිත දිග මෝසම් වැසි සමයේ ලැබුණ වර්ෂාව අඩු වීම නිසා වර්ෂය අවසාන වන විට ජල මට්ටම් පහත බැස තිබිණි.

2015 වර්ෂය තුළ කරන ලද ආකාරයටම කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ කටයුතු මෙම වසර තුළදී ද සාර්ථක ලෙස කරගෙන යන ලදි. කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් විසින් රැස් කරන ලද බැක්ටීරියාවේදාත්මක ජල නියැදීන් 187 ක් කුරුණෑගල කලාපීය රසායනාගාරය තුළදී නොමිළයේ පරීක්ෂණයට භාජනය කරන ලද අතර එම නියැදීන් අතරින් 17% ක් දූෂණයට බඳුන් වී ඇති බව වාර්තා විය. නිවැරදි කිරීමේ ක්‍රියාකාර කම් නිර්දේශයන්ද සමග එකී පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දෙනු ලැබිණි.

වයඹ කලාපයේ නිකවැරටිය, වාරියපොල, ගිරිඋල්ල, දන්කොටුව හා වෙන්නප්පුව යන ජල සම්පාදන යෝජනා ක්‍රම පහ ජල සුරක්ෂිතතා සැලැසුම් පිළියෙල කිරීම සඳහා 2016 වර්ෂය වෙනුවෙන් තෝරා ගන්නා ලද අතර එම කටයුතු 2017 වර්ෂය තුළදී සම්පූර්ණ කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත.

කටුපොත - බමුණාකොටුව, රස්නායකපුර දීර්ඝ කිරීම හා කල්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය ලබා ගෙන ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රුපියල් දස ලක්ෂ 18,906 ක්, 2,400 ක් හා 12,810.13 ක් වන අතර මුළු ජල සම්පාදනය පිළිවෙලින් දිනකට ඝණ මීටර 1800 ක්, 2500 ක් හා 9000 ක් වේ. මේ අතර ආවරණය කරනු ලබන ජන ගහණය පිළිවෙලින් 134,000 ක්, 19, 835 ක් හා 72,000 ක් වේ.

කුරුණෑගල කලාපය විසින් පළ කරනු ලැබ ඇති මෙහෙයුම් හා නඩත්තු වාර්තා අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආදායම් රහිත ජලය 17% ක් වන අතර පුත්තලම් දිස්ත්‍රික්කයේ එය 14% ක් වේ. වෙනත් කලාපයන් හා සසඳා බලන කල්හි මේවා සාපේක්ෂක වශයෙන් අඩු ප්‍රතිශතයන් වේ.

කිලෝ මීටරයකට ඇති ප්‍රධාන කාන්දු වීම් සංඛ්‍යාව, කිලෝ මීටරයකට ඇති සුළු හා සේවා කාන්දු සංඛ්‍යාව, සම්බන්ධතා 1000 කට ඇති වාණිජ පැමිණිලි සංඛ්‍යාව, සම්බන්ධතා 1000 කට ඇති ඇස්තමේන්තු කරන ලද අය පත් සංඛ්‍යාව හා මනු කියවන්නන්ගේ දෝෂ ප්‍රතිශතය යනාදී වශයෙන් වූ මූලික ආදායම් රහිත ජල දර්ශකයන් වර්ෂය මුළුල්ලේම පසු විපරමට භාජනය කරන ලදි. 2016 මැයි මාසය වන විට ආදායම් රහිත ජලය අඩු කිරීමේ වැඩ සටහන සඳහා කලාපය වෙත රුපියල් දස ලක්ෂ 30 ක මුදලක් වෙන් කරනු ලැබ තිබුණ අතර මෙම අරමුදල් වලින් 30% ක ප්‍රමාණයක් බෙදා හැරීම් පද්ධතිය තුළ කලාපීය වෑල්ව ස්ථාපිත කිරීම සඳහා යොදා ගනු ලැබ තිබිණි. තවද, නිවාස සම්බන්ධතාවයන් සපයා දීමේදී පොලි එතිලින් නල හා සවි කිරීම් භාවිතා කිරීම වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කලාපය තුළ ඇති නීති විරෝධී සම්බන්ධතා සංඛ්‍යාව අවම වී ඇත.

2016 වර්ෂය තුළදී අප විසින් සහාය සේවා කලාපය තුළ ඇතැම් බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාර කම් සිදු කරනු ලැබ ඇත. හෙට්ටිපොල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පොම්ප කිරීමේ ධාරිතාවය වැඩි දියුණු කිරීම පිණිස පහල ඔසොවි පොම්ප හා උපාංගයන් සවි කිරීමේ ව්‍යාපෘතිය විමර්ෂණ අවස්ථාවේ පවතී. යන්ත්‍රාගාරයේ ඉහළ ඔසොවි පොම්ප ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා කුරුණෑගල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ 2 වැනි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉහළ ඔසොවි පොම්පය වෙනුවට නව පොම්පයක් සවි කිරීම ආවරණය කිරීමේ ව්‍යාපෘතිය දැනට ස්ථාපිත කිරීමේ අවස්ථාවේ පවතී. මෙම ව්‍යාපෘතීන් දෙක රුපියල් 2,587,090.00 ක පිරිවැයකට ප්‍රදානය කරනු ලැබ ඇත.

2015 වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තාව අනුව වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව රුපියල් දස ලක්ෂ 368 තොග තිබුණ බව වාර්තා වී ඇති අතර, එය සම්බන්ධතා සංඛ්‍යාව හා සලකා බලන විට ඉතා ඉහල අගයක් විය. මෙම තොග අගය අඩු කිරීම සඳහා සංඛ්‍යාංක ආකාරයේ මධ්‍යගත තොග දත්ත සංචිතයක්

ස්ථාපිත කරන ලද අතර ඒ නිසා කලාපය වෙත වෙන් කර දෙනු ලැබ ඇති වෙන් කිරීම් ඉතිරි කරමින් ප්‍රධාන භාණ්ඩ මිළ දී ගැනීම අඩු වී ඇත.

2015 ඵලදායිතා සම්මාන සඳහා වයඹ කලාපයේ අංශයන් කිහිපයක් විසින් තරඟ කරන ලද අතර ඒ අනුව කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය, භූ ගත ජල කාර්යාලය, කලාපීය රසායනාගාරය හා නිකවැරටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය විසින් ප්‍රශංසාත්මක සහතික දිනා ගනු ලැබිණි.

වර්ෂය තුළදී මිලි මීටර 63 සිට මිලි මීටර 280 දක්වා විවිධ විෂ්කම්භයන්ගෙන් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් කිලෝ මීටර 23 ක් නිම කරන ලද අතර, නව ජල සම්බන්ධතාවයන් 500 ක් සපයා දෙන ලදි. ඊට අමතර ලෙස, ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ නල මාර්ග දීර්ඝ කිරීම් කටයුතු මෙහෙයුම් හා නඩත්තු කටයුතු යටතේද වයඹ කලාපය තුළ සිදු කරන ලද්දේය.

වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රති ආරෝපණ කටයුතු වශයෙන්, රන්දෙනිගම ජල සම්පාදන යෝජනා ක්‍රමය (රුපියල් දස ලක්ෂ 6.5), සහ ආගරවත් ජල සම්පාදන යෝජනා ක්‍රමය (රුපියල් දස ලක්ෂ 4.5) හා සූරිය උයන හා දුම්මලසූරිය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් (රුපියල් දස ලක්ෂ 10.2) සම්පූර්ණයෙන් නිම කරන ලදි. ඒ 6 මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු හා සම්බන්ධයෙන් රුපියල් දස ලක්ෂ 98 ක පිරිවැයක් දරමින් නල මාර්ග ප්‍රති ස්ථාන ගත කිරීමේ කටයුතු ද වර්ෂය තුළ දී නිම කරන්නට යෙදුනි.

2016 වර්ෂය සඳහා පුනරුත්ථාපන වැයක් වශයෙන් රුපියල් දස ලක්ෂ 45 ක් වෙන් කර දී තිබිණි. එම අරමුදල් වලින් කොටසක් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු සම්ප ලෙස පසු විපරම් කිරීම සඳහා අභ්‍යන්තරික වශයෙන් බෙදා හරින ලදි. 2015 අය වැය වර්ෂය සඳහා වූ වෙන් කිරීම රුපියල් දස ලක්ෂ 37 ක් වූ අතර වැය කළ මුදල රුපියල් දස ලක්ෂ 35 ක් විය. මේ අතර 2016 අය වැය වර්ෂය සඳහා වූ වෙන් කිරීම රුපියල් දස ලක්ෂ 7.2 ක් වූ අතර වැය කළ මුදල රුපියල් දස ලක්ෂ 5.3 ක් විය. සමස්ත වැය කිරීම වෙන් කිරීමෙන් 90% ක් විය. මෙම අරමුදල් යොදා ගනිමින් කලාපය විසින් අලුත් පොම්ප ස්ථාපිත කිරීම්, ගබඩා ගොඩනැගිල්ල ඇතුලු ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම් හා ප්‍රතිකාරක යන්ත්‍රාගාර හා බෙදා හැරීම් නල මාර්ග ජාලාව වැඩි දියුණු කිරීමේ කටයුතු ද සිදු කරනු ලැබ ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් රුපියල් දස ලක්ෂ 9 ක් වැය කරමින් පන්නව, හැවන්පැලැස්ස හා පහල කිණියම ප්‍රජා මූල සංවිධානයන් වෙනුවෙන් දිනකට ඝණ මීටර 10 ක ධාරිතාවයකින් යුතු විලෝම ආශ්‍රැති ඒකක 3 ක් සපයා සවි කර දෙනු ලැබ ඇති අතර ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නොදන්නා හේතුන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගයට ගොදුරු වී ඇති රෝගීන් වෙනුවෙන් වර්ෂා ජලය රැස් කිරීමේ ටැංකි 32 ක් සපයා සවි කර දෙන ලදි. අභ්‍යන්තර හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ අරමුදල් වලින් කරන වැඩ කටයුතු හා සම්බන්ධයෙන් එම අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ලද පරිදි ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 52 ක් සඳහා අප විසින් ඇස්තමේන්තු පිළියෙල කර දෙන ලද අතර ඒ අතුරින් රුපියල් දස ලක්ෂ 6.5 ක පිරිවැයක් වැය කොට රාගෙදර බලහින්ගම ජල සම්පාදන යෝජනා ක්‍රමය දැනට ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

අනිකුත් වැඩ කටයුතු අතර දැයට කිරුළ අරමුදල් යටතේ නෙල්ලිගල (රුපියල් දස ලක්ෂ 8.3 යි), දඹුරුනදේගම (රුපියල් දස ලක්ෂ 9.1 යි) හා කොටකන්ද (රුපියල් දස ලක්ෂ 5.9 යි) යන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 3 ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කරනු ලැබ ඇති අතර මහ ජනතාවගේ ඉල්ලීම මත ඇස්තමේන්තු 42 ක් පිළියෙල කරන ලද අතර ඒ අතරින් යෝජනා ක්‍රම 4 ක් සඳහා අරමුදල් ලැබුණ අතර එම යෝජනා ක්‍රමයන් 4 දැනට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

2016 අගෝස්තු / සැප්තැම්බර් කාලය තුළ කලාපයට බල පාන ලද නියං තත්ත්වයට සියළු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කැප වීම හරහා සාර්ථක ලෙස මුහුණ දෙන්නට මෙහෙයුම් හා නඩත්තු අංශයට හැකි විය. නියඟයේ බල පෑමට ගොදුරු වූ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පිළිබඳ විස්තර හඳුනා ගනු ලැබූ අතර බවුසර මගින් ජලය සැපැයීම හා ප්‍රභවයන් වැඩි දියුණු කිරීමේ ක්‍රියා මාර්ග යන් අනුගමනය කිරීම මගින් ආපදා තත්ත්වය අභිභවා යාමට කටයුතු කරන ලදි. මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් පලාත් පාලන ආයතනයන් සමග සම්බන්ධීකරණය වෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාරිභෝගිකයින් නොවන මහ ජනතාව වෙත ජලය සපයා දීමට කටයුතු කළෝය. මීට අමතර වශයෙන්, මතු වෙමින් පවතින ආපදා තත්ත්වයට මුහුණ දීම සඳහා අලුත් නිෂ්පාදන ළිං ඉදි කිරීමට ද, බවුසර මගින් ජලය බෙදා දීමේ කටයුතු ආරම්භ කිරීමේ ස්ථාන සංඛ්‍යාව වැඩි කිරීමට හා අත් පොම්ප මගින් ක්‍රියාත්මක කරනු ලබන නල ළිං පිරිසිදු කිරීමට හා සෝදා ශුද්ධ කිරීමටද අවශ්‍ය පියවර ගන්නා ලදි.

2016 වර්ෂය තුළදී වයඹ කලාපයේ මෙහෙයුම් හා නඩත්තු අංශය විවිධ ආකාරයන්ගෙන් වැඩි දියුණු විය. ප්‍රධාන වශයෙන් තුළු මුව තුළ ජලය හිග වීම වැනි දැවෙන ගැටළු වලට විසඳුම් එම අංශය විසින් සොයා ගනු ලැබ ඇත. ආඩිගම හා දොඩංගස්ලන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සඳහා නව ජල ප්‍රභවයන් සොයා ගනු ලැබූ අතර අදාල ඉදි කිරීම් කටයුතු නිම කරනු ලැබ ඇත. මේ හේතුව නිසා 2017 වර්ෂය තුළදී ජලය බෙදා හැරීමේ ජාලය පුළුල් කිරීමේ හා ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව වැඩි කිරීමේ ද හැකියාව අප වෙත ලැබෙනු ඇත. තවද මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් 2016 වර්ෂය තුළදී නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 4000 ක් පමණ ලබා දී ඇති අතර එය ඉලක්කගත සංඛ්‍යාවෙන් 80% ක් සාක්ෂාත් කර ගැනීමකි. කලාපයේ මෙහෙයුම් හා නඩත්තු අංශයේ මෙහෙයුම් පිරිවැය සම්බන්ධයෙන් සලකා බැලීමේදී, පුද්ගල, බලය, රසායන ද්‍රව්‍ය, අළුත්වැඩියා කිරීම් හා නඩත්තු යන සෑම අංගයක්ම සම්බන්ධයෙන් වූ ඉලක්කයන් 2016 වර්ෂය තුළදී සාක්ෂාත් කරගනු ලැබ ඇති බව පෙනී යන අතර එය හොඳ ජයග්‍රහණයකි.

**මධ්‍යම**

2016 වර්ෂය ආරම්භ වීම හා සමගාමී ලෙස සාමාන්‍යයෙන් සිදු කරනු ලබන පරිදි මධ්‍යම පලාතේ සහාය සේවා මධ්‍යස්ථානය විසින් ආගමික කටයුතු වල නිරත වන ලදි. ඇසළ පෙරහර හා සමගාමී ලෙස බෝධි පූජා පිං කමක් පැවැත්වීම, වෛද්‍ය කඳවුරක් පැවැත්වීම, ලේ දන් දීමේ කඳවුරක් පැවැත්වීම, ගාල්ල කරා යන වාර්ෂික ගමන හා අළුත් අවුරුදු උත්සවය කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සුබ සාධක සමිතිය විසින් සංවිධානය කරන ලද අනිකුත් ප්‍රධාන ක්‍රියාකාර කම් අතර විය.

වර්ෂයේ ප්‍රධාන සිදු වීම වූයේ 2016.09.29 දින හා 2016.09.30 වැනි දෙ දින තුළදී පිළිවෙලින් කටුගස්තොට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ හා ගැටඹේ සහාය සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ පවත්වන ලද ජංගම සේවාවයි. පැමිණිලි සියල්ලක්ම පාහේ ආමන්ත්‍රණය කරන ලද අතර ඒවා ප්‍රතිකාර්මික ක්‍රියාකාරකම් සඳහා අදාල අංශයන් වෙත යොමු කරන ලදි. කුණ්ඩසාලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා කලාපීය කාර්යාලයක් දිගන නගරයෙහි විවෘත කරන ලදි. දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය හා විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය මෙම වර්ෂය තුළදී භෞතික වශයෙන් ආරම්භ කරන ලදි.

ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ සටහන යටතේ, රාත්‍රී ප්‍රවාහ පරීක්ෂණ, පියවර පරීක්ෂණ හා දියුණු උපකරණ යොදා ගනිමින් ගෘහස්ත මනු පරීක්ෂා කිරීමේ වැඩ සටහන් වැනි කාන්දු ප්‍රවීක්ෂණ ක්‍රියාකාර කම් බෙදා හැරීමේ කලාපයන් තුළ හා දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය තුළ කරන ලද විශේෂ කාන්දු වීම් සොයා ගැනීමේ වැඩ කටයුතු සමග ඉහල ආදායම් රහිත ජල තත්ත්වයක් පෙන්නුම් කළ රිකිල්ලගස්කඩ, වලපනේ හා පූඩළුඔය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ හා ඊරියගම කලාපය තුළ ද සිදු කරන ලදි. 2011 වර්ෂය තුළදී කරුවලවත්ත ප්‍රදේශය තුළ ස්ථාපිත කරන ලද "කෙන්ට්" වර්ගයේ ජල මනු සම්බන්ධයෙන් විශේෂ විමර්ශණයක් සිදු කරනු ලැබිණි. බෙදා හැරීමේ කලාපයන් වැඩි දියුණු කිරීම සඳහා පැරණි වෑල්ව, තොග මනු හා පීඩන මාපන යන්ත්‍ර අළුතින් සපයා සවි කිරීම සහ පැරණි පොදි නල මාර්ග වෙනුවට නව පොදි නල මාර්ග යෙදීම ද සිදු කරන ලදි. ටැංකි තුළ ඇති ජල මට්ටම් සැලැකිල්ලට ගනිමින් තොග මනු ක්‍රමාංකනය කරන ලදි. ආදායම් රහිත ජලය මන්තු කිරීමේ ව්‍යාපෘතිය හා මිනිසුන් අතින් සිදු වන වැරදි අඩු කිරීම සඳහා

හපන් ආන්තිකයන් යොදා ගනිමින් අයපත්කරණය කිරීම මහනුවර උතුර කලාපයේ පිහිටි හාරිස්පත්තුව නියමු ව්‍යාපෘති ප්‍රදේශය තුළ සිදු කරන ලද්දේ ජපන් ආධාර ප්‍රදානය යටතේය.

මාරස්සන හා කුණ්ඩසාලේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ බල ශක්ති විගණනයන් සිදු කරන ලදි. පලාපත්වල ඉහල ඔසොව් පොම්පය ස්ථාපිත කිරීම, ඇල්පිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ විචල්‍ය වේග ධාවකය ස්ථාපිත කිරීම, පොල්ගොල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ විදුලි බල ධාරක පැනලයක් සවි කිරීම හා මාතලේ තුළු මුව පොම්පය වෙනුවට නව තුළු මුව පොම්පයක් ස්ථාපිත කිරීම ද බල ශක්ති අරමුදල යටතේ 2016 වර්ෂය තුළ දී නිම කරන ලදි. බල ශක්ති සංරක්ෂණය සඳහා ගන්නා ලද සෙසු පියවර අතර ප්‍රතිදීපන විදුලි බුබුළු වෙනුවට ආලෝක විමෝචන ඩයෝඩ **(LED)** විදුලි බුබුළු යෙදීම, (බලගොල්ලේ) ඉල්ලුම අවම කාල වේලාවන් තුළදී ජලය පොම්ප කිරීමට කටයුතු කිරීම, නැගෙනහිර මහනුවර ප්‍රදේශය තුළ **KVA** අඩු කිරීම සඳහා ද්විත්ව පොම්ප කිරීම් අවම කරමින් කෙටි කාල සීමාවන් තුළ පොම්ප ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම ආදිය විය. තොග මට්ටම් අවම කිරීම සඳහා අළුතින් මිළ දී ගැනීම් අවම කරමින් හැකි තාක් දුරට දැනටමත් තිබෙන තොග භාවිතයට ගන්නා ලදි.

එලදායී තාවය, පෙර ලංසු අගැයීම, ජල සුරක්ෂිතතා විගණනය, මූල්‍ය සාක්ෂර තාවය, පරිගණක, මනු කියවන්නන් වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩ සටහන, සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය, මයික්‍රොසොෆ්ට් ප්‍රවේශය, සිංහල යුනිකෝඩ්, ජල **GEMS,** ආරක්ෂාකාරී රිය ධාවනය හා හදිසි ගිණි ගැනීම් වලින් ආරක්ෂා වීම වැනි පුහුණු වැඩ සටහන් 2016 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරනු ලැබිණි. සවි කරන්නන් වෙනුවෙන් පොලි එතිලින් පිරිද්දුම් වැඩ සටහනක් ද මහනුවර නැගෙනහිර කලාපය විසින් පවත්වන ලද්දේය.

2016 වර්ෂයේදී පවත්වන ලද ජාතික ඵලදායිතා තරඟයේදී පාරදෙක ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුන් වැනි ස්ථානය දිනා ගත්තේය. 2016 වර්ෂයේ ලෝක ජල දින සැමැරුම් උත්සවයේදී ග්‍රාමීය ජල සම්පාදන කාර්යාලය විසින් හොඳම කාර්යාලය වෙනුවෙන් වූ ත්‍යාගය දිනා ගන්නා ලදි. 2016 වර්ෂයේ පවත්වන ලද ජාතික සේවා ක්‍රීඩා උත්සවයේදී හාරිස්පත්තුව ජල සම්පාදන යෝජනා ක්‍රමයට අනුයුක්ත ආර්.එන්.සී. රත්නායක මෙනෙවිය විසින් යගුලිය විසි කිරීමේ, කව පෙත්ත විසි කිරීමේ හා හෙල්ල විසි කිරීමේ තරඟයන්ගෙන් රන් පදක්කම් දිනා ගත්තාය. මීවතුර, විසල් මහනුවර හා පාරදෙක ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලද්දේය. ඊට අමතර ලෙස නාවලපිටිය, උකුවෙල - උඩතැන්න, පාතදුම්බර, රිකිල්ලගස්කඩ, අරත්තන හා හැටන් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි.

විල්ගමුව ප්‍රදේශයේ බල පවත්නා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගය පිළිබඳ ගැටළුව අභිභවා යාමේ පියවරක් වශයෙන් 2016 වර්ෂයේදී පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ආරම්භ කරන ලද අතර ජල ටැංකි 120 ක් බෙදා හරින ලදි. ග්‍රාමීය ජල සම්පාදන ක්‍රියාකාර කම් යටතේ, ප්‍රජා මූල සංවිධාන සාමාජිකයින් හා ප්‍රාදේශීය සභා නිලධාරීන් වෙනුවෙන් ජල මනු අළුත්වැඩියා කිරීම, දේශගුණික විපර්යාසයන් හා අනුගත වීම සහ ක්ලොරීන් යෙදීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදි. ජල සංරක්ෂණය පිළිබඳ ප්‍රදර්ශන කුටි 3 ක් කලාපය තුළ පවත්වන ලදි. ප්‍රජා මූල සංවිධානයන්ගේ හා වෙනත් සංවිධානයන්ගේ ඉල්ලීම මත නව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 34 ක් වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කරන ලද අතර ඒවායේ මුළු වටිනාකම රුපියල් දස ලක්ෂ 115.6 ක් විය. ක්ලෝරිනීකරණ උපකරණ හතලිස් අටක් හා ජල පොම්ප 18 ක් ප්‍රජා මූල සංවිධානයන් අතර බෙදා හරින ලද්දේය. ජලාධර ආරක්‍ෂා කිරීමේ වැඩ සටහන යටතේ රිකිල්ලගස්කඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා මුල්ඔය ප්‍රදේශයේ වැසිකිළි 22 ක් හා ගව ගාල තුළ ජීව වායු ඒකකයක් ද ඉදි කරන ලදි. නිවැරදි සනීපාරක්‍ෂණ චර්යාවන් හා ජලාධර ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පාසැල් දරුවන්, තාක්‍ෂණික නිලධාරීන් හා වතු ප්‍රතිලාභීන් වෙනුවෙන් පවත්වන ලදි. එසේම, රුක් සිටුවීමේ වැඩ සටහන් හා පරිසර දූෂණයට ගොදුරු වීමේ දැඩි ප්‍රවණතාවයක් ඇති ස්ථානයන්හි දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම ද මෙම වැඩ සටහන යටතේ සිදු කරන ලද්දේය. තවද, සනීපාරක්ෂණය සම්බන්ධයෙන් වන දකුණු ආසියානු සමුළුවේ ක්‍රියාකාර කම් යටතේ අඹගමුව, පස්බාගෙ කෝරලේ හා හන්තාන වතු යාය යන ප්‍රදේශයන්හි වැසිකිළි 170 ක් ද ඉදි කරන ලදි.

මධ්‍යම කලාපයේ භූ ගත ජල ක්‍රියාකාර කම් යටතේ උඩතැන්න හා මැදදුම්බර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා අනුබද්ධිත භූ ගත ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම ද, අත් පොම්ප 40 ක් පුනරුත්ථාපනය කිරීම ද, ළිං 20 ක් සෑරීම ද, ළිං 23 ක් සෝදා හැරීම හා සංවර්ධනය කිරීම ද, අත් පොම්ප 6 ක් ස්ථාපනය කිරීම ද, පොම්ප පරීක්‍ෂණ 1 ක් සිදු කිරීම ද, දත්ත හිඩැස් පිරවීම සඳහා අත් පොම්ප නල ළිං සමීක්‍ෂණයක් කිරීම ද (ගෝලීය ස්ථානගත කිරීම් පද්ධති - **GPS** - ඛණ්ඩාංක 48 ක්), භූ ගත ජල ගුණාත්ම මන්තු කිරීම් හා උල්පත් ප්‍රවාහ මිණුම් 1 ක් ද සිදු කරන ලදි.

මහනුවර දකුණ, මහනුවර උතුර හා මහනුවර නැගෙනහිර කලාපයන් තුළ ආසන්න වශයෙන් කිලෝ මීටර 85.5 ක මුළු දිග ප්‍රමාණයක නල මාර්ග දීර්ඝ කිරීම් ද කරන ලදි.

කුණ්ඩසාලේ, මාරස්සන, තලවකැලේ, මාතලේ හා ඇල්පිටිය යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ප්‍රාග් ධන අය වැය යටතේ තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර, සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ නල මාර්ගයන් වැඩි දියුණු කිරීම සහ යාන්ත්‍රික හා විද්‍යුත් කටයුතු ද කරන ලද්දේය. කෙසේ වුවද, අරමුදල් ප්‍රතිපාදන නොමැති වූ හෙයින් 2016 වර්ෂය තුළ මාරස්සන ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාකාර කමක් ඉටු කළ නොහැකි විය. මෙම වර්ෂය තුළදී පුනරුත්ථාපන අරමුදල් ප්‍රතිපාදන යටතේ මාතලේ, පාරදෙක හා නයාපාන තුළු මුව හා සම්බන්ධිත තුළු මුව වැඩි දියුණු කිරීම් ද, පුස්සැල්ලාව ජල සම්පාදන යෝජනා ක්‍රමයෙහි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම ද, ක්ලෝරිනීකරණ උපකරණ සවි කිරීම හා අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය එළීම ද මෙම වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. පුනරුත්ථාපන අරමුදල් ප්‍රතිපාදන යටතේ දැනට සිදු කරනු ලබමින් පවතින ක්‍රියාකාර කම් වන්නේ පොල්ගොල්ලේ අධි වේගී ජල ප්‍රවාහ පෙරණය පුනරුත්ථාපනය කිරීම ද, මවුන්ට් ටෙම්පල් වෙත යන සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය නැවත එළීම හා මහනුවර දකුණ ප්‍රදේශයේ වැල්ව කුටි ඉදි කිරීම ද වේ.

ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයට හානි සිදු කරමින් නිල්ලඹ හා දොළුව ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රදේශයන් තුළ නාය යාම් සිදු විය. කුණ්ඩසාලේ හා මැද දුම්බර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ නියං තත්ත්වය හේතු කොට ගෙන ද, ගලගෙදර, නාවුල, පූජාපිටිය, හාරිස්පත්තුව හා ගල්හින්න ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ මිහි විද්මන් හා ළිං වල ජල මට්ටම් පහත බැසීම කරණකොට ගෙන ද තද බල ජල හිඟයන් ඇති විය. පොල්ගොල්ල තුළු මුව තුළ ඇති වූ ජල දූෂණ තත්ත්වය අනිකුත් ගැටළුව විය. විශ්‍රාම ගිය කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් නව කාර්ය මණ්ඩල සාමාජිකයින් පත් නොකිරීම, වාහන හා රියැදුරන් ආදීන් නොමැති වීම වැනි සම්පත් හිඟ වීම් නිසා නැගෙනහිර මහනුවර කලාපය දුෂ්කරතාවයන්ට මුහුණ දෙන ලදි. තවද, විදේශ අරමුදල් ප්‍රතිපාදනයන්ගෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත මහනුවර උතුර, පාතදුම්බර, කුණ්ඩසාලේ - හාරගම හා මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතීන් අරමුදල් නොමැති වීම හේතු කොට ගෙන භෞතික වශයෙන් ආරම්භ කළ නොහැකි විය.

නාය යාම් හේතු කොට ගෙන ඇති වූ නල මාර්ග බිඳ වැටීම් ජල සම්පාදනයට අවම බාධාවන් ඇති වන සේ පුනරුත්ථාපනය කරන ලද අතර නියං සමය තුළදී පාරිභෝගිකයින් වෙත බවුසර මගින් ජලය සැපැයීමට කටයුතු කරන ලදි. ජලාධර ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා රුක් රෝපණ වැඩ සටහන් සංවිධානය කරන ලදි.

මෙම කටයුතු වලට අමතරව, මධ්‍යම කලාපයේ නල ජල සම්පාදන ආවරණය නංවා ලීම සඳහා නානු ඔය, පුඩලුඔය, පුපුරැස්ස - අටබාගේ, හපුගස්තලාව හා නාවලපිටිය පල්ලේගම ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ව්‍යාපෘති යෝජනාවන් පිළියෙල කරන ලදි.



**මාවනැල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය.**

කෑගල්ල හා රත්නපුර ප්‍රදේශයන් තුළ හා සබරගමුව කලාපයේ සහාය සේවා මධ්‍යස්ථානය තුළ බොහෝ විශේෂ සිදු වීම් සිදු විය. එසේ සිදු කරන ලද ඇතැම් විශේෂ සිදු වීම් වූයේ ලෝක ජල දින සැමරුම, විවිධ ස්ථානයන්හි පවත්වන ලද ජංගම සේවාවන්, ක්‍රිකට් තරඟාවලිය හා සුහද හමුවයි.

බෙදා හැරීම වැඩි දියුණු කිරීම, පැරණි පොදි නල මාර්ග වෙනුවට අළුතින් පොදි නල මාර්ග එලීම, හානි වී ඇති වෑල්ව මාරු කිරීම, නව වෑල්ව කුටි ඉදි කිරීම, පැරණි නල මාර්ග වෙනුවට අළුත් නල මාර්ග එලීම හා සම්බන්ධතාවයන් වෙනස් කිරීම වැනි බොහෝ ආදායම් රහිත ජලය අවම කිරීම හා සම්බන්ධ ක්‍රියාකාර කම් කලාපීය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ 2016 වර්ෂය තුළදී සිදු කරන ලදි.

මාවනැල්ල හා උඩවලව ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ පැරණි පොම්ප වෙනුවට අළුත් පොම්ප සවි කිරීම හා කෑගල්ල කලාපය තුළ ඇති පොම්පාගාරයන්හි බල සාධක නිවැරදි කිරීම සඳහා විදුලි බල ධාරක පනේල ස්ථාපිත කිරීම (මෙම ව්‍යාපෘතීන් සඳහා වැය වූ මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 9.6 ක් විය) බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාර කම් වශයෙන් සිදු කරන ලද අතර මෙම සියළුම ව්‍යාපෘතීන් 2016 වර්ෂයේ අවසානය වන විට සම්පූර්ණයෙන්ම නිම කරන ලදි. මේ හරහා අපේක්ෂිත ඉතිරි කිරීම මසකට රුපියල් 1,50,000.00 ක් වේ. තවද විදුලි බල පරිභෝජනය අඩු කිරීම සඳහා පොම්ප පාලනය කිරීමට හා මෙහෙයුම් කටයුතු සිදු කරන වේලාවන් වෙනස් කිරීමට ද පියවර ගන්නා ලදි. රත්නපුර හා කෑගල්ල ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල වන සියළුම පොම්ප සඳහා සහ වෙනත් උපකරණ සම්බන්ධයෙන් නාස්තිය වැලැක්වීමේ නඩත්තු කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ හා ඒ හා අනුබද්ධ ප්‍රදේශයන් තුළ ඵලදායිතා වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාර කම් සිදු කරන ලද අතර, කලාපීය කාර්යාලයන් තුළ මූලික ඵලදායිතා සංකල්ප පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා එස් 5 වැඩසටහන් ද දියත් කරන ලදි. එස් 5 සම්බන්ධ තරඟයක් සංවිධානය කරන ලද අතර දැනට එය ක්‍රියාත්මක වෙමින් පවතී.

රත්නපුර හා කෑගල්ල කලාපයන් තුළ ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි ගුණාත්ම කළමනාකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කරනු ලැබ ඇත. මෙය සිදු කරනු ලබන්නේ කලාපය තුළ ඇති දිනකට ඝණ මීටර 10000 කට අධික ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ **(ISO)** 9001 - 2008 සහතික කිරීම ලබා ගැනීම සඳහාය.

කලාපයන් තුළ ජල සුරක්ෂිතතා සැලසුම ක්‍රියාත්මක කිරීම ද 2015 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2016 වර්ෂය අඛණ්ඩ ලෙස ක්‍රියාත්මක විය. ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය මෙම වැඩ සටහන යටතේ වූ නියමු ව්‍යාපෘතිය වූ අතර, කාබනික ගොවි තැන, රුක් රෝපණය හා ජලාධර ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙත සනීපාරක්ෂණ පහසුකම් සලස්වා දීම ද මෙම වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරන ලදි. එම කටයුතු වලට අමතරව දොළ පාරේ රක්ෂිතය බෙදා සළකුණු කොට වෙන් කර පෙන්වීම ද, පැල්මඩුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජලාධර ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව වෙත සනීපාරක්ෂණ පහසුකම් සලස්වා දීම වැනි ජලාධර ආරක්ෂා කිරීමේ කටයුතු ද ආරම්භ කරන ලදි.

ඵලදායී තාවයට හා ගුණාත්ම කළමනාකරණ ක්‍රමයට අදාල පුහුණු වැඩ සටහන් දහසයක් හා ජල නල කාර්මික පුහුණු වැඩ සටහන් මෙන්ම දැනුවත් භාවය නංවා ලීමේ වෙනත් වැඩ සටහන් ද 2016 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් පවත්වන ලද්දේය.

කලාපය තුළ ක්‍රියාත්මක වන රසායානාගාරයන් වෙනුවෙන් පිළිගැනීම් ලබා ගැනීම 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2016 වර්ෂය තුළ එම කටයුතු අඛණ්ඩ ලෙස සිදු කරන ලදි.

වර්ෂය තුළදී කෑගල්ල ප්‍රදේශයේ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 21 ක් හා රත්නපුර ප්‍රදේශයේ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 24 ක් ආවරණය වන සේ ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම ගණනාවක් වෙත තාක්ෂණික සහාය ලබා දෙන ලදි. වර්ෂය තුළදී කරන ලද අනිකුත් කටයුතු කලාපය තුළ ප්‍රජා මූල සංවිධානයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල දත්ත රැස් කිරීම හා ජල ගුණාත්මය පරීක්ෂා කිරීම සිදු කරන ලදි. මීට අමතර ලෙස, ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය හා සම්බන්ධ පුනරුත්ථාපන කටයුතු කිරීමෙහි ලා ග්‍රාමීය ජල සම්පාදන අංශය සිය සහාය ලබා දුන්නේය.

තවද, රත්නපුර හා කෑගල්ල කලාපයන් තුළ කරන ලද නල මාර්ග දීර්ඝ කිරීම් පිළිවෙලින් කිලෝ මීටර 33 ක් හා 44 ක් විය. එසේම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 6625 ක් ලබා දෙනු ලැබ ඇත.

භූගෝලීය තොරතුරු පද්ධති **(GIS)** සිතියම්කරණ වැඩ සටහන කෑගල්ල හා රත්නපුර ප්‍රදේශයන් තුළ දැනට සිදු කෙරෙමින් පවතින අතර භූගෝලීය තොරතුරු පද්ධති **(GIS)** සිතියම්කරණය පිළිබඳ පුහුණු වැඩ සටහනක් 2016 නොවැම්බර් 27 වැනි දින සිට 29 වැනි දිනය දක්වා රත්නපුර පුස්තකාල ශාලාවේදී පවත්වන ලදි.

දේශීය අරමුදල් යොදා ගනිමින් ප්‍රදේශයන් දෙක තුළ සිදු කරන ලද නල මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ මුලු පිරිවැය රුපියල් දස ලක්ෂ 295 ක් වූ අතර වැඩ සටහනේ සමස්ත ප්‍රගතිය 100% ක් විය.

ප්‍රස්තුත වර්ෂය තුළ කෑගල්ල හා රත්නපුර ප්‍රදේශයන් තුළ බොහෝ පුනරුත්ථාපන ක්‍රියාකාර කම් සිදු කරන ලද අතර එම ක්‍රියාකාර කම් සඳහා වෙන් කරන ලද මුලු වෙන් කිරීම රුපියල් දස ලක්ෂ 63 ක් විය. වර්ෂය අවසන් වන විට එම වැඩ සටහන් වල භෞතික ප්‍රගතිය ආසන්න වශයෙන් 80% ක් විය.

ආසන්න වශයෙන් 48450 ක ජන ගහනයක් වෙත ජලය සම්පාදනය කිරීම සඳහා සැලසුම් කරන ලද ගලිගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සවිස්තරාත්මක සැලැසුම් සකස් කිරීම නිම කරනු ලැබ ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර කොන්ත්‍රාත් කරුවන් වෙතින් ලංසු කැඳවනු ලැබ ඇත. ලංසු අගැයීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. එසේම 18217 ක ජන සංඛ්‍යාවක් වෙත ජලය සම්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් සැලසුම් කරන ලද පඹහින්න ජල සම්පාදන ව්‍යාපෘතිය හා සම්බන්ධ ලංසු අගැයීමේ කටයුතු දැනට නිම කරනු ලැබ ඇත. තවද කොරියාමේ අපනයන ආනයන බැංකු අරමුදල් වලිනි ක්‍රියාත්මක කරන්නට යෝජිත විසල් රුවන්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල යන්ත්‍රාගාර සැලසුම් කිරීමේ හා ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ද ලංසු කැඳවනු ලැබූ අතර එම ලංසු අගැයීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

2016 වර්ෂය තුළදී කෑගල්ල ප්‍රදේශයේ නාය යාමේ තර්ජනයට ලක් ව නාය යාමේ අවදානම් තත්ත්වය නිසා වෙනත් ස්ථානයන්හි ප්‍රති ස්ථාන ගත කරන ලද පවුල් 2000 කට පමණ ජලය සපයා දීමේ අති විශාල අභියෝගයට මුහුණ දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සිදු විය. සංක්‍රමණික මධ්‍යස්ථානයන් වෙත ජලය සම්පාදනය කර දීම මගින් හා නාය යාම් ආපදා තත්ත්වයට ගොදුරු වූ ජනතාව නැවත පදිංචි කරන ලද ජනාවාසයන් වෙනුවෙන් නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදි කිරීම මගින් ද මෙම කර්තව්‍යය ඉටු කරන ලදි. මෙම කාර්යයන් සඳහා දරන්නට සිදු වූ පිරිවැය ආසන්න වශයෙන් රුපියල් දස ලක්ෂ 52 ක් විය.

**ඌව.**

කාර්ය මණ්ඩලය දැනටමත් බදුල්ලේ පිහිටි නව කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය වෙත 2015 නොවැම්බර් 01 වැනි දින සිට ගොස් ඇත. මහියංගන ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීමේ කටයුතු 2016 සැප්තැම්බර් 17 වැනි දින විවෘත කරන ලදි. ඇතැම් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල ගුණාත්මය පිළිබඳ ගැටළු ද පැණ නැගුන අතර එම තත්ත්වයට පිළියම් වශයෙන් තුළු මුවයන්ට තිබුණ බාධක ඉවත් කිරීම, බොර තත්ත්වය අඩු කිරීම හා කුඩා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි ක්ලෝරිනීකරණ උපකරණ ස්ථාපිත කිරීම වැනි ප්‍රතිකාර්මික ක්‍රියා මාර්ගයන් ගන්නා ලදි. හපුතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, බදුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය ද වෙනුවෙන් ජලාධාර ප්‍රදේශ ආරක්ෂා කිරීමේ වැඩ සටහනක් දියත් කරන ලදි.

බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාර කම් ද සිදු කරන ලදි. වර්ෂය තුළදී ඉටු කරන්නට යෙදුන ඇතැම් බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාර කම් වූයේ ගාස්තු ක්‍රමය අනුව සකස් වීම, අකාර්යක්ෂම පොම්ප වෙනුවට අලුත් පොම්ප යෙදීම හා ඉල්ලුම අධික කාල සීමාවන් තුළදී පොම්ප කිරීමෙන් වැලැකී සිටීම ද වේ. විදුලි බලය වෙනුවෙන් යන පිරිවැය අඩු කිරීමට අමතර වශයෙන් සියලුම පොම්පාගාර ස්ථානයන් තුළ නිවාරණ නඩත්තු කටයුතු කිරීම තුළින් නඩත්තු පිරිවැය හා පොම්ප බිඳ වැටීම් කාල සීමාවන් අඩු කර ගැනීමේ හැකියාවද ලැබුණි.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ කර ගෙන යන ලද ආදායම් රහිත ජලය අවම කිරීමේ කටයුතු වූයේ බුත්තල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත අධීක්ෂණික පාලන හා දත්ත ප්‍රතිග්‍රහණ **(SCADA)** ක්‍රමය හඳුන්වා දීම, මහියංගන, බදුල්ල, හාලි ඇල හා ඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතීන් වර්ධනය කිරීම, ආදායම් රහිත ජල ප්‍රමාණය මිණීම සඳහා ජල තොග මනු සපයා දීම, පරණ වෑල්ව වෙනුවට අලුත් වෑල්ව යෙදීම, කාන්දු පරීක්ෂක උපකරණ ලබා දීම, දැනට ක්‍රියාත්මක වන ගෘහස්ත සම්බන්ධතාවයන්ගේ දෝෂ නිදොස් කිරීම, පොදි නල මාර්ග වෙනුවට නව නල මාර්ග එලීම හා පැරණි නල මාර්ග වෙනුවට අලුත් නල මාර්ග එලීමද වේ.

මීට අමතර වශයෙන් තාක්ෂණික වැඩසටහන් හයක්, තාක්ෂණික නොවන වැඩ සටහන් දහයක්, පරිගණක පුහුණු වැඩසටහන් දෙකක්, ප්‍රජා මූල සංවිධාන සාමාජිකයින් පුහුණු කිරීමේ වැඩසටහන් තුනක් හා කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් හතක් ඇතුළු පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රස්තුත වර්ෂය තුළ දී සිදු කරන ලදි.

2016 වර්ෂය සඳහා මොනරාගල හා බදුල්ල දිස්ත්‍රික්කයන් වෙනුවෙන් රුපියල් දස ලක්ෂ 118 ක් වටිනා ග්‍රාමීය ජල සම්පාදන යොජනා ක්‍රම සැලසුම් කරනු ලැබූ අතර එම ව්‍යාපෘතීන් දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එම ජල සම්පාදන ව්‍යාපෘතීන් වන්නේ බෝගොඩ, සින්නමාලිගාතැන්න, ගලඋඩ, කැටවල, පැල්ගහතැන්න, රාහුප්පොල, රහන්ගල, කඳාන හා බොරගස් පුනරුත්ථාපනය කිරීම, සාරන ලද ළිං 9 ක් ඉදි කිරීම, පල්ලෙවෙල ගොවිඳුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය (සම්බන්ධතාවයන් 750 යි), කිරිඉබ්බන්වැව වම ජල සම්පාදන ව්‍යාපෘතිය හා ඔක්කම්පිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමයයි.

ගිරාඳුරුකෝට්ටේ වැඩි දියුණු කිරීම, රත්කින්ද ජල සම්පාදන යෝජනා ක්‍රමය, අගලඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම, බදුල්ලේ වෑවත්ත ජල සම්පාදන යෝජනා ක්‍රමය හා මොනරාගල කුමාරපුර ජල සම්පාදන ව්‍යාපෘතිය හා අදාලව නල මාර්ග දීර්ඝ කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

අට්ටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් හා තල්දෙන - මීගහකිවුල ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ද, බණ්ඩාරවෙල - දියතලාව - හපුතලේ ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ද ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය ලබා ගෙන තිබේ.

උමා ඔය ව්‍යාපෘතිය යටතේ වූ පහත සඳහන් ප්‍රති ආරෝපණය කළ හැකි වැඩ ද වර්ෂය තුළ දී සිදු කරන ලද්දේය -

**මකුලැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය** - මෙම යෝජනා ක්‍රමය මකුලැල්ල, බඹරගම, අඹදන්ඩේගම හා එගොඩගම ප්‍රදේශයන්හි ඇති ජල සම්මිබන්ධතා 1500 ක් වෙත ජලය සම්පාදනය කිරීමට අපේක්ෂා කරයි. මේම් සඳහා වන මුලු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 221 ක් වේ. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම යෝජනා ක්‍රමයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ආසන්න වශයෙන් පිළිවෙලින් 55% ක් හා 45% ක් විය.

**කුරුඳුගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය** - මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරනු ලබන්නේ වෙහෙරගලතැන්න ප්‍රදේශයේ ජල සම්පාදන සම්බන්ධතාවයන් 145 ක් වෙත ජලය සැපයීම වන්නේය. මේ සඳහා වන මුලු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 9.5 ක් වේ. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම යෝජනා ක්‍රමයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ආසන්න වශයෙන් පිළිවෙලින් 100% ක් හා 95% ක් විය.

**වෙහෙරගලතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය** - මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරනු ලබන්නේ එගොඩගම, වෙහෙරගලතැන්න, හීල් ඔය හා පල්ලෙපේරුව ප්‍රදේශයේ ජල සම්පාදන සම්බන්ධතාවයන් 650 ක් වෙත ජලය සැපයීම වන්නේය. මේ සඳහා වන මුලු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 103 ක් වේ. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම යෝජනා ක්‍රමයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ආසන්න වශයෙන් පිළිවෙලින් 80% ක් හා 65% ක් විය.

**උතුරු.**

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ ප්‍රධානත්වය දරනු ලබන්නේ සහකාර සාමාන්‍යාධිකාරී (උතුර) වරයකුගේ සහාය සහිතව උතුරු පලාත භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයා විසිනි. මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාර කම් කලාපීය කළමනාකරු (යාපනය) හා කලාපීය කළමනාකරු (වවුනියා) වශයෙන් කලාප කොටස් දෙකකට බෙදනු ලැබ ඇත. පළාතේ මුලු ජන ගහණය දස ලක්ෂ 1.23 කි (වර්ෂ 2015 ජන ගහණ සංගණනයට අනුව). ජාතික ජල සම්පාදන හ ජලාපවහන මණ්ඩලය විසින් (2016 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට) නඩත්තු කර ගෙන යනු ලබන මුලු සම්බන්ධතා සංඛ්‍යාව 18330 ක් වන අතර සමස්ත නල ජල සම්පාදන ආවරණය 7.11 % ක් හා ග්‍රාමීය ජල සම්පාදන ආවරණය ආසන්න වශයෙන් 1.13 % ක් වේ.

යාපනය කලාපීය කළමනාකාර වරයා යාපනය, කිලිනොච්චි හා මුල්ලෙයිතිවු යන දිස්ත්‍රික්ක තුන ආවරණය කරයි. යාපනය කොට්ඨාසයේ කලාපීය කළමනාකාර වරයා විසින් ජල සම්පාදන යෝජනා ක්‍රම 21 ක් මෙහෙයවනු ලබයි. ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාර කම්, ජලය බෙදා හැරීම වැඩි දියුණු කිරීම්, හානි වූ වෑල්වයන් වෙනුවට අලුත් වෑල්වයන් සවි කිරීම හා බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාර කම් 2016 වර්ෂය තුළ දී මෙම කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි.

මෙම ක්‍රියාකාර කම් වෙනුවෙන් දරන ලද සම්පූර්ණ පිරිවැය ආසන්න වශයෙන් රුපියල් දස ලක්ෂ 6.73 ක් වේ. ජල සම්පාදන යෝජනා ක්‍රම 10 ක් තුළ කිලෝ මීටර 35.20 ක දිගට නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර එයින් අපේක්ෂිත සම්බන්ධතා සංඛ්‍යාව 219 කි. මෙම ක්‍රියාකාර කම් වල මුළු පිරිවැය ආසන්න වශයෙන් රුපියල් දස ලක්ෂ 133.00 ක් වූ අතර ඒ සඳහා අරමුදල් සපයා දෙන ලද්දේ යාපනයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උතුරු පලාත් සභාව විසිනි. යාපනයේ කලාපීය රසායනාගාරය උතුරු සහාය

සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රධාන ජල පරීක්ෂණ රසායනාගාරයන් අතුරින් එකක් වන අතර, ඉහල පරාසයක විශ්ලේෂණාත්මක ධාරිතාවයකින් යුක්තව කටයුතු කරමින් විශේෂයෙන්ම බැර ලෝහ විශ්ලේෂණය වැනි බොහෝ ජල ගුණාත්ම පරාමිතීන් විශ්ලේෂණය කිරීමේ කටයුතු ඉටු කිරීමේ හැකියාව ඒ හරහා අපට ලැබී ඇත. ඊට අමතර ලෙස කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය මන්තු කිරීමට හා රසායනාගාර සේවාවන් කිලිනොච්චි දිස්ත්‍රික්කය හා මුලතිව් දිස්ත්‍රික්කය වෙත දීර්ඝ කිරීම සඳහා කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ සුළු පරිමාණ රසායනාගාරයක් ස්ථාපිත කරන ලදි. කලාපය තුළ ක්‍රියාත්මක වන යාපනය දිස්ත්‍රික්කයේ මාතගල් හා ශාන්තෙයි ද, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අක්කරායන්, වඩ්ඩක්කාච්චි හා ඉයක්කච්චි ද යන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම පහ සම්බන්ධ මෙහෙයුම් කටයුතු හා නඩත්තු කටයුතු යාපනයේ ග්‍රාමීය ජල සම්පාදන ඒකකයේ පසු විපරම යටතේ ඒ ඒ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පිහිටා ඇති ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වන ප්‍රජා මූල සංවිධානයන් විසින් කරනු ලබයි. යාපනයේ කලාපීය කළමනාකාර වරයා යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසින් 2016 වර්ෂය තුළදී කිලෝ මීටර 22.70 ක නල මාර්ග දීර්ඝ කිරීම් කරන ලද අතර ඒ සඳහා දරණ ලද පිරිවැය රුපියල් දස ලක්ෂ 59.70 ක් විය. එම වැඩ කටයුතු වල ප්‍රගතිය ආසන්න වශයෙන් 20% ක් වන අතර ඉතිරි වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. තෙල් දූෂණයට ගොදුරු වූ චුන්නාකම් හා නියඟයට ගොදුරු වූ කිලිනොච්චි නගර ප්‍රදේශයන් වෙත බවුසර මගින් ජලය බෙදා හැරීම සිදු කරන ලදි. දේශීය බැංකුවක් විසින් සපයන ලද අරමුදල් වලින් ක්‍රියාත්මක කරනු ලබන උඩුප්පිඩි නල මාර්ග දීර්ඝ කිරීම් සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇත. මෙම කලාපයට බල පාන පොදු ගැටළු අතර පේදුරු තුඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත බල පා ඇති ජල ගුණාත්ම ගැටළුව වන ජලයේ ඇති යකඩ අන්තර්ගතය හා ඔඩ්ඩුසුඩාන් හා නෙදුන්කර්නි ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත බල පා ඇති මද ෆ්ලුඕරයිඩ් අන්තර්ගතය හා චුන්නාකම් තෙල් දූෂණය ද වේ.

මන්නාරම දිස්ත්‍රික්කය හා වවුනියා දිස්ත්‍රික්කය ආවරණය කරනු ලබන වවුනියා කලාපයේ කලාපීය කළමනාකරු විසින් 2016 වර්ෂය තුළදී සම්බන්ධතා සංඛ්‍යාව 2263 කින් වැඩි කරනු ලැබ ඇති අතර එය මුළු වර්ෂයේම ආවරණය හා සාපේක්ෂකව ගත් කල ආසන්න වශයෙන් 4.1 % ක වැඩි වීමකි. මීට අමතරව, 2016 වර්ෂය තුළදී මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්කයන්හි නියඟයට ගොදුරු වූ ආසන්න වශයෙන් 46000 ක ජනතාවක් වෙත බවුසර මගින් ජලය සැපයීම සිදු කරන ලදි.

මෙම පලාතට බල පවත්නා පානීය නල ජල සැපයුම් හිඟයට විසඳුමක් වශයෙන් ප්‍රධාන දීර්ඝ කාලීන යෝජනා හතරක් උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සකස් කරනු ලැබ ඇත. මන්නාරම දිස්ත්‍රික්කයේ විසල් මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් පලාතේ ජන ගහණයෙන් 14 % ක් ආවරණය කරමින් ලබා දීමට අපේක්ෂා කරනු ලබන සම්බන්ධතා සංඛ්‍යාව ආසන්න වශයෙන් 35000 ක් වන අතර ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 14, 818.65 ක් වේ. මේ අතර වවුනියා දිස්ත්‍රික්කයේ විසල් වවුනියා ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් පලාතේ ජන ගහණයෙන් ආවරණය කිරීමට අපේක්ෂිත ප්‍රතිශතය 25 % ක් වන අතර ලබා දීමට අපේක්ෂා කරනු ලබන සම්බන්ධතා සංඛ්‍යාව ආසන්න වශයෙන් 63, 500.00 ක් වනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 21,602.98 ක් වේ. විසල් මන්නාරම හා විසල් වවුනියාව යන ව්‍යාපෘති දෙකේම 1 වැනි අදියර අප විසින් ආරම්භ කරනු ලැබ ඇති අතර ඒ මගින් පිළිවෙලින් මුසාලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටසක් ආවරණය වනු ඇත.

මුලතිවු දිස්ත්‍රික්කයේ වැලිඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් පලාතේ නල ජල සැපයුම් ආවරණය 1.10 % කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1867.00 ක් වනු ඇත. මේ අතර මුලතිවු දිස්ත්‍රික්කයේ මාන්කුලම් ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් පලාතේ නල ජල සම්පාදන ආවරණය 4.70% කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර දෙනු ලැබීමට අපේක්ෂා කරනු ලබන සම්බන්ධතා සංඛ්‍යාව ආසන්න වශයෙන් 17500 වේ. මේ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 12,663.00 ක් වේ.

වවුනියා කලාපයේ ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් මන්නාරම් දිස්ත්‍රික්කයේ මඩුකරෙයි සඳහා සාධ්‍යතා වාර්තාවක් පිළියෙල කරන ලද අතර ඊට අදාල මුදල වූයේ රුපියල් දස ලක්ෂ 4.80 කි. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගය මැඩ ලීමේ කටයුතු මා සම්බන්ධ අය වැය යටතේ 2016 වර්ෂයේදී මුලතිවු දිස්ත්‍රික්කයෙහි ජල සම්පාදන යෝජනා ක්‍රම දෙකක් ඉදි කිරීම ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපෘති දෙක මගින් පවුල් 800 කට සෙත සැලසෙනු ඇත. වැඩි දුරටත්, ඝණ මීටර 10 ක ධාරිතාවයකින් යුත් විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ගම් අතර ස්ථාපිත කරන ලද අතර, උතුරු පලාතේ පාසැල් අතර බෙදා දී ස්ථාපිත කිරීම සඳහා විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 35 ක් ලබා ගැනීමේ පියවර සම්පූර්ණ කරනු ලැබ ඇත. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගය මැඩ ලීමේ කටයුතු යටතේ වවුනියාවේ බෝගස්වැව, මන්නාරම මුසාලි හා යාපනයේ චුන්නාකම් යන ගම්මානයන් වෙත බවුසර් ජලය සැපැයීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. වවුනියා කලාපයේ භූ ගත ජල අංශය විසින් විමර්ෂණ 131 ක් ද, මිහි විදුමන් 87 ක් ඉදි කිරීම ද, පොම්ප ස්ථාපිත කිරීම් 22 ක් ද, අත් පොම්ප අළුත්වැඩියා කිරීම් 73 ක් හා ළිං සෝදා පවිත්‍ර කිරීම් 74 ක් ද ජාතික සමගි හා සංහිඳියා කාර්යාලය විසින් හඳුනාගනු ලැබූ ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ හා වෙනත් ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යොදා ගනිමින් උතුරු සහාය සේවා මධ්‍යස්ථානය යටතේ සිදු කරන ලදි. එසේ කරන ලද මුළු වැඩ කටයුතු සඳහා රුපියල් දස ලක්ෂ 50.60 ක් වැය කරන ලද අතර භූ ගත ජල අංශය වෙත ලැබුණ ආදායම රුපියල් දස ලක්ෂ 43.75 ක් වේ.

2016 වර්ෂය තුළදී වවුනියාවේ පිහිටි උතුරු සහාය සේවා මධ්‍යස්ථානයට අයත් පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණු කිරීම් වැඩ සටහන් දෙකක් පවත්වන ලදි. විවිධ පරදු ධාරීන් නියෝජනය කරමින් පැමිණි සහභාගි වන්නන් 45 දෙනෙකු වෙනුවෙන් ඉපිළුමෙන් ක්‍රියාත්මක කෙරෙන වෑල්ව වෙනුවෙන් වන නියාමන පියවර සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලද අතර ජල කාර්මිකයින් දැනුවත් කිරීමේ වැඩ සටහනක් සහභාගි වන්නන් 40 දෙනෙකු වෙනුවෙන් පවත්වන ලදි.

**නැගෙනහිර.**

නැගෙනහිර සහාය සේවා සැපයුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයා යටතේ වන අතර ඔහුගේ සහාය පිණිස සහකාර කළමනාකාර වරුන් දෙදෙනෙක් හා වෙනත් විධායක නිලධාරීන් හා සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයින් සිටිති. මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාර කම් ක්‍රියාත්මක වන්නේ ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව හා අක්කරෙයිපත්තුව භාර කලාපීය කළමනාකරුවන් සිව් දෙනාගේ කළමනාකාරිත්වය යටතේ වේ. නැගෙනහිර සහාය සේවා සැපයුම් මධ්‍යස්ථානයට අයත් ප්‍රධාන ක්‍රියාකාර කම් වන්නේ එදිනෙදා මෙහෙයුම් හා නඩත්තු වැඩ කටයුතු කරගෙන යාම සඳහා කලාපීය කාර්යාලයන් වෙත පහසු කම් සැලැස්වීමත්, ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ සටහන පසු විපරම් කිරීම හා ආදායම් වර්ධනය කර ගැනීම සඳහා නව ජල සම්බන්ධතාවයන් සංඛ්‍යාව වැඩි කිරීමද වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු වූ විශේෂ සිදු වීම් වූයේ මහ ඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාසය කරන පවුල් 5000 ක් වෙත සේවය සැපැයීම සඳහා දියත් කරන ලද මහ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය විවෘත කිරීමත්, වර්ධනය කරන ලද හා පුනරුත්ථාපනය කරන ලද පොතුවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය විවෘත කිරීමත්, කල්මුනෙයි හා මරුදමුනෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සැපයුම් පැය ගණන වැඩි කිරීම සඳහා තලවට්ටුවාන් පොම්පාගාරය වර්ධනය කිරීමත්, කන්තලේ හා අම්පාර ස්ථාන භාර නිලධාරී කාර්යාල ස්ථාපිත කිරීම හා අම්පාර ජංගම සේවාවක් පැවැත්වීමද වේ. (එහිදී ඉදිරිපත් වූ පැමිණිලි 314 අතුරින් පැමිණිලි 174 කට ක්ෂණිකව විසඳුම් ලබා දෙන

ලදි. වාලච්චේනෙයි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා වූ **NPD** අනුමැතිය 2016.01.12 වැනි දින ලබා ගන්නා ලද අතර, ඒ සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් බිලියන 9.84 ක් විය. වවුනතිව් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ **(ISO)** ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

මෙම වර්ෂය තුළදී ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ කටයුතු බොහෝ සෙයින් ක්‍රියාත්මක කරන ලදි. පහත සඳහන් කටයුතු කලින් කලට ඉටු කරනු ලබන අතර කලාප මට්ටමේදී ඒවා පසු විපරමට භාජනය කරනු ලැබේ. එම කටයුතු නම්, දෝෂ සහිත මනු 9059 ක් මාරු කිරීම, කාන්දු වීම් 10997 ක් අළුත්වැඩියා කිරීම හා වර්ෂය තුළදී කලාප හතර තුළ රාත්‍රී කාලයේ කාන්දු වීම් සමීක්ෂණ 2 ක් සිදු කිරීමද වේ. මීට අමතර ලෙස නිවාස 635 ක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ඒ අතුරින් නිවාස 19 ක සම්බන්ධතාවයන් නීති විරෝධී බව සොයා ගෙන එම සම්බන්ධතාවයන් විසන්ධි කරන ලදි. තවද, සේවා සම්බන්ධතාවයන් 300 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රෙගුලාසීන් අනුව නැවත සකස් කරන ලද්දේය. අම්පාර කලාපයේ කොන්ඩවෙඩ්ඩවන් ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ පරණ වෑල්ව 6 ක් වෙනුවෙන් නව වෑල්ව 6 ක් සවි කිරීම ද, පරණ තොග මනු 2 ක් වෙනුවෙන් නව තොග මනු දෙකක් සවි කිරීම ද සිදු කරන ලදි.

මඩකලපුව කලාපයේ කල්ලඩි ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය භාරයට ගැනීමෙන් පසුව එහි ආදායම් රහිත ජල ප්‍රමාණය ඉහල ගොස් ඇති බව පෙනී ගිය අතර කිලෝ මීටර 3.0 ක් දිග බෙදා හැරීමේ නල මාර්ගය **PVC** නල යොදා ගනිමින් රුපියල් දස ලක්ෂ 9.0 ක පිරිවැයක් වැය කොට නැවත එලන ලද්දේය.

ත්‍රිකුණාමල කලාපය තුළ කලාප සකස් කිරීම්, දිස්ත්‍රික් මනු හා ආංශික වෑල්ව හඳුන්වා දීම් හා සේවා සම්බන්ධතාවයන් නැවත සකස් කිරීම් ද 2016 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර එම කටයුතු දැනට සිදු වෙමින් පවතී. ඊට අමතර ලෙස ප්‍රවාහ මනු හතරක් හා තොග මනු හතරක් ද සවි කරන ලද අතර විෂ්කම්භය මිලි මීටර 63 ක් වූ **uPVC** නල යොදා ගනිමින් පොදි නල මාර්ග නැවත එලා සකස් කරන ලද්දේය.

බල ශක්ති සංරක්ෂණය කිරීමේ කටයුතු වශයෙන් සියළුම කලාපීය කාර්යාලයන් තුළ හා සහාය සේවා සැපයුම් කාර්යාලය තුළ වූ සියළුම සාමාන්‍ය විදුලි බුබුළු ඉවත් කොට ඒ වෙනුවට ආලෝක විමෝචන විදුලි බුබුළු හා සීඑෆ්එල් විදුලි බුබුළු යොදන ලදි. තිරුක්කෝවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ සාගම පොම්පාගාරයේ විදුලි මාර්ග වර්ගය 1 ට 1 වර්ගයෙන් වෙනස් කරන ලද අතර ඒ හේතු කොට ගෙන මසකට රුපියල් 2,00,000.00 ක මුදලක් ඉතිරි කරගත හැකි වූ අතර, එක් මෙහෙයුමක් යටතේ එක් පොම්පයක් නඩත්තු කිරීමට කටයුතු කරන ලදි. බල ශක්ති විගණනය කර ගෙන යන ලද අතර පොම්ප වක්‍රය අනුව පොළඹනය වෙනස් කරන ලදි.

කලාපීය ගබඩාවේ තොග මට්ටම් පහත දැමීම සඳහා සේවයට ගත නොහැකි හා චලනය නොවන භාණ්ඩ තොග හඳුනා ගනු ලැබූ අතර, තොග මට්ටම් අඩු කිරීමේ කටයුතු දැනට සැලසුම් කරනු ලැබ ඇත. වර්ෂය තුළදී බොහෝ වත් කම් කළමනාකරණ ක්‍රියාකාර කම්ද සිදු කරන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම් ගොඩ නැගීමට අදාලව සියළුම කලාපයන්ට අනුයුක්ත අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් හැකියා නංවා ලීමේ පුහුණු කිරීම් වැඩ සටහන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදල් භාවිතා කරමින් පවත්වන ලද්දේය. හඳුනාගනු ලැබ ඇති සියළුම යෝජනා ක්‍රමයන් සඳහා ජල සුරක්ෂිතතා සැලැසුම් කණ්ඩායම් පත් කරනු ලැබ ඇති අතර සියළුම මොඩියුලයන් ඉදිරිපත් කළ යුතු දිනයන් නියම කරනු ලැබ ඇත.

ග්‍රාමීය ජල සම්පාදන ක්‍රියාකාර කම් වශයෙන් පවුල් 700 කට ප්‍රතිලාභ ලැබෙන පරිදි ජෝන් කීල්ස් සමාගම විසින් සපයන ලද අරමුදල් හා නිධාන්ගත වකු ගඩු රෝගය මර්ධනය කිරීමේ අරමුදල් යොදා ගනිමින් රුපියල් දස ලක්ෂ 7.50 ක පිරිවැයක් වැය කරමින් ත්‍රිකුණාමල කලාපය තුළ ප්‍රතිලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර තුනක් ස්ථාපිත කරන ලදි. එසේම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන්නන්ගේ හා වෙනත් සංවිධානයන්ගේ සහාය ඇතිව ආරෝග්‍ය ශාලාවන්, පාසැල් හා ගම්මාන තුළ ආසන්න වශයෙන් ප්‍රතිලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 22 ක් ස්ථාපිත කරන ලදි. ත්‍රිකුණාමලයේ ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසින් ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින් 32 දෙනෙක්, පාසැල් දරුවන් හා පාසැල් ගුරුවරුන් වෙනුවෙන් ප්‍රතිලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ පුහුණු කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි. අම්පාර කලාපය තුළ 10001 ජල ටැංකි 132 ක් ස්ථානගත කරන ලද අතර දැනට ක්‍රියාත්මක කරමින් පවතින ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සම්පූර්ණයෙන් නිම වන තෙක් එකී ටැංකි වෙත බවුසර මගින් ජලය සැපයීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ සටහන යටතේ කින්නියාවේ ඉරක්කාමම් වෙත කිලෝ මීටර 11.65 ක් දිග **PVC** නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලදි. තවද, ප්‍රති ආරෝපණ අරමුදල් හා නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශයේ රුපියල් දස ලක්ෂ 560 අරමුදල යටතේ ත්‍රිකුණාමලයේ කින්නියා, වෙරුගල් හා තම්පලගාමම් ප්‍රදේශයන් තුළ **PVC** නල යොදා ගනිමින් කිලෝ මීටර 13.5 ක හා කිලෝ මීටර 29.5 ක නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද්දේය.

මඩකලපුව කලාපය තුළ ආරියම්පති, ඉරුතයපුරම්, වෙන්කලඩි හා මන්දූර් ප්‍රදේශයන් වෙත කිලෝ මීටර 13.87 ක නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලදි.

**ප්‍රාග්ධන අය වැය ප්‍රගතිය.**

කුඩා හා මධ්‍ය පරිමාණ උපයෝගිතා සිරු මාරු කිරීම් ව්‍යාපෘතීන් යටතේ කන්තලේ (අග්බෝපුර) ජල සම්පාදන ව්‍යාපෘතිය හා වාන් ඇල ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරෙමින් පැවැතිනි. ඉරුදයපුරම්, වෙන්කලඩි හා එරාවූර් හි කිලෝ මීටර 7. 0 ක් වූ නල මාර්ග දීර්ඝ කිරීම් රුපියල් දස ලක්ෂ 12.0 ක පිරිවැයක් දරමින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතීන් වශයෙන්, සූරියපොකුණ පුස්සලවින්න ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (දෙහිඅත්තකණ්ඩිය සූරියපොකුණ හා පුස්සලවින්න ග්‍රාම නිලධාරි වසම් තුළ ජීවත් වන ඉලක්ක පවුල් 500 ක් වෙනුවෙන්) 2016 වර්ෂයේ අවසානය වන විට 90 % ක් නිම කරනු ලැබ තිබිණි. සඳුන්පුර, ලිහිනියාගම හා මාවනාවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් (ඉලක්ක ජන ගහණය පවුල් 3000 කි) ප්‍රජා මූල සංවිධානයන් වෙතින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් භාර ගන්නා ලද අතර ඒවා ප්‍රතිකාරක ඒකක ස්ථාපිත කරමින් හා නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරමින් රුපියල් දස ලක්ෂ 33.0 ක පිරිවැයක් දරමින් පුනරුත්ථාපනය කරන ලදි. හෙන්නානිගල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (දෙහිඅත්තකණ්ඩියේ හෙන්නානිගල දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ ඉලක්ක පවුල් 1000 කි) ඉදි කිරීමේ කටයුතු රුපියල් දස ලක්ෂ 63.0 ක පිරිවැයකින් 2016 වර්ෂය තුළ ආරම්භ කරන ලද අතර දැනට එහි වැඩ කටයුතු වලින් 40 % ක් පමණ නිම වී ඇත. බක්මීගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ (ගෝමරන්කඩවල බක්මීගම හා මැදවච්චිය ග්‍රාම නිලධාරි වසම් තුළ ඉලක්ක පවුල් 475 කි) වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එහි පොම්පය සවි කිරීමට තිබේ. දේශීය බැංකු අරමුදල් වැඩ සටහන යටතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කිලෝ මීටර 105 ක් දිගට බෙදා හැරීමේ නල මාර්ග දීර්ඝ කිරීම් එලීම, කුළුණ හා ප්‍රතිකාරක ඒකකය ඉදි කිරීම හා මඩකලපු දිස්ත්‍රික්කයේ සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් නල මාර්ග එලීම ද රුපියල් දස ලක්ෂ 199.0 ක පිරිවැයක් යටතේ 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ඊට අවශ්‍ය සියළුම ද්‍රව්‍ය සපයා දෙන ලදුව නල මාර්ග එලීමේ කටයුතු වලින් 80% ක් නිම කරනු ලැබ ඇත. ත්‍රිකුණාමලය

කලාපය තුළ සේරු නුවර හා නීල පොල යන ප්‍රදේශයන් වෙත නව සේවා සම්බන්ධතාවයන් 6400 ක් සපයා දීම සඳහා කිලෝ මීටර 160 ක් දිගට PVC නල යොදාගනිමින් නල මාර්ග දීර්ඝ කිරීම හා ඝණ මීටර 750 ක ධාරිතාවයකින් යුත් කුළුණක් ඉදි කිරීම ද රුපියල් දස ලක්‍ෂ 539 ක මුළු පිරිවැයක් යටතේ 2014 වර්ෂය තුළදී ආරම්භ කරන ලදි. මෙම වැඩ වලින් කිලෝ මීටර 79 ක නල මාර්ග දීර්ඝ කිරීම් හා කුළුණ ඉදි කිරීමේ කටයුතු වලින් 50 % ක් ද නිම කරනු ලැබ ඇති අතර ඉතිරි වැඩ කොටස් 2017. 03. 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන් නිම කරනු හැකි වෙතැයි අපේක්ෂා කරනු ලැබේ. ආපදා අවදානම් අවම කිරීමේ වැඩ කටයුතු යටතේ ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර ප්‍රදේශයන් තුළ නියං තත්ත්වයේ බල පෑමට ගොදුරු වූ ප්‍රදේශයන් වෙත බවුසර් මගින් ජලය සම්පාදනය කිරීමට කටයුතු කරන ලදි. ප්‍රස්තුත වර්ෂය තුළදී නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 31581 ක් සපයා දීම ද, රුපියල් දස ලක්‍ෂ 273.08 ක් වටිනා ටෙන්ඩර 80 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කොට ඒ අතරින් ටෙන්ඩර 56 ක් ප්‍රදානය කිරීම ද සිදු කරන ලදි. නැගෙනහිර සහාය සේවා සැපයුම් මධ්‍යස්ථානයේ මුළු අයපත් කරණය, මුදල් රැස් කිරීම, ආදායම හා වියදම පිළිවෙලින් රුපියල් දස ලක්ෂ 1,387.19 ක්, රුපියල් දස ලක්ෂ 1,257.07 ක්, රුපියල් දස ලක්ෂ 1,700.98 ක් හා රුපියල් දස ලක්ෂ 1,763.43 ක් විය.

විවිධ ගැටළු කිහිපයකට මුහුණ දීමට ද වර්ෂය තුළ දී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට සිදු විය. සාරනු ලැබ ඇති ළිං දෙක වෙතින් ඉල්ලුම සපුරා ලීමට අවශ්‍ය තරම් ප්‍රමිතියෙන් යුත් ජලය ලබා ගැනීමට පුල්මොඩ්ඩෙයි කුඩා නගරයේ ජල සම්පාදන යෝජනා ක්‍රමය අසමත් විය. ඒ නිසා තාවකාලික ලෙස ආන්දන්කුළම් සුළු වාරි මාර්ග යෝජනා ක්‍රමය වෙතින් ජලය ලබා ගැනීමට සිදු විය.

මුතූර් ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලසුම් කරන ලද්දේ දිනකට ජලය ඝණ මීටර 8500 ක් නිෂ්පාදනය කිරීමටය. දැනට ඇති ඉල්ලුම දිනකට ජලය ඝණ මීටර 3000 කි. කෙසේ වුවද වියලි කාල සීමාව තුළදී නීලපොල තුළු මුව තුළට ගලා ඒමේ ධාරිතාවය අඩු වීම හේතු කොට ගෙන නිෂ්පාදනය කළ හැකි වූයේ දිනකට ජලය ඝණ මීටර 1900 ක් පමණකි. ගොවීන්ගෙන් ලැබෙන ඉල්ලුම නිසා සගමම් වාරි මාර්ග වැවෙන් තිරුක්කෝවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත ජලය ලබා ගැනීම සීමා වී ඇත.

## දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය / දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්.

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතී විසින් සාක්ෂාත් කරගෙන ඇති සාර්ථකත්වයන්.

2016 වර්ෂය තුළදී ඉදි කෙරෙමින් / වර්ධනය කෙරෙමින් පැවැතුන විදේශීය /දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් පෙන්නුම් කරනු ලබන සිතියම.

**විදේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපාති.**



| ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ඒජන්සිය |
|---|---|
| 1. කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර I - පියවර II | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 2. වීසල් කොළඹ ජල පුනරුත්ථාපනය | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 3. කොළඹට උතුරින් පිහිටි නගර ජල සම්පාදනය - පියවර II | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 4. වීසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපාතිය පියවර II | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 5. නැගෙනහිර පලාතේ ජල සම්පාදන සංවර්ධනය | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 6. කිලිනොච්චි ජල සම්පාදන පුනරුත්ථාපනය | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 7. අනුරාධපුර උතුර ජල සම්පාදනය | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 8. විසල් දඹුල්ල ජල සම්පාදනය - පියවර I | ඉන්දියාව |
| 9. වයඹ කලාපීය නාගරික ජල සම්පාදනය හා සනීපාරක්ෂණය | ආසියානු සංවර්ධන බැංකුව |
| 10. යාපනය - කිලිනොච්චි ජල සම්පාදනය හා සනීපාරක්ෂණය | ආසියානු සංවර්ධන බැංකුව |
| 11. වීසල් කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීම් ආයෝජනය | ආසියානු සංවර්ධන බැංකුව |
| 12. අම්පාර දිස්ත්‍රික් සේවා නොලබන ප්‍රදේශ සඳහා ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය | ආසියානු සංවර්ධන බැංකුව |
| 13. කොලොන්න - බලංගොඩ ජල සම්පාදන ව්‍යාපාතිය | බෙල්ජියම |
| 14. ලබුගම කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය | හන්ගේරිය |
| 15. බදුල්ල, හාලිඇල හා ඇල්ල ජල සම්පාදනය | එක්සත් ජනපද අපනයන ආනයන බැංකුව |
| 16. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ජල සම්පාදනය | චීනය |
| 17. මහියංගන ජල සම්පාදන ව්‍යාපාතිය වර්ධනය කිරීම | ඔස්ට්‍රියාව |
| 18. මොනරාගල බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපාතිය | KBC බෙල්ජියම |

**දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද ව්‍යාපාතීන්**

A. බෙන්තොට ජල සම්පාදන ව්‍යාපාතිය
B. අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපාතිය
C. රුහුණුපුර බෙදා හැරීම් ජල සම්පාදන ව්‍යාපාතිය
D. කොළඹ ජල සම්පාදන වැඩි දියුණු කිරීම් ව්‍යාපාතිය
E. කොළඹ දිස්ත්‍රික්කයට නැගෙනහිරින් පිහිටි ජල සම්පාදන ව්‍යාපාති - 1 වැනි පැකේජය
F. ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපාතිය
G. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපාතිය
H. ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපාතිය
I. ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපාතිය
J. වැලිගම ජල සම්පාදන ව්‍යාපාතිය

## විදේශීය අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්.

**ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්.**

1. කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1 පියවර 11 හා විසල් කොළඹ ප්‍රදේශයේ ආදායම් රහිත ජලය අවම කිරීම.



**බණ්ඩාරගම සිට පිළියන්දල දක්වා දිවෙන DI 1000/800 ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ විසල් කොළඹ ප්‍රදේශයේ දකුණු කොටස වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ. කැස්බෑව, පිළියන්දල, බොරලැස්ගමුව, මඩපාත, පොල්ගස්ඕවිට, කිඳෙල්පිටිය, කහතුඩුව, කිරිවත්තුඩුව, ගෝනාපොල, කුඹුක, පානදුර, කිරිබේරිය, නිව්දාව සහ හිරණ යන ප්‍රදේශයන්හි හා ඒ අවට වෙසෙන 3,00,000 ක ජනතාව (පවුල් 60000 ක්) වෙත මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලැසෙන අතර කොළඹ නගරයේ CBI ප්‍රදේශයේ ආදායම් රහිත ජලය අවම කිරීම මගින් විසල් කොළඹ නගරයේ පිටකොටුව, හෙට්ටියාවත්ත, කොටහේන, මරදාන හා කොම්පඤ්ඤ වීදිය ප්‍රදේශයේ ජීවන පරිසරය වැඩි දියුණු වනු ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් සපයා දෙන ලද ජපන් යෙන් දස ලක්ෂ 8388 ක් වූ ODI ණය මුදල හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය වූ රුපියල් දස ලක්ෂ 2458 ක මුදල ද උපයෝගී කර ගනිමිනි. ජල ප්‍රභවය වන්නේ කළු ගඟයි. 2009 සැප්තැම්බර් මාසයේදී ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර මුල් විෂය පථයට අදාල සියළුම භෞතික වැඩ කටයුතු සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කරන ලද අතර අතිරේක විෂය පථයට අදාල වැඩ කටයුතු ණය මුදලින් ඉතිරි වූ මුදල් උපයෝගී කර ගනිමින් 2016 ජූලි මාසය වන විට අවසාන කරන්නට හැකි විය.

දිනකට ජලය ඝණ මීටර 60000 ක ධාරිතාවයකින් යුත් කඳන (හොරණ) ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර දිගුව ඉදි කිරීම් කටයුතු ද, බණ්ඩාරගම සිට පිළියන්දල දක්වා ඉදි කරන ලද කිලෝ මීටර 14.7 ක් දිග 1000/8000 විෂ්කම්භයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය ද, කැස්බෑව, ජඹුරලිය හා කුඹුක ජල කුළුණු වෙත ඉදි කරන ලද කිලෝ මීටර 67 ක් දිග මිලි මීටර 450/400 විෂ්කම්භයකින් යුත් දෙවැනි ප්‍රධාන නල මාර්ගය ද, කැස්බෑව (ඝණ මීටර 1500 ක ධාරිතාව), ජඹුරලිය හා කුඹුක (එකක් ඝණ මීටර 1000 ක ධාරිතාවයෙන් යුත්) ඔසොවි ජල කුළුණු 3 ක් ඉදි කිරීම ද, පානදුර, කිරිබේරිය හා කැස්බෑව නැගෙනහිර / බටහිර ප්‍රදේශයේ සිට කිලෝ මීටර 250 ක් දිග නව බෙදා හැරීමේ නල මාර්ග එලීම හා කොළඹ CBI ප්‍රදේශයේ ආදායම් රහිත ජලය අවම කිරීම සඳහා එවකට තිබුණ CI නල මාර්ග වෙනුවට කිලෝ මීටර 48.7 ක් දිගට නව CI නල මාර්ග එලීම ද මුල් විෂය පථයට අයත් වැඩ කටයුතු වලට ඇතුලත් විය.

ඉහතින් සඳහන් කරන ලද මුල් වැඩ කටයුතු වලට අමතර වශයෙන් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානයේ ඩෘෂ ණය මුදලින් ඉතිරි මුදල් භාවිතා කරමින් පහත සඳහන් ඉදි කිරීම් හා සැපයුම් ද සිදු කරන ලදි. එනම්, කොළඹ කොම්පඤ්ඤ වීදිය ප්‍රදේශයේ දෙවැනි බෙදා හැරීම් පද්ධතිය (ආසන්න වශයෙන් කිලෝ මීටර් 25 ක් දිග) පුනරුත්ථාපනය කොට ක්‍රියාත්මක කිරීම ද, වැල්මිල්ලේ ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ඔසොවි ජල කුළුණ ඉදි කිරීම ද, ව්‍යාප්ත කරන ලද හා මූලික වැඩ විෂය පථය යටතේ ආවරණය නොවූ ප්‍රදේශය වෙත කිලෝ මීටර් 212 ක් දිග ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය එලීම ද, බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්යාලය සඳහා සිව් මහල් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම ද, පිළියන්දල ප්‍රදේශය භාර ඉංජිනේරු වරයා සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම ද, කුඹුක ස්ථාන භාර නිලධාරී වරයා සඳහා කාර්යාලය හා නිල නිවාසය ඉදි කිරීම ද, මෙහෙයුම් හා නඩත්තු වැඩ කටයුතු සඳහා අවශ්‍ය මෙවලම්, යන්ත්‍රෝපකරණ, උපකරණ හා පරිගණක සැපයීමද වේ.

අළුතින් ඉදි කරන ලද ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් නල මාර්ග සහ කැස්බෑව, ජඹුරලිය, කුඹුක හා වැල්මිල්ල ඉදි කරන ලද ජල කුළුණු හතර ක්‍රියාත්මක තත්ත්වයට පත් කොට පරිහරණය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අදාල මෙහෙයුම් හා නඩත්තු අංශයන් වෙත පවරා දෙන ලදි. කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කොට ඇති අතර ඒවා අදාල කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ඉංජිනේරු හා ස්ථාන භාර නිලධාරී කාර්යාලයන් වෙත භාර දෙනු ලැබ ඇත.

8 ඒ කොන්ත්‍රාත්තු පැකේජය (එනම් කොළඹ CBI ප්‍රදේශයේ ආදායම් රහිත ජල කිලෝ මීටර 56.6 ක් දිග නල මාර්ග නැවත එලීම) හැර අනිකුත් සියළුම කොන්ත්‍රාත්තු පැකේජ වෙනුවෙන් වූ අවසාන ගෙවීම් සියල්ල පියවා අවසන් කොට ඇත. 8 ඒ කොන්ත්‍රාත්තු පැකේජය වෙනුවෙන් වූ ගෙවීම් කොන්ත්‍රාත් කරුගේ හිමිකම් පෑම අවසන් වන තෙක් රඳවා ගනු ලැබ ඇත.

2016 දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100 % ක් හා 98 % ක් වේ.

**2. විසල් කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය.**



**මාලිගාකන්ද ජලාශය**

මෙම පුනරුත්ථාපන ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරන ලද්දේ කොළඹ ප්‍රදේශයේ ආරක්ෂිත පානීය ජල සැපයුම හා සම්බන්ධ සේවා මට්ටමේ තත්ත්වය ඉහල නංවා ලීමයි. ඒ වැනි බොහෝ ප්‍රාග්ධන ව්‍යාපෘතීන් අතර මෙම ව්‍යාපෘතිය ද සහශ්‍ර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඇතිව සැලසුම් කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන් කිහිපය අතුරින් එක් ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය විසල් කොළඹ ප්‍රදේශයේ ආදායම් රහිත ජලය අවම කිරීමේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දීර්ඝ කාලීන ක්‍රමෝපාය සාර්ථක කර ගැනීම පිණිස තබන ලද ඉදිරි පියවරකි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 4,785 ක් වන අතර ඒ සඳහා අරමුදල් සපයනු ලබන්නේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසිනි. එය සැලැසුම් කරන ලද්දේ

කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ සහ කෝට්ටේ - මුල්ලේරියාව ප්‍රදේශයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කොට නංවා ලීමේ අරමුණ ඇතිව වේ. එහි ආරම්භක දිනය වූයේ 2007 දෙසැම්බර් 27 වැනි දිනය වන අතර 2017 පෙබරවාරි 28 වැනි දිනය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත. ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 2012 වර්ෂයේදී 125000 ක් වනු ඇත.

**මෙම ව්‍යාපෘතිය සමන්විත වන්නේ පහත සඳහන් අංගයන්ගෙනි :**

i. මාලිගාකන්ද ජලාශය - අපේක්ෂා කරන්නේ අනාගත හා අවිනිශ්චිත අවස්ථාවන් වෙනුවෙන් ගබඩාකරණ ධාරිතාවය වැඩි කරමින් මැද කොළඹ ප්‍රදේශයේ ජල පද්ධතිය වැඩි දියුණු කිරීම වේ.

ii. එලි හවුස් ජලාශය - අපේක්ෂා කරන්නේ අනාගත හා අවිනිශ්චිත අවස්ථාවන් වෙනුවෙන් ගබඩාකරණ ධාරිතාවය වැඩි කරමින් උතුරු කොළඹ ප්‍රදේශයේ ජල පද්ධතිය වැඩි දියුණු කිරීම වේ.

iii. ගොතටුව ජල කුළුණ - අපේක්ෂා කරන්නේ කෝට්ටේ මුල්ලේරියාව ප්‍රදේශයේ ජල පද්ධතිය වැඩි දියුණු කිරීම වේ.

iv. අඹතලේ සිට ගොතටුව (IDH) දක්වා වූ සම්ප්‍රේෂණ ධාරිතාවය වැඩි කිරීම.

v. ආදායම් රහිත ජලය අවම කිරීම, නීති විරෝධී ජල සම්බන්ධතාවයන් අවම කිරීම හා දෙමටගොඩ ප්‍රදේශයේ අඩු ආදායම් ලබන ජනතාවගේ සෞඛ්‍ය හා ජීවන තත්ත්වයන් නංවා ලීම.

vi. කොළඹ මහ නගර සභාවේ කසල ශෝධන කාර්ය මණ්ඩලයේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල කර්මාන්ත කාර්ය මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ කාර්යාල පහසුකම් වැඩි දියුණු කිරීම.

කොළඹ මහ නගර සභාව හා සමග ඇති වූ ඇතැම් ගැටළු සහගත තත්ත්වයන් හා ප්‍රමාදයන් නිසා වැඩ නැවතුන මාලිගාකන්ද වෑල්ව කුටි පරිශ්‍රයේ හැර අයවැය ලේඛන ගත අනිකුත් කාර්යයන් අතුරින් ඇතැම් ඒවා සාක්ෂාත් කරගෙන ඇති අතර ඉතිරි වැඩ කොටස් යාවත්කාලීන ලෙස දැනට කරගෙන යමින් පවතී. ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ගය, කෝට්ටේ මුල්ලේරියාව ප්‍රදේශයේ බෙදා හැරීම් ජාලය, ගොතටුව ජල කුළුණ, යාන්ත්‍රික හා විදුලිත් වැඩ කටයුතු සහ ආදායම් රහිත ජලය අවම කිරීමේ වැඩ කටයුතු සාර්ථක ලෙස නිම කරනු ලැබ ඇත. එලි හවුස් හා මාලිගාකන්ද ජලාශයන් සම්පූර්ණයෙන් නිම කොට භාර දෙනු ලැබ ඇති අතර මාලිගාකන්ද වෑල්ව කුටිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එය පවත්නා බෙදා හැරීමේ ජාලය හා සම්බන්ධ කළ යුතුව ඇත. කොළඹ මහ නගර සභාවට අයත් ඉඩම් අත් පත් කරගෙන පිරිසිදු කිරීමට ඇති හෙයින් මාලිගාකන්ද වෑල්ව කුටිය ඉදි කිරීම ප්‍රමාද විය. වැඩ වල ප්‍රමිතියේ තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘති කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කොන්ත්‍රාත් කරු සමග නිරන්තරයෙන් රැස්වීම් පවත්වමින් සියළුම ව්‍යාපෘති ක්‍රියාකාර කම් සමීප ලෙස පසු විපරම් කිරීමේ කටයුතු අඛණ්ඩ ලෙස කරගෙන යනු ලැබේ. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 97.78% ක් හා 108.86 % ක් විය.

### 3. කොළඹින් උතුර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර 11



කඳාන පොම්පාගාරය.

කොළඹින් උතුර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කිරීමෙන් අරමුණු කරන ලද්දේ වර්ෂ 2020 වන විට 600000 ක ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීම මගින් සේවා සැපයීම වන අතර ප්‍රක්ෂේපිත ඉල්ලුම දිනකට ආසන්න වශයෙන් ජලය ඝණ මීටර 180000 ක් වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ **JBIC (SL-P 90)** විසින් සපයන ලද **ODA** ණය මුදලේ සහාය ඇතිව වන අතර ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දස ලක්ෂ 6,500 ක් විය. මුල් විෂය පථය 2012 වර්ෂයේදී නිම කරන ලද අතර අමතර වැඩ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

ව්‍යාපෘතියේ 11 වැනි පියවරට ඒකල සහ කඳානේ ඉදි කරනු ලබන භූ ජලාශයන් දෙකක් ද, දෙල්ගොඩ ඉදි කරනු ලබන ඔසොවි තුලන ජලාශයක් ද, කඩවත පිහිටුවනු ලබන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයක් ද ඇතුළුව මහර, බියගම, ගනේමුල්ල, රාගම, වැලිසර, මුතුරාජවෙල, පමුණුගම, කඳාන, ජා ඇල හා ඒකල යන ප්‍රදේශයන් ආවරණය වන බෙදා හැරීම් පද්ධතීන් ඇතුලත් වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාරිභෝගික සේවා ඒකකයන් පිහිටුවීම සඳහා කාර්යාල ගොඩ නැගිලි කිහිපයක් ඉදි කිරීම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

මූලික විෂය පථය යටතේ වූ සිවිල් වැඩ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ නව සම්බන්ධතාවයන් ලබා දීම සඳහා මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. මාර්ග හිඩැස් පිරවීම සඳහා අවශ්‍ය අතිරේක සම්පත් හා නල මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. යාන්ත්‍රික හා විදුලිත් වැඩ සපයා ස්ථාපිත කර ක්‍රියාත්මක තත්ත්වයට පත් කොට සම්පූර්ණයෙන් නිමවා මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. තවද කැළණිය හා වත්තල ප්‍රදේශයන් තුළ AC නල මාර්ග සඳහා පීවීසී නල සපයා එලීම ද සම්පූර්ණයෙන් නිම කොට මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත පවරා දෙනු ලැබ ඇත.

ඉතිරි මුදල් ප්‍රමාණයන් උපයෝගී කර ගනිමින් කරන ලද අමතර වැඩ යටතේ දෝෂ සහිත වෑල්ව වෙනුවෙන් නව වෑල්ව සපයා සවි කිරීම ද, ව්‍යාපෘති ප්‍රදේශය තුළ නව වෑල්ව ස්ථාපිත කිරීම ද, කැළණියේ ප්‍රාදේශීය ඉංජිනේරු වරයාගේ කාර්යාලය ඉදි කිරීම ද, කොටුගොඩ ප්‍රදේශයට වෑල්ව සපයා DI හා පීවීසී නල එලීම හා රතුපස්වල ප්‍රදේශයට පීවීසී නල සැපැයීමද නිම කරනු ලැබ ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ හා කටුනායක ආයෝජන මණ්ඩලයේ ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජලාශය ඉදි කිරීම හා ජල සම්පාදන ක්‍රමයන්ගේ පොම්පාගාර වර්ධනය කිරීම ද අමතර අරමුදල් උපයෝගී කර ගනිමින් 2015 මැයි මාසයේදී ආරම්භ කරන ලද අතර දැනට එම වැඩ කටයුතු නිම කරනු ලැබ ඇත.

තොරතුරු තාක්ෂණ උපකරණ, යන්ත්‍ර සූත්‍ර, වාහන, අන්තර් ජාල පුහුණු කිරීම් මෘදුකාංග, අමතර සම්පත් හා ද්‍රව්‍ය, එළදායි තාවය වර්ධනය කිරීමේ ක්‍රියාකාර කම් යටතේ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත සපයා දෙන ලදි. මූලික විෂය පථය යටතේ වූ සියළුම වැඩ කටයුතු මෙන්ම අමතර වැඩ ද ඉතිරි කරගත් මුදල් උපයෝගී කර ගනිමින් 2016 වර්ෂය තුළ දී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

### 4. විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1 පියවර 11



විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය

විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 1997 වර්ෂයේදීය. ප්‍රධාන සැලැසුම සකස් කිරීම, සවිස්තරාත්මක සැලැසුම සකස් කිරීම මෙන්ම අදියර 1 පියවර 1 හා අදියර 1 පියවර 11 යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ද ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ අරමුදල් සහාය ඇතිව සිදු කරන ලදි. ඒ අනුව අදියර 1 පියවර 1 2003 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2006 ඔක්තෝබර් මාසයේදී නිම කොට අවසන් කරන ලදි. අදියර 1 පියවර 1 යටතේ තුඹ මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, සේවා ජලාශයන් 4 ක්, පොම්පාගාර 3 ක්, කිලෝ මීටර 25 ක් දිග සම්ප්‍රේෂණ නල මාර්ග හා කිලෝ මීටර 15 ක් දිග බෙදා හැරීමේ නල මාර්ග ඉදි කරන ලද අතර එම වැඩ කටයුතු මගින් මහනුවර නගරයේ හා ඒ අවට 281000 ක ජනතාවකට සෙත සැලැසුන අතර අදියර 1 පියවර 1 ට අදාල වැඩ කටයුතු සඳහා වැය වූ පිරිවැය ජපන් යෙන් දස ලක්ෂ 3,679 ක් හා රුපියල් දස ලක්ෂ 1,086 ක් විය.

2007 වර්ෂයේදී පැකේජ අටක් වශයෙන් 1 වැනි අදියරේ දෙවැනි පියවර ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ අරමුදල් සහාය යටතේ ක්‍රියාත්මක කරන ලදි. මෙහි විෂය පථය තුළට සේවා ජලාශ 8 ක් ඉදි කිරීම ද, පොම්පාගාර 3 ක් ඉදි කිරීම ද, සම්ප්‍රේෂණ නල මාර්ග කිලෝ මීටර් 19 ක් එලීම ද, බෙදා හැරීමේ නල මාර්ග කිලෝ මීටර 78 ක් එලීම ද, බාදිය ප්‍රතිසාධන පහසු කම් ද, සේවක මණ්ඩල නිල නිවාස 12 ක් ඉදි කිරීම හා ජලයේ සුදුසු භාවය පරීක්ෂා කිරීමේ රසායනාගාරයක් ඉදිකිරීම ද ඇතුලත් විය. මේ හරහා අකුරන, පූජාපිටිය, හාරිස්පත්තුව, තුම්පනේ සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයන්හි වෙසෙන ජනතාව වෙත සෙත සැලසුනි. තවද 2011 හා 2013 වර්ෂයන් තුළදී එකී ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ ණය අරමුදලින් ඉතිරි වී තිබුණ මුදල් උපයෝගී කර ගනිමින් ඇතැම් අමතර කොන්ත්‍රාත්තු පැකේජයන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ අනුව මැදවල, කෝපි වත්ත හා රජපිහිල්ල යන ප්‍රදේශයන්හි ජල සම්පාදන පහසු කම් වැඩි දියුණු කිරීමට හා එමෙන්ම ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාර කම් කරගෙන යාමට ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි. අදියර 1 පියවර 11 යටතේ කරන ලද මෙම වැඩ කටයුතු සඳහා වැය වූ මුළු පිරිවැය ජපන් යෙන් දස ලක්ෂ 4,634 ක් හා රුපියල් දස ලක්ෂ 1,122 ක් වූ අතර ඒ තුළින් 269,300 ක ජන ගහණයකට සෙත සැලසුනි.

ආයතන සංවර්ධන වැඩ කටයුතු වශයෙන් 'සුරකිමු සැම ජල බිඳුවක්ම අප පණ මෙන්' නම් වූ පොත මුද්‍රණය කොට මුළු රට පුරා පිහිටි පාසැල් අතර බෙදා දීම ද, නියමු ව්‍යාපෘතියක් වශයෙන් ඉපිලුමෙන් ක්‍රියාත්මක කෙරෙන වෑල්ව නියාමනය දියත් කිරීමත් (අංක 1953 / 27 දරණ අදාල ගැසට් නිවේදනය 2016.02.11 වැනි දින ප්‍රසිද්ධ කරන්නට යෙදුන අතර එම ගැසට් නිවේදනය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය 2016 ජුලි 21 වැනි දින ලැබුණි. එම ගැසට් නිවේදනය 2017.1.1 දින සිට බලාත්මක විය), ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා සම්බන්ධ දෘඩාංග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමත්, ඉපිලුමෙන් ක්‍රියාත්මක කෙරෙන වෑල්ව සම්බන්ධයෙන් එම වෑල්ව නිෂ්පාදනය කරන්නන් හා ආනයනය කරන්නන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීමත්, ඉහල බල ධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීමත්, පාසැල් දරුවන් හා ගුරු මහත්ම මහත්මීන් වෙනුවෙන් දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් පැවැත්වීමත් හා මුළු දිවයින පුරා පාසැල් තුළ ජල සංරක්ෂණ සමාජ පිහිටුවීමත් 2016 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

මීට අමතරව, විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ එහි සේවාවන් නොලැබුණ ප්‍රදේශ ආවරණය කිරීම සඳහා මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය පිහිටුවා ලීම පිණිස විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය සිය සහාය ලබා දුන් අතර, ප්‍රතිසම්පාදන අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස මග පෙන්වීමක් වශයෙන් (සැලැසුම් මත ගොඩ නගන ලද) නියැදි ලංසු ප්‍රලේඛනයක් ජල අංශය වෙත ඉදිරිපත් කිරීමට ඊට හැකි වුන අතර ඒ අනුව කොන්ත්‍රාත් කරුවන් මුහුණ පාන අවදානම් තත්ත්වයන් අවම කිරීමේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හොඳ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ හා සේවා පැකේජයන් ලබා ගැනීමේ හැකියාව ඇති කිරීමේත් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා නිෂ්පාදනය කරනු ලබන රටවල් හා නිර්දේශිත නිෂ්පාදකයින්ගේ ලැයිස්තුව නම් ලේඛනය ඉදිරිපත් කරන ලද්දේය. ආදායම් රහිත ජලය වැලැක්වීමේ හා නිවැරදි කිරීමේ ක්‍රමෝපායයන් උපදේශක වැඩ මුළු මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර නිවාස සම්බන්ධතා 5000 වැඩ සටහන යටතේ දියත් කරන ලද නියමු ව්‍යාපෘතියක් මගින් එම ක්‍රමෝපායයන්ගෙන් ඇතැම් ඒවා ක්‍රියාත්මක කරන ලදි. නිවාස සම්බන්ධතාවයන් සැපැයීම සඳහා හොඳ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා ගැනීමට හැකි වන පරිදි නියැදි ලංසු ප්‍රලේඛනයන් ඉදිරිපත් කරන ලදි. විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර 11 න් ලැබුණ ප්‍රතිඵලයක් වශයෙන් ජලයේ සුදුසු භාවය පිරික්සා බැලීමේ රසායනාගාරය වෙත ජලයේ ගුණාත්මය පිළිබඳ පරාමිතීන් නිශ්චය කිරීම සඳහා අවශ්‍ය සංස්ථිති පිරික්සුම් උපකරණයන් ලබා දෙන ලදි.

2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් 99.9% ක් හා 100% ක් විය.

## 5. නැගෙනහිර පලාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ අම්පාර දිස්ත්‍රික්කයේ වාසය කරන 209,270 ක ජනතාවක් වෙත සේවා සැපැයීමේ අරමුණෙනි. ව්‍යාපෘති ප්‍රදේශයෙන් වඩා විශාල කොටස වෙත සේවා සැපයීමට සැලැසුම් කරනු ලැබ ඇත්තේ දෙහිඅත්තකණ්ඩියේ හා කොන්ඩවටුවන දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වෙතින් දැනට ලැබෙන නිෂ්පාදිත ජලයෙන් වන අතර ඒවාට අමු ජලය ලැබෙන ප්‍රභවයන් වන්නේ පිළිවෙලින් මහවැලි ගඟ හා කොන්ඩවටුවන ජලාශය වේ. මහ ඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත සේවය සපයනු ලබන නව මහ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත අමු ජලය ලැබෙන ප්‍රභවය වන්නේ රඹකැන් ඔය ජලාශයයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 6,526 කි. ප්‍රමුඛතා පිළිවෙල අනුව ව්‍යාපෘතියේ අංගයන් වන්නේ කොන්ඩවටුවන සිට කල්මුනේ දක්වා දිවෙන ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය, පොතුවිල්, සම්මන්තුරෙයි, ඉරක්කාමම්, දීඝවාපිය, උහන, දමන, හිඟුරාන, ඝණ මීටර 6500 ක ජල ධාරිතාවයකින් යුත් මහ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය, ජල කුළුණු, බිම් ටැංකි, පොම්පාගාර හා දෙහිඅත්තකන්ඩිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීම ද වන්නේය.

තවද, ව්‍යාපෘතියෙන් ඉතිරි වී ඇති සේ හඳුනාගනු ලැබ ඇති අරමුදල් උපයෝගී කර ගනිමින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ එකඟත්වය ඇතිව මුල් විෂය පථය ඉක්මවා යමින් ජල සම්පාදන ආවරණය වැඩි කිරීම හරහා ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීමට දායක වනු පිණිස පානම ප්‍රදේශය හා කෝනේස්පුරම් ප්‍රදේශය ආවරණය කිරීම පිණිස නව වැඩ පැකේජ දෙකක් ක්‍රියාත්මක කරනු ලැබේ.

දෙහිඅත්තකන්ඩිය තුළු මුව පොම්ප හැරෙන්නට ව්‍යාපෘතියේ සෙසු සියළුම අංගයන් ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ දැනට මෙහෙයුම් කටයුතු වල යොදවා ආදායම් ජනනය කරන තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

ලංසු තැබීමේ ක්‍රියාවලිය තුළ ඇති ඉහල තරඟකාරී තත්ත්වය හේතු කොට ගෙන විවිධ කොන්ත්‍රාත්තු පැකේජයන්ට අදාල මිළ ගණන් ද ඉතා තරඟකාරී තත්ත්වයකට පත් වී තිබිණි. එකී තරඟකාරී ස්වභාවය නිසා මෙන්ම නිවැරදි කොන්ත්‍රාත්තු සමුද්ගකරණය හා ඛක්ර් ක්‍රියාවලිය හේතු කොට ගෙන ද 2012 - 2015 කාල සීමාව තුළදී දිනකට ජලය ඝණ මීටර 6500 ක ධාරිතාවයකින් යුත් මහ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය රුපියල් දස ලක්ෂ 1,000 ක මුළු පිරිවැයකින් සම්පූර්ණයෙන්ම නිම කිරීමේ හැකියාව ලැබිණි.

## 6. කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපාතිය පුනරුත්ථාපනය කිරීම.

ගැටුම්කාරී තත්ත්වයන් පාලනය කරනු ලැබූ වහාම කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කරනු ලැබිය යුතු බවට හඳුනා ගන්නා ලද්දේය. එකී පුනරුත්ථාපනය කිරීමේ කටයුතු කරගෙන යන ලද්දේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියෙන්

ලැබුණ ප්‍රදානයක් හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් ද යොදා ගනිමිනි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2011 වර්ෂයේ මාර්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2016 ඔක්තෝබර් මාසයේදී එය සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය ජලය ඝණ මීටර 3800 ක් වන අතර කිලිනොච්චි හා පරන්තන් යන ප්‍රදේශයන් තුළ සේවා සපයා දෙනු ලැබීමට අපේක්ෂිත ඉලක්ක ජන ගහණය 40000 කි. ව්‍යාපෘතිය යටතේ අළුතින් ඉදි කරන ලද අංගයන් වන්නේ (ඝණ මීටර 1000 ක හා ඝණ මීටර 400 ක ධාරිතාවයන්ගෙන් යුත්) ඔසොවි කුළුණු දෙකක්, රළු ගතිය කැපීමේ පෙරණයන්, සෝදන ලද වැලි ගබඩා කිරීමේ අංගනය, සෝදන ලද ජලය ගබඩා කිරීමේ පොකුණ, නව පොම්පයක් හා අදාල උපකරණ සපයා ස්ථාපිත කිරීම, කිලෝ මීටර 8 ක් දිය ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර 49 ක් දිග ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය, පනේල කාමරය සහ විදුලි ජනන යන්ත්‍ර කාමරය ද වේ. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට හා තුළු මුවට අනුබද්ධ සිවිල් ව්‍යුහයන් පුනරුත්ථාපනය කරන ලදි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියෙන් ලැබුණ ප්‍රදානය යටතේ වන අතර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1940 ක් වේ.

ව්‍යාපෘතියේ 1 වැනි පියවර යටතේ කිලිනොච්චි නගරය, කනගපුරම්, තිරුනගර් දකුණ හා කනේෂපුරම් යන ග්‍රාම නිලධාරී වසම් ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, එහි 11 වැනි පියවර යටතේ භාරතීපුරම්, මලයාලපුරම්, විවේකානන්දනගර්, අනන්තපුරම් තොන්ඩමනගර් හා තිරුනගර් උතුර යන ග්‍රාම නිලධාරී වසම් ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ප්‍රධාන කොන්ත්‍රාත්තුව යටතේ වූ භෞතික ඉලක්කය සාක්ෂාත් කර ගන්නා ලද අතර එය ක්‍රියාත්මක තත්ත්වයට පත් කොට භාර දීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ 1 වැනි පියවරෙහි සමස්ත භෞතික ප්‍රගතිය 92.6 % ක් විය. 1 වැනි පියවර යටතේ නිවාස සම්බන්ධතා ලබා දීමේ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. අතිරේක නල මාර්ග කිලෝ මීටර 35 ක් එලීමේ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතියේ 11 වැනි අදියර යටතේ ප්‍රදානය කරන ලද අතර එය 20.6 % ක භෞතික ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන තිබේ. 2016 වර්ෂයේ දෙසැම්බර් මාසයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගෙන තිබි සමස්ත මූල්‍ය ප්‍රගතිය 77.36% ක් වේ.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ මෙහෙයුම් කටයුතු, යාන්ත්‍රික හා විදුලි පහසු කම් නඩත්තු කිරීම, ජලයේ ගුණාත්මය මන්තු කිරීම හා පාලනය කිරීම, නිවාස සම්බන්ධතා හා ජල මනු ස්ථාපිත කිරීම හා බෙදා හැරීමේ ජාලය නඩත්තු කිරීම සම්බන්ධ පුහුණු කිරීමේ වැඩ සටහන් එන්ජේඑස් උපදේශක සමාගම විසින් පවත්වන ලදි.

**7. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපාතිය (අදියර 1)**



මෙම ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 75 කින් සමන්විත මැදවච්චිය හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඉදි කිරීම මගින් එම ප්‍රදේශයන් තුළ (2034 වන විට) ජීවත් වන ආසන්න වශයෙන් 115,600 ක් වූ ජන ගහණය වෙත ආරක්ෂාකාරී පානීය ජලය සම්පාදනය කර දීම වන්නේය. මීට අතිරේක වශයෙන් මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් දෙකක් ද මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කිරීමට නියමිත අතර දැනට එම ප්‍රදේශයේ සිටින ජනතාව යැපෙන්නේ දන්ත හා අස්ථි ෆ්ලෝරෝසියාවට හේතු වන හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකුගඩු රෝගයට තුඩු දීමේ ඉහල ප්‍රවණතාවයක් ඇති අනාරක්ෂිත භූ ගත ජලය මත වේ.

ව්‍යාපෘතිය වෙත මූල්‍ය ප්‍රදාන දායකත්වය ලබා දෙන නියෝජිතායතනය වන්නේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය වන අතර ව්‍යාපෘතියේ ආරම්භක පිරිවැය ජපන් යෙන් දස ලක්ෂ 5,166 ක් හා රුපියල් දස ලක්ෂ 2,786 ක් වන්නේය. ණය මුදල 2013 ජූලි 5 වැනි දින සිට බලාත්මක වූ අතර උපදේශක කොන්ත්‍රාත්තුව 2014 ජූලි 15 වැනි දින ආරම්භ විය.

ව්‍යාපෘතියේ අංගයන් වන්නේ මහකනදුරාව වැවෙහි ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 19,800 ක ධාරිතාවයකින් යුත් තුළු මුව ද, දිනකට ජලය ඝණ මීටර 9,400 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, කිලෝ මීටර 89 ක දිගින් යුත් **HDPE** ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය ද, කිලෝ මීටර 163 ක දිගින් යුත් **HDPE** ප්‍රධාන බෙදා හැරීමේ නල මාර්ග පද්ධතිය ද, කිලෝ මීටර 330 ක දිගින් යුත් පීවීසී බෙදා හැරීම් නල මාර්ග පද්ධතිය ද, ඔසොවු ටැංකි 4 ක් ද, බිම් ටැංකි 3 ක් හා යාන්ත්‍රික හා විදුලි වැඩ ද වේ.

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි අදියර සඳහා වූ උපදේශක කොන්ත්‍රාත්තුව 2014 වර්ෂයේදී ප්‍රදානය කරන ලද අතර, සවිස්තරාත්මක සැලසුම් හා සියළුම කොන්ත්‍රාත්තු පැකේජ වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තු ලිපි ලේඛන පිළියෙල කිරීම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

**"ඒ"** කොටස (තුළු මුව පහසු කම්, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ජලය ගබඩා කිරීමේ ව්‍යුහයන් ඉදි කිරීම් සහ සහ යාන්ත්‍රික, විදුලි හා ගොඩනැගිලි වැඩ) සඳහා වූ කොන්ත්‍රාත්තු පැකේජයට අදාල ලංසු තැබීමේ ලිපි ලේඛන 2016 ඔක්තෝබර් 04 වැනි දින **PQ** ලංසු කරුවන් වෙත නිකුත් කරන ලදි. ලංසු භාර ගැනීම 2017 ජනවාරි 03 වැනි දින අවසන් කිරීමට නියමිතව තිබුණද පසුව එය 2017 ජනවාරි 31 ක් වැනි දිනය දක්වා දීර්ඝ කරනු ලැබිනි.

**"බී"** කොටස (සම්ප්‍රේෂණ නල මාර්ග, උප ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග හා ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ග සපයා එලීම) සඳහා වූ කොන්ත්‍රාත්තු පැකේජයට අදාල ලංසු අගැයීමේ කටයුතු වෙනුවෙන් 2016.10.27 වැනි දින ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ එකගත්වය ලැබුණි. කැබිනට් පත්‍රිකාව කෙටුම් පත් කර ප්‍රතිසම්පාදන අධ්‍යක්ෂ වරයා වෙත ඉදිරිපත් කරන ලදි. අධ්‍යාස ලිපි අසාර්ථක වූ ලංසු කරුවන් වෙත යවන ලදි. දෙවැනි පහලම ලංසුව ඉදිරිපත් කරන ලද ලංසු කරුවා විසින් ප්‍රතිසම්පාදන අභියාචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර ප්‍රතිසම්පාදන අධ්‍යක්ෂ වරයා විසින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනිමින් පවතී.

**"සී - 1"** කොටස (ඉසින්බැස්සගල බෙදා හැරීම් කලාපය තුළ **u PVC** නල මාර්ග එලීම, සවි කිරීම් හා විශේෂාංග සැපයීම, **DI** සහ **GI** නල මාර්ග සපයා එලීම) වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර 2016 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වන විට කිලෝ මීටර් 4.1 ක් දිගින් යුත් නල මාර්ග එලා අවසන් කරනු ලැබ ඇත.

**"සී - 2"** කොටස (යූපීවීසී නල, සවි කිරීම් හා විශේෂ උපාංග සපයා ගෙනවිත් භාර දීම) සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර නල, සවි කිරීම් හා උපාංගයන් ගෙනවිත් භාර දීම සිදු කෙරෙමින් පවතී. එම කටයුතු වලින් 99% ක් නිම වී ඇත.

**"සී - 3"** කොටස (නැගෙනහිර රඹෑව, ඇතාකඩ හා රඹෑව යන බෙදා හැරීම් කලාපයන් තුළ යූපීවීසී නල මාර්ග එලීම, සවි කිරීම් හා විශේෂ උපාංගයන් සවි කිරීම, **DI** සහ **GI** නල මාර්ග සපයා එලීම හා සවි කිරීම් හා විශේෂ උපාංගයන් සපයා සවි කිරීම) සම්බන්ධ

කොන්ත්‍රාත්තුව රුපියල් 218,130,094.00 ක මුදලකට හා රුපියල් 89,985,000.00 ක යාවකාලික මුදලකට හා රුපියල් 30,811,509.40 ක අවිනිශ්චිත අවස්ථා ප්‍රතිපාදනයකට ප්‍රදානය කරන ලද අතර 2016 දෙසැම්බර් මස අවසානය වන විට කිලෝ මීටර් 2.6 ක දිගින් යුත් නල මාර්ග එලනු ලැබ ඇත.

**"ඩී - 2"** කොටස හා සම්බන්ධ කොන්ත්‍රාත්තු පැකේජය (බවුසර, කැබ් රථ, මිනි බැක්හෝ රථ හා යතුරු පැදි මිළයට ගැනීම) 2014 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2016 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 26.95 % ක් හා 5.77 % ක් විය.

**"ඕ "** කොටසට අදාල කොන්ත්‍රාත් පැකේජය ප්‍රදානය කිරීම ප්‍රමාද වීමට හේතුව වූයේ දෙවැනි අඩුම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයක් වූ අතර ප්‍රතිසම්පාදන අධ්‍යක්ෂ වරයා විසින් ඒ පිළිබඳව අවශ්‍ය පියවර ගනිමින් පවතී.

**"ඒ "** කොටසට අදාල කොන්ත්‍රාත් පැකේජය ප්‍රදානය කිරීම ප්‍රමාද වීමට හේතුව වූයේ උපදේශක වරයා විසින් ඉදිරිපත් කරන ලද ලංසු ලියවිල්ලේ දක්නට තිබුණ අඩුපාඩු වේ. ලංසු ලිපි ලේඛන අගැයීම සඳහා 2016 මාර්තු 17 වැනි දින රැස් වූ **SCAPC** මණ්ඩලය තම **TEC** නිරීක්ෂණ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදේශක වරයාගෙන් ඉල්ලා සිටින ලද අතර ඒ හේතුව නිසා **SCAPC** විසින් ලංසු ලිපි ලේඛන අනුමත කිරීම ආසන්න වශයෙන් 03 මසක පමණ කාලයක් ප්‍රමාද විය.

**ඉන්දියානු ආධාර සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.**

**8. විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1.**



**විසල් දඹුල්ල**

විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1 සැලසුම් කොට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවක් වූ අතර එය ආරම්භ කරන ලද්දේ 2012 වර්ෂයේ මාර්තු මාසය තුළදීය. එම ව්‍යාපෘතිය වෙත අරමුදල් සපයනු ලබන්නේ ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව විසින් හා ශ්‍රී ලංකාවේ මහජන බැංකුව විසින් වන අතර මුළු ව්‍යාපෘති පිරිවැය ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 77.8 ක් වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දඹුල්ල සංවර්ධන ප්‍රදේශය ආවරණය වන පරිදි ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම වේ. මෙහි ප්‍රතිලාභීන් වන්නේ දඹුල්ල, ගලේවෙල, කැකිරාව, පලාගල, පලුගස්වැව හා ඒ අවට ප්‍රදේශ වල ජීවත් වන 174100 ක ජනතාව වේ.

ව්‍යාපෘති අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 65000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක්, දිනකට ජලය ඝණ මීටර 32000 ක ධාරිතාවයකින් යුත් සම්පූර්ණයෙන් ස්වයංක්‍රීයව මෙහෙයවෙන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා ඊට අනුබද්ධ දෙවැනි පොම්පාගාරයක් සහිත පවිත්‍ර ජල ටැංකියක් හා ජලය ඝණ මීටර 1350 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් හා තවත් භූමි ජලාශයන් 5 ක්ද, මුළු ධාරිතාවය ඝණ මීටර 5500 කින් යුත් ඔසොවි කුළුණු දෙකක් ද කිලෝ මීටර 0.7 ක දිගින් යුත් හා විෂ්කම්භය මිලි මීටර 900 කින් යුත් මෘදු යකඩ ප්‍රධාන අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ග යක් ද විෂ්කම්භය මිලි මීටර 250 සිට 450 ක් වූ කිලෝ මීටර 71.5 ක දිගින් යුත් මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් ද, කිලෝ මීටර් 218 ක දිගින් යුත් විෂ්කම්භය මිලි මීටර 63 සිට 280 ක් දක්වා වූ බෙදා හැරීමේ ප්‍රධාන යුපීවීසී නල මාර්ගයක් ද ස්ථාන භාර නිලධාරී කාර්යාල ගොඩනැගිල්ල, එක් නඩත්තු කාර්යාලයක්, කාර්ය මණ්ඩල නිල නිවාසයක් හා ක්‍රියාත්මක කරන්නන්ගේ නිල නිවාස 3 ක් ඇතුළු මෙහෙයුම් ගොඩනැගිලි ද වේ.

අමු ජල තුළු මුව හා පොම්පාගාරයේ ද, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ හා දෙවැනි පොම්පාගාරයේ ද ඉදි කිරීම් කටයුතු සේවයේ යොදවනු ලැබීමට පෙර අවදිය තුළ තිබෙන අතර කුළුණු, ජලාශ, සම්ප්‍රේෂණ ජාලය හා බෙදා හැරීමේ ජාලයේ ඉදි කිරීම් කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

2016 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82 % ක් හා 83 % ක් විය.

**ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.**

**09. වයලි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය- ආසියානු සංවර්ධන බැංකුවේ 5 වැනි ව්‍යාපෘතිය.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වයලි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වයඹ හා උතුරු පළාත් වල ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන් වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙනි. මෙම ව්‍යාපෘතිය යටතේ වවුනියාව, මන්නාරම, හලාවත හා පුත්තලම යන නගරයන් වෙත ඉහළ මට්ටමක ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවා පහසු කම් සපයා අපේක්ෂා කරනු ලැබේ. කරනු ලැබ ඇති මුලු පිරිවැය රුපියල් දස ලක්ෂ 20,742.91 ක් වන අතර 2016 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 85.81 % ක් හා 65.01 % ක් විය. 2014 වර්ෂය තුළදී කොන්ත්‍රාත්තු විසි හතක් ද, 2015 වර්ෂය තුළ දී කොන්ත්‍රාත්තු 8 ක් හා 2016 වර්ෂය තුළ දී කොන්ත්‍රාත්තු 02 ක් ද මෙම ව්‍යාපෘතිය යටතේ පිරිනමනු ලැබ ඇත.

**වවුනියාව.**

මෙම ව්‍යාපෘතිය විසින් දිනකට ජලය ඝණ මීටර 12000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වවුනියාවේ ඉදි කරනු ලබන අතර 2016 වර්ෂයේ අවසානය වන විට එහි භෞතික ප්‍රගතිය 92 % ක් විය. ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ වූ සියලුම සිවිල් වැඩ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර යාන්ත්‍රික හා විද්‍යුත් ස්ථාපිත කිරීම් දැනට කරගෙන යමින් පවතී. ඝණ මීටර දස ලක්ෂ 3.83 ක රැලි පැන්නුම සහිත රැස්කුරු ජලාශයක් පේරු ආරු ඔය හරහා ඉදි කිරීමේ කටයුතු මේ වන විට නිම වෙමින් පවතින අවස්ථාවට පත් වී ඇත. 2017 වර්ෂය තුළ දී පවුල් 15950 ක් වෙත ප්‍රතිකාරිත ජලය දිනකට ඝණ මීටර 9800 ක් සැපයීම සඳහා මතු පිට ජලය මෙන්ම භූ ගත ජලය ද ඒකාබද්ධ කොට යොදාගනු ලබනවා ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ අලුත් ජල කුළුණු 3 ක්, ජලාශයක් හා කිලෝ මීටර් 225 ක් දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග පද්ධතිය වන අතර එම කටයුතු දැනට නිම වීමේ අවසන් අදියරෙහි පවතී. ආසන්න වශයෙන් කිලෝ මීටර් 20 ක පමණ දිගින් යුත් බෙදා හැරීම් නල එලීම හා කිලෝ මීටර් 22 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගය ඉදි කිරීම ද කිරීමට ඉතිරි වී ඇති වැඩ අතර වේ. මෙම ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂණ සංරචකයක් ද තිබෙන අතර ඒ යටතේ පොදු වැසිකිළි 4 ක් සපයා දීම ද, දිනකට ඝණ මීටර 28 ක තුළු ගැලීම් ධාරිතාවයකින් යුත් දැනට ක්‍රියාත්මක වන පූතික යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම හා වවුනියාමේ ගෘහස්තයන් 500 ක් වෙනුවෙන් ගෘහස්ත වැසිකිළි ඉදි කර දීම ද දැනට සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන්නන්ගේ මුළු සංඛ්‍යාව 109,432 ක් වේ.

**මන්නාරම.**

මන්නාරම සිදු කරනු ලබන වැඩි දියුණු කිරීම් වලට මන්නාරම, මුරුලකන්, වන්කාලි හා තිරුකෙතීස්වරම් යන ප්‍රදේශයන් වෙත ප්‍රතිකාර කරන ලද ජලය දිනකට ඝණ මීටර 12000 ක් සැපයීමට හැකි වන පරිදි මිහි විදමන් 10 ක් සංවර්ධනය කිරීම ඇතුලත් වේ. 2017 වර්ෂය තුළ දී පවුල් 6672 ක සැලැසුම්ගත ජන ගහණයක් වෙත පූර්ණ වශයෙන් ප්‍රතිකාර කරන ලද ජලය සම්පාදනය කිරීම සඳහා කිලෝ මීටර 27.6 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගයකින් හා කිලෝ මීටර 105 ක දිගින් යුත් බෙදා හැරීම් නල මාර්ග පද්ධතියකින්ද යුක්ත වූ එක් නව ජල කුළුණක් හා භූ ගත ජල ජලාශයන් දෙකක් දැනට ඉදි කරනු ලබමින් තිබේ. මීට අමතරව පොදු වැසිකිලි 4 ක් හා ගෘහස්ත වැසිකිලි 330 ක් දැනට ඉදි කිරීම් පියවර තුළ පවතී. වැඩ සියල්ලක්ම මෙන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

පූතික ප්‍රතිකාරක පහසුකම, ජලය ගබඩා කිරීමේ ව්‍යුහයන්, පොදු වැසිකිළි හා බෙදා හැරීමේ පද්ධතිය සඳහා වූ මෘදු යකඩ හා ඉහල ඝණත්වයේ පොලි එතිලින් සහ පීවීසී නල සපයා එලීම ද සඳහා වූ කොන්ත්‍රාත්තු ප්‍රදානය කරනු ලැබ ඇත. පූතික ප්‍රතිකාරක පහසුකම, පොදු වැසිකිළි ඉදි කිරීම හා නල මාර්ග එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ජලය ගබඩා කිරීමේ ව්‍යුහයන් සම්බන්ධයෙන් වූ සිවිල් ඉදි කිරීම් කටයුතු හා යාන්ත්‍රික හා විදුලිත් උපකරණ ස්ථාපනය කිරීමේ කටයුතු 2016 දෙසැම්බර් මාසය තුළ දී සම්පූර්ණයෙන් නිම කරන ලදි. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 55033 ක් වේ.

**හලාවත.**

හලාවත ජල සම්පාදනය සඳහා අමු ජලය උකහා ගනු ලබන්නේ දැදුරු ඔයෙන් වන අතර, ඒ හරහා 93165 ක ප්‍රක්ෂේපිත ජන ගහනයක් වෙත දිනකට ප්‍රතිකාරිත ජලය ඝණ මීටර 12000 ක් සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය බිංගිරියේ ඉදි කිරීමට යෝජිත ජලය ඝණ මීටර 12000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් (දැනට එහි භෞතික ප්‍රගතිය 74% කි), ජලාශ 2 ක්, සම්ප්‍රේෂණ නල මාර්ග කිලෝ මීටර 49 ක් හා බෙදා හැරීමේ නල මාර්ග කිලෝ මීටර 153 ක් යන ප්‍රධාන අංගයන්ගෙන් සමන්විත වන අතර ඒ අතුරින් සම්ප්‍රේෂණ නල මාර්ග කිලෝ මීටර 46 ක් හා බෙදා හැරීම් නල මාර්ග කිලෝ මීටර 76.3 මේ වන විට සම්පූර්ණ කරනු ලැබ ඇත. සනීපාරක්ෂණ අංශය යටතේ පොදු වැසිකිලි පහක් හා ගෘහස්ත වැසිකිලි 500 ක් දැනට ඉදි කරනු ලබමින් පවතී. පූතික ප්‍රතිකාරක පහසුකම හා නල එලීම පිළිබඳ බොහෝ කොන්ත්‍රාත්තු අවසන් කරනු ලැබ ඇති අතර තුළු මුව හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉදි කිරීම් කටයුතු දැනට සිදු කරමින් පවතින අතර ඒවායේ ප්‍රගතිය 62% කි.

**පුත්තලම.**

පුත්තලම ජල සම්පාදන යෝජනා ක්‍රමයට දිනකට ජලය ඝණ මීටර 12000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ඇතුලත් වන අතර ඊට ජලය උකහා ගනු ලබන්නේ කලා ඔයෙනි. සේවා සැපැයීමට අපේක්ෂා කරනු ලබන ජන ගහණය 160655 ක් වේ. යෝජිත යෝජනා ක්‍රමය ජලාශයන් දෙකකින් ද,පොම්පාගාර 7 කින් ද, එලුවන්කුලමේ සිට පුත්තලම දක්වා දිවෙන කිලෝ මීටර 46 ක දිගකින් යුත් සම්ප්‍රේෂණ නල පද්ධතියකින් ද, දිනකට ජලය ඝණ මීටර 12000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද සමන්විත වේ. පුත්තලම නගරය තුළ හා ඒ අවට අර්ධ නාගරික ප්‍රදේශයන් තුළ පොදු වැසිකිලි 6 ක් ඉදි කිරීමෙන් හා ගෘහස්ත වැසිකිලි 500 ක් ඉදි කිරීමෙන් සනීපාරක්ෂණ අංශය සමන්විත වේ. පූතික ප්‍රතිකාරක පහසුකම හා පොදු වැසිකිලි ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. නල මාර්ග එලීමේ කොන්ත්‍රාත්තු දැනට ක්‍රියාත්මක කරගෙන යමින් පවත්නා අතර එම වැඩ කටයුතු වල භෞතික ප්‍රගතිය 80 % කි. එලුවන්කුලම තුළු මුව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ කටයුතු සැලැසුම් කරන ලද කාලය අනුව ප්‍රමාදයක් සහිතව දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 62 % ක් හා 74 % ක් වේ.

**10. යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකු 6 වැනි ව්‍යාපෘතිය)**



**වවුනියාවේ නෙරොපර්ආරු වෙල්ලේ පිට වාන ඉදි කිරීමේ කටයුතු.**

යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය 2011 වර්ෂයේ දී ආරම්භ කරන ලද්දේ යාපනය අර්ධ ද්වීපයේ වාසය කරන්නා වූ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා ජීවන තත්ත්වයන් ඉහල නැංවීමේ හා මුළු මහත් උතුරු ප්‍රදේශය පුරාම නැවත පදිංචි කිරීමේ කටයුතු වලට සහාය දීමේ අරමුණ සහිතව වේ. යාපනය හා කිලිනොච්චි යන දිස්ත්‍රික්කයන් දෙක තුළ ඇති ජල හිඟ කම බල පවත්නා ප්‍රදේශයන් හි වාසය කරන ආසන්න වශයෙන් 3,00,000 ක් පමණ වූ ජනතාව වෙත මෙම ව්‍යාපෘතිය විසින් ආරක්ෂිත පානීය ජලය සපයනු ලබනවා ඇත. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය (ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ලබන ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 90 කින් ද, ප්‍රංශ සංවර්ධන ඒජන්සි ආයතනය විසින් සපයනු ලබන යුරෝ දස ලක්ෂ 40 කින් හා ශ්‍රී ලංකා ජන රජය විසින් සපයනු ලබන ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 34.04 කින් සැදුම්ලත්) ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 164.04 ක් වන අතර මේ සඳහා අරමුදල් සපයනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසින් හා ප්‍රංශ සංවර්ධන ඒජන්සි ආයතනය විසින් වේ. මුළු එකතුව රුපියල් දස ලක්ෂ 35,900 ක් වේ. (සැලැකිය යුතුයි : අතිරේක මූල්‍යකරණ ණය මුදල සඳහා අත්සන් තැබීම 2017 ඔක්තෝබර් මාසයේදී සිදු කරනු ලබනවා ඇත). ව්‍යාපෘතිය සඳහා නියමිත කාල සීමාව වන්නේ 2011 පෙබරවාරි මාසයේ සිට 2017 අගෝස්තු මාසය අත කාලය වුවද ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලබන්නේ 2020 ජනවාරි මාසයේදීය.

ව්‍යාපෘතියේ අංගයන් වන්නේ ජල සම්පාදන හා සනීපාරක්ෂණ යටිතල පහසු කම් වැඩි දියුණු කිරීම ද - 300000 ක ජනතාවක් වෙත ජලය සම්පාදනය කර ලීම හා 80000 ක ජනතාවක් වෙත සනීපාරක්ෂණ පහසුකම් සලස්වා ලීම - යාපනයේ ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කර ලීම ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හැකියාවන් නංවාලීම හා යාපනයේ කලාපීය කාර්යාලයක් ඉදි කිරීමද වේ.

ව්‍යාපෘති විෂය පථයේ ඇති වූ ප්‍රධාන වෙනස් කම් නිසා දිනකට ජලය ඝණ මීටර 24000 ක ධාරිතාවයක් සහිත මුහුදු දියෙන් ලවණ හරණය කිරීමේ යන්ත්‍රාගාරයක් ඇතුළුව ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රංශ සංවර්ධන ඒජන්සිය විසින් හවුලේ අරමුදල් යොදවන ලද (ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 40) ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා මලාපවහන අංගය හැර ජල ප්‍රභවය වූ ඉරනමඩු වැවට සම්බන්ධ කිරීමට යෝජිත තොග ජල සම්ප්‍රේෂණ මාර්ගය අත හැර දැමීම කරන ලදි. ගෘහස්ත ජල සම්බන්ධතාවයන් වෙනුවෙන් වූ ප්‍රතිපාදනය, ජලය බෙදා හැරීමේ පද්ධතීන් ප්‍රශස්ත මට්ටමට පත් කිරීම, ජල සම්පත් කළමනාකරණය කිරීම ශක්තිමත් කිරීම හා ව්‍යාපෘතියේ සේවාවන් ව්‍යාප්ත කිරීම යන කාරණා පිළිබඳව එකඟත්වයකට පැමිණ ඇත.

ව්‍යාපෘතියේ මුළු සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව අමෙරිකානු ඩොලර් දස ලක්ෂ 274.04 ක් වේ. (අතිරේක අරමුදල් සැපයීම ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලැබෙන අමෙරිකානු ඩොලර් දස ලක්ෂ 120 ක් හා ශ්‍රී ලංකා ජන රජය වෙතින් ලැබෙන අමෙරිකානු ඩොලර් දස ලක්ෂ 30 ක් වේ).

මෙම ව්‍යාපෘතිය යටතේ ඇති ප්‍රධාන පැකේජයන් අතුරින් සහකාර සාමාන්‍යාධිකාරී වරයාගේ කාර්යාලය ඉදි කිරීම හා නිල නිවාසය ඉදි කිරීම ඇතුලත් පැකේජ දෙකක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඔසොවු කුළුණු දෙකක්, ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග දෙකක් හා එක් බෙදා හැරීම් පද්ධති පැකේජයක් ඇතුළු පැකේජ පහක් මේ වන විට ඉදි කෙරෙමින් පවතී. බෙදා හැරීමේ පද්ධතියක් හා ඔසොවු කුළුණක් සඳහා වූ තවත් පැකේජ දෙකක් දැනට දැන්වීම් පළ කිරීමේ පියවර තුළ ද, යාපනය නාගරික ප්‍රදේශය තුළ ජලය බෙදා හැරීමේ පද්ධතිය හා යාන්ත්‍රික හා විද්‍යුත් කටයුතු අධීක්ෂණ පාලනය හා දත්ත ලබා ගැනීම (SCADA) ප්‍රලේඛන අවදියේ ද පවතින අතර මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වාහන හා උපකරණ ලබා ගැනීමේ පැකේජය දැනට සංකල්පීය තත්ත්වයේ පවතී.

සාමාන්‍ය ගැටළු වන්නේ ආසියානු සංවර්ධන බැංකුව සමග කඩිනම් කළ යුතුව ඇති ජල සම්පාදන අංගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අතිරේක අරමුදල් (ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 120 ක්) වෙනුවෙන් ණය ලිපි ලේඛන අත්සන් කිරීම හා ව්‍යාපෘති ඉංජිනේරු ආයතනික උපදෙස් ලබා ගැනීමේ විචලනය වෙනුවෙන් කැබිනට් අනුමැතිය ලබා ගැනීමයි.

2016 වර්ෂය අවසානය වන විට (සංශෝධිත වැඩ සටහන මත පදනම්ව) ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් 17 % ක් හා 38 % ක් විය.

**11. විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන.**



**වේලනෙයි හි ජල කුළුණ.**

1800 ගණන් වලදී නල ජල සේවාව ලැබුණ ආසියානු නගරයන් ස්වල්පය අතුරින් කොළඹ ද එක් නගරයක් විය. බෙදා හැරීම් ජාලයේ කොටස් විශාල සංඛ්‍යාවක් සාදනු ලැබ ඇත්තේ වසර 100 කට වැඩි කාලයකට පෙර වේ. වැඩි වෙමින් පවත්නා ජල ඉල්ලුමට විසඳුම් සෙවීම සඳහා බොහෝ ව්‍යාපෘතීන් දියත් කරනු ලැබුව ද, බෙදා හැරීම් ජාලය සැලකිය යුතු මට්ටමකින් පුනරුත්ථාපනය කිරීමක් සිදු කරන ලද්දේ නැත. වර්තමානය වන විට කොළඹ නගරය තුළ ආදායම් රහිත ජලය ආසන්න වශයෙන් 44.90 % ක් වන අතර ජල නල කාන්දු වීම් ජල සැපයුම දුර්වල වීමට තුඩු දෙන හෙයින් ආදායම් රහිත ජලය අවම කිරීම හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා සිදු කළ යුතුව තිබේ. මේ පරමාර්ථය සඳහා කොළඹ නගරය දිස්ත්‍රික් මනු ප්‍රදේශ (DMAS) 69 කට බෙදනු ලැබ තිබේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ කොළඹ නගරය තුළ ජලය සැපයුමේ ප්‍රමාණවත් භාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම ද, ආදායම් රහිත ජලය දැනට පවත්නා මට්ටම වූ 49 % සිට 2020 වන විට 18 % මට්ටම දක්වා අඩු කිරීම ද, (PPTA උපදේශක වාර්තාව අනුව 2012 වර්ෂයේදී ආදායම් රහිත ජලය 49 % ක් විය), ආදායම් රහිත ජලය අවම කිරීමේ අරමුණින් දීර්ඝ කාලීන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආයතනික, මෙහෙයුම් හා ව්‍යාපෘති කළමනාකරණ හැකියාවන් නංවා ලීම ද වේ.

කොළඹ නගරය තුළ ජල සම්පාදන ජාල පුනරුත්ථාපන ව්‍යාපෘති හා ඒ හා සම්බන්ධ සියළුම වැඩ කටයුතු සඳහා අරමුදල් සපයනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසිනි. මූලිකව ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘති පිරිවැය වුවේ ආසියානු සංවර්ධන බැංකුව - ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 164 ක් හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 55.1 ක් විය. අද දින වන විට ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් වීම නිසා හා මිළ ගණන් ඉහල යාම නිසා ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02 වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් අතිරේක මූල්‍ය ආධාර ඉල්ලනු ලැබ ඇති අතර අංක 03 දරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණ අතිරේක මුදල් ප්‍රමාණය වූයේ ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 55.64 ක් විය ( ආසියානු සංවර්ධන බැංකුව - ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 38 ක් හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 17.64 ක් වශයෙනි).

කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය අංක 01 හා අංක 2 දරණ ව්‍යාපෘතීන් තුළ අන්තර්ගත වී තිබේ. අංක 01 ව්‍යාපෘතිය හා අදාල ප්‍රධාන කොන්ත්‍රාත්තු (කොළඹ නගරයේ උතුරු කොටසේ හා කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ පද්ධතීන් පුනරුත්ථාපනය කිරීම) 2015 වරශයේ දී ආරම්භ කරන ලද අතර 02 වැනි ව්‍යාපෘතිය හා අදාල ප්‍රධාන කොන්ත්‍රාත්තු (කොළඹ නගරයේ බටහිර කොටසේ හා කොළඹ නගරයේ දකුණු කොටසේ පද්ධතීන් පුනරුත්ථාපනය කිරීම) ප්‍රදානය කිරීමේ තත්ත්වයේ පවතී. 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 13.87 % ක් හා 22.91 % ක් විය.

## ඕස්ට්‍රේලියානු සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය.

**12. අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශය වෙනුවෙන් දියත් කරන ලද ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රම ව්‍යාපෘතිය - අදියර 111**

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ අම්පාර දිස්ත්‍රික්කයේ සේවා නොලබන ප්‍රදේශ වල මෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ හා මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ද ඇතැම් ප්‍රදේශ වල ජීවත් වන ආසන්න වශයෙන් 200000 ක පමණ ජනතාවක් වෙත සේවා සපයා දීම පිණිස වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 27000 ක ධාරිතාවයකින් යුත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව ඉදි කිරීමත්, කෝනේෂපුරම් හා බක්කිඇල්ලේ ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ඔසොවි කුළුණු ඉදි කිරීමත්, නාමල් ඔය, ඉඟිනියාගල හා මැද කඳවුර තුළ ඝණ මීටර 750 ක ධාරිතාවයකින් යුත් ඔසොවි කුළුණු ඉදි කිරීම හා තොට්ටම ඝණ මීටර 600 ක ධාරිතාවයකින් යුත් ඔසොවි කුළුණක් ඉදි කිරීමත්, හිමිදුරාවේ ඝණ මීටර 2500 ක ධාරිතාවයකින් යුත් බිම් ටැංකියක් ඉදි කිරීම හා පරගහකැලේ, දඩයන්තලාව හා ගොනාගොල්ල ඝණ මීටර 1600 ක ධාරිතාවයන්ගෙන් යුත් බිම් ටැංකි ඉදි කිරීමත්, කිලෝ මීටර 100 ක දිගින් යුත් මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය සපයා එලීමත්, (බෙදා හැරීම් පද්ධතිය වෙනුවෙන් කිලෝ මීටර 1200 ක පමණ දිගින් යුත් පොලි එතිලින් නල හා උපාංග සපයා එලීමත් වේ. නව සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 40000 ක් පමණ ලබා දීමේ හැකියාව මෙම ව්‍යාපෘතිය සතුව ඇති අතර ව්‍යාපෘතියට වැය වන මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 26,720 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්තු කිහිපයක් ප්‍රදානය කරනු ලැබ ඇත. ප්‍රධාන කොන්ත්‍රාත්තුව වූයේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමත්, සම්ප්‍රේෂණ පද්ධතිය සපයා එලීම හා ඒ හා අදාල අනිකුත් වැඩ කටයුතු විය. කිලෝ මීටර් 1200 ක දිගින් යුත් බෙදා හැරීම් පද්ධතිය

විලීමේ කොන්ත්‍රාත්තුව හා කුළුණු 6 ක් ඉදි කිරීම ඇතුලත් තවත් කොන්ත්‍රාත්තු දෙකක් ද ප්‍රදානය කරනු ලැබ ඇත.

ප්‍රධාන කොන්ත්‍රාත්තුව විසින් 2015 වර්ෂයේ අවසානය වන විට 100 % ක භෞතික ප්‍රගතියක් ද, 100% ක මූල්‍ය ප්‍රගතියක්ද සාක්ෂාත් කර ගනු ලැබ ඇති අතර කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2015 සැප්තැම්බර් මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා අම්පාර දිස්ත්‍රික්කයට බල පාන ලද අහිතකර කාල ගුණ තත්ත්වයන් හේතු කොට ගෙන අම්පාර බෙදා හැරීමේ ජාල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කාලය 2017 ජනවාරි දක්වා දීර්ඝ කර ගනු ලැබූ අතර දැනට එය ක්‍රියාත්මක කිරීම සඳහා පෙල ගස්වනු ලැබ තිබේ. මෙම ව්‍යාපෘතිය මගින් අතිරේක ජල සම්පාදන සම්බන්ධතාවයන් 2000 ක් ලබා දීමට අපේක්ෂා කරනු ලැබේ. ඇතැම් විට කුළුණු ඉදි කිරීමේ කොන්ත්‍රාත්තු නියමිත දිනට අවසන් කිරීමට නොහැකි විය හැකිය. ඒවා 2017 මාර්තු මාසය වන විට සම්පූර්ණයෙන් නිම කළ හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

2012, 2013 හා 2014 යන වර්ෂයන් තුළ දී ශ්‍රී ලංකා රජයේ දායකත්වය වශයෙන් ලැබිය යුතු දේශීය අරමුදල් හිඟයකට ව්‍යාපෘතිය මුහුණ දුන්නේය. ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියා නවසීලන්ත අපනයන මූල්‍ය හා රක්ෂණ සංස්ථාව සහ ශ්‍රී ලංකා රජය අතර දැනට පවත්නා ණය 6.5 % කින් වැඩි කිරීම හරහා කඩිනමින් සපුරා ගත යුතු අරමුදල් අවශ්‍යතාවයන් සඳහා මුදල් ලැබී ඇත.

2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99.55% ක් හා 76.15% ක් විය.

## බෙල්ජියන් සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය.

### 13. කොලොන්න / බලන්ගොඩ ජල සම්පාදන ව්‍යාපාතිය.

මෙම යෝජනා ක්‍රමය බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම හා කොලොන්න සඳහා නව ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඉදි කිරීම ද යන ප්‍රධාන අංගයන් ද්විත්වයෙන් සමන්විත වේ.

ව්‍යාපෘතිය වෙත අරමුදල් සපයනු ලබන්නේ ශ්‍රී ලංකා රජය හා බෙල්ජියන් රජය විසිනි. මුලු (සංශෝධිත) පිරිවැය වූයේ රුපියල් දස ලක්ෂ 4,988 ක් වූ අතර, ඒ සඳහා දේශීය අරමුදල් වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් රුපියල් දස ලක්ෂ 1,562 ක් සපයනු ලබන අතර, විදේශීය අරමුදල් වශයෙන් බෙල්ජියානු රජය විසින් රුපියල් දස ලක්ෂ 3,426 ක් සපයනු ලබයි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2015 වර්ෂය තුළ දී භෞතික වශයෙන් 100 % ක් සම්පූර්ණයෙන්ම නිම කරන ලදි.

බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සැලසුම් කරන ලද්දේ පවුල් 8000 ක් වෙත නව සම්බන්ධතාවයන් ලබා දීම මගින් ජල සම්පාදන ආවරණය වර්ධනය කිරීමේ හා දැනට පවත්නා අඩු ලුහුඩු කම් අවසන් කිරීමේ ද අපේක්ෂාව ඇතිව වේ. මේ පිළිබඳව සලකා බලන කල්හී, බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම තුළින් 40000 ක ජන ගහනයක් වෙත සැපයීමට හැකි වන සේවාවට අමතරව රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන්, බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයෙන් හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් තුළින් ලැබෙන වාණිජ හා කාර්මික ජල ඉල්ලුම සපුරාලීමේ හැකියාව ද ලැබෙනු ඇත. මේ අනුව 2030 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත සම්පූර්ණ ජල ඉල්ලුම දිනකට ඝණ මීටර 7000 ක් වෙතැයි ගණන් බලනු ලැබ ඇති අතර ඒ සඳහා අවශ්‍ය අමු ජලය දැනට බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා තුළු මුව පිහිටුවනු ලැබ ඇති වලවේ ගඟේ වැලිහරනාව නම් ස්ථානයෙන් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලසුම් කරන ලද්දේ කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන 40000 ක ජනතාව වෙත මුළු වර්ෂය පුරාම ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීමට හා වර්ෂා සෘතුව තුළ දී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමත් සඳහා වේ. එම නිසා වාණිජ හා කාර්මික අංශයන්ගේ ඉල්ලුම සපුරා ලීමට අමතර ලෙස නව ජල සම්බන්ධතා 8000 ක් සපයා දෙනු ලැබීමට නියමිත වේ. 2030 වර්ෂය වන විට ඉල්ලුම දිනකට ජලය ඝණ මීටර 7000 ක් වනු ඇතැයි තක්සේරු කරනු ලැබ ඇති අතර ඒ සඳහා අමු ජලය ඇරැපෝරුව ගංගාව හරහා විජේරිය නම් ස්ථානයේ මීටර 3 ක් උස මීටර 25 ක දිගින් යුත් අමුණක් ඉදි කර ඒ ස්ථානයෙන් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. තවද වාරි මාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව ද ආසන්න වශයෙන් අක්කර 1500 ක වී වගාවන් සඳහා එකී අමුණේ ගඟ පහලින් ජලය ලබා ගැනීම සිදු කරනු ලබයි. එම නිසා විශේෂයෙන්ම වියලි සෘතුව තුළ දී ජලය බෙදා හදා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදි.

පනාමුර බිම් ජලාශයේ බෑවුම් තහවුරු කිරීම හා බලංගොඩ දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන අමු ජල නල මාර්ගයේ තිබුණ AC නල වෙනුවට නව AC නල විලීම ද ව්‍යාපෘතියේ ඉතිරි අරමුදල් භාවිතා කරමින් සිදු කරන ලද අතර, එම මුදල් ඉතිරි වී තිබුනේ ශ්‍රී ලංකා රජය විසින් දෙනු ලැබ තිබි අරමුදල් වලිනි.

පනාමුර බිම් ජලාශයේ බෑවුම් තහවුරු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද්දේ එම ජලාශය නාය යාමේ තර්ජනයන්ට ලක් වීමේ අවදානමට මුහුණ දී ඇති හෙයිනි.

බලංගොඩ දැනට භාවිතා කරනු ලබන ප්‍රධාන අමු ජල නල මාර්ගය හොඳ ක්‍රියාත්මක තත්ත්වයක තිබුනේ නැත. එසේම දැනට ක්‍රියාත්මක කරනු ලබන යන්ත්‍රාගාරයේ ධාරිතාවය අනාගතයේදී ඝණ මීටර 3000 සිට ඝණ මීටර 5000 ක් දක්වා වර්ධනය කිරීමට ද සැලසුම් කරනු ලැබ ඇත. එම නිසා, දැනට තිබෙන විෂ්කම්භය මිලි මීටර 200 ක් වූ AC නල වෙනුවට මිලි මීටර 400 විෂ්කම්භයෙන් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් (HDPE) නල කිලෝ මීටර 1785 ක් විලීම සිදු කරන ලදි.

කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල සියළුම වැඩ කටයුතු සෑහෙන මට්ටමකට සම්පූර්ණ කරනු ලැබ ඇති හෙයින් හා සියළුම පරීක්ෂණ සාර්ථක ලෙස අවසන් කරනු ලැබ ඇති හෙයින් ද, වැඩ කටයුතු සෑහෙන මට්ටමකට නිම කොට ඇති බවට සහතිකයක් 2015 සැප්තැම්බර් 30 වැනි දින නිකුත් කරන ලදි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අනුයුක්ත මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ප්‍රධාන ගැටළුවකින් තොරව ක්‍රියාත්මක කරමින් පවතින අතර මහ ජනතාව වෙත ජල සම්බන්ධතා සපයා දීම දැනට සිදු කර ගෙන යනු ලබයි. එසේම සමස්ත ව්‍යාපෘතියම මෙහෙයවීම් කටයුතු සඳහා මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත.

**පොදු ගැටළු.**

විදේශීය කොන්ත්‍රාත් කරු වන CFE ආයතනය වැලිහරනාව දක්වා ඇති ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා දීමට එකඟ වූ නමුත් අරමුදල් පවරා දීමේ ක්‍රියාවලිය තුළ පැන නගින ලද ඇතැම් ගැටළුකාරී තත්ත්වයන් නිසා මෙතෙක් ප්‍රවේශ මාර්ගය ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

තවත් ගැටළුවක් වූයේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුන ගැටළු පිළිබඳව කොන්ත්‍රාත් කරු වෙත පෙන්වා දීමෙන් පසුව කොන්ත්‍රාත් කරු විසින් එම ගැටළු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට අසමත් වීමයි.

**ඵලදායි තාවය නංවා ලීමේ ක්‍රියාකාර කම් හා ව්‍යාපෘතියේ සමස්ත තත්ත්වය:**

කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය

හා අදාල සියළුම ඉදි කිරීම් කටයුතු 2015 වර්ෂය තුළ දී සම්පූර්ණයෙන්ම නිම කරන ලදි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර දෙකම සම්බන්ධයෙන් වූ ජල ගුණාත්මය හා අවශ්‍ය ධාරිතාවය පිළිබඳව පරීක්ෂා කර බලන ලද අතර සියළු පරීක්ෂණයන් සාර්ථක ලෙස නිම විය. එම නිසා මෙම ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිම කරනු ලැබ ඇති බවට පිළිගත හැකි වේ.

කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පනාමුර කලාපයේ බෙදා හැරීම් පද්ධතිය හා සම්බන්ධ ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල හා මෘදු යකඩ නල, සවි කිරීම්, විශේෂ උපාංග, මෘදු යකඩ වෑල්ව හා උපාංගයන් සපයා, ගෙනැවිත් දී එලීම සහ බලංගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බෙදා හැරීම් පද්ධතිය හා සම්බන්ධ ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල හා මෘදු යකඩ නල, සවි කිරීම්, විශේෂ උපාංග, මෘදු යකඩ වෑල්ව හා උපාංගයන් සපයා, ගෙනැවිත් දී එලීම කොලොන්න හා බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා රජයේ අරමුදල් උපයෝගී කර ගනිමින් හා කොලොන්න හා බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ අධීක්ෂණය යටතේ දැනට සිදු කෙරෙමින් පවතී.

## හන්ගේරියානු සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘති.

**14. ලබුගම - කලටුවාව ප්‍රතිකාරක යන්ත්‍රාගාර පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ හන්ගේරියානු රජයේ අරමුදල් හා දේශීය රාජ්‍ය අරමුදල් යටතේය. ව්‍යාපෘතියේ පිරිවැය වන්නේ ලබුගම යුරෝ 16,714,045 ක් හා කලටුවාව යුරෝ 17,383,906 කි.

ලබුගම හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සම්බන්ධයෙන් හඳුනා ගනු ලැබ ඇති අංගයන් හා අදාල සියළුම නවීකරණ වැඩ කටයුතු හා අළුතින් ඉදි කිරීම් කටයුතු ව්‍යාපෘතියට ඇතුලත් වේ. 2013 ඔක්තෝබර් 21 වැනි දින ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය 2017 පෙබරවාරි මාසයේ දී සම්පූර්ණයෙන් නිම කළ හැකි වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ව්‍යාපෘතිය සඳහා මුලින් වෙන් කරන ලද කාලය මාස 36 ක් වූ අතර අනපේක්ෂිත හා සුවිශේෂී කාල ගුණික තත්ත්වයන් නිසා එහි කාලය තවත් මාස 4 කින් දීර්ඝ කරන ලද්දේය.

ව්‍යාපෘතියේ අරමුණ වූයේ ලබුගම හා කලටුවාවේ පිහිටි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් දෙකේම නිෂ්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීම හා ජලයේ ගුණාත්මය වර්ධනය කිරීම ද විය. ඒ අනුව ලබුගම හා කලටුවාවේ නිෂ්පාදන ධාරිතාවය ව්‍යාපෘතිය අවසාන වන විට දිනකට ජලය ඝණ මීටර 45000 කින් ඉහල යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමත් සමග එම කටයුතු ආරම්භ කරනු ලබනවා ඇත.



ලබුගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය.

## ඇමෙරිකා එක්සත් ජනපදයේ හා ශ්‍රී ලංකා රජයේ ආධාර සහිතව ආරම්භ කරන ලද ව්‍යාපාතීන්.

**15. බදුල්ල, හාලි ඇල හා ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියෙන් අදහස් කරනු ලබන්නේ නල ජල සැපයුම් ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම මගින් ව්‍යාපෘති ප්‍රදේශය වෙත ආරක්ෂාකාරී හා විශ්වාස දායක ජල සම්පාදන සේවාවක් සැපයීම සිදු කරනු ලබන ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයක් බදුල්ල, හාලි ඇල හා ඇල්ල ප්‍රදේශයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම වන්නේය. බදුල්ල, හාලි ඇල හා ඇල්ල සංවර්ධන සැලැස්ම බාධාවකින් තොරව හා කලට උචිත පරිදි ක්‍රියාත්මක කිරීමට සහාය දීම ව්‍යාපෘතිය විසින් ඉලක්ක කරනු ලබන අතර ව්‍යාපෘති ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය හා ආර්ථික වර්ධනය කෙරෙහි සිය දායකත්වය දීමට ද ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.



දෙමෝදර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම

2017.08.31 වැනි දිනය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇති අතර 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 78 % ක් හා 84 % ක් විය. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ හා වේල්ල ඉදි කිරීමේ ඉතිරි වැඩ කටයුතු දැනට සිදු කරගෙන යමින් පවතී. වානේ ටැංකි අටක් ස්ථාපිත කිරීම දැනටමත් නිම කරනු ලැබ ඇති අතර භූමි අලංකරණ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

සම්ප්‍රේෂණ නල මාර්ග හා ප්‍රධාන මාර්ග එලීමේ කටයුතු දැනට සිදු කරමින් පවතින අතර එම වැඩ කටයුතු වල ප්‍රගතිය 30 % ක් වේ.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය හා බන්ඩාරපුර කාර්ය මණ්ඩල නිල නිවාස 4 ක් ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දෙනු ලැබ ඇත.

ඉතිරි නල සපයා එලීමේ කටයුතු හා අදාල රුපියල් දස ලක්ෂ 1,533 ක් වටිනා ටෙන්ඩරය හා සම්බන්ධ ලිපි ලේඛන කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පිළියෙල කරනු ලැබ ඇත.

ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණයෙන්ම පාහේ නිම කරනු ලැබ ඇති අතර සියළුම ඉඩම් රජයට අයත් ඉඩම් වශයෙන් හඳුනා ගනු ලැබ ඇත.

බන්ඩාරපුර, එලදලුව, මාදිරිය හා හාලි ඇල දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර හා තුළු මුව පුනරුත්ථාපනය කිරීමේ කටයුතු දැනට සම්පූර්ණයෙන්ම පාහේ නිම කරනු ලැබ ඇති අතර ඒවා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරමින් පවතී.

## චීන ආධාර යටතේ ආරම්භ කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්.

**16. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙම ව්‍යාපෘතිය සමන්විත වන අංගයන් වන්නේ බස්නාගොඩ ජලය රැස් කර තබා ගැනීමේ ජලාශය ඉදි කිරීම ද, දිනකට ජලය ඝණ මීටර 85000 ක ධාරිතාවයකින් යුත් තුළු මුව ඉදි කිරීම හා දිනකට ජලය ඝණ මීටර 56700 ක ධාරිතාවයකින් යුත් පොම්ප ස්ථාපිත කිරීම ද, බස්නාගොඩ තුළු මුව සිට කරස්නාගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දක්වා ප්‍රධාන අමු ජල නල මාර්ගය එලීම ද, ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුත් පිරිසිදු ජල ජලාශය සමග දිනකට ජලය ඝණ මීටර 54000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම ද, ඉහල ඔසොව් පොම්පාගාරය ඉදි කිරීම ද, දිනකට ජලය ඝණ මීටර 81000 ක් දක්වා වර්ධනය කරනු ලැබීමේ හැකියාව සහිතව කරස්නාගල රසායන කුටිය, වැඩ පොළ, රසායනාගාරය, ගබඩාව හා කාර්යාල පහසු කම් ඉදි කිරීම ද, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රයේ පිහිටි ඉහල ඔසොව් පොම්පාගාරයේ සිට ඉහල මට්ටමේ ජලාශය වෙත ප්‍රතිකාර කරන ලද ජලය සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන නල මාර්ගය එලීම ද, හා ඒ සමග ජලය ඝණ මීටර 10000 ක ධාරිතාවයකින් යුත් ඉහල මට්ටමේ ජලාශය ඉදි කිරීම ද වේ.

ඉහල මට්ටමේ ජලාශයේ සිට දැනට ක්‍රියාත්මක වන හා යෝජිත ජල කුළුණු වෙත විෂ්කම්භය මිලි මීටර 1100 සිට මිලි මීටර 150 ක් දක්වා වූ කිලෝ මීටර 89.2 ක දිගින් යුත් මෘදු යකඩ ප්‍රධාන ගුරුත්ව බලයෙන් ක්‍රියා කරන ප්‍රතිකාර කරන ලද ජල සම්ප්‍රේෂණ නල මාර්ගය එලීම ද, අළුතින් යෝජනා කරනු ලැබ ඇති ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණු 5 ක් ඉදි කිරීම ද, විෂ්කම්භය මිලි මීටර 90 සිට මිලි මීටර 400 ක් දක්වා වූ මෘදු යකඩ හා යූපීවීසී නල භාවිතා කරමින් කිලෝ මීටර 630 ක දිගින් යුත් බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගය එලීම ද, ගම්පහ කළමනාකරු වෙනුවෙන් වර්ග මීටර 500 ක කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම ද, ප්‍රාදේශීය ඉංජිනේරු වරයා වෙනුවෙන් වර්ග මීටර 200ක කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම ද, වර්ග මීටර 150 ක නිල නිවාසයක් ඉදි කිරීම ද, වර්ග මීටර 150 ක ස්ථාන භාර නිලධාරි කාර්යාල ඉදි කිරීම හා වර්ග මීටර 50 ක රසායනාගාරයක් ඉදි කිරීම ද ව්‍යාපෘතිය යටතේ ආවරණය කරනු ලබන සෙසු අංගයන් වන්නේය.

බෙදා හැරීමේ හා සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ගයන්, ජල කුළුණු හා ඉහල මට්ටමේ ජලාශය වෙනුවෙන් වූ සවිස්තරාත්මක සැලසුම්, සැලසුම් කිරීමේ කණ්ඩායම් විසින් පිළියෙල කරන ලද්දේය. නයිවල, පස්යාල, බැලුම්මහර, මිනුවන්ගොඩ හා අත්තනගල්ලට අදාල සවිස්තරාත්මක සැලසුම් ද සැලසුම් කිරීමේ කණ්ඩායම් විසින් පිළියෙල කර නිම කරනු ලැබ ඇති අතර ලංසු කැඳවීමට අදාල ලිපි ලේඛන දැනට සකස් කෙරෙමින් පවතී. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල සවිස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම දැනට ආරම්භ කරනු ලැබ ඇත. චීන සංවර්ධන බැංකු සංස්ථාව හා ලංකා බැංකුව සමග ණය ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත. නැවත පදිංචි කිරීම් ක්‍රියාත්මක සැලසුම පිළියෙල කිරීම ආරම්භ කරනු ලැබ ඇත.

## ඔස්ට්‍රියාවේ සහාය ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.

**17. මහියංගනය ජල සම්පාදන ව්‍යාපෘතිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතියේ විෂය පථයට ඇතුලත් වන්නේ මහියංගනයේ හා රිදීමාලියද්දේ පොදු ජල සම්පාදන පහසුකම් සැලසුම් කොට, ඉදි කොට, ව්‍යාප්ත කොට ආසන්න වශයෙන් 50000 ක ග්‍රාමීය ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජල පහසු කම් සම්පාදනය කර දීම වන්නේය.

තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, තිස්සපුර ජල කුළුණ, අමු ජල හා ප්‍රතිකාර කරන ලද ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය, රසායනාගාරය, ගබඩාව හා නිල නිවාස ඉදි කිරීම් කටයුතු 2016.09. 17 වැනි දිනය වන විට සම්පූර්ණයෙන් නිම කරන ලද්දේය.

MUT GmbH විදේශ අරමුදල් යටතේ වූ විෂය පථය 100 % ක් නිම කරනු ලැබ ඇති අතර විදේශීය අරමුදල් සම්පූර්ණ ප්‍රමාණයම වැය කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ වූ විෂය පථයට අදාල වැඩ කොටස් දැනට සිදු කෙරෙමින් පවතී.



**මහියංගනයේ ජල කුළුණ**

**බෙල්ජියම් KBC බැංකු සහය යටතේ ආරම්භ කරන ලද ව්‍යාපෘති.**

**18. මොනරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය.**



**කුඹුක්කන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය**

මොණරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද්දේ 2014 දෙසැම්බර් 30 වැනි දින වන අතර එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇත්තේ 2017 ජුලි 30 වැනි දින ය.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මොනරාගල, බුත්තල, ඔක්කම්පිටිය හා මඩුල්ල යන ඉල්ලුම් මධ්‍යස්ථානයන්ගේ ආරක්ෂිත ජල සම්පාදන පහසු කම් ඉල්ලුම සපුරා ලීම සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කර දීම වේ. මෙසේ කරනු ලබන්නේ ප්‍රදේශයේ ජනතාවගේ දැනට පවත්නා හා අනාගතයේදී ඇති විය හැකි නල ජල අවශ්‍යතාවයන් සපුරා ලීමේ පරමාර්ථයෙන් හා ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය හා ජීවන තත්ත්වයන් නංවා ලීමේ අපේක්ෂාවෙනි. සේවා ලබා දීම පිණිස මොනරාගල දිස්ත්‍රික්කයේ ඉලක්ක කරනු ලැබ ඇති ජන ගහණය 60000 ක් වේ.

ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වෙතැයි ඇස්තමේන්තු ගත කරනු ලැබ ඇති පිරිවැය රුපියල් දස ලක්ෂ 5,515 ක් වන අතර අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයන් වන්නේ බෙල්ජියමේ KBC බැංකුව, ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව හා ශ්‍රී ලංකා රජයයි.

ව්‍යාපෘතියේ ජල ප්‍රභවයන් වන්නේ කුඹුක්කන් ඔය, මැණික් ගඟ හා සුමේධ වැව වේ. ව්‍යාපෘතිය (දිනකට ජලය ඝණ මීටර 3500 ක ධාරිතාවයකින් යුත්) දැනට ක්‍රියාත්මක වන මැණික් ගඟ තුළු මුව වැඩි දියුණු කිරීම ද, (දිනකට ජලය ඝණ මීටර 6600 ක ධාරිතාවයකින් යුත්) කුඹුක්කන නව තුළු මුව ඉදි කිරීම ද, (නියං සමයේදී දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත්) සුමේධ වැව තුළු මුව ඉදි කිරීම ද, (දිනකට ජලය ඝණ මීටර 6000 ක ධාරිතාවයකින් යුත්) කුඹුක්කන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම ද, පිළිවෙලින් ජලය ඝණ මීටර 2000

ක ධාරිතාවයකින් යුත්, ජලය ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත්, ජලය ඝණ මීටර 650 ක ධාරිතාවයකින් යුත් හා ජලය ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් ජලය ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් ජලය ගබඩා කිරීමේ ටැංකි කුඹුක්කන, බුත්තල, හොරොම්බුව, වැලියායේ හා මඩුල්ලේ ඉදි කිරීම ද, මිලි මීටර 450 හා මිලි මීටර 150 විෂ්කම්භයෙන් යුත් මෘදු යකඩ හා පොලි එතිලින් නල යොදා ගනිමින් කිලෝ මීටර 27 ක දිගින් යුත් සම්ප්‍රේෂණ හා ප්‍රධාන නල මාර්ග එලීම ද, කිලෝ මීටර 102 ක දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග එලීම ද (සැපයීම හා එලීම කිලෝ මීටර 60 ක් වන අතර සැපයීම පමණක් කිලෝ මීටර 42 කි) යන අංගයන්ගෙන් සමන්විත වේ.

කුඹුක්කන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, ඔක්කම්පිටිය තුළු මුව, බුත්තල තුළු මුව, හොරොම්බුව හා වැලි යාය භූමි ජලාශයන්, මඩුල්ල ජල කුළුණ, කාර්යාල ගොඩනැගිලි හා නිල නිවාස ඉදි කිරීම, හා සම්ප්‍රේෂණ හා බෙදා හැරමේ නල මාර්ග එලීම සම්පූර්ණයෙන්ම පාහේ නිම කරනු ලැබ ඇති අතර ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 98% ක් හා 57.6% ක් විය.

## දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන්.

### 1. බෙන්තොට ජල සම්පාදන ව්‍යාපාතිය.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගාලු පාර ඔස්සේ කොස්ගොඩ සිට බෙන්තොට දක්වා ආසන්න වශයෙන් කිලෝ මීටර 9 ක් දිගට හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිලදාරි වසම් 22 ක් තුළ ඇති අතුරු මාර්ග ඔස්සේ ජලය බෙදා හැරීම දීර්ඝ කිරීම වේ. ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් දස ලක්ෂ 1,239 ක් වේ. කොන්ත්‍රාත්තුව 2014 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර එය 2017 පෙබරවාරි මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂිතය. අරමුදල් සපයනු ලබන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසිනි. සපයා දීමට අපේක්ෂා කරනු ලබන සම්බන්ධතා සංඛ්‍යාව 4500 ක් වන අතර ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 18000 ක් වේ. ව්‍යාපෘතිය කිලෝ මීටර 41.08 ක් දිගින් යුත් පීවීසී හා මෘදු යකඩ නල හා මෘදු යකඩ හා CI වෑල්ව හා උපාංගයන් සැපයීම ද, කිලෝ මීටර 38.4 ක දිගින් යුත් පීවීසී හා මෘදු යකඩ නල එලීම හා උපාංගයන් සවි කිරීම ද, අම්බලන්ගොඩ පොම්ප ස්ථාපිත කිරීම හා බද්දේගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ සර්ජන බඳුන (surge vessel) ස්ථාපිත කිරීම ද, යන ප්‍රධාන අංගයන්ගෙන් සමන්විත වේ. නල සැපයීම සම්පූර්ණ කරනු ලැබ ඇත. නල මාර්ග එලීමේ ප්‍රගතිය 98 % ක් වේ. නල මාර්ග එලීමේ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර (කිලෝ මීටර 2 ක) පීඩන පරීක්ෂණ කිරීමට අදාල ඉතිරි වැඩ හා (කිලෝ මීටර 6 ක) විෂ බීජ නාශන කටයුතු ඉතිරි වැඩ සිදු කළ යුතුව තිබේ. පොම්ප ස්ථාපිත කිරීමේ ප්‍රගතිය 25 % කි. සර්ජන බඳුන් (surge vessels) ස්ථාපිත කිරීමේ ප්‍රගතිය 25 % කි. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 8 % ක් වන අතර දෙසැම්බර් මාසයේ අවසානට වන විට වැය කරනු ලැබ ඇති මුළු මුදල රුපියල් දස ලක්ෂ 579 ක් ද, මූල්‍ය ප්‍රගතිය 47% ක් ද වේ.



**බෙන්තොට ගාලු පාරේ මිලි මීටර 225 ක විෂ්කම්භයෙන් යුත් පීවීසී නල එලීම.**

### 2. ගාල්ලේ පොකුරු ජල සම්පාදන ව්‍යාපාතිය.

වැලිගම, ඌරගස්මන්හන්දිය, ගෝනාපිනුවල හා දික්කුඹුර යන ජල සම්පාදන ක්‍රමයන් තුළ කරනු ලබන වැඩි දියුණු කිරීම් කටයුතු වලින් මෙම ව්‍යාපෘතිය සමන්විත වන අතර එය සම්පූර්ණයෙන් ග්‍රාම නිලධාරි වසම් 55 ක් ඒ මගින් ආවරණය කරනු ලබයි. ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් දස ලක්ෂ 1,755 ක් වේ. ව්‍යාපෘතිය 2017 ජනවාරි මාසය තුළ දී ආරම්භ කිරීමට නියමිත අතර 2019 ජනවාරි මාසය වන විට එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ. අරමුදල් සපයනු ලබන්නේ ලංකා බැංකුව (රුපියල් දස ලක්ෂ 754 ක්) හා මහජන බැංකුව (රුපියල් දස ලක්ෂ 1000) විසිනි. සපයා දෙනු ලැබීමට නියමිත ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව 20000 ක් වන අතර ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 82000 ක් වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ කිලෝ මීටර 93.5 ක දිගින් යුත් පීවීසී හා මෘදු යකඩ නල හා මෘදු යකඩ හා CI වෑල්ව හා උපාංගයන් සැපයීම ද, කිලෝ මීටර් 89.7 ක දිගින් යුත් පීවීසී හා මෘදු යකඩ නල එලීම හා උපාංගයන් සවි කිරීම හා ඌරගස්මන්හන්දිය, ගෝනාපීනුවල, කොවුල්හේන, වක්වැල්ල හා වැලිගම පොම්ප ස්ථාපිත කිරීම ද වේ. තවද මෙම ව්‍යාපෘතියේ විෂය පථය යටතේ ඌරගස්මන්හන්දියේ ජලය ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් හා ඉහල ඔසොව් පොම්පාගාරය ඉදි කිරීම ද, වැලිගම ජලය ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශය, ආරක්ෂකයාගේ නිල නිවාසය හා පොම්පාගාරය ඉදිකිරීම ද සිදු කරනු ලැබීමට නියමිත ඇත. අත්තිකාරම් ගෙවීමේ කටයුතු සිදු වෙමින් පැවැතිනි. කොන්ත්‍රාත් කරු වෙත අත්තිකාරම් ගෙවීමෙන් අනතුරුව වැඩ කටයුතු ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

### 3. අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපාතිය.

දිනකට ජලය ඝණ මීටර 27000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව ඉදි කිරීම ද, ඝණ මීටර 2500 ක ධාරිතාවයකින් යුත් හිමිදුරාව හා එකක් ඝණ මීටර 1600 ක ධාරිතාවයකින් යුත් පරගහකැලේ, දඩයන්තලාව හා ගොනාගොල්ල යන බිම් ටැංකි ඉදි කිරීම ද, කිලෝ මීටර 100 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන මෘදු යකඩ සම්ප්‍රේෂණ නල මාර්ගය එලීම හා බෙදා හැරීමේ ජාලය සඳහා කිලෝ මීටර 698 ක දිගින් යුත් පොලි එතිලින් නල සැපයීම ද යන ප්‍රධාන අංගයන්ගෙන් සමන්විතව 2010 වර්ෂයේ දී ආරම්භ කරන ලද අම්පාර අදියර 111 ව්‍යාපෘතිය 2014 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

කෙසේ වුවද, අවශ්‍ය අරමුදල් නොලැබීමේ හේතුව නිසා අවශ්‍ය වූ බෙදා හැරීමේ පද්ධතියට වුවමනා නල සපයා නල මාර්ග එලීම අපහසු විය. ව්‍යාපෘතියේ අවසාන ප්‍රයත්නය වුනේ ප්‍රදේශය තුළ ජීවත් වන දිළිඳු ජනතාව වෙත නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 40000ක් සපයා දීම විය. එම නිසා, ශ්‍රී ලංකාවේ දේශීය බැංකු කිහිපයක් වෙතින් ලැබෙන අරමුදල් උපයෝගී කර ගනිමින් අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් තීරණය කරන ලදි.

අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කිලෝ මීටර් 1,119.3 ක දිගින් යුත් බෙදා හැරීමේ ජාලය ද, කිලෝ මීටර 527 ක දිගින් යුත් පොලි එතිලින් නල සහ අවශ්‍ය සවි කිරීම් හා විශේෂ උපාංග සැපයීම ද පැකේජ කිහිපයකට සකස් කොට කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලද්දේය (ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් දස ලක්ෂ 6,848.1 ක් විය). මෙම ව්‍යාපෘතිය 2014 නොවැම්බර් මාසයේ ආරම්භ කරන ලද අතර, එහි සංශෝධිත අවසන් කිරීමේ දිනය 2017 ජනවාරි 14 වැනි දිනය වන්නේය.

“ඒ” පැකේජය සමන්විත වන්නේ කිලෝ මීටර 527 ක මුළු දිග ප්‍රමාණයකට ඉහල ඝණත්වයේ පොලි එතිලින් (HDPE) නල හා සවි කිරීම් සැපයීම හා මෘදු යකඩ හා CI වෑල්ව, උපාංගයන්, මැනුබිල් ආවරණ හා මතු පිට පෙට්ටි සපයා ගෙනැවිත් භාර දීම යන කටයුතු වලිනි.

“බී” පැකේජය සමන්විත වන්නේ පාලම් හරස් මාරු හා බෝක්කු

හරස් මාරු ද, වෑල්ව කුටි හා වෙනත් අදාල ඉදි කිරීම් ද සහිතව බක්කිඇල ප්‍රදේශය තුළ කිලෝ මීටර 124 ක දිග ප්‍රමාණයකින් හා ගොනාගොල්ල ප්‍රදේශය තුළ කිලෝ මීටර 218 දිග ප්‍රමාණයකින් යුත් පොලි එතිලින් නල මාර්ග එලා සවි කිරීම්, විශේෂ උපාංගයන්, මෘදු යකඩ හා CI වෑල්ව හා උපාංගයන් යෙදීම ද යන අංගයන්ගෙනි.

"සී" පැකේජය සමන්විත වන්නේ පාලම් හරස් මාරු හා බෝක්කු හරස් මාරු ද, වෑල්ව කුටි හා වෙනත් අදාල ඉදි කිරීම් ද සහිතව කිලෝ මීටර 776 ක මුළු දිග ප්‍රමාණයකින් යුක්තව පොලි එතිලින් නල මාර්ග එලා සවි කිරීම්, විශේෂ උපාංගයන්, මෘදු යකඩ හා CI වෑල්ව හා උපාංගයන් යෙදීම ද යන අංගයන්ගෙනි.

"ඩී" පැකේජය සමන්විත වන්නේ අවිවාහක නිල නිවාස, කාර්ය මණ්ඩල නිල නිවාස, කළමනාකාර නිල නිවාස, දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගේ නිල නිවාසය, ඉංජිනේරු නිල නිවාස, රැක බලා ගන්නාගේ නිල නිවාසය ඉදි කිරීම ද, ඒ සමග පරගහකැලේ, ගොනාගොල්ලේ හා නාමල් ඔය ප්‍රදේශයන්හි ගබඩා ගොඩනැගිලි ඉදි කිරීම ද, උහන, දමන හා මැද කඳවුර තුළ ස්ථාන භාර නිලධාරි නිල නිවාස ඉදි කිරීම ද යන අංගයන්ගෙනි.

මුලින් ඉලක්ක කරන ලද්දේ මෙම ව්‍යාපෘතිය මගින් ජල සම්පාදන සම්බන්ධතාවයන් 10000 ක් ලබා දීම වුව ද ඊට අමතර ලෙස අතිරේක ජල සම්පාදන සම්බන්ධතාවයන් 2000 ක් ලබා දීමට ද පසුව තීරණය කරන ලදි. කෙසේ වුවද, 2016 වර්ෂයේ අවසානය වන විටත් ජල සම්පාදන සම්බන්ධතාවයන් 10000 ක් ලබා දීම සිදු කරනු ලැබ තිබිණි.

අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය සැලසුම් කරන ලද පරිදි ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර 2016 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 92.05 % ක් හා 81.33 % ක් වේ.



පරගහකැලේ ස්ථාන භාර නිලධාරි කාර්යාලය

**4. රුහුණුපුර බෙදා හැරීම් ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සූරියවැව, හම්බන්තොට, ලුනුගම්වෙහෙර හා සෙවනගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ ඇති ග්‍රාම නිලධාරි වසම් 24 ක් තුළ ඇති ජල සම්පාදන සම්බන්ධතා නංවා ලීම වේ. ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් දස ලක්‍ෂ 1,929.61 ක් වූ අතර ව්‍යාපෘතිය සඳහා නියමිත කාල සීමාව 2014 නොවැම්බර් 20 වැනි දින සිට 2017 පෙබරවාරි 28 වැනි දිනය දක්වා වේ. අරමුදල් සපයනු ලබන බැංකුව කොමර්ෂල් බැංකුව වේ. සූරියවැව හා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් වෙත ජල සම්පාදන සම්බන්ධතා 13700 ක් සැපැයීමට සැලැසුම් කරනු ලැබ ඇත. මිලි මීටර 63 සිට මිලි මීටර 225 ක් දක්වා වූ විවිධ විෂ්කම්භයන්ගෙන් යුත් කිලෝ මීටර 244 ක දිගින් යුත් නල මාර්ග එලීම ව්‍යාපෘතියට ඇතුලත් වේ. 2016 දෙසැම්බර් අවසානය වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 94.00 % ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 46.18 % ක් විය.




රුහුණුපුර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

**5. කොළඹ නාගරික ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 1 වැනි අදියර.**

කොළඹ නාගරික ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 1 වැනි අදියර ක්‍රියාත්මක කරනු ලබන්නේ 2040 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත ඉල්ලුම සැලකිල්ලට ගනිමින් අනාගත සංවර්ධනය වෙත දායක වීමේ අපේක්ෂාවෙන් කොල්ලුපිටිය, කොටුව, ගාලු මුව දොර, ඩී. ආර්. විජේවර්ධන මාවත, බොරැල්ල හා යුනියන් පෙදෙස යන ප්‍රදේශයන්හි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොළඹ නගරයේ ජලය බෙදා හැරීමේ ජාලය වැඩි දියුණු කිරීම සඳහා වේ. මෙම ව්‍යාපෘතිය යටතේ ආසන්න වශයෙන් කිලෝ මීටර් 6.1 ක මෘදු යකඩ එලීමට ද, පාලම් හරස් මාරු හයක් ඉදි කිරීමට හා කිලෝ මීටර 3.6 ක දිගින් යුත් ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල මාර්ග එලීමට ද සැලැසුම් කරනු ලැබ ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය වන්නේ ඇමෙරිකානු ඩොලර් දස ලක්‍ෂ 6.3 ක් හා රුපියල් දස ලක්‍ෂ 1,948 ක් වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ ලංකා බැංකුව විසින් අරමුදල් සපයනු ලබන දේශීය බැංකු අරමුදල් වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වශයෙනි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2014 නොවැම්බර් 20 වැනි දින වන අතර එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත්තේ 2016 නොවැම්බර් 19 වැනි දින ය. මේ අතර ඒ සඳහා 2017 ජනවාරි මාසය දක්වා කාලය දීර්ඝ කිරීමක් ද ලැබී තිබේ. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 91% ක් වූ අතර සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය 70% ක් වේ. ගාමිණී සිනමා ශාලා හන්දියේ KVA 132 ක බල සන්ද්‍රාමයක් හරස් මාරු කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් පැණ නැගුන විරෝධතාවයක් නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය.

**6. කොළඹ දිස්ත්‍රික්කයට නැගෙනහිරින් පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ හෝමාගම, කඩුවෙල, පාදුක්ක, සීතාවක හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ වාසය කරනු ලබන 373000 ක ඇස්තමේන්තුගත ජන ගහණයක් වෙත ආරක්ෂිත නල මාර්ග පානීය ජලය සම්පාදනය කර දීම වේ. මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් 2040 වර්ෂය වන විට ප්‍රදේශයේ වෙසෙන ජනතාව වෙත ජල සම්පාදන සම්බන්ධතාවයන් 91000 කට වැඩි සංඛ්‍යාවක් ලබා දීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තු පැකේජ 3 කින් සමන්විත වන අතර පැකේජ 1, පැකේජ 2 හා පැකේජ 3 සඳහා වැය වෙතැයි අපේක්ෂිත ව්‍යාපෘති පිරිවැය පිළිවෙලින් රුපියල් දස ලක්ෂ 5,170.00 ක්, රුපියල් දස ලක්ෂ 4,823.00 ක් හා රුපියල් දස ලක්ෂ 10,049.00 ක් වේ.

2016 වර්ෂයේ අවසානය වන විට අංක 1 පැකේජයට අදාල වැඩ කටයුතු සිදු කෙරෙමින් පැවැති අතර ඒ යටතේ කිලෝ මීටර 155 ක දිගින් යුත් නල මාර්ග එලනු ලැබ තිබිණි. එහි භෞතික හා

මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 64% ක් හා 46% ක් විය. අංක 2 පැකේජය සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කරු විසින් කටයුතු ආරම්භ කරනු ලැබ ඇති අතර නල අවශ්‍යතාවයෙන් කොටසක් සඳහා ඇණවුම් කරනු ලැබ ඇත. කොන්ත්‍රාත්තු පැකේජ අංක 3 ද ක්‍රියාත්මක වෙමින් පැවැති අතර, ඒ යටතේ කිලෝ මීටර 199 ක දිගින් යුත් නල මාර්ගයන් එලා තිබිණි. එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 54% ක් හා 43% ක් විය.



**මීගොඩ - දාම්පේ මාර්ගයේ විෂ්කම්භය මිලි මීටර 355 නල පැස්සීමේ සූදානම.**

**7. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය.**

අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සැපයීම සිදු කරනු ලබන්නේ දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති යටතේ ලංකා බැංකුව විසිනි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අවිස්සාවේල්ල හා කොස්ගම ප්‍රදේශයේ ජල නල මාර්ග බෙදා හැරීමේ පද්ධතිය නංවා ලීම වේ. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල පීවීසී හා මෘදු යකඩ නල, සවි කිරීම් හා උපාංග සපයා එලීමට ද, ඒ හා සම්බන්ධ අනිකුත් වැඩ කටයුතු සඳහා ද අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර ව්‍යාපෘති පිරිවැය රුපියල් දස ලක්ෂ 1,382.40 ක් වේ. ව්‍යාපෘතිය සඳහා ආරම්භ කරනු ලබන දිනයේ සිට නියමිත කාල සීමාවන් වන්නේ කොස්ගම අනු ව්‍යාපෘතිය සඳහා මාස 12 ක් ද, ඒ අතර අවිස්සාවේල්ල අනු ව්‍යාපෘතිය සඳහා මාස 18 ක් ද වශයෙන් වේ. මෙම ව්‍යාපෘතියේ සැබෑ ආරම්භක දිනය වූයේ 2016 ජූනි මස 01 වැනි වේ.

මෙම ව්‍යාපෘතිය යටතට වැටෙන වැඩ කටයුතු වලට ඇතුලත් වන්නේ කොස්ගම හා අවිස්සාවේල්ල ප්‍රදේශයට කිලෝ මීටර් 46 ක දිග ප්‍රමාණයෙන් යුත් බෙදා හැරීමේ නල පද්ධතියක් සපයා එලීම ද, කොස්ගම තුළ මුව වැඩි දියුණු කිරීමේ කටයුතු හා අවිස්සාවේල්ල වැඩ බිම තුළ පුනරුත්ථාපන කටයුතු ද වේ. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 43 % ක් වූ අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය 23 % ක් විය. මේ අතර ණය අරමුදල් වලින් කළ සම්පූර්ණ වැය කිරීම රුපියල් දස ලක්ෂ 328.4 ක් විය.

විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කළ යුතු වූ ගෙවීම් හා මාර්ග ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා දරණ ලද වියදම් නිසා ප්‍රමාණ පත්‍රයට අදාලව සැලැකිය යුතු වෙනස් කම් සිදු වූ අතර ඊට මුහුණ දීම සඳහා සැලසුම් සංශෝධනයක් ද සිදු කරන ලද අතර ඊට අමතරව එම සංශෝධනයන් අනුමත කර ගැනීම පිණිස සංකීර්ණ අනුමත කිරීම් ක්‍රියාවලියක් ද අනුගමනය කිරීමට සිදු විය. මෙම තත්ත්වය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය කෙරෙහි බල පාන ලද අතර භෞතික ප්‍රගතිය සැලැසුම් කරන ලද පරිදි ඉදිරියට යමින් පවතී.

**8. ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ ගලගෙදර හා මාවතගම ප්‍රදේශයන්හි වාසය කරන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජල පහසු කම් සලස්වා දීම සඳහා වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ දිනකට ප්‍රතිකාර කරන ලද ජලය ඝණ මීටර 5000 ක් කටුගස්තොට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට හරවා යවනු ලබනවා ඇත. මෙම ජල ප්‍රමාණයෙන් දිනකට ජලය ඝණ මීටර 3000 ක ප්‍රමාණයක් මාවතගම ප්‍රදේශය වෙත සපයා දීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම ජල ප්‍රමාණය මාවතගම, පරගහදෙනිය හා පිලැස්ස ප්‍රදේශයන් වෙත ජලය සම්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන අතර මාවතගම ආයෝජන මණ්ඩලය වෙත ද දිනකට ජලය ඝණ මීටර 500 ක් සම්පාදනය කර දීමට ද අපේක්ෂා කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතීන් යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සපයනු ලබන අරමුදල් උපයෝගී කර ගනිමින් වන අතර ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් දස ලක්ෂ 3,126 ක් වේ.

බෙදා හැරීමේ පද්ධතිය එලීම හා ජලය ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණ ඉදි කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. 2016 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 10.6 % ක් හා 20% ක් විය.

**9. ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය.**



**කොන්ත්‍රාත් කරුගේ ප්‍රධාන අංගනය සඳහා අලි වැට සකස් කිරීම.**

ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය දේශීය බැංකු මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් වන අතර එය හැටන් නැෂනල් බැංකුවෙන් ලැබෙන ණය මුදලක් මත ක්‍රියාත්මක කරනු ලැබේ. එහි කොන්ත්‍රාත් මුදල රුපියල් දස ලක්ෂ 4,496 ක් වේ. මෙම ව්‍යාපෘතිය 2016 ජූලි 21 වැනි දින ආරම්භ කරන ලද අතර සම්පූර්ණයෙන් අවසන් කරනු ලැබීමට නියමිත දිනය 2018 ජූලි 20 වැනි දින වේ.

ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ මොරගහකන්ද - කළුගඟ වාරි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම සඳහා පිහිටුවන ලද ලග්ගල නව නගරය වෙත ජල සම්පාදන පහසුකම් සපයා දීම සඳහා වේ.

ලග්ගල නව නගරය නිර්මාණය කරනු ලැබ ඇත්තේ මධ්‍යම පලාතේ නැගෙනහිර මායිමේ වන අතර ඒ නව නගරය වෙත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම සඳහා දිනකට ජලය ඝණ මීටර 4250 ක ප්‍රමාණයක් කළු ගඟෙහි නිර්මාණය කරනු ලැබ ඇති තුළු මුව හරහා උකහා ගනු ලබනවා ඇත. මේ මගින් 2036 වර්ෂය වන විට ආවරණය කරනු ලැබීමට අපේක්ෂා කරනු ලබන ඉලක්ක ජන ගහණය 30133 කි.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, ජලය ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ඔසොවි ජලාශයක් ද, ජලය ඝණ මීටර 500 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකියක් හා ජලය ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකියක් ද, එකක් ජලය ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි 2 ක් හා ජලය ඝණ මීටර 200 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකියක් ද, මීටර 500 ක දිගින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් ද, කිලෝ මීටර 39 ක දිගින් යුත් පිරිසිදු

කරන ලද ජලය සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ගයක් ද, කිලෝ මීටර 190 ක දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග ද, ප්‍රාදේශීය රසායනාගාරයකින් හා ගබඩාවකින් සමන්විත ස්ථාන භාර නිලධාරී කාර්යාලය ද, ස්ථාන භාර නිලධාරී නිල නිවාසය හා රැක බලා ගන්නන්ගේ නිල නිවාස 3 ක් ද වේ.

ජලය ගබඩා ටැංකි වෙත සම්ප්‍රේෂණය කරනු ලැබීමට බලාපොරොත්තු වන්නේ පොම්ප කිරීම මගින් නිසා, විද්‍යුත් යාන්ත්‍රික උපකරණ සපයා ස්ථාපිත කිරීම සහ පොම්ප හා අදාල උපාංගයන් සපයා ස්ථාපනය කිරීම ද ව්‍යාපෘතියේ කොටසක් වනු ඇත.

වර්ෂය තුළ දී ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද මුදල රුපියල් දස ලක්ෂ 734 ක් වූ අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 3 % ක් හා 16.32 ක් විය.

**10. විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය.**



විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර ඒ සඳහා අරමුදල් සපයනු ලබන්නේ ජාතික සංවර්ධන බැංකුව විසින් වේ. එහි කොන්ත්‍රාත් මුදල රුපියල් දස ලක්ෂ 3,580 ක් වේ. ව්‍යාපෘතිය 2016 අගෝස්තු 21 වැනි දින ආරම්භ කරන ලද අතර එය සම්පූර්ණයෙන් නිම කිරීමේ සැලසුම්ගත දිනය 2018 ජූලි 31 වැනි දාය.

ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ ප්‍රදේශය තුළ බල පවත්නා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත රෝගය පාලනය කිරීමේ පියවරක් වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 39 කින් සමන්විත මධ්‍යම පලාතේ නැගෙනහිර පැත්තට මායිම්ව පිහිටා ඇති විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත ජල සම්පාදන පහසු කම් සම්පාදනය කර ලීම සඳහා වේ.

මේ සඳහා ව්‍යාපෘතිය විසින් හීන් ගඟ ප්‍රදේශය තුළ ඉදි කරනු ලැබ ඇති තුළු මුව ළිඳකින් දිනකට ජලය ඝණ මීටර 6000 ක ප්‍රමාණයක් උකහා ගැනීමට අපේක්ෂිතය. 2034 වර්ෂය වන විට ආවරණය කරනු ලැබීමට අපේක්ෂිත ජන ගහණය 33725 කි.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 5500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, ජලය ඝණ මීටර 800 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකියක් ද, එකක් ජලය ඝණ මීටර 225 ක් බැගින් වූ ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි 2 ක් ද, ජලය ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි එකකින් ද, කිලෝ මීටර 1 ක දිගින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් ද, කිලෝ මීටර 18 ක දිගින් යුත් පිරිසිදු කරන ලද ජලය සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ගයක් ද, කිලෝ මීටර් 100 ක දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ගයන් ද, ස්ථාන භාර නිලධාරී කාර්යාලයක් ද, මෙහෙයුම් කරන්නාගේ නිල නිවාසයක් ද, තනි මහලකින් යුත් කාර්ය මණ්ඩල නිල නිවාසයක් හා රැක බලා ගන්නාගේ නිල නිවාසයක් ද වේ.

ජලය ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබීමට බලාපොරොත්තු වන්නේ පොම්ප කිරීම මගින් නිසා, විද්‍යුත් යාන්ත්‍රික උපකරණ සපයා ස්ථාපිත කිරීම සහ පොම්ප හා අදාල උපාංගයන් සපයා ස්ථාපනය කිරීම ද ව්‍යාපෘතියේ කොටසක් වනු ඇත.

වර්ෂය තුළ දී ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද මුදල රුපියල් දස ලක්ෂ 496 ක් වූ අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 2.7 % ක් හා 13.85 ක් විය.

## ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ලද කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්.

**2016 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කෙරෙමින් / සංවර්ධනය කෙරෙමින් පැවැති ව්‍යාපෘතීන්ගේ පිහිටීම පෙන්නුම් කරනු ලබන සිතියම.**




| පලාත | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 04 |
| උතුරු මැද | 02 |
| උතුරු | 00 |
| සබරගමුව | 09 |
| දකුණු | 06 |
| ඌව | 05 |
| බස්නාහිර | 01 |
| නැගෙනහිර | 02 |
| වයඹ | 04 |
| එකතුව | 33 |

## ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ලද කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්.

**1). මධ්‍යම පලාත**

**i) කුණ්ඩසාලේ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර.**

මෙම ව්‍යාපෘතිය වනාහී කුණ්ඩලසාලේ, බලගොල්ල, දිගන, අරත්තන, වාවින්න හා පන්විල යන ප්‍රදේශයන්හි වාසය කරන ආසන්න වශයෙන් 130000 ක් පමණ වන ජනතාවක් වෙත සේවා සැපැයීම සඳහා කරනු ලබන වැඩි වර්ධනය කිරීමක් වේ. සම්පූර්ණයෙන් ප්‍රතිකාර කරන ලද ජලය සැපැයීම සඳහා අමු ජලය ලබා ගන්නේ මහවැලි ගඟෙන් හා හුළු ගඟෙන් වන අතර දිනකට ධාරිතාවය ජලය ඝණ මීටර 30000ක් වේ. සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 1,685 කි. දැනට දිනකට ජලය ඝණ මීටර 18000 ක් ලබා ගනු ලබන්නේ අරත්තන පිහිටි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙන් වන අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට කළ යුතු වැඩි දියුණු කිරීම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. පන්විල නගරය දක්වා නල මාර්ග එලීමේ වැඩ කටයුතු අවසන් කරනු ලැබ ඇති අතර වාවින්න දක්වා නල මාර්ග එලීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 97% ක් හා 98% ක් විය.

**ii) මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය මාතලේ නාගරික ප්‍රදේශය තුළ හා අවට උප නාගරික ප්‍රදේශයන් තුළ වාසය කරන 30000 ක ජනතාවක් වෙත සේවය සැපැයීම සඳහා දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමක් වේ. ජල ප්‍රභවය වන්නේ සුදුගඟ වන අතර දැනට පවත්නා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 12000 ක් වන අතර සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 525 ක් වේ. ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 16000 ක් දක්වා වැඩි දියුණු කිරීමට යෝජනා කරනු ලැබ ඇත. මෙම වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු යටතේ නව තුළු මුව ටැංකියක් ඉදි කිරීම ද, පොම්පාගාරය ඉදි කිරීම හා පොම්ප කිරීමේ හා බෙදා හැරීමේ නල මාර්ග පද්ධති වැඩි දියුණු කිරීමේ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ හා යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 97 % ක් හා 82 % ක් විය. (සංශෝධනය කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාලව).

**iii) මාරස්සන ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙම ව්‍යාපෘතිය මාරස්සන නාගරික ප්‍රදේශය තුළ හා අවට උප නාගරික ප්‍රදේශයන් තුළ වාසය කරන නව ප්‍රතිලාභීන් 25,000 කට සේවා සැපැයීමට හැකි වනු පිණිස කරනු ලබන වැඩි වර්ධනය කිරීමක් වන අතර, මා ඔයෙන් අමු ජලය ලබාගෙන පූර්ණ ප්‍රතිකාරක ක්‍රමයක් යටතේ ජලය බෙදා හැරීමට අපේක්ෂා කරන අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 5000 ක් වේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව 2013 වර්ෂයේදී රුපියල් දස ලක්ෂ 339 ක් වන සේ සංශෝධනය කරන ලදි. දැනට තිබෙන දිනකට ජලය ඝණ මීටර 2200 ක නිෂ්පාදන ධාරිතාවය ප්‍රදේශය තුළ වේගයෙන් වැඩි වෙමින් පවත්නා ජල ඉල්ලුම සපුරා ලීම සඳහා ප්‍රමාණවත් වන්නේ නැත. සියල්ලම ගත් කල ආසන්න වශයෙන් සේවා සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 3500 ක් පමණ තිබේ. මයිලපිටිය හා පොත්ගොඩ කලාපයන් තුළ නල මාර්ග සැපැයීමේ හා එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2016 වර්ෂය සඳහා අරමුදල් වෙන් කිරීමක් සිදු කොට තිබුනේ නැත. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 96% ක් හා 96% ක් විය.

**iv) තලවකැලේ / ලිඳුල ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය තලවකැලේ හා ලිඳුල ප්‍රදේශය තුළ වාසය කරන 15000 ක ජනතාවක් වෙත සේවය සැපැයීම සඳහා දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමක් වේ. ජල ප්‍රභවයන් වන්නේ ග්‍රේට් වෙස්ටර්න් හා නානු ඔයයි. සංශෝධනය කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 352 ක් වන අතර අරමුදල් සපයා ගනු ලබන ප්‍රභවයන් වන්නේ ශ්‍රී ලංකා රජය හා ලංකා විදුලි බල මණ්ඩලයයි (ප්‍රති ආරෝපණය කළ හැකි). දැනට ක්‍රියාත්මක වන අර්ධ වශයෙන් ප්‍රතිකාර කටයුතු කළ හැකි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය වූ දිනකට ජලය ඝණ මීටර 1650, දිනකට නිෂ්පාදන ධාරිතාවය ජලය ඝණ මීටර 2500 ක් දක්වා ඉහල නංවමින් වැඩි වර්ධනය කරනු ලබනවා ඇත. තුළු මුව වැඩි දියුණු කිරීම් හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත වාතනය කිරීමේ උපකරණයක්, කැටි ගස්වනයක්, අවසාදන හා පීඩන පෙරණයන් හා අධිවේගී වැලි පෙරණයන් වැනි අංගයන් එකතු කිරීම ද මෙම වැඩ පිළිවෙලට ඇතුලත් වේ. මීට අමතරව, ඉහල කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය නිසා ජනයා නැවත පදිංචි කරවනු ලැබ ඇති ප්‍රදේශයන් දක්වා දැනට පවත්නා බෙදා හැරීම් පද්ධතිය විස්තාරණය කිරීමට ද අපේක්ෂා කරනු ලැබේ. තුළු මුව අමුණ ද, පොම්පාගාරය හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, රසායන කුටිය ද ඉදි කිරීම හා තුළු මුව පොම්ප ස්ථාපනය කිරීම සහ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ බාහිර ආලෝකකරණ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා අධිවේගී වැලි පෙරණයක් ඉදි කිරීම සහ තුළු මුව ප්‍රවේශ මාර්ගය වැඩි දියුණු කිරීම අවශ්‍යව පවතී. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 98 % ක් හා 73 % ක් විය. (සංශෝධනය කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාලව).

**2. උතුරු මැද පලාත.**

**i) මින්නේරිය ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය මින්නේරිය, ගිරිතලේ හා හිඟුරක්ගොඩ යන ප්‍රදේශයන් තුළ වාසය කරන 69000 ක ජනතාවක් වෙත සේවය සැපැයීම සඳහා දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමක් වේ. ජල ප්‍රභවය මින්නේරිය වැව වන අතර දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ප්‍රතිකාරක ක්‍රියාවලිය මද වේගී වැලි පෙරණයන්ගෙන් හා දිනකට ජලය ඝණ මීටර 10900 ක ධාරිතාවයක් සහිත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද සමන්විත වේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 173 ක් වේ. මින්නේරිය හා හිඟුරක්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වනු ලබන්නේ මින්නේරිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙන් වන අතර මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළම පිහිටුවනු ලැබ ඇති එකම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය එය වේ. තුළු මුව ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 13600 ක් දක්වා ඉහල ශ්‍රේණිගත කිරීම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් එක් අංගයකි. අවසාදිත ටැංකියක් ඉදි කිරීම, අධිවේගී වැලි පෙරණයක් ඉදි කිරීම, ගබඩා පහසු කම් ඉදි කිරීම හා යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ ස්ථාපිත කිරීම ද දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි වර්ධනය කිරීමේ කටයුතු වලට ඇතුලත් වේ. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ට කරන වැඩි දියුණු කිරීම් හා බෙදා හැරීම් නල මාර්ග එලීමේ කටයුතු සම්පූර්ණයෙන්ම පාහේ නිම කරනු ලැබ ඇති අතර 2016 වර්ෂය අවසාන වන විට සමස්ත භෞතික ප්‍රගතිය 100% ක් විය.

**ii) ඉපලෝගම ජල සම්පාදන ව්‍යාපෘතිය.**

2030 වර්ෂයේදී ඉපලෝගම රණවිරු ගම්මානය ඇතුළුව ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 4 ක් තුළ වාසය කරන 152000 ක් වූ ජන ගහණයකට සේවය සැපැයීමට මෙම නව ජල සම්පාදන යෝජනා ක්‍රමය අදහස් කරයි. දිනකට ජල ඝණ මීටර 13500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉපලෝගම හා කැකිරාව දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් දෙකටම පොදු වේ. ජල ප්‍රභවය වන්නේ කලා වැවයි. අමු ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය කිලෝ

මීටර 4 ක දිගින් යුක්ත වන අතර ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග යේ දිග ද කිලෝ මීටර 4 කි. මුළු පිරිවැය ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් ලැබෙන රුපියල් දස ලක්ෂ 798 ක් වේ. තුළු මුව හා රණවිරු ගම්මානයේ මල අපවහන පද්ධතියේ ඉදි කිරීම් කටයුතු සහ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ හා ජල කුළුණු ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර බෙදා හැරීම් පද්ධතිය නිම කළ යුතුව තිබේ. 2016 වර්ෂය අවසාන වන විට සමස්ත භෞතික ප්‍රගතිය 100% ක් විය.

**3. උතුරු පලාත.**

2016 වර්ෂය තුළ දී උතුරු පලාත තුළ ක්‍රියාත්මක වෙමින් පැවැති කුඩා පරිමාණ හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘතීන් කිසිවක් නොවීය.

**4. සබරගමුව පලාත.**

**i) ඇඹිලිපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙය නින්දගම්පැලැස්ස, ඇඹිලිපිටිය, නව නගරය, පල්ලේගම, උඩගම, කලගෙඩිආර, හල්මිල්ලකැටිය, යෝදගම, කුබුගොඩ ආර, මොරකැටිය, හිඟුර, තුංකම හා කැටගල් ආර යන ප්‍රදේශයන් තුළ වාසය කරන ප්‍රතිලාභීන් 84000 ක් වෙත සේවය සැපයීමේ පරමාර්ථයෙන් දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද සහිතව වැඩි වර්ධනය කිරීමේ අරමුණ සහිතව දියත් කරන ලද ව්‍යාපෘතියක් වේ. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 607.89 ක් වේ. තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා බෙදා හැරීමේ නල පද්ධතිය එලීම ආදිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100 % ක් හා 96 % ක් විය. ව්‍යාපෘතිය දැනටමත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**ii). උඩවලව ජල සම්පාදන ව්‍යාපාතිය - පියවර 1 හා 11.**

මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමක් වන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 973.20 ක් වේ. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව වන්නේ කොළඹගෙ ආර, නින්දගම් පැලැස්ස, රන්වමඩම, තිබුල්කැටිය හා උඩ වලව, යාය 2, අන්දළුව, මඩුවන්වල, පනහදුව, රත්කරව්ව, ගඟේයාය, සන්කපාල මිරිස්වැල්පොත හා මහගම ජීවත් වන 62500 ක ජන ගහණයක් වේ. වැඩ කටයුතු වල මුල් විෂය පථය යටතේ වූ කර්තව්‍යයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 75% ක් විය. ව්‍යාපෘතිය දැනටමත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**iii). ගොඩකවෙල ජල සම්පාදන ව්‍යාපාතිය.**

මෙම නව ව්‍යාපෘතිය ගොඩකවෙල, ගලහිටිය, මස්ඉඹුල අර්ධ නාගරික ප්‍රදේශ, අල්පිටිය, බලවින්න නැගෙනහිර, ගොඩකවෙල, වරා යාය, බලවින්න බටහිර, බලවින්න උතුර, කෝම්පිටිය, මාවතලන්ද, මැද්දේගම, රිදීවිට, දඹවින්න, කපුහේන තැන්න, බලවින්න නැගෙ නහිර, මාවතලන්ද හා මල්වත්ත යන ප්‍රදේශයන් තුළ ජීවත් වන ප්‍රතිලාභීන් 22500 ක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අදහස් කරයි. ජල ප්‍රභවය රක්වාන ගඟ වන අතර දිනකට ජලය ඝණ මීටර 4500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මගින් ජලය සම්පූර්ණයෙන් ප්‍රතිකාරිත කරනු ලැබේ. ජල තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ගබඩාකරණ ටැංකිය හා බෙදා හැරීම් පද්ධතියේ ඉදි කිරීම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 288.80 ක් වේ. මුල් විෂය පථය යටතේ වූ කර්තව්‍යයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ව්‍යාපෘතිය දැනටමත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**iv). ගලිගමුව ජල සම්පාදන ව්‍යාපාතිය.**

ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම මෙම වර්ෂය තුළ දී නවතා දැමීමට සිදු විය. නල මාර්ග එලීම සම්බන්ධයෙන් වූ නිම කරන ලද කොන්ත්‍රාත්තු වෙනුවෙන් ගෙවීමට ඉතිරිව තිබුණ ගෙවීම් කිරීම පමණක් සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ව්‍යාපෘතිය ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා මාරු කරන ලදී.

**v). නිවිතිගල ජල සම්පාදන ව්‍යාපාතිය.**

රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි වටාපොත, සිදුරුපිටිය, තුත්තිරිපිටිය, හල්කඳලිය, නිවිතිගල සහ යක්දෙහිවත්ත යන ප්‍රදේශයන් තුළ වාසය කරනු ලබන ප්‍රතිලාභීන් 6000 ක සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට මෙම ව්‍යාපෘතිය අපේක්ෂා කරයි. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය වන්නේ රුපියල් දස ලක්ෂ 153.4 කි. යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රධාන අංගයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉඩම සම්බන්ධයෙන් පැන නැගුන ගැටළුවක් හේතු කොට ගෙන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු අත් හැර දමන්නට සිදු විය. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82 % ක් හා 65 % ක් වූ අතර ව්‍යාපෘතිය දැනටමත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**vi). පැල්මඩුල්ල ජල සම්පාදන ව්‍යාපාතිය.**

ඉහල බෝපිටිය, පැල්මඩුලුගම, පැල්මඩුල්ල නගරය, පහල බෝපිටිය, කුට්ටපිටිය, ගනේගම, ගොඩගම, රිල්හේන, උඩතුල, දෙනවක, උදාකඩ, පනාවැන්න, බෝරල, මොරතොට, නුගවෙල නැගෙනහිර, නුගවෙල බටහිර, කට්ටන්ග, කොටකෙතන, වැල්ලඳුර, යායින්න හා නාරන්ගොඩ යන ප්‍රදේශයන් ආවරණය කරමින් පැල්මඩුල්ල ප්‍රදේශයේ වාසය කරන ප්‍රතිලාභීන් 22500 ක සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජලය සපයා දීමට මෙම ව්‍යාපෘතිය අපේක්ෂා කරයි. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 412.09 ක් වේ. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100 % ක් හා 98 % ක් වූ අතර ව්‍යාපෘතිය යටතේ වූ මුල් විෂය පථය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**vii). කිරිඇල්ල ජල සම්පාදන ව්‍යාපාතිය.**

රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉඩන්ගොඩ හා කිරිඇල්ල යන ප්‍රදේශයන්හි ජීවත් වන ප්‍රතිලාභීන් 8000 ක සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට මෙම ව්‍යාපෘතිය අපේක්ෂා කරයි. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 205 ක් වේ. ව්‍යාපෘතියේ 1 වැනි පියවර සම්පූර්ණයෙන් නිම කරන ලදී. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 24 % ක් වූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**viii). මාදොල ජල සම්පාදන ව්‍යාපාතිය.**

මෙම ව්‍යාපෘතිය මගින් අදහස් කරනු ලබන්නේ අවිස්සාවේල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ මාදොල වික්‍රමසිහගම ග්‍රාම නිලධාරි වසම වෙත ආරක්ෂිත නල ජලය සම්පාදනය කර දීමට වේ. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 4000 ක් වනු ඇත. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 132 ක් වේ. මතු වූ ප්‍රායෝගික ගැටළු හේතු කොට ගෙන නිම කිරීමට නොහැකි වූ රාජසේවක ගම්මානය දක්වා වූ දීර්ඝ කිරීම හැරුණ විට ව්‍යාපෘතිය යටතේ වූ සෙසු කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82 % ක් හා 58 % ක් වූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ තිබේ.

**ix). මාවනැල්ල ජල සම්පාදන ව්‍යාපාතිය.**

මාවනැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමේ කටයුතු (ව්‍යාපෘතිය සඳහා වූ ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 158.92 ක් විය) කැටි ගස්වනය, අධිවේගී

වැලි පෙරණය හා පොම්පාගාරය ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කිරීමෙන් හා තුළු මුව පොම්ප හා ඉහල ඔසොවි පොම්ප ආදිය සපයා ස්ථාපනය කිරීමෙන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, දිනකට ජලය ඝණ මීටර 9500 ක ධාරිතාවයක් තිබුණ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 5500 කින් ඉහල නංවන ලදි. වර්ෂය අවසාන වන විය වැය කරනු ලැබ තිබි මුදල රුපියල් දස ලක්ෂ 57.5 ක් වූ අතර භෞතික ප්‍රගතිය 98 % ක් විය.

**5). දකුණු පලාත.**

**i). ගෝනාපීනුවල ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

ගෝනාපීනුවල ජල සම්පාදන යෝජනා ක්‍රමය 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද්දේ ගෝනාපීනුවල හා ඒ අවට ප්‍රදේශයන් වෙත කරනු ලබන ජලය බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙනි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 350 ක් වේ. ප්‍රතිලාභ ලබන්නන්ගේ සංඛ්‍යාව 20800 ක් වේ. ප්‍රදේශය තුළ යුපීවීසී හා මෘදු යකඩ නල මාර්ග සපයා එලීමෙන් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. අරමුදල් ප්‍රභවය වන්නේ ප්‍රාග්ධන අය වැයයි.

යුපීවීසී හා මෘදු යකඩ නල සැපයීම සම්පූර්ණ කරනු ලැබ ඇත. බද්දේගම - හික්කඩුව සිට අධිවේගී මාර්ග ප්‍රවේශ මාර්ගය දක්වා නල මාර්ග එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉතිරි බෙදා හැරීමේ පද්ධතිය සම්බන්ධ අතුරු මාර්ගයන් දිගට නල මාර්ග එලීමේ කටයුතු ගාලු පොකුරු ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබනවා ඇත. වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100 % ක් හා 87 % ක් විය.

**ii). බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

2013 වර්ෂයේදී බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද්දේ බද්දේගම හා එහි නගරාශ්‍රිත ප්‍රදේශයන් වෙත කරනු ලබන ජලය බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා වේ. ඒ සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 441 ක් වූ අතර ඒ මගින් ප්‍රතිලාභ ලබන්නන්ගේ සංඛ්‍යාව 33800 ක් විය. යුපීවීසී නල හා මෘදු යකඩ නල සැපයීම හා ප්‍රදේශය තුල නල මාර්ග එලීම ව්‍යාපෘතියේ සංයුතිය විය. යුපීවීසී නල හා මෘදු යකඩ නල සැපයීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර නල මාර්ග එලීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 96 % ක් හා 85 % ක් විය.

**iii). සිතුල්පව්ව ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

සිතුල්පව්ව ජල සම්පාදන ක්‍රමය 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද්දේ තුළු මුව ළිඳ, රඳවා ගන්නා කුටිය **(crib chamber)**, පොම්පාගාර පාලන කුටිය හා ඝණ මීටර 25 ක ධාරිතාවයකින් යුත් අතරමැදි ටැංකිය ඉදි කිරීම සඳහා සහ පහල ඔසොවි පොම්ප, ඉහල ඔසොවි පොම්ප, බාදිය පොම්ප හා උපාංගයන් සපයා ස්ථාපනය කර ලීම සඳහා ද වේ. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සැපයීම කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසින් වන අතර මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 116 ක් ද, ව්‍යාපෘතිය තුළින් ප්‍රතිලාභ ලබන්නන්ගේ සංඛ්‍යාව 10000 ක් ද වන්නේය.

තුළු මුව ළිඳ, රඳවා ගන්නා කුටිය **(crib chamber)**, පොම්පාගාර පාලන කුටිය හා ඝණ මීටර 25 ක ධාරිතාවයකින් යුත් අතරමැදි ටැංකිය ඉදි කිරීම සහ පහල ඔසොවි පොම්ප සපයා ස්ථාපනය කර ලීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. අනිකුත් වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කරනු ලැබ ඇත්තේ 2017 වර්ෂය තුළදී ය. වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 75 % ක් හා 60% ක් විය.

**iv). තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වාතනය කිරීමේ උපකරණයක් ද, අවසාදන ටැංකියක් ද, රසායන කුටියක් හා මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම වේ. මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එය නිම කිරීමට සැලසුම් කරනු ලැබ ඇත්තේ 2018 වර්ෂයේදීය. අරමුදල් සැපයීමේ ප්‍රභවය වන්නේ ශ්‍රී ලංකා රජය වන අතර ප්‍රතිලාභ ලබන්නන්ගේ සංඛ්‍යාව 10000 ක් ද, ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 393 ක් ද වේ. ව්‍යාපෘතියේ වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 2 % ක් හා 5 % ක් විය.

**v). හරිතගම ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

හරිතගම ජල සම්පාදන යෝජනා ක්‍රමය 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලද්දේ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ නල මාර්ග පද්ධතීන් එලීම සඳහා ද, පොම්පාගාරයක් ද සහිතව බිම් ටැංකිය ඉදි කිරීම සඳහා සහ සිරස් අතට සවි කරන ලද මාර්ගස්ථ හුවන පොම්ප කට්ටල හා උපාංගයන් සපයා සවි කිරීම සඳහා ද වේ. මෙම ව්‍යාපෘතියේ ජල ප්‍රභවය වන්නේ විසල් ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයයි. අරමුදල් ප්‍රභවය වන්නේ ප්‍රාග් ධන අය වැය ලේඛනයයි. ප්‍රතිලාභ ලබන්නන්ගේ සංඛ්‍යාව 1500 ක් වන අතර ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 30.2 ක් වේ. භෞතික වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර 2016 වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රගතිය 95 % ක් විය.

**vi). කතරගම ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

කතරගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඕස්ට්‍රියාව විසින් අරමුදල් සපයනු ලැබූ **UNIHA** ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂයේදී වැඩි වර්ධනය කරන ලදි. ඒ අනුව කතරගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 8000 ක මට්ටම දක්වා වර්ධනය වී ඇත. කෙසේ වුවද, වැඩි වන බොර තත්ත්වය නිසා වර්ෂා ඍතු තුළ දී අපේක්ෂිත ධාරිතාවය සාක්ෂාත් කර ගැනීමට යන්ත්‍රාගාරය අසමත් විය. එම නිසා දැනට ඇති අවසාදන ටැංකිය වැඩි දියුණු කිරීම ද, කැට් ගස්වනයන් ඉදි කිරීම ද, රසායන කුටිය ඉදි කිරීම හා මද වේගී වැලි පෙරණයන් දෙක සඳහා පෙරණ මාධ්‍යයන් සපයා යෙදීම ද කිරීම තුළින් කතරගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉහල ශ්‍රේණිගත කිරීමට තීරණය කරන ලදි. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 137 ක් විය. ව්‍යාපෘතිය දැනටමත් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 85% ක් විය.

**6). ඌව පලාත.**

**i). ඕකිය ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙය නව යෝජනා ක්‍රමයක් වන අතර හින්නාරන්ගල්ල, ගල්වීදණ්ඩ, වැලිමඩ, ලන්දෙගම, චන්ද්‍රමඩුව, මිරහවත, ගුරුතලාව, මහතැන්න, දඹවින්න හා වැලිමඩ නගරය හා ඒ ආශ්‍රිත අනු නාගරික ප්‍රදේශයන් තුළ ජීවත් වන 10000 ක ජන ගහණයක් වෙත ඒ තුළින් සේවය සපයා දීමට අපේක්ෂා කරනු ලැබේ. ජල ප්‍රභවය උමා ඔය වන අතර දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හරහා සම්පූර්ණයෙන් ප්‍රතිකාර කරන ලද ජලය සම්පාදනය කර දීමට කටයුතු කරනු ඇත. සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 264.7 ක් වන අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99% ක් හා 100.4% ක් විය. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය හරහා ආසන්න වශයෙන් නව සම්බන්ධතාවයන් 1000 ක් පමණ දෙනු ලැබ ඇත.

**ii). මොනරාගල ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර.**

මේ ව්‍යාපෘතිය හරහා අදහස් කරන ලද්දේ මොනරාගල, හුලන්දාව වම, හුලන්දාව දකුණ, මුප්පන, ජයසේනගම, මදුරකැටිය හා සිරිගල යන ප්‍රදේශයන් ආවරණය කරමින් මොනරාගල හා එයට අනුබද්ධිත අර්ධ නාගරික ප්‍රදේශයන්හි ජීවත් වන ආසන්න වශයෙන් 10000 ක් පමණ වූ ජන ගහණයක් වෙත සේවය සැපයීමට හැකි

වන පරිදි දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීම වේ. ජල ප්‍රභවය වන්නේ ජී - ලොන් වතු යාය හරහා ගලා බසින ඔයක් වන අතර දිනකට ජලය ඝණ මීටර 2850 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මගින් ජලය අර්ධ වශයෙන් ප්‍රතිකාර්ත කිරීම සිදු කරනු ලැබීමට නියමිතව ඇත. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 154.8 ක් වන අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ආසන්න වශයෙන් පිළිවෙලින් 100% ක් හා 104.5% ක් විය. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය හරහා ආසන්න වශයෙන් නව සම්බන්ධතාවයන් 1000 ක් පමණ දෙනු ලැබ ඇත.

**iii). අඹගස්දෝව ජල සම්පාදන ව්‍යාපාතිය.**

මෙම ව්‍යාපෘතිය කරගහැල්පත, මඩවල හා ඌව පරණගම ප්‍රදේශයන් ආවරණය කරමින් අඹගස්දෝව හා එයට අනුබද්ධිත අර්ධ නාගරික ප්‍රදේශයන්හි ජීවත් වන ආසන්න වශයෙන් 17750 ක් පමණ වූ ජන ගහණයක් වෙත සේවය සැපැයීමට හැකි වන පරිදි දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමක් වේ. ජල ප්‍රභවය වන්නේ බොඹරු ඇල්ල වන අතර දිනකට ජලය ඝණ මීටර 3000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මගින් ජලය පූර්ණ වශයෙන් ප්‍රතිකාර්ත කිරීම සිදු කරනු ලැබීමට නියමිතව ඇත. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 382 ක් වන අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ආසන්න වශයෙන් පිළිවෙලින් 100% ක් හා 100.2% ක් විය. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය හරහා ආසන්න වශයෙන් නව සම්බන්ධතාවයන් 1000 ක් පමණ දෙනු ලැබ ඇත.

**iv). වැල්ලවාය ජල සම්පාදන ව්‍යාපාතිය.**

මෙම ව්‍යාපෘතිය මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවායේ පිහිටි වැල්ලවාය, කුඩා ඔය, හඳපානාගල, යලබෝව, වරුණගම, තෙලුල්ල හා ඇතිලිවැව යන ප්‍රදේශයන් ආවරණය කරමින් එම ප්‍රදේශයන් තුළ ජීවත් වන 6000 ක් පමණ වන ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරයි. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 250 ක් වන අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99% ක් හා 75.1% ක් විය. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය හරහා ආසන්න වශයෙන් නව සම්බන්ධතාවයන් 1200 ක් පමණ දෙනු ලැබ ඇත.

**v). බඩල්කුඹුර ජල සම්පාදන ව්‍යාපාතිය.**

මෙම ව්‍යාපෘතිය මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රදේශයේ පිහිටි බඩල්කුඹුර, අලුපොත, නක්කල, කරවිල, ඇල්ල, හිඳිකිවුල, තන්වත්ත හා මැදිරිය යන ප්‍රදේශයන් ආවරණය කරමින් එම ප්‍රදේශයන් තුළ ජීවත් වන 22000 ක් පමණ වන ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරයි. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 124.4 ක් වන අතර 2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ආසන්න වශයෙන් පිළිවෙලින් 100% ක් හා 101.9 % ක් විය. 2016 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය හරහා ආසන්න වශයෙන් නව සම්බන්ධතාවයන් 300 ක් පමණ දෙනු ලැබ ඇත.

**7). බස්නාහිර පලාත.**

**අ.) බස්නාහිර උතුරු හා බස්නාහිර මධ්‍යම.**

2016 වර්ෂය තුළ දී බස්නාහිර උතුරු හා බස්නාහිර මධ්‍යම කලාපයන් තුළ ක්‍රියාත්මක වෙමින් පැවැති කුඩා පරිමාණ හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘතීන් කිසිවක් නොවීය.

**ආ) බස්නාහිර දකුණ.**

**i). කළුතර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපාතිය - 11 වැනි පියවර.**

මෙම යෝජනා ක්‍රමය සැලසුම් කරන ලද්දේ පයාගල, මග්ගොන, බේරුවල, ධර්ගා නගරය, බෙන්තොට හා අළුත්ගම යන ප්‍රදේශයන් වෙත ජල සම්පාදනය දීර්ඝ කර 210000 ක ජන ගහණයක් වෙත ජලය සම්පාදනය කිරීමට හැකි වනු පිණිස වේ. ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2006 වර්ෂයේදීය. ජල ප්‍රභවය කළුගඟ වූ අතර දිනකට ජලය ඝණ මීටර 56250 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මගින් ජලය පූර්ණ වශයෙන් ප්‍රතිකාර්ත කිරීම සිදු කරනු ලැබීමට කටයුතු යොදන ලද්දේය. ඇස්තමේන්තු කරන ලද සංශෝධිත පිරිවැය රුපියල් දස ලක්ෂ 1,366 ක් විය.

ව්‍යාපෘතියේ 1 වැනි පියවරෙහි ප්‍රධාන අරමුණ වූයේ කළුතර දකුණු ප්‍රදේශය වෙත ජලය බෙදා හැරීම වැඩි දියුණු කිරීමයි. කිලෝ මීටර 9 ක දුර ප්‍රමාණයකට මධ්‍යම හන්දියේ සිට මග්ගොන දක්වා මිලි මීටර් 600 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ හා ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල මාර්ග එලීම සහ කිලෝ මීටර් 5 ක දුර ප්‍රමාණයකට මග්ගොන සිට බේරුවල දක්වා මිලි මීටර් 600 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ හා ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල මාර්ග එලීම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඊට අමතර ලෙස විශේෂයෙන්ම ග්ලැඩිස් වත්ත, අක්කර 80 සහ මග්ගොන ඇතුලත් කළුතර ප්‍රදේශය තුළ බෙදා හැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා සිදු කරන ලද නල මාර්ග එලීමේ කටයුතු හා පොම්පාගාරය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2016 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 98.5 % ක් හා 98 % ක් විය.

**8.) නැගෙනහිර පලාත.**

**i). කන්තලේ (අග්බෝ පුර) ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය තුළට ඇතුලත් වන්නේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අග්බෝ පුර නගරය, බටුකච්චි, සීනි කර්මාන්ත ශාලා පාර හා බාතියගම යන ප්‍රදේශයන්හි වාසය කරන 8000 ක ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙත තමන්ගේ එදිනෙදා ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබා දීම වේ. ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. කෙසේ වුවද, රුපියල් දස ලක්ෂ 29.0 ක පිරිවැයක් දරමින් මැදගම, තලසස්වැව හා පේරමඩුව යන ගම්මානයන් වෙත අතිරේක නල මාර්ග දීර්ඝ කිරීමේ කටයුතු 2016 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද අතර එම කටයුතු වලින් 40% ක් දැනට සම්පූර්ණ කරනු ලැබ ඇත.

**ii). වාන් ඇල ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙම ව්‍යාපෘතිය පිහිටුවන ලද්දේ ජයන්තිපුර, පන්සල් ගොඩැල්ල, සූරන්ගල හා අවට පෙදෙස් වල වාසය කරන ප්‍රතිලාභීන් 14000 ක සංඛ්‍යාවක් වෙත සේවා සැපැයීම සඳහා ඝණ මීටර 750 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණක් ඉදි කිරීම ද, සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් නල මාර්ග එලීම ද පිණිස වන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දස ලක්ෂ 808.50 ක් විය. මේ වන විට නල මාර්ග එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර කුළුණ ඉදි කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. කෙසේ වුව ද, ප්‍රතිලාභීන්ගේ හදිසි ඉල්ලුම සපුරා ලීම සඳහා පොම්ප කිරීම මගින් ජලය සම්පාදනය කර දීමට දැනට කටයුතු යොදා ඇති අතර ව්‍යාපෘතිය 2017.01.13 වැනි දින ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලබනවා ඇත.

**9.) වයඹ පලාත.**

**i). මහව -වාරියපොළ-නිකවැරටිය ජලසම්පාදන යෝජනා ක්‍රමය.**

මේ වනාහී ප්‍රදේශය තුළ වාසය කරනු ලබන පවුල් 45000 ක් වෙත සේවය සැපැයීම සඳහා අළුතින් සැලසුම් කරන ලද ව්‍යාපෘතියකි. ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 996 ක් වේ. ව්‍යාපෘතියේ නිකවැරටිය හා මහව කොටස් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී. නිකවැරටිය / මහව යෝජනා ක්‍රමයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 6500 ක්

වන අතර ජලය ලබා ගන්නා ප්‍රභවය මාගාල්ලේ වැවයි. පූර්ණ ප්‍රතිකාරක කටයුතු කිරීමේ පහසු කම් මෙම යෝජනා ක්‍රමය සතුව තිබේ. වාරියපොල යෝජනා ක්‍රමයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලද්දේ 2013 වර්ෂයේදීය. පූර්ණ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 2000 ක් වන අතර ජල ප්‍රභවය වන්නේ මාගුරුඔයයි. වාරියපොල ජල සම්පාදන යෝජනා ක්‍රමය 2014 දෙසැම්බර් මාසයේදී ක්‍රියාත්මක තත්ත්වයට පත් කරන ලදි. රසායන කුටිය හා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු වාරියපොල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ඉතිරි වැඩ කටයුතු වශයෙන් දැනට කරගෙන යනු ලැබේ. 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99% ක් හා 99% ක් විය.

**ii). ඉබ්බාගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මේ වනාහී ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 11 ක් තුළ ජීවත් වන ජනතාව වෙත පානීය ජල පහසු කම් සම්පාදනය කර දීම සඳහා ආරම්භ කරන ලද නව ජල සම්පාදන යෝජනා ක්‍රමයකි. ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 7400 ක් වන අතර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 239 ක් වේ. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 1500 කි. 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 90% ක් හා 90% ක් විය. බෙදා හැරීමේ ජාලය හා විද්‍යුත් හා යාන්ත්‍රික අංශයන්ට අදාල ඉතිරි වැඩ කටයුතු පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබනවා ඇත.

**iii). දඹදෙනිය ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙය දඹදෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 70 ක් ආවරණය කිරීම සඳහා අළුතින් ආරම්භ කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමයක් වේ. මේ සඳහා පිළියෙල කරනු ලැබ ඇති මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 796 ක් වන අතර ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් මුළු සංඛ්‍යාව 51835 ක් වනු ඇත. යෝජනා ක්‍රමයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 4500 ක් වේ. 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 75% ක් හා 75% ක් විය. මේ වන විට සමුච්චිත වියදම රුපියල් දස ලක්ෂ 224.82 ක් වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ඉතිරි වැඩ කටයුතු කිරීම පිණිස අමතර රුපියල් දස ලක්ෂ 340 ක මුදලක් අවශ්‍ය වනු ඇත.

**iv). දිවුල්ගනේ ජල සම්පාදන යෝජනා ක්‍රමය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සාරන ලද ළිඳක් උපයෝගී කර ගනිමින් දිවුල්ගනේ හා දළුපොතගම ග්‍රාම නිලධාරී වසම් වෙත නල ජලය සම්පාදනය කිරීම වේ. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 47 ක් වන අතර ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 1800 කි. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන අවස්ථාව වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 100 % ක් වූ අතර 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට මූල්‍ය ප්‍රගතිය 99 % ක් විය.

## ක්‍රියාත්මක කිරීම සඳහා පෙල ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් (ජල සම්පාදන ව්‍යාපෘතීන්)

**1. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර 1).**

අදියර තුනකින් ක්‍රියාත්මක කරනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇති යෝජිත ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් ආනමඩුව, ආරච්චිකට්ටුව, මහකුඹුක්කඩවල, මුන්දලම, නවගත්තේගම, පල්ලම, පුත්තලම හා කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හා රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනුකැටිය ග්‍රාම නිලධාරී වසම ද ආවරණය කරනු ලබනවා ඇත. ප්‍රදේශය තුළ ඇති භූ ගත ජලයේ දුර්වල ගුණාත්මය හා හිඟය හේතු කොට ගෙන එහි වාසය කරන ජනයා ආරක්ෂිත පානීය ජලය නොමැතිව අසහනයට පත් වී සිටිති. මේ ප්‍රදේශය තුළ ප්‍රජා මූල සංවිධානයන් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ආසන්න වශයෙන් 85 ක් පමණ ක්‍රියාත්මක වුව ද ඒවා ගුණාත්මය හා ප්‍රමාණවත් භාවය පිළිබඳ ඇතැම් ගැටළු වලට මුහුණ දෙමින් ඇත. විශේෂිත වශයෙන් ඒවා කඨිනත්වය හා ලවණතාවය වැනි ගැටළු වලට මුහුණ පාමින් සිටිති. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙහෙයුම් කටයුතු කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වන්නේ ආනමඩුව හා උඩප්පුව යන යෝජනා ක්‍රමයන් දෙක පමණක් වේ.

මෙම තත්ත්වය අභිභවා යාමේ පරමාර්ථයෙන් ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර තුනකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ තිබේ. ඉඟිනිමිටියේ ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 11000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, ඉඟිනිමිටියේ ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 12500 ක ධාරිතාවයකින් යුත් තුළු මුව ද, කිලෝ මීටර 1.5 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර් 328 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල මාර්ග ජාලය ද මෙහි 1 වැනි අදියරට ඇතුලත් වේ. 1 වැනි අදියර හරහා සේවය කරනු ලැබීමට ප්‍රක්ෂේපිත ජන ගහණය 82000 ක් වන අතර ව්‍යාපෘතියේ ආරම්භක පිරිවැය රුපියල් දස ලක්ෂ 9,722 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ තිබේ.

**2. කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කැළණිය, කඩවත, වත්තල, පෑලියගොඩ, මහර, රාගම, බියගම, වැලිසර, කඳාන, ජා ඇල, පමුණුගම හා ඒකල වැනි කොළඹට උතුරු දෙසින් පිහිටා ඇති නගර වලින් මෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළ, ආයෝජන මණ්ඩලය හා ගුවන් හමුදාව වෙතින් ද එන දිනෙන් දින වර්ධනය වෙමින් පවතින දැඩි ඉල්ලුම සපුරා ලීම සඳහා පානීය ජල පහසුකම් සපයා දීම වේ. නව ජල සම්බන්ධතාවයන් 120000 ක් සපයා දීම හරහා ඉහත සඳහන් ප්‍රදේශයන් තුළ ජීවත් වන 1750000 ක ජනතාවක් වෙත මෙම ව්‍යාපෘතිය මගින් සෙත සලස්වනු ලබනවා ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රංශයේ ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් කෝර්පරේට් බැංකුව විසින් සපයන ලද යුරෝ 95,794,399. 25 ක මුදලක් ද, ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුවෙන් සපයන ලද යුරෝ 13,056,433.39 ක මුදලක් හා රුපියල් 10,000,000.00 ක මුදලක් හා ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද රුපියල් 5,281,720.00 ක මුදලක් ද යනාදී වශයෙන් වූ ණය පහසුකම් උපයෝගී කර ගනිමිනි. ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාර කම් වන්නේ දිනකට ජලය ඝණ මීටර 180000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, මිලි මීටර 1200 /800 විෂ්කම්භයෙන් යුත් කිලෝ මීටර 24.6 ක දිගින් යුත් පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය ඉදි කිරීම ද, මිලි මීටර 225 හා මිලි මීටර 110 අතර විවිධ විෂ්කම්භයන්ගෙන් යුත් කිලෝ මීටර් 300 ක දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග සැපයීම හා අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ අමු ජල ගුණාත්මය වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් බියගම නිදහස් වෙළෙඳ කලාපයෙන්, ලංකා විදුලි බල මණ්ඩලයෙන් හා සපුගස්කන්දේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් කාන්දු වන තෙල් ගැටළුවට පිළියමක් වශයෙන් කිලෝ මීටර 9.6 ක දුර ප්‍රමාණයකට පොලි එතිලින් නල මාර්ග එලීම ද වේ. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට සැලැසුම් කරනු ලැබ ඇත්තේ 2020 ජනවාරි 22 වැනි දිනය.

**3. විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය.**

යෝජිත විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් මාතලේ, රත්තොට, උකුවෙල, පල්ලෙපොල, යටවත්ත, නාඋල හා අඹන්ගඟ කෝරලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හත ආවරණය කරනු ලබනවා ඇත. ග්‍රාම නිලධාරී වසම් 260 ක් මෙම ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාස හත තුළ අන්තර්ගත වන අතර එම සංඛ්‍යාව මාතලේ දිස්ත්‍රික්කය තුළ ඇති මුළු ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාවෙන් භාගයක් පමණ වේ. මේ ප්‍රදේශය තුළ වාසය කරන ජනතාවගෙන් වැඩිම සංඛ්‍යාවක් භාවිතා කරන ප්‍රධාන පානීය ජල ප්‍රභවයන් වන්නේ දැනට මාතලේ, උකුවෙල හා උඩතැන්නේ ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වන අතර ඒවායින් සේවය ලබන සාමාන්‍ය ජනතාවගේ මතයට අනුව ඒ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙතින් ලැබෙන සේවාව සතුටුදායක මට්ටමක නැත. (උකුවෙල හා උඩතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රම සතුව සුදුසු ජල ප්‍රතිකාරක පහසුකම් පවා නැත). අනිකුත් ප්‍රධාන ජල ප්‍රභවයන් වන්නේ අත් පොම්ප නල ළිං හා සාරන ලද ළිං වේ. (පොදු අයිතියෙන් හා පෞද්ගලික අයිතියෙන් යුත් තනි හෝ පොදු ළිං). ඇතැම් ග්‍රාම නිලධාරී වසම් තුළ ජීවත් වන ජනතාව සිය ජල අවශ්‍යතාවයන් සපුරා ගන්නේ ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගෙන් **(CWSSP)** හා ප්‍රාදේශීය සභා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගෙන් වන අතර, ඔවුන් එම ජලය ප්‍රධාන වශයෙන්ම භාවිතා කරන්නේ පානීය අවශ්‍යතාවයන් සඳහා පමණකි. පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගැටළුව සෑම විටම ප්‍රධාන වශයෙන්ම දැඩි සැලකිල්ලට භාජනය වූ කාරණයක් වන අතර දීර්ඝ කාලයක් මුලුල්ලේ මාතලේ දිස්ත්‍රික්කය වෙත බල පාන ලද ගැටළුවක් විය. 2035 වර්ෂය වන විට ව්‍යාපෘතිය විසින් සපුරා ලිය යුතු වෙතැයි ප්‍රක්ෂේපිත ඉල්ලුම දිනකට ජලය ඝණ මීටර 74918 ක් වේ. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 23,959 + අගය එකතු කළ බද්ද රුපියල් දස ලක්ෂ 2,994. 9 ක් වන අතර 2035 වසර වන විට සේවය ලබනු ඇතැයි ප්‍රක්ෂේපිත ජන ගහණය 352507 ක් වේ.

**4. දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතිය.**

මෙම ජල සම්පාදන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිධාන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමට හැකි වන පරිදි මහව හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ වාසය කරනු ලබන ජනතාවගෙන් කොටසක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ. දැදුරුඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය විසින් මහව හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ මහව හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 97 ක් ආවරණය කරනු ලබනවා ඇත. මේ ප්‍රදේශයන් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 90700 ක් පමණ වූ ජනතාවකට මේ හරහා සෙත සැලසෙනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ කොරියානු නිර්යාත ආයාත බැංකුව විසින් සපයනු ලැබ ඇති ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 58.155 ක ණය ආධාර හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය වන රුපියල් දස ලක්ෂ 1,326 ක මුදල ආධාර කර ගනිමිනි. ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාර කම් වන්නේ ජල ප්‍රභවය - එනම් දැදුරුඔය ජලාශයේ වම් ඉවුරේ ඇල ඉදි කිරීම, ඝණ මීටර 34500 ක ධාරිතාවයකින් යුත් අමු ජල තුළු මුව ඉදි කිරීම, ඝණ මීටර 15000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, කිලෝ මීටර 3.5 ක දිගින් යුත් මිලි මීටර 500 ක විෂ්කම්භයකින් යුත් ප්‍රධාන අමු ජල මෘදු යකඩ නල මාර්ගය ඉදි කිරීම, පිරිසිදු කරන ලද ජලය සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ග එලීම මහව, නාගොල්ලාගම හා පොල්පිතිගම ඔසොවි කුළුණු 3 ක් ඉදි කිරීම සහ මිලි මීටර 90 සිට මිලි මීටර 450 ක් දක්වා වූ විෂ්කම්භයෙන් යුත් සහ කිලෝ මීටර 266 ක දිග ප්‍රමාණයකින් යුත් පිරිසිදු ජලය බෙදා හැරීමේ ජාලය ඉදි කිරීම ද වේ.

# ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල සම්පාදන ව්‍යාපෘති)

**බටහිර කොට්ඨාසය.**

**ඉටු කරන ලද ක්‍රම සම්පාදන වැඩ කටයුතු:**

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ බස්නාහිර අනු අංශය විසින් ප්‍රස්තුත වර්ෂය තුළ දී පහත දැක්වෙන ක්‍රම සම්පාදන කටයුතු කරනු ලැබ ඇත :

- ඔරුගොඩවත්තේ සිට කඩුවෙල දක්වා වූ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය ප්‍රති ස්ථාපන ගත කිරීම සඳහා සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම. යෝජිත ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය මං තීරු හතරක් සේ පුළුල් කරමින් වැඩි දියුණු කිරීමට ගත් පියවරත් සමග වේ. ඒ වන විට තිබුණ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය ප්‍රති ස්ථාපන ගත කිරීමට සැලැසුම් කරන ලද අතර ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දස ලක්ෂ 9,250 ක් විය.
- වැලිවිට ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් **PPP** කොන්ත්‍රාත්තු සඳහා මූල්‍ය ආකෘතිය පිළියෙල කිරීම. ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයෙන් යෙදවුම් මිළ ගණන් කැඳවීමේ ප්‍රලේඛනය පිළියෙල කිරීම සඳහා භාර දෙන ලදි.
- කළු ගඟ ජල සම්පාදන ව්‍යාප්ති ව්‍යාපෘතිය (1) වෙනුවෙන් උපදේශක සේවා සඳහා මිළ ගණන් කැඳවීමේ ප්‍රලේඛනය පිළියෙල කිරීම. යෝජිත ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 294000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ඉදි කිරීම හා දිනකට ජලය ඝණ මීටර 140000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් කඳනේ ඉදි කිරීම ද, ප්‍රධාන මෘදු යකඩ සම්ප්‍රේෂණ නල මාර්ගය හා බෙදා හැරීමේ ජාලය එලීම හා කුළුණු හා භූමි ජලාශ ඉදි කිරීම ද ඇතුලත් වේ.
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පරිශ්‍රය තුළ මහල් හයකින් යුත් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සැලැසුම් කොට ගොඩ නැගීමේ ටෙන්ඩර ලියවිල්ල පිළියෙල කිරීම.

ප්‍රධාන කාර්යාලයේ වැඩි දියුණු කිරීම් වැඩ ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම.

**නිම කරන ලද සවිස්තරාත්මක සැලැසුම්.**

වර්ෂය තුළ දී පහත සඳහන් සවිස්තරාත්මක සැලැසුම් වැඩ කටයුතු නිම කරන ලදි:

- ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ මහල් පහකින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සවිස්තරාත්මක සැලැසුම් සකස් කිරීම හා ඉදි කිරීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ඔරුගොඩ වත්තේ සිට කඩුවෙල දක්වා සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් ප්‍රධාන නල මාර්ග ප්‍රති ස්ථාපන ගත කිරීම සඳහා සවිස්තරාත්මක සැලැසුම් හා අවශ්‍ය ටෙන්ඩර ලියවිලි පිළියෙල කිරීම.
- වැලිවිට ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන සම්ප්‍රේෂණ ජාල ආකෘතිය පිළියෙල කිරීම
- සීතාවක අපනයන සකස් කිරීමේ කලාපය සඳහා පෙරණයන් පුනරුත්ථාපනය කිරීම
- තුළු මුව සිට මාදිවෙල ඇල හරහා අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත දිවෙන ප්‍රධාන අමු ජල නල මාර්ගයේ නල ඔසවා තැබීමේ ව්‍යුහය ඉදි කිරීම සඳහා සවිස්තරාත්මක සැලැසුම පිළියෙල කිරීම.

**නිම කරන ලද සැලැසුම් සමාලෝචන වැඩ කටයුතු**

වර්ෂය තුළදී පහත සඳහන් සැලැසුම් සමාලෝචන වැඩ කටයුතු නිම කරන ලදි.

- විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ වැඩ සටහන සඳහා ගොතටුව සිට මාලිගාකන්ද දක්වා දිවෙන මිලි මීටර 1200 ක විෂ්කම්භයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ගය.
- ලබුගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමට හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමට අදාල සැලැසුම් සමාලෝචනය කිරීම

- ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල මූලික සැලසුම් සමාලෝචනය.
- කැළණිය දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර - සඳහා මූලික සැලසුම් සමාලෝචනය.
- කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘති 1, 2 හා 3 පැකේජ.
- කොළඹ නාගරික ජල සම්පාදන වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය.

**දකුණු - නැගෙනහිර කොට්ඨාශය.**
**ඉටු කරන ලද ක්‍රම සම්පාදන වැඩ කටයුතු**

වර්ෂය තුළදී පහත සඳහන් සැලසුම් කටයුතු නිම කරන ලදි:

- ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා භූ ලක්ෂණ ප්‍රතිසම්පාදන ප්‍රලේඛන පිළියෙල කිරීම සම්පූර්ණ කරනු ලැබ ඇති අතර ඉඩම් හඳුනා ගැනීම හා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.
- හැඩ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ඉඩම් හඳුනා ගැනීම, තාවකාලික පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම හා පෙර සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විරුද්ධත්වය නිසා යෝජිත ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් නව තුළු මුව සැලැස්මක් පිළියෙල කරන ලදි.
- බදුල්ල - හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා දෙමෝදර පදික පාලම් හරස් මාරුව පිළිබඳව විමර්ශණයක් සිදු කිරීම.

**නිම කරන ලද සවිස්තරාත්මක සැලසුම්.**

- IDA ණය 5685.**lk** අරමුදල් යටතේ ජල සම්පාදන හා සනීපාරක්‍ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ව්‍යාපෘතීන්ට අදාල සවිස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම නිම කරනු ලැබ ඇත.
- ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, තුළු මුව, බෙදා හැරීම් පද්ධතිය, මෘදු යකඩ ප්‍රධාන අමු ජල හා සම්ප්‍රේෂණ නල මාර්ග, භූමි ජලාශ දෙකක්, කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස ආදියෙන් සමන්විත පඹහින්න ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදි කිරීම සඳහා ද්‍රව විද්‍යාත්මක, ව්‍යුහාත්මක හා යාන්ත්‍රික හා විද්‍යුත් සැලසුම් පිළියෙල කිරීම නිම කරනු ලැබ ඇත. සවිස්තරාත්මක රූප සටහන්, ප්‍රමාණ පත්‍ර හා ප්‍රතිසම්පාදන ප්‍රලේඛන පිළියෙල කිරීමේ කටයුතු 2016 වර්ෂය තුළදී නිම කරන ලදි.
- පාරු තුළු මුව, අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය, සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය, ගුරුත්ව බලයෙන් ප්‍රතිකාරිත ජලය ගෙන යාමේ ප්‍රධාන නල මාර්ගය, භූමි ජලාශය, බෙදා හැරීමේ පද්ධතිය, නිල නිවාස 3 ක්, ස්ථාන භාර නිලධාරි කාර්යාල ගොඩනැගිල්ල හා වැඩ බිමේ වැඩ, (වාතන උපකරණය, කැටි ගැස්වනය,අධිවේගී වැලි පෙරණය, සක්‍රිය කාබන් පෙරණය, භූමි ජලාශය, පොම්පාගාරය හා ගොහොදු ප්‍රතිකාරක ක්‍රියාවලියෙන් සමන්විත) ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය යන අංගයන්ගෙන් සැදුම් ලත් සියඹලාන්ඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වූ සවිස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.
- (වාතන උපකරණය, කැටි ගැස්වනය,අධිවේගී වැලි පෙරණය, භූමි ජලාශය හා ගොහොදු ප්‍රතිකාරක ක්‍රියාවලිය යන අංගයන්ගෙන් සැදුම් ලත්) සාම්ප්‍රදායික ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, වැර ගැන්වූ සිමෙන්ති ටැංකි 2 ක්, භූමි ජලාශය හා පොම්පාගාරය,ඇතුලත්) සම්ප්‍රදායික ජල ප්‍රතිකාරය යන්ත්‍රාගාරය, නිල නිවාස 3 ක් හා ස්ථාන භාර නිලධාරි කාර්යාල ගොඩනැගිල්ල යන අංගයන්ගෙන් සමන්විත හල්දුම්මුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සවිස්තරාත්මක සැලසුම පිළියෙල කිරීම නිම කරන ලදි. ඊට අමතර ලෙස අමු ජල ප්‍රධාන නල මාර්ගයට, ප්‍රතිකාරිත ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයට හා බෙදා හැරීමේ පද්ධතියට අදාල සැලසුම් සකස් කරන ලදි.
- කැළණි ගඟේ පිහිටි තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ජල කුළුණු 3 ක් හා එක් භූමි ජලාශයක් යන අංගයන්ගෙන් සමන්විත රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය හා අදාල උපදේශක කාර්යයන් හා සැලසුම් කොට ගොඩ නැගීමේ වැඩ කටයුතු වලට අදාල යෝජනා කැඳවීමේ ප්‍රලේඛනය පිළියෙල කිරීම නිම කරන ලද අතර ඊට අමතරව උපදේශක වැඩ හා සැලසුම් කොට ගොඩ නැගීමේ වැඩ යන දෙකම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ද පිළියෙල කරන ලදි.
- රුපියල් දස ලක්‍ෂ 100 ක අය වැය ලේඛනයක් යටතේ ඉදි කිරීමට යෝජිත කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය (පනාමුර කලාපය) සඳහා වූ ප්‍රමාණ පත්‍රිකා හා සවිස්තරාත්මක රූප සටහන් ඇතුළු ටෙන්ඩර් ලියකියවිලි පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබ ඇත. තවත් රුපියල් දස ලක්‍ෂ 200 ක යෝජනා ක්‍රමයක් වෙනුවෙන් වූ ටෙන්ඩර ලියකියවිලි පිළියෙල කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.
- රුපියල් දස ලක්‍ෂ 100 ක අය වැය ලේඛනයක් යටතේ ඉදි කිරීමට යෝජිත බලංගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වූ ප්‍රමාණ පත්‍රිකා හා සවිස්තරාත්මක රූප සටහන් ඇතුළු ටෙන්ඩර් ලියකියවිලි පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබ ඇත.
- කොලොන්න, බලංගොඩ, මොනරාගල, බුත්තල, බදුල්ල හා මහියංගනය කණ්ඩායම් ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති අගයීම් ප්‍රලේඛනය පිළියෙල කිරීම හා ප්‍රතිසම්පාදන ප්‍රලේඛනය පිළියෙල කිරීම දැනට සිදු කෙරෙමින් පවතී. මීට පෙර විදේශීය අරමුදල් යොදා ගනිමින් දැනටමත් පානීය ජල නිෂ්පාදනය වැඩි දියුණු කරනු ලැබ ඇති මෙම ප්‍රදේශයන් තුළ ක්‍රියාත්මක වන නල මාර්ග ජාලයන් ව්‍යාප්ත කරනු ලැබීමට යෝජනා කරනු ලැබ ඇති අතර මෙම ව්‍යාපෘතිය දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.
- කිරිඳි ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමට අදාල සවිස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම නිම කරනු ලැබ ඇත. කැටි ගැස්වනයට, ආනත තල අවසාදන ටැංකියට, අධිවේගී වැලි පෙරණයට හා රසායන ද්‍රව්‍ය පෝෂක පද්ධතියට අදාල ද්‍රව විද්‍යාත්මක හා ව්‍යුහාත්මක සැලසුම් පිළියෙල කිරීම සිදු කරන ලද අතර ඊට අමතර ලෙස සවිස්තරාත්මක රූප සටහන් හා ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම ද සම්පූර්ණයෙන් නිම කරන ලදි.
- රන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කැටි ගැස්වනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සම්පූර්ණයෙන් නිම කරන ලදි.
- අන්දරගස්යාය භූමි ජලාශයේ සිට දැනට ක්‍රියාත්මක වන බන්දගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමය පෝෂණය කිරීම සඳහා අවශ්‍ය සවිස්තරාත්මක සැලසුම් සම්පූර්ණයෙන් නිම කරන ලදි. රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අන්දරගස්යාය භූමි ජලාශයේ සිට බන්දගිරිය බිම් ටැංකිය හා කෑලියපුර ජල කුළුණ වෙත දිවෙන ප්‍රධාන ගුරුත්ව සම්ප්‍රේෂණ නල මාර්ගය සඳහා අවශ්‍ය ද්‍රව විද්‍යාත්මක සැලසුම් පිළියෙල කොට අවසන් කරන ලදි.
- අම්පාර 111 වැනි අදියර ජල සම්පාදන යෝජනා ක්‍රමට සම්බන්ධ ජල කුළුණු 6 ක් සඳහා අංගන නල එලීම වෙනුවෙන් ටෙන්ඩර ලියවිලි පිළියෙල කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.
- අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ දැනට සේවා නොලබන දඩයන්තලාව, මැද කඳවුර, පරගහකැලේ, නාමල් ඔය, ඉඟිනියාගල, හිම්දුරාව සහ තෝට්ටම යන ප්‍රදේශයන් වෙත ජලය සම්පාදනය කිරීම සඳහා බෙදා හැරීම් පද්ධතියක් සැලසුම් කරන ලදි. අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් පියන්ගල පිහිටි අනුයාත ගොඩනැගිල්ල, බිම් ටැංකිය හා පොම්පාගාරය යන

අංගයන්ට අදාල සැලැසුම් සමාලෝචනයට භාජනය කරන ලදි.

**සැලැසුම් සමාලෝචන වැඩ කටයුතු.**

මොනරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට ද, බදුල්ල - හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතියට හා මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතියට ද අදාල සැලැසුම් සමාලෝචන කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළ දී සිදු කරන ලදි.

## උතුරු / උතුරු මැද කොට්ඨාසය

**2016 වර්ෂය තුළ ඉටු කරන ලද සැලැසුම් වැඩ කටයුතු:**
**1. අංශය : ක්‍රම සම්පාදන හා සැලැසුම්**
**ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය (උතුරු / උතුරු මැද)**
**ඉටු කරන ලද සැලැසුම් කටයුතු :**

- යෝජිත මුලතිව් ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සැලැසුම් කටයුතු (ලෝක බැංකු අරමුදල් යටතේ)
- චිරුක්කලම්පිඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සැලැසුම් කටයුතු
- මුලන්කාවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සැලැසුම් කටයුතු (ලෝක බැංකු අරමුදල් යටතේ)
- දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල සැලැසුම් කටයුතු (කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල - කොරියානු නිර්යාත ආයාත බැංකු අරමුදල්). - උපදේශක සේවාවන් ලබා ගැනීම සඳහා යෝජනා කැඳවීමේ ප්‍රලේඛනය, සැලැසුම් කොට ගොඩනැගීමට අදාල කොන්ත්‍රාත් ලියවිලි, EDC හා ඇමැති මණ්ඩලය විසින් පත් කරනු ලැබ ඇති ස්ථාවර ප්‍රතිසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීම හා ප්‍රාග් පිරිනැමීම් හා ප්‍රාග් ලංසු කැඳවීම් රැස්වීම් ආදිය පැවැත්වීම.
- විසල් පොලොන්නරුව නගර සංවර්ධන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ වූ වැඩ සැලැසුම් කිරීම හා සම්පූර්ණ කිරීම.
- පොලොන්නරුවට නැගෙනහිරින් පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීමේ ලියවිල්ල පිළියෙල කිරීම

**ඉටු කරන ලද සැලැසුම් සමාලෝචන කටයුතු**

- විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සංකල්පිත සැලැසුම් හා සවිස්තරාත්මක සැලැසුම් සමාලෝචනයට භාජනය කිරීම.
- ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරනු ලබන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි පියවරට අයත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් ජාල සැලැසුම් හා කාර්ය පත්‍රිකා සමාලෝචනයට භාජනය කිරීම.

**නිම කරන ලද සවිස්තරාත්මක සැලැසුම්.**

- ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මුලතිව් ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල රළු පෙරණය, කුළුණ හා බිම් ටැංකිය, පොම්පාගාරය හා අනුයාත ගොඩනැගිලි සඳහා වූ සැලැසුම් පිළියෙල කිරීම හා රූප සටහන් සහ ටෙන්ඩර් ලියවිලි සම්පූර්ණයෙන් නිම කිරීම.
- ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මුලතිව් ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල බෙදා හැරීම් ජාලය සඳහා සැලැසුම් පිළියෙල කිරීම.
- ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මුලන්කවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල වාතන උපකරණය, හුණු යෙදීමේ ටැංකිය, රළු පෙරණය, කුළුණ හා බිම් ටැංකිය, පොම්පාගාරය හා අනුයාත ගොඩනැගිලි යන අංගයන්ට අදාල සැලැසුම් පිළියෙල කිරීම හා රූප සටහන් සම්පූර්ණයෙන් නිම කිරීම.
- ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මුලන්කවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල බෙදා හැරීම් ජාලය හා ජල කුළුණ හා ගොඩනැගිලි යන අංගයන්ට අදාල සැලැසුම් පිළියෙල කිරීම.
- (විසල් පොලොන්නරුව නගර සංවර්ධන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ) සම්ප්‍රේෂණ නල මාර්ග, බිම් ටැංකිය හා පොම්පාගාරය සැලැසුම් කිරීම.

## යාන්ත්‍රික හා විද්‍යුත් අංශය.

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී සැලැසුම් වැඩ කටයුතු ගණනාවක් සිදු කරනු ලැබ ඇත.

ප්‍රස්තුත වර්ෂය තුළදී පහත සඳහන් යෝජනා ක්‍රමයන්ට හා වැඩ සටහන් වලට අදාල සැලැසුම් කටයුතු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත: සියඹලාන්ඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමය, සුමේද වැව තුළු මුව, මුලතිව් ජල සම්පාදන ව්‍යාපෘතිය, හල්දුමුල්ල - බෙරගල ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය, පඹහින්න ජල සම්පාදන යෝජනා ක්‍රමය, කෙසෙල්වත්ත - කිරිබේරිය පොම්පාගාරය සැලැසුම් කිරීමේ වැඩ කටයුතු, ගොතටුව - මොරගස්මුල්ල පොම්පාගාරය, මොදරවිල අපජල රැස් කිරීමේ ජාලය හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙනුවෙන් යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ හා උපාංගයන් සපයා ස්ථාපිත කිරීම, දෘෂ්‍ය හා අභිවාහ්‍ය කලා විශ්ව විද්‍යාලයේ දෙහිවල පිරිමි ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා මල අපවහන පොම්ප කිරීමේ කට්ටල හා උපාංගයන් සපයා සවි කිරීම, ආයෝජන මණ්ඩල / ගුවන් තොටුපොල ජල සම්පාදන පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී පාදස්ථානය සඳහා පල්දෝරු කාණු උපකරණ මිළ දී ගැනීමේ වැඩ හා සම්බන්ධ ප්‍රලේඛන වැඩ කටයුතු, විවිධ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ඇති ජල මිටියම් බල පෑම (water hammer effect) විශ්ලේෂණය කිරීමේ කටයුතු, කද්දුව තුළු මුව සඳහා යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ හා උපාංගයන් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සහ එම වැඩ කටයුතු වලට අමතර ලෙස D 5 අත් පොත යාවත්කාලීන කිරීම ද සිදු කරන ලදි.

ඊට අමතරව, යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී සැලැසුම් සමාලෝචනය කිරීමේ කටයුතු වලට ද සම්බන්ධ වී කටයුතු කරන ලදි. බදුල්ල / හාලි ඇල ජල සම්පාදන ව්‍යාපෘතිය, මොනරාගල හා බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, මහියංගනය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, කතරගම ශුද්ධ නගරයේ මල අපවහන යටිතල පහසු කම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, යාපනය - කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය, ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශයන් සඳහා වූ ජල සම්පාදන යෝජනා ක්‍රමය අදියර 111 හා සම්බන්ධ සැලැසුම් සමාලෝචන වැඩ කටයුතු 2016 වර්ෂය තුළදී ඉටු කරන ලදි. මීට අමතරව, දකුණු පාර්ශව ගොඩනැගිල්ලේ යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු අධීක්ෂණය කිරීමේ කටයුතු සඳහා ද මෙම අංශය විසින් සම්බන්ධ වී කටයුතු කරන ලදි.

**ප්‍රලේඛන අංශය.**

ප්‍රලේඛන අංශය ප්‍රලේඛන අනු අංශය, සැලැසුම් අත් පොත් යාවත්කාලීන කිරීමේ අනු අංශය හා ප්‍රමාණ සමීක්ෂණ අනු අංශය යනුවෙන් හැඳින්වෙන අනු අංශයන් තුනකින් සමන්විත වේ.

## ප්‍රලේඛන අනු අංශය

ප්‍රලේඛන අනු අංශය සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛනයන් පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම ද, සම්මත පිරිවිතර පිළියෙල කිරීම ද, පූර්ව සුදුසු කම් ප්‍රලේඛන පිළියෙල කිරීම හා ජාතික ජල සම්පාදන

හා ජලාපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය තුළට දත්ත ඇතුළු කිරීමේ කර්තව්‍යය ද සිදු කිරීමේ යෙදී සිටියි.

නව සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛනයන් 2 ක් පිළියෙල කිරීම ද, නව පිරිවිතර ප්‍රලේඛනයන් 4 ක් පිළියෙල කිරීම ද, පූර්ව සුදුසුකම් ප්‍රලේඛන 2 ක් පිළියෙල කිරීම හා ඊට අමතරව සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛනයන් 54 ක් සමාලෝචනය කිරීම ද 2016 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ඉහත සඳහන් කරනු ලැබ ඇති ක්‍රියාකාර කම් වලට අමතරව ලංසු තැබීමේ ප්‍රලේඛනයන් සමාලෝචනයට භාජනය කිරීම සඳහා සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය තුළ පැන නැගෙන ගැටළු නිරාකරණය කිරීම සඳහා 2008 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද  සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛන සමාලෝචන කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස ද ප්‍රලේඛන අනු අංශය විසින් කටයුතු කරන ලදි. සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛන සමාලෝචන කමිටුව විසින් රැස්වීම් 21 ක් පවත්වන ලදි. තවද, ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් පවත්වනු ලබන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් වල ද ලේකම් කාර්යාලය ලෙස කටයුතු කරන ලද්දේ ප්‍රලේඛන අනු අංශය විසිනි.

**සැලැසුම් අත් පොත් යාවත්කාලීන කිරීමේ අනු අංශය**

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ සැලැසුම් අත් පොත් යාවත්කාලීන කිරීමේ අනු අංශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රියා පටිපාටි / සැලැසුම් අත් පොත් යාවත්කාලීන කිරීම හා පිළියෙල කිරීම යන කර්තව්‍යයන් භාරව කටයුතු කරයි. 2016 වර්ෂය තුළ දී අනු අංශය විසින් ක්‍රම සම්පාදන හා සැලැසුම් සමාලෝචන කමිටුවේ මග පෙන්වීම හා උපදෙස් යටතේ පහත සඳහන් වැඩ කටයුතු  ඉටු කරන ලදි.

■ ක්‍රම සම්පාදන හා සැලැසුම් සමාලෝචන කමිටුවේ නිරීක්ෂණ ද ඇතුලත් කොට පිළියෙල කරන ලද **P I** අත් පොත සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රලේඛන) ගේ සහ ප්‍රධාන ඉංජිනේරු (සැලැසුම් අත් පොත්) ගේ ද සහභාගිත්වය ඇතිව ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශක වරයා විසින් සමාලෝචනයට භාජනය කරන ලදි. පුළුල් ලෙස කරුණු ඇතුලත් වන සේ අත් පොත නැවත සකස් කරනු ලැබ ඇති අතර එය සංස්කරණය කිරීම සඳහා ක්‍රම සම්පාදන හා සැලැසුම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබනවා ඇත.

**D3** අත් පොතෙහි දෙවැනි කෙටුම් පත අත් පොත සම්බන්ධ ක්‍රම සම්පාදන හා සැලැසුම් සමාලෝචන කමිටුවේ නිරීක්ෂණ ඇතුලත් කරමින් සම්පූර්ණ කරනු ලැබ ඇත. එය ක්‍රම සම්පාදන හා සැලැසුම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබනවා ඇත. මෙම කර්තව්‍යය සම්පූර්ණ කිරීම සඳහා 2016 වර්ෂය තුළ දී **D3** අත් පොත සම්බන්ධ රැස්වීම් අටක් (දින 15 ක් තුළ) පවත්වන්නට යෙදුනි.

■ කවාකාර ටැංකි සඳහා වූ පෙරැදි කොන්ක්‍රීට් අත් පොත සමාලෝචනය කිරීම හා සවිස්තරාත්මක ව්‍යුහාත්මක ගණනය කිරීම් කොන්ත්‍රාත්කාර ඒබීඊ නිකෝ, ජේජීයූ අංශය හා ප්‍රධාන ඉංජිනේරු (අත් පොත්) ගේ සහභාගිත්වයෙන් සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇත. කෙසේ වුවද මෙම කාර්යය සම්පූර්ණ කිරීමට පෙර සැලැසුම් කටයුතු හා සම්බන්ධ සෙසු පාර්ශවයන් වෙතින් ද කරුණු විමසනු ලබනවා ඇත. මෙම අත් පොත පිළියෙල කරන ලද්දේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ සහාය යටතේ කොන්ත්‍රාත්කාර ඒබීඊ නිකෝ විසිනි.

**ප්‍රමාණ සමීක්ෂණ අනු අංශය.**

ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සිදු කරනු ලබන සියළුම සැලැසුම් කටයුතු වලට අදාල ප්‍රමාණ පත්‍රිකා පිළියෙල කිරීම ද, ඉංජිනේරු වරුන්ගේ ඇස්තමේන්තු පිළියෙල කිරීම ද,  ජල සම්පාදන හා මල අපවහන කටයුතු වලට අදාල අනුපාතික පොත පිළියෙල කිරීම ද, විචල්‍යතා අගැයීම් කිරීම ද, කාර්ය අයිතමන්ගේ මිළ නියම කිරීම සඳහා කාර්ය ප්‍රතිමානයන් පිළියෙල කිරීම පිණිස ජල සම්පාදන හා මල අපවහන කටයුතු අධ්‍යයනය කිරීම හා ව්‍යාපෘතීන් විසින් පිළියෙල කරනු ලබන ඉංජිනේරු වරුන්ගේ ඇස්තමේන්තු සමාලෝචනය කිරීම ද ප්‍රමාණ සමීක්ෂණ වැඩ කටයුතු වලට ඇතුලත් වේ.

2016 වසර තුළදී මෙම අනු අංශය විසින් ප්‍රමාණ පත්‍රයන් 188 ක් පිළියෙල කිරීම ද, දේශීයව අරමුදල් සපයන ලද කොන්ත්‍රාත්තු සඳහා ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තු 21 ක් පිළියෙල කිරීම හා ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තු 3 ක් පිළියෙල කිරීම ද, අඩ වශයෙන් ප්‍රතිකාරිත කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා සැලැසුම් කොට ඉදි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් එක් පිරිවැය යෝජනාවක් පිළියෙල කිරීම හා 2015 වර්ෂය සඳහා ජල සම්පාදනය වෙනුවෙන් වූ වාර්ෂික ගාස්තු ප්‍රමාණ පොත හා  මල අපවහනය සම්බන්ධයෙන් වූ ගාස්තු ප්‍රමාණ පොත පිළියෙල කිරීම ද සිදු කරන ලදි. ඊට අමතරව ඇතැම් ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රමාණ පත්‍ර හා ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා වැඩ බිම් වෙත යාම ද සිදු කරන ලදි. තවද ඇතැම් ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කරුවන් සමග මිළ ගණන් ප්‍රමන්ත්‍රණය කිරීමේ කටයුතු වලට ද අනු අංශය සම්බන්ධ විය.

# ක්‍රියාත්මක වන මළ අපවහන යෝජනා ක්‍රම.




| පලාත / සහාය සේවා මධ්‍යස්ථානය | යෝජනා ක්‍රම සංඛ්‍යාව |
|---|---|
| ● මධ්‍යම | 01 |
| ● නැගෙනහිර | 00 |
| ● උතුරු මැද | 00 |
| ● වයඹ | 00 |
| ● උතුරු | 00 |
| ● සබරගමුව | 00 |
| ● දකුණු | 01 |
| ● ඌව | 01 |
| ● බටහිර මධ්‍යම | 07 |
| ● බටහිර උතුර | 03 |
| ● බටහිර දකුණ | 01 |
| එකතුව | 14 |

කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මල අපවහන යෝජනා ක්‍රමය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම 13 ක් ද මීට ඇතුලත්ව ඇත.

# ක්‍රියාත්මක තත්ත්වයට පත් කරනු ලැබ ඇති ව්‍යාපෘතීන් හා වෙනත් මළ අපවහන ක්‍රියාකාරකම්.

**නව යෝජනා ක්‍රම ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම.**

2016 වර්ෂයේ මාර්තු මාසය තුළදී රුපියල් දස ලක්ෂ 220 ක පිරිවැයක් දරා ශ්‍රී පාද ස්ථානය සඳහා නව අපජල යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නංවන ලදී.

මහරගම පිළිකා ආයතනයේ අභ්‍යන්තර මල අපවහන පද්ධතිය රුපියල් දස ලක්ෂ 25.0 ක පිරිවැයක් දරමින් පුනරුත්ථාපනය කොට පිළිකා රෝහල වෙත භාර දෙන ලදී.

**ආයතන සංවර්ධන ක්‍රියාකාර කම්.**

**i.** ජා ඇල /වීකල කලාපීය කළමනාකරුගේ කාර්යාලය ස්ථාපිත කිරීම

ජා ඇල /වීකල මළ අපවහන යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු හා නඩත්තු කටයුතු වඩාත් ඉහල තලයකට ගෙන වීමේ පරමාර්ථයෙන් ජා ඇල /වීකල කලාපීය කළමනාකරණ කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. රද්දොලුව මළ අපවහන යෝජනා ක්‍රමය 2014 සැප්තැම්බර් මාසයේදී ජා ඇල /වීකල කලාපීය කළමනාකරු විසින් සිය භාරය යටතට ගන්නා ලද අතර බියගම අපනයන ප්‍රවර්ධන කලාපය 2016 ජනවාරි මාසයේදී ජා ඇල /වීකල කලාපීය කළමනාකරු විසින් සිය භාරය යටතට ගන්නා ලදී.

**ii.** විධායක හා විධායක නොවන ශ්‍රේණීන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් සොයිසා පුර නිල නිවාස ඉදි කිරීම.

විධායක ශ්‍රේණීන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් නිල නිවාස 4 ක් හා විධායක ශ්‍රේණීන්ට අයත් නොවන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් නිල නිවාස 4 ක් ද රුපියල් දස ලක්ෂ 62.1 ක පිරිවැයක් දරමින් රත්මලානේ සොයිසා පුරයේ ඉදි කොට නිම කරන ලදී. නිල නිවාස ගොඩ නැගීමේ 11 වැනි පියවර රුපියල් දස ලක්ෂ 62.0 පිරිවැයක් දරමින් සම්පූර්ණයෙන් නිම කරන ලදී.

**iii.**රද්දොලුගම ස්ථාන භාර නිලධාරි කාර්යාලය ඉදි කිරීම.

නව ස්ථාන භාර නිලධාරි කාර්යාලයක් ඉදි කිරීමේ කටයුතු 2016 වර්ෂය තුළදී රුපියල් දස ලක්ෂ 5.5 ක පිරිවැයක් දරමින් සම්පූර්ණයෙන් නිම කරන ලදී.

**iv.**මල අපවහන අංශය සඳහා ගුණාත්ම කළමනාකරණ ක්‍රමයක් සංවර්ධනය කිරීම.

2015.6.3 දින සිට ක්‍රියාත්මක වන පරිදි මළ අපවහන අංශය වෙත **ISO** 9001:2008 / **SLS ISO** 9001 සහතිකකරණය ප්‍රදානය කරනු ලැබ ඇත. ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන **(ISO)** 9000 සහතිකකරණය දිනා ගත හැකි වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ප්‍රථම පරිපාලන කාර්යාලය මල අපවහන අංශය වන අතර එමෙන්ම රට තුළ මල අපවහන ක්ෂේත්‍රය තුළ එවැනි සහතිකකරණයක් දිනා ගැනීමේ භාග්‍යය ලැබූ එකම සංවිධානය ද එය වන්නේය.

**මෙම සහතිකකරණයේ විෂය පථයට පහත සඳහන් කරුණු ඇතුලත් වේ :**

- **අපජල කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම.**
- **අපජල ව්‍යාපෘතීන් සංවිධානය කිරීම, ක්‍රම සම්පාදනය හා සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.**
- **අපජල පහසුකම් මෙහෙයවීම හා නඩත්තු කිරීම.**

**v.** “මළ අපවහන අංශයේ සමාජ ආරක්ෂණ සමිතිය” ස්ථාපිත කිරීම.

මළ අපවහන අංශය විසින් **ISO** 9001:2008 / **SLS ISO** 9001 සහතිකකරණය දිනා ගැනීමෙන් අනතුරුව “සමාජ වගකීම වෙනුවෙන් වැඩි දායකත්වයක් ලබා දීම” යන සංස්ථානික ගුණාත්ම අරමුණ සපුරා ලීමේ පරමාර්ථයෙන් සමාජ ආරක්ෂණ සමිතියක් ස්ථාපනය කරන ලදී. සමිතියේ මෙහෙවර වන්නේ “පරිසරය ආරක්ෂා කරමින් අපජලය පාලනය කරමු” යන්නයි.

අතිරේක සාමාන්‍යාධිකාරී (මළ අපවහන) මෙම සමිතියේ ප්‍රධාන උපදේශක වරයා වන්නේය.

**වෙනත් ඵලදායිතාව නංවා ලීමේ ක්‍රියාකාර කම්.**

**i.** ගාස්තු අය නොකරනු ලබන මළ අපවහන සම්බන්ධතාවයන් සොයා ගනිමින් ඒවා නීත්‍යානුකූල තත්ත්වයට පත් කිරීම

ගාස්තු අය නොකරනු ලබන මළ අපවහන සම්බන්ධතාවයන් සොයා ගැනීම සඳහා දෙහිවල - ගල්කිස්ස ප්‍රදේශය තුළ සමීක්ෂණයක් සිදු කරන ලද අතර ඒ අනුව එවැනි සම්බන්ධතාවයන් 693 ක් සොයා ගත හැකි විය. ආදායම් නැති වීම සම්බන්ධයෙන් වසර 1 - 2 දක්වා දඩ අය කර ගැනීම් ද සහිතව එම සම්බන්ධතාවයන් නීත්‍යානුකූල කිරීමේ පියවර දැනට ගනිමින් පවතී.

**ii.** අපජලය බැහැර කිරීම සම්බන්ධයෙන් දැනට පවත්නා ප්‍රාගුණ්‍ය සංග්‍රහය ක්‍රියාවට නැංවීම පිළිබඳව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

ගොඩනැගිලි ඉදි කිරීමේදී අපජලය බැහැර කිරීම සම්බන්ධයෙන් දැනට පවත්නා ප්‍රාගුණ්‍ය සංග්‍රහය ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කොට පැවැත්වීමට සැලසුම් කරන ලදී.

**මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාර කම්.**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ ද, මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ ද, ජා ඇල නගර සභා බල ප්‍රදේශ තුළ හා කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ ද ක්‍රියාත්මක වන මල අපවහන පද්ධතීන්ගේ මෙන්ම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ඇති ඇතැම් නිවාස යෝජනා ක්‍රමයන්ගේ මල අපවහන පද්ධතීන්ගේ ද මහ කොළඹ ප්‍රදේශයේ රාජ්‍ය ආයතනයන් කිහිපයක මල අපවහන පද්ධතීන්ගේ ද මෙහෙයුම් හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් මහ කොළඹ මල අපවහන අංශය වගකීම දරයි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන මල අපවහන සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 17035 ක් ක්‍රියාත්මක වේ.

ඒ අනුව, සොයිසා පුර, මත්තෙගොඩ, ජයවඩනගම, රද්දොලුගම, මද්දුමගෙවත්ත හා මොදරවිල යන නිවාස යෝජනා ක්‍රමයන් හා ජනාධිපති ලේකම් කාර්යාලය, කථා නායක නිල නිවාසය, පාර්ලිමේන්තුව (ජල සම්පාදනය හා මල අපවහනය), සෙත්සිරිපාය (ජල සම්පාදනය හා මල අපවහනය), ඉසුරු පාය (ජල සම්පාදනය හා මල අපවහනය) හා ජයවර්ධනපුර ආරෝග්‍ය ශාලාව ආදී රාජ්‍ය ආයතනයන්ගේ ද මල අපවහන පද්ධතීන් නඩත්තු කරනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසිනි.

මීට අමතර ලෙස කතරගම, හීක්කඩුව හා හන්තාන නිවාස යෝජනා ක්‍රමයන්ට අදාල මල අපවහන පද්ධතීන් ද නඩත්තු කරනු ලබන්නේ අදාල කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් යටතේ ඒ ඒ ප්‍රාදේශීය කළමනාකරුවන් විසිනි. තවද ආයෝජන මණ්ඩලයට අයත් කොග්ගල, බියගම හා සීතාවක වැනි කාර්මික උද්‍යානයන් වෙත ද කොන්ත්‍රාත් පදනම යටතේ නඩත්තු සේවාවන් සැපයීම කරනු ලැබේ.

## ක්‍රියාත්මක කරනු ලබමින් පවතින මළ අපවහන ව්‍යාපෘතීන්.

**නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන මල අපවහන ව්‍යාපෘතීන් විසින් අත් කර ගනු ලැබ ඇති සාර්ථකත්වයන්.**

**2016 වර්ෂය තුළදී විදේශීය අරමුදලින් ඉදි කෙරෙමින් පැවැති / වැඩි වර්ධනය කෙරෙමින් පැවැති ස්ථානයන් දැක්වෙන සිතියම.**




| ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ඒජන්සිය |
| --- | --- |
| 1. මහ කොළඹ අපජල කළමනාකරණ | ආසියානු සංවර්ධන බැංකුව |
| 2. රත්මලාන/මොරටුව හා ජා ඇල/ඒකල ප්‍රදේශයන් සඳහා අපජල බැහැර කිරීමේ පද්ධතීන් | ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය |
| 3. මහනුවර මහ නගර සභා අපජල කළමනාකරණය | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| 4. මහ කොළඹ ප්‍රදේශයේ ගෘහස්ත මල අපවහන සම්බන්ධතාවයන් හා ජාලයෙන් පිටත සනීපාරක්ෂණ විසඳුම් වැඩි කිරීම | ආසියානු සංවර්ධන බැංකුව |
| 5. විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවා | චීනය |
| 6. කතරගම අපජල බැහැර කිරීම් ව්‍යාපෘතිය | ඕස්ට්‍රියාව |
| 7. යාපනය මහ නගර සභා මල අපවහන ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව |

## විදේශීය අරමුදල් යටතේ වූ මළ අපවහන ව්‍යාපෘතීන්.

**ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.**

**1) මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය.**

2009 දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලද ණය ගිවිසුම් අංක 2558 – **SRI (SF)** යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සැලසුම් කරන ලද්දේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන දෙහිවල / ගල්කිස්ස හා කොලොන්නාව / මීතොටමුල්ල ප්‍රදේශයන් තුළ ඇති සමූහ ජල සම්පාදන හා මල අපවහන පද්ධතීන් වැඩි දියුණු කිරමේ පරමාර්ථය ඇතිවය.

සියළුම ඉදි කිරීම් කටයුතු තනි කොන්ත්‍රාත්තුවක් යටතේ සිදු කරගෙන යාම පිණිස ව්‍යාපෘතියේ විෂය පථය සකස් කරනු ලැබ ඇති අතර ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කරමින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදි. (2016 වර්ෂය තුළ දී කරන ලද ප්‍රති - වෙන් කිරීම ද ඇතුළුව) ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ආසියානු සංවර්ධන බැංකුවේ මුළු වෙන් කිරීම ඇමෙරිකානු ඩොලර් දස ලක්ෂ 9.43 ක් වූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රුපියල් දස ලක්ෂ 364 ක් විය. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 1,430 ක් විය (2016 දෙසැම්බර් 30 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතය ඇමෙරිකානු ඩොලර් 1 ශ්‍රී ලංකා රුපියල් 151.66 ක් වීම අනුව).



ව්‍යාපෘතියේ ආරම්භක දිනය 2014 සැප්තැම්බර් 16 වශයෙන් නියම කරනු ලැබ තිබී අතර අවසන් කිරීමේ දිනය 2016 අගෝස්තු 16 වශයෙන් නියම කර තිබිණි. ඉදි කිරීම් කටයුතු නිම කිරීම සඳහා කොන්ත්‍රාත් කරු විසින් කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා සිටීම අනුව 2017 මාර්තු 31 වැනි දින දක්වා කාලය දීර්ඝ කිරීමක් ලබා දෙන ලදි.

ව්‍යාපෘතියේ විෂය පථය සැලසුම් කරන ලද්දේ සියළුම ඉදි කිරීම් කටයුතු සිදු කළ යුත්තේ මෙහෙයුම් ක්‍රියාකාර කම් වලට කිසිදු බාධාවක් සිදු නොවන අයුරින් ඒ ඒ පොම්පාගාරයන්හි ක්‍රියාත්මක තත්ත්වන් එලෙසම තිබියදීය යන පදනම මත පිහිටා වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුයාත ව්‍යුහයන් සහිත පොම්පාගාර ගොඩනැගිලි වල, පරිශ්‍රයේ නල මාර්ග වල හා භූමි අලංකරණ කටයුතු වල ද සම්පූර්ණ ව්‍යුහාත්මක නව්‍යකරණයන් සහිතව සියළුම පොම්ප කිරීමේ ස්ථානයන් පරිවර්තනයකට භාජනය විය. කොලොන්නාව කලාපයේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ මෙහෙයුම් කටයුතු වල නිරත වන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ඉඩ කඩ සලස්වා දීම සඳහා එක් පොම්ප කිරීමේ ස්ථානයක් තුළ (**KP** 3 වැඩ බිම) මෙහෙයුම් කටයුතු සඳහා නව ගොඩනැගිල්ලක් දැනට ඉදි කරනු ලබමින් පවතී. තිබෙන යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ වෙනුවට නව උපකරණ යෙදීම විෂය පථය තුළ ඇති ප්‍රධාන හා ඉතාම වැදගත් කොටසක් වූ අතර, එය පොම්ප කිරීමේ ස්ථානයන් 5 ක් තුළ සාර්ථක ලෙස ඉටු කරනු ලැබ ඇත. සියළුම පොම්ප කිරීමේ ස්ථානයන් තුළ සිදු කෙරෙන ක්‍රියාකාර කම් අඛණ්ඩව පසු විපරම් කිරීමට හැකි වනු පිණිස එම ස්ථානයන් අධීක්ෂණමය පාලනය හා දත්ත ලබා ගැනීම **(SCADA)** උපකරණ සැපයුම සමග සම්බන්ධීකරණය කරනු ලැබ ඇත.

පොම්ප කිරීමේ ස්ථානයන් බාධාවකින් තොරව ක්‍රියාත්මක තත්ත්වයට පත් කරමින් පල්දෝරු හා අපජල තුළු ගැලීම් කළමනාකරණය කිරීමේ හැකියාව ඇති කිරීම සඳහා අළුතින් ආනයනය කරන ලද පොම්ප, පොම්ප කිරීමේ ස්ථානයන් 5 ක් තුළ ස්ථාපනය කරන ලදි. ඒ අනුව, පැරණි පොම්ප ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන වසර ගණනාවක් මුළුල්ලේ පැවැති පොම්ප කිරීමේ ස්ථානයන් පිටාර ගැලීමට හා ජලයෙන් යට වීමට ගොදුරු වීමේ අවදානම අවසන් කරමින් සාමාන්‍ය මෙහෙයුම් මට්ටම් පවත්වාගෙන යාමේ ගැටළුව විසඳනු ලැබ ඇත.

"නිෂ්පාදනය කරන ලද රට මත පදනම් වෙමින් ප්‍රධාන පොම්ප පිළිගත හැකි බව" සම්බන්ධයෙන් ආරාවුලක් පැන නැගුන අතර එය තීරකකරණයට යොමු කරන ලදි. විනිශ්චය කිරීමේ ක්‍රියාවලිය නිම කිරීමෙන් අනතුරුව කොන්ත්‍රාත් කරුගේ වාසියට තීරණයක් දෙන ලදි.

සෑම පොම්ප කිරීමේ ස්ථානයකම චූෂණ නල වල ප්‍රමාණය ඉහල නැංවීම හා **MLP** 2 වැඩ බිම වෙනුවෙන් නව සැලසුමක් අනුව වහලක් තැනීම වැනි ඇතැම් ඉතාමත්ම අත්‍යවශ්‍ය කොන්ත්‍රාත්තු විචලනයන්ට අමතර ලෙස මුල් විෂය පථය මත 2016 දෙසැම්බර් මස අවසානයට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 90 % ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 65 % තත්ත්වයේ පවතී.

## ස්වීඩන් සහයෝගිතාවය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.

**2). රත්මලාන/මොරටුව හා ජා ඇල/ඒකල ප්‍රදේශයන් වෙනුවෙන් වන අපජල බැහැර කිරීමේ පද්ධතීන්.**

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන මිනිසුන්ට හා එහි පරිසරයට සිදු විය හැකි හානිකර බල පෑම් වලක්වා ලීම සඳහා, කාර්මික, ගෘහස්ත හා වාණිජ අපජලය එක් රැස් කොට ඒවා ප්‍රතිකාරිත කර යෝග්‍ය ආකාරයකට එම ප්‍රතිකාරිත ජලය ජලාශයන් වෙත බැහැර කිරීම සඳහා වන්නේය. මෙම ව්‍යාපෘතිය සමන්විත වන්නේ රත්මලාන /මොරටුව දිනකට ඝණ මීටර 17000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙන් ද, පොම්ප කිරීමේ ස්ථානයන් 04 කින් ද, මිලි මීටර 1100 ක විෂ්කම්භයකින් හා මීටර 600 ක දිග ප්‍රමාණයකින් ද යුත් මුහුද කරා දිවෙන නල මාර්ග යකින් ද, කිලෝ මීටර් 23.7 ක දිග ප්‍රමාණයකින් යුත් ගුරුත්ව පල්දෝරු නල මාර්ගයන්ගෙන් ද, කිලෝ මීටර 10.6 ක දිග ප්‍රමාණයකින් යුත් ආරෝහක පල්දෝරු නල මාර්ගයන්ගෙන් හා කිලෝ මීටර 7.7 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන පීඩන නල මාර්ගයකින් ද වේ.

ජා ඇල ඒකල ප්‍රදේශයේ ප්‍රධාන අංගයන් වන්නේ දිනකට ඝණ මීටර 7250 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, පොම්ප කිරීමේ ස්ථානයන් 03 ක් ද, මීටර 700 ක දිග ප්‍රමාණයකින් යුත් දඩුගම් ඔය කරා දිවෙන නල මාර්ගයක් ද, මීටර 2225 ක දිගින් යුත් නල මාර්ග ජාලය ද, කිලෝ මීටර් 7.9 ක දිග ප්‍රමාණයකින් යුත් ගුරුත්ව පල්දෝරු නල මාර්ගයන් ද, කිලෝ මීටර 2.60 ක දිග ප්‍රමාණයකින් යුත් ආරෝහක පල්දෝරු නල මාර්ගයන් හා කිලෝ මීටර 5.5 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන පීඩන නල මාර්ගය ද වේ. 2013 නොවැම්බර් මාසයේදී වැඩ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හේතු කොට ගෙන ව්‍යාපෘතිය හා ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අවහිරයට ලක් විය. තත්ත්වයන්ගේ සිදු වූ මෙම විපර්යාසය නිසා ජාත්‍යන්තර අධීක්ෂණ ඉංජිනේරු වරයා නොමැති වූ හෙයින් ඇති වූ ව්‍යාකූල තත්ත්වය යටතේ අමතර වගකීම් දරමින්, සිටින කාර්ය මණ්ඩලය යොදා ගනිමින් සිය භූමිකාව වෙනස් කිරීමට ව්‍යාපෘති මන්ත්‍ර ඒකකයට **(PMU)** සිදු විය. කෙසේ වුව ද අත්‍යවශ්‍ය ලෙස සලකන ලද වැඩ කටයුතු දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ව්‍යාපෘතිය 96 % සම්පූර්ණ කරනු ලැබ ඇති බවට දැනට සලකනු ලැබේ. දැනට කර්මාන්ත 121 ක් පද්ධතිය හා සම්බන්ධ කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කරන්නට යෙදුන ජා ඇල /ඒකල

කොටසේ මෙහෙයුම් කටයුතු දැනට මහ කොළඹ මල අපවහන වැඩ පිළිවෙල යටතේ ක්‍රියාත්මක වන අතර එය තිරසාර භාවය සාක්ෂාත් කරගනු ලැබ ඇත. හිඩැස පිරවීමේ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වීමෙන් අනතුරුව රත්මලාන /මොරටුව කොටස ද මෙහෙයුම් අංශයෙන් තිරසාර භාවයට පත් වනු ඇත. සම්පූර්ණ කිරීමත් සමග 2016 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය 90.3 % ක් වූ අතර 2016 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 100 % ක් විය.

2016 පෙබරවාරි මාසය වන විට රත්මලාන /මොරටුව ප්‍රදේශය ඇතුලත් කොටස 100 % ක් සම්පූර්ණ කරනු ලැබිණි. දැනට කර්මාන්ත හා ආයතන සම්බන්ධතාවයන් 185 ක් ද, ගෘහස්ත සම්බන්ධතාවයන් 2835 ක් ද පද්ධතිය හා සම්බන්ධ කරනු ලැබ තිබේ.

2012 පෙබරවාරි මාසය වන විට ජා ඇල /ඒකල ප්‍රදේශය ඇතුලත් කොටස 100 % ක් සම්පූර්ණ කරනු ලැබිණි. මෙම යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු දැනට සිදු කරනු ලබන්නේ මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් වන අතර ඒ මගින් කර්මාන්ත 99 කට ද, වාණිජ ආයතන හා වෙනත් ආයතන 27 කට ද, ගෘහස්ත පාරිභෝගිකයින් 1340 ක් වෙත හා ගුවන් හමුදා කඳවුරු 1 කට ද සේවය සපයනු ලැබේ.

**3. මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය.**



**4 වැනි පැකේජය සමාරම්භක අවස්ථාව**

මහනුවර මහ නගරය තුළ සිදු වන කිසිදු වග විභාගයක් නොමැති අපජල බැහැර කිරීමේ හේතුවෙන් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයන් වෙත ජලය සපයනු ලබන ප්‍රධාන ප්‍රභවයන් වූ නුවර වැව, මැද ඇල හා මහවැලි ගඟ දූෂණයට ලක් වෙයි. මෙම ගැටළුවට ස්ථිරසාර විසඳුමක් සොයා ගැනීම සඳහා මහනුවර මහ නගරය වෙනුවෙන් අපජල බැහැර කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් යෝජනා කරන ලදි. යෝජිත ව්‍යාපෘතිය මගින් අදහස් කරන ලද්දේ නගරය තුළ හෙක්ටෙයාර 732 ක භූමි ප්‍රදේශයක අපජලය රැස් කොට, ඉන් පසු එය කිලෝ මීටර 92 ක් දිගින් යුත් නල මාර්ග ජාලයක් ඔස්සේ දිනකට ඝණ මීටර 14000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වෙත යැවීමට වේ.

මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂිතය. ආසන්න වශයෙන් 55000 ක පදිංචි ජන ගහණයක් හා 150000 ක සංක්‍රමණික ජන ගහණයක් මෙම ව්‍යාපෘති හරහා ප්‍රතිලාභ ලබනු ඇත.

ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් පහත දැක්වෙන අපවාහ බැහැර කිරීම් සම්මතයන්ට අනුකූල වන පරිදි ප්‍රතිකාර කරන ලද අපජලය නැවතත් පරිසරය වෙත මුදා හැරීම සහතික කරනු ලබනවා ඇත : ජෛව විද්‍යාත්මක අම්ලකර ඉල්ලුම (දින 5 ක දී 20.0 **C** බැගින්) ලීටරයකට මිලි ග්‍රෑම් 20 කට අඩුවෙන් තිබිය යුතු වීම, මුළු අවලම්බිත ඝණ ද්‍රව්‍යයන් ලීටරයකට මිලි ග්‍රෑම් 20 කට අඩුවෙන් තිබිය යුතු වීම, රසායනික අම්ලකර ඉල්ලුම ලීටරයකට මිලි ග්‍රෑම් 250 කට අඩුවෙන් තිබිය යුතු වීම හා මුළු ජීවාන්තක ප්‍රමාණය ලීටරයකට මිලි ග්‍රෑම් 10 කට අඩුවෙන් හා ෆෙකල් කොලිෆෝම් (මිලි ලීටර 100 ක තිබීමට බෙහෙවින් ඉඩ කඩ ඇති සංඛ්‍යාව) මධ්‍යම පරිසර අධිකාරියේ මග පෙන්වීම් අනුව 40 කට අඩුවෙන් තිබිය යුතු වීම ද එකී සම්මතයන් වේ.

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 22,588 කි. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ ණය අරමුදල් දායකත්වය වන ජපන් යෙන් දස ලක්ෂ 14,087 හා රජයේ ඒකාබද්ධ අරමුදලේ දායකත්වය වන රුපියල් දස ලක්ෂ 4060 ද බදු, තීරු බදු, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු ගෙවීම් හා ඉඩම් අත් පත් කර ගැනීමේ පිරිවැය දැරීම සඳහා ද වෙන් කරනු ලැබ ඇත.

මෙම ව්‍යාපෘතිය පැකේජ 4 කින් සමන්විත වන අතර පැකේජයන්ට අදාල සියළුම කොන්ත්‍රාත්තු ප්‍රදානය කරනු ලැබ ඇත. පැකේජ 4 ම සම්බන්ධ කොන්ත්‍රාත්තු දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී. දේපල සම්බන්ධතා සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී සිදු වූ ප්‍රමාදය නිසා ව්‍යාපෘතිය ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීම මත අහිතකර බල පෑම් ඇති වීමේ හැකියාව තිබේ.

**පැකේජ අංක 1 (අප ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ප්‍රධාන පොම්ප කිරීමේ ස්ථානයට අනුබද්ධ ප්‍රතිකාරිත අපවාහ බැහැර කිරීමේ පද්ධතිය හා ගොහොදු මඩ වියලීමේ තට්ටු සැලසුම් කිරීම හා ඉදි කිරීම).**

පැකේජ අංක 1 ට අදාල සැලසුම් වැඩ කටයුතු 2015 මාර්තු 03 වැනි දින ආරම්භ කරන ලදි. ඉදි කිරීම් වැඩ කටයුතු 2016 පෙබරවාරි 19 වැනි දින ආරම්භ කරන ලදි. අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අනුබද්ධ ඔක්සිකරණ අගල් 4 ක් ඉදි කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර නිල නිවාස ඉදි කිරීමේ කටයුතු ද දැනට ආරම්භ කරනු ලැබ ඇත.

**පැකේජ අංක 2 (ප්‍රධාන පල් දෝරු නල මාර්ග, ශාඛා පල් දෝරු නල මාර්ග හා සේවා සම්බන්ධතාවයන් හා මනු බිල් පොම්ප කිරීමේ ස්ථානයන් සැලසුම් කොට ඉදි කිරීම හා මෙහෙයුම් හා නඩත්තු උපකරණ සැපයීම).**

2 වැනි පැකේජයට අදාල ඉදි කිරීම් වැඩ කටයුතු 2015 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද අතර දැනට එම වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. මනු බිල්, සේවා නල මාර්ගයන් හා IC සමග කිලෝ මීටර 46 ක දිග ප්‍රමාණයකින් යුත් පල් දෝරු නල මාර්ග එලනු ලැබ ඇති අතර ඇතැම් නල මාර්ගයන් වෙනුවෙන් ආලෝක හා දර්පන සහ වායු පරීක්ෂණ වැනි අවශ්‍ය පරීක්ෂණයන් ද සිදු කරනු ලැබ ඇත.

**පැකේජ අංක 3 (දේපල සම්බන්ධතාවයන් සැලසුම් කොට ඉදි කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම).**

මෙම කොන්ත්‍රාත්තුව දේපල සම්බන්ධතාවයන් 9205 ක සංඛ්‍යාවක් ආවරණය කරයි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද්දේ 2016 ජුනි 21 වැනි දින ය. කොන්ත්‍රාත්තුවට අදාල වැඩ කටයුතු 2016 ජූලි 05 වැනි දින ආරම්භ කරන ලදි. තල මිණුම් හා කොන්දේසි මිණුම් දැනට සිදු කෙරෙමින් පවතී. තෝරාගත් දේපල සඳහා සවිස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම දැනට සිදු කෙරෙමින් පවතින අතර ඉදි කිරීම් කටයුතු ඉදිරියේදී ආරම්භ කරනු ලබනවා ඇත.

**පැකේජ අංක 4 (තෝරා ගනු ලැබූ අඩු ආදායම් ප්‍රදේශයන් තුළ පොදු සනීපාරක්ෂණ පහසු කම් ඉදි කිරීම, පරීක්ෂණයට භාජනය කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම)**

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ වැසිකිලි 138 කින් හා ස්නානය කිරීමේ ස්ථාන 02 කින් සමන්විත වැසිකිලි ගොඩනැගිලි 14 ක සංඛ්‍යාවක් ඉදි කිරීම හා පුනරුත්ථාපනය කිරීම කොන්ත්‍රාත්තුවට ඇතුලත් විය. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද්දේ 2016 ජනවාරි 19 වැනි දින වන අතර කොන්ත්‍රාත්තු වැඩ කටයුතු 2016 පෙබරවාරි 03 වැනි දින ආරම්භ කරන ලදි. ස්ථාන 8 ක වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

**පෞද්ගලික වැසිකිලි වැඩ සටහන.**

මෙම වැඩ සටහන යටතේ තනි වැසිකිලි 512 ක් ඉදි කරනු ලැබීමට නියමිත වේ. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රජා මූල සංවිධාන මාර්ගයෙන් ය. දැනටමත් ප්‍රජා මූල සංවිධානයන් 03 ක සංඛ්‍යාවක් සංවිධානය කරනු ලැබ ඇති අතර ඒවායේ සාමාජිකයින්

මුදල් පරිහරණය කිරීම සහ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් දැනට සිදු කරගෙන යනු ලැබේ.

දැනට බල පවත්නා පස් ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍ර ක්‍රමය හේතු කොට ගෙන කොන්ත්‍රාත් කරුවෝ තමන්ගේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සිටිති.

**4) මහ කොළඹ ප්‍රදේශය තුළ මල අපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම සඳහා වූ ප්‍රතිඵල මත පදනම් වූ ආධාර සම්බන්ධ ගෝලීය හවුල (GPOBA - ලෝක බැංකුව) ව්‍යාපෘතිය.**

- මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය වන්නේ මහ කොළඹ ප්‍රදේශය තුළ ගෘහස්ත මල අපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම හා ප්‍රදේශය තුළ ඇති අඩු ආදායම් ලාභී නිවෙස් වෙත ජාලයෙන් පිටස්තර සනීපාරක්ෂණ විසඳුම් ලබා දීමයි.
- සෝමානන්ද මාවතෙහි පරිශ්‍ර තුළ සම්බන්ධතාවයන් 100 ක් ද ඇතුළුව සෘජු මල අපවහන සම්බන්ධතාවයන් 1234 ක් දෙහිවල ගල්කිස්ස, ජා ඇල /ඒකල, රත්මලාන / මොරටුව හා කොලොන්නාව ප්‍රදේශයන් වෙත සපයා දීම මගින් එකී අනු ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරන ලද්දේය. විමධ්‍යගත අපජල ප්‍රතිකාර කිරීම් හා බැහැර කිරීම් ක්‍රමය **(DEWTS)** දියවරපුර පිහිටි ධීවර නිවාස 64 ක් සම්බන්ධයෙන් සාර්ථක ලෙස ක්‍රියාත්මක තත්ත්වයට පත් කර අඩු පාඩු සඳහා වග කිව යුතු කාල සීමාව නිම කරන ලද්දේය.
- බඩෝවිට පොම්ප කිරීමේ ස්ථානයන් තුනක් ඉදි කොට ක්‍රියාත්මක තත්ත්වයට පත් කරන ලද අතර පරිශ්‍රය ඇතුලත පල්දොරු කාණු සහිතව මල අපවහන සම්බන්ධතාවයන් 1500 ක් නිම කරන ලදි.
- දැනට ක්‍රියාත්මක වන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම හා මල අපවහන සම්බන්ධතාවයන් 328 ක් සැපයීම මගින් රත්මලාන සුනාමි නිවාස යෝජනා ක්‍රමයේ උප ව්‍යාපෘතිය හා සම්බන්ධ විමධ්‍යගත අපජල ප්‍රතිකාර කිරීම් හා බැහැර කිරීම් ක්‍රමය නිම කරන ලදි.
- දෙහිවල ගල්කිස්ස, මොරටුව, කොලොන්නාව හා ජා ඇල ඒකල ප්‍රදේශයන්හි සරල හා සාම්ප්‍රදායික දීර්ඝ කිරීම් උප ව්‍යාපෘතිය තුළ කිලෝ මීටර 7.9 ක දිගින් යුත් ගුරුත්ව පල් දෝරු දීර්ඝ කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒ මගින් සම්බන්ධතාවයන් 1475 ක් ආවරණය කරනු ලබනවා ඇත. එහි භෞතික ප්‍රගතිය 58.4 % ක් වේ.
- ගෘහස්තයන් 3785 ක් ආවරණය කරනු ලබන වැඩ බිම තුළ සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ආරම්භ කරන ලද අතර එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 7 % ක් වේ.
- ලුනාව සමුද්‍ර ශක්ති නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් වූ විමධ්‍යගත අපජල ප්‍රතිකාරක පද්ධතියේ ඉදි කිරීම් වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර ඒ මගින් පවුල් 160 කට සෙත සැලසෙනු ඇත. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 19.2 කි.
- ව්‍යාපෘති ප්‍රදේශයන් තුළ දැනුවත් කිරීමේ වැඩ සටහන් හා රැස්වීම් පවත්වන ලද අතර ඊට අමතරව පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම් හා නිවේදනය කිරීම් ද සිදු කරන ලදි. එළදායි තාවය නංවා ලීමේ පියවරක් වශයෙන් ව්‍යාපෘතිය තුළ එස් 5 වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි. කොන්ත්‍රාත් කරුවන් කියා සිටින පරිදි මල අපවහන වැඩ කටයුතු සඳහා මිනිස් බලය සොයා ගැනීම දුෂ්කර කටයුත්තක් වී ඇති අතර මේ හේතුව නිසා ඇතැම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇත.

**5. විසල් කුරුණෑගල ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතිය.**

- ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2014 පෙබරවාරි මාසයේදී වන අතර ජල සම්පාදනය හා මල අපවහනය යන අංගයන් දෙකින්ම මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. ඉදි කිරීම් කටයුතු 2015 ජනවාරි මාසයේදී ආරම්භ වූ අතර 2016 වර්ෂයේ අවසානය වන විට එම වැඩ කටයුතු සිදු වෙමින් පැවැතිනි.
- කිලෝ මීටර 8.5 ක දිග ප්‍රමාණයකින් යුත් අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගයක් ද සහිත අමු ජල තුළු මුව, දිනකට ජලය ඝණ මීටර 5000 ක ධාරිතාවයකින් යුත් අළුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දිනකට ජලය ඝණ මීටර 9000 ක ධාරිතාවයක් ඇති වන සේ පුනරුත්ථාපනය කිරීම, වැහැර ඉදි කරනු ලබන බිම් ජලාශය, ඔසොවි ජලාශය, කිලෝ මීටර 7.5 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රතිකාරිත ජලය සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ගයක් සැපැයීම හා එලීම සහ පානීය ජලය සැපැයීම සඳහා කිලෝ මීටර් 110 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ නල මාර්ග ජාලය යන අංගයන්ගෙන් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ.
- ව්‍යාපෘතියේ මළ අපවහන කොටසට ඇතුලත් වන්නේ දිනකට ඝණ මීටර 4500 ක ධාරිතාවයකින් යුක්ත වූ මල අපවහන යන්ත්‍රාගාරයක්, කිලෝ මීටර 134 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ගුරුත්ව පල් දෝරු නල මාර්ගයක්, කිලෝ මීටර 4.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්‍රධාන පීඩන නල මාර්ගයක්, පොම්ප කිරීමේ ස්ථාන 6 ක් හා නිවාස සම්බන්ධතා 3500 ක් යන අංගයන් වේ. මීට අමතරව කුරුණෑගල නගරය තුළ හා ඒ අවට ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ප්‍රමාණවත් සනීපාරක්ෂණ පහසු කම් සපයා දීම සඳහා කුරුණෑගල ශික්ෂණ රෝ හලේ මල අපවහන නල පද්ධතිය අළුත්වැඩියා කොට පුනරුත්ථාපනය කිරීම ද ව්‍යාපෘතියේ මල අපවහන කොටසට ඇතුලත් වේ.
- චීනයේ නිර්යාත ආයාත බැංකුව විසින් හා ශ්‍රී ලංකා රජය විසින් පිළිවෙලින් ඇමෙරිකානු ඩොලර් දස ලක්‍ෂ 77.30 ක් හා ශ්‍රී ලංකා රුපියල් දස ලක්‍ෂ 3,200.00 ක් වශයෙන් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර දීම සිදු කරන ලදි.
- 2016 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය විසින් 73.04 % ක භෞතික ප්‍රගතියක් හා 60.27 % ක මූල්‍ය ප්‍රගතියක් ද සාක්‍ෂාත් කර ගෙන තිබිණි. විදේශීය හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් වැය කරන ලද්දේ පිළිවෙලින් ඇමෙරිකානු ඩොලර් දස ලක්‍ෂ 48.89 (67%) ක් හා රුපියල් දස ලක්‍ෂ 1,209.87 (38%) ක් වශයෙන් වේ.

ජල සම්පාදන කොටසේ විෂය පථය සම්බන්ධයෙන් ගත් කල්හී තුළු මුව හා පොම්පාගාරයේ ඉදි කිරීම් කටයුතු වලින් 50 % ක් ද, ප්‍රධාන අමු ජල නල මාර්ගයේ කිලෝ මීටර් 7.5 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග එලීම ද, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමට අදාල වැඩ කටයුතු වලින් 70 % ක් හා ඔසොවි ටැංකියට අදාල වැඩ කටයුතු වලින් 90 % ක ප්‍රමාණයක් ද නිම කරනු ලැබ ඇත. යාන්ත්‍රික හා විදුලි උපකරණ බොහෝ ප්‍රමාණයක් වැඩ බිම වෙත ළඟා වී ඇති අතර ඒවා ස්ථාපනය කිරීමේ වැඩ කටයුතු දැනට ආරම්භ කරනු ලැබ ඇත. ජලය බෙදා හැරීමේ නල මාර්ග ජාලයේ කිලෝ මීටර 84 ක දිග ප්‍රමාණයක නල එලීමේ කටයුතු නිම කරනු ලැබ ඇත.

ව්‍යාපෘතියේ මළ අපවහන කොටසට අදාල ව්‍යුහාත්මක වැඩ කටයුතු අතුරින් මල අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ මුර කාමරය හැර අනිකුත් කටයුතු නිම කරනු ලැබ ඇත. කට්ටි වැඩ, කපරාරු කිරීම හා හිඩැස් පිරවීම වැනි නිමා කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. යාන්ත්‍රික හා විදුලි උපකරණ අතුරින් බොහෝ ප්‍රමාණයක් වැඩ බිම වෙත ළඟා වී ඇති අතර ඒවා ස්ථාපනය කිරීම දැනට ආරම්භ කරනු ලැබ ඇත. මල අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල සියළු වැඩ කටයුතු වලින් 64 % ක ප්‍රමාණයක් සම්පූර්ණ කරනු ලැබ ඇත. මල අපවහන රැස් කිරීම් ජාලය තුළ අන්තර් බාධක කුටි 245 ක් ඉදි කිරීම ඇතුළු කිලෝ මීටර 57.6 ක දිග ප්‍රමාණයකින් යුත් මල අපවහන නල මාර්ග එලීමේ වැඩ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2016 වර්ෂය තුළ දී විසල් කුරුණෑගල ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතිය විසින් අපජල කළමනාකරණ ක්‍රම සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලද අතර ඒවායේ අවධානය විශේෂයෙන්ම යොමු කරන ලද්දේ ගෘහස්ත මල අපවහන සම්බන්ධතාවයන් වෙතය. තාක්‍ෂණික හා තාක්‍ෂණික නොවන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් 2016 වර්ෂය තුළ දී දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

## ඕස්ට්‍රියන් ආධාර සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය.

**6). කතරගම අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය විසින් මැණික් ගඟ හා ඒ අවට පරිසරය තව දුරටත් දූෂණය වීම වැලැක්වීමේ පරමාර්ථයෙන් නගර සීමාව වටා පිහිටි වන්දනා කරුවන්ගේ නවාතැන් පොලවල්, හෝටල්, සාප්පු, ගෘහස්ත ඒකක හා කාර්යාල ආදිය වෙත පල් දෝරු නල මාර්ග පහසුකම් සම්පාදනය කර දීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබ ඇත. පල් දෝරු නල මාර්ග ජාලය විස්තාරණය කිරීම මගින් දැනට ක්‍රියාත්මක වන පද්ධතිය ඉහල ශ්‍රේණිගත කිරීම හා මළ අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය තුළ අන්තර්ගත වේ. යාන්ත්‍රික වාතකයන් ස්ථාපනය කිරීම මගින් දැනට ක්‍රියාත්මක වන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ඝණ මීටර 750 ධාරිතාවයේ සිට දිනකට ඝණ මීටර 3000 ක ධාරිතාවයකට ඉහල නැංවෙනු ලබන අතර ඒ හරහා කතරගම වෙත වන්දනාව සඳහා පැමිණෙන අති විශාල ජන ගහණයක් වෙත සේවය සැලැසීමේ හැකියාව උදා වනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයනු ලබන්නේ යුනි ක්‍රෙඩිට් බෑන්ක් ඕස්ට්‍රියා ඒජී ආයතනය විසිනි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 2,040 ක් වේ.

අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා රැස් කිරීමේ නල ජාලය සැලසුම් කිරීම, යාන්ත්‍රික සවි කිරීම් හා යටි ගං පරිණත පොකුණ සමග දිනකට ඝණ මීටර 3000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, කිලෝ මීටර 16 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ රැස් කිරීමේ නල මාර්ග ජාලය එලීම හා පොම්පාගාර 7 ක් ඉදි කිරීම ද, ඒවායේ පොම්ප ස්ථාපිත කිරීම ද මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේය.

ව්‍යාපෘතියේ කාලය මූලික වශයෙන් නියම කරනු ලැබ තිබුනේ 2014 අගෝස්තු මාසයේ සිට 2016 අගෝස්තු මාසය දක්වා විය. එහෙත් පසුව ලැබුන දීර්ඝ කිරීම් නිසා ව්‍යාපෘතිය නිම කිරීමේ නව ඉලක්ක දිනය 2017 ජූනි 30 වේ (03 න් මසක මෙහෙයුම් කාලයක් ද සහිතව).

ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2014 අගෝස්තු මාසයේ ආරම්භ කරන ලදි. එහි වැඩ කටයුතු අවසන් කරනු ලැබීමට අපේක්ෂිත දිනය වන්නේ 2016 අගෝස්තු මාසයයි. ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 15000 ක් වේ. 2016 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 74 % ක් හා 72 % ක් විය.

කතරගම නගරයේ පවත්නා සමාජ හා සංස්කෘතික ස්වභාවය හේතු කොට ගෙන නගරයේ මධ්‍ය ප්‍රදේශය තුළ වර්ෂයේ ඕනෑම කාලයක් තුළ ඉදි කිරීම් කටයුතු කරගෙන යාම දුෂ්කර හෙයින් ප්‍රගතිය වර්ධනය කර ගැනීම සඳහා රාත්‍රී කාලයන් තුළ දී හා සති අන්තයන් තුළ දී ඉදි කිරීම් කටයුතු කරන ලෙස කොන්ත්‍රාත් කරු වෙත උපදෙස් ලබා දී ඇත.

## ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලැබ ඇති කුඩා හා මධ්‍ය පරිමාණ මළ අපවහන ව්‍යාපෘතීන්.

### බස්නාහිර පලාත.

**(අ) බත්තරමුල්ල අකුරෙගොඩ පිහිටි ආරක්ෂක මූලස්ථානය වෙනුවෙන් අපජල බැහැර කිරීමේ පද්ධතියක් ඉදි කිරීම.**

තුළු මුව පොම්ප කිරීමේ ස්ථානයකින් ද, සුන් බුන් හා රළු ද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසු කමකින් ද, වාතනය කිරීමේ ටැංකියකින් ද, අවසාදනය වීමේ ටැංකියකින් ද, ගොහොදු පොම්ප කිරීමේ ස්ථානයකින් ද, ගොහොදු ඝණීභවනය කිරීමේ පහසු කමකින් ද, ගොහොදු වියලීමේ තට්ටු වලින් ද, කොම්පෝස්ට් පෙරණයකින් ද, පරිණත කිරීමේ පොකුණු වලින් ද, විශාලනය වීමේ කුටියකින් ද සමන්විත වූ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, කාර්යාල ගොඩනැගිල්ලක් හා පාලන කුටියක් ඉදි කිරීම හා විද්‍යුත් යාන්ත්‍රික සවි කිරීම් ද යන අංගයන්ගෙන් අදාල කටයුතු සමන්විත වේ.

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 437 ක් වන අතර 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 69.85 % ක් හා 17.34 % ක් විය.

**(ආ) කොලොන්නාවේ අපජල රැස් කිරීම හා සම්ප්‍රේෂණය ඉහල ශ්‍රේණිගත කිරීම.**

මෙයට අදාල වැඩ කටයුතු වලට කොන්ක්‍රීට් මනු බිල් 08 කින් සමන්විත මීටර 458 ක දිග ප්‍රමාණයකින් හා මිලි මීටර 315 ක විෂ්කම්භයකින් යුක්ත වූ ඉහල ඝණත්වයේ පොලි එතිලින් පල් දෝරු නල මාර්ගයක් සපයා පුවක්ගස්වත්ත හන්දියේ සිට කේපී 2 පොම්ප කිරීමේ ස්ථානය දක්වා එලීම ද, කොන්ක්‍රීට් මනු බිල් 04 කින් සමන්විතව ඇල හරස් මාරුවක් ද සහිතව මීටර 40 ක දිගින් හා මිලි මීටර 250 ක විෂ්කම්භයකින් යුක්ත වූ ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල මාර්ගයක් සාලමුල්ල නිවාස යෝජනා ක්‍රමයේ සිට කේපී 1 පොම්ප කිරීමේ ස්ථානය දක්වා සපයා එලීම සහ පුවක්ගස්වත්ත හන්දියේ සිට කේපී 2 පොම්ප කිරීමේ ස්ථානය දක්වා මහා මාර්ගය ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත් කිරීම ද ඇතුලත් වේ.

2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100 % ක් හා 89.58 % ක් විය.

### සබරගමුව පලාත

**(අ) ශ්‍රී පාදස්ථානය වෙනුවෙන් අපජලය රැස් කිරීමේ හා බැහැර කිරීමේ පද්ධතිය ඉදි කිරීම.**

මෙම වැඩ කටයුතු වලට මිලි මීටර 150 ක විෂ්කම්භයෙන් හා මීටර් 500 ක දිග ප්‍රමාණයකින් යුත් ඉහල ඝණත්වයේ පොලි එතිලින් ප්‍රධාන පල් දෝරු නල මාර්ගයක් උඩ මළුවේ සිට ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දක්වා සපයා එලීම ද, සමතාකරණ ටැංකියකින් ද, පූතික ටැංකියකින් ද, නිර්වායු පෙරණයන්ගෙන් හා තෙත් බිම් හා විෂ බීජ නාශක පහසු කමකින් ද සමන්විත වන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද ඇතුලත් වේ. ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ඝණ මීටර 62.6 ක් වන අතර ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 220 ක් වේ.

2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100 % ක් හා 94.43 % ක් විය.

## පෙල ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් (මළ අපවහන).

### බස්නාහිර පලාත

**1. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල රැස් කිරීමේ හා බැහැර කිරීමේ යෝජනා ක්‍රමය.**

පසු ගිය දශක දෙක මුළුල්ලේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිදු වූ වේගවත් සංවර්ධනයත් සමග නිවාස සෑදීම සඳහා පැන නැගී ඇති ඉල්ලුම සපුරා ලීම සඳහා දැනට පවතින්නා වූ සංවර්ධිත ඉඩම් බොහෝ සංඛ්‍යාවක් අනු බෙදුම් වලට භාජනය වී ඇති අතර ප්‍රධාන මාර්ගයන් දිගට ඇති ඉඩම් වාණිජ සංවර්ධනය සඳහා අනු බෙදුම් වලට භාජනය වී ඇත. ගොඩනැගිලි ඉදි කිරීමේ ඉඩම් කොටස් වල ප්‍රමාණය අඩු වී ඇති හෙයින් හා අවට ඇති ඉඩම් වල තිබෙන නොගැඹුරු ළිං හේතු කොට ගෙන ඕනෑම ගොඩනැගිලි ඉදි කෙරෙන

බිම් කොටසක පූතික ටැංකියක් ස්ථාපිත කිරීම බෙහෙවින් දුෂ්කර කටයුත්තක් බවට පත් වී ඇත.

ඉඩම් වලට ඇති ඉල්ලුම සපුරා ලිම සඳහා පහත් බිම් ප්‍රදේශයන් ද ගොඩ කරනු ලැබ ඇත. මෙම තත්ත්වය වගුරු බිම් වල හා ජල මාර්ගයන්හි ඇති ජලය පැතිර යාම වැඩි වීමේ ප්‍රවණතාවයකට තුඩු දී ඇති අතර මේ නිසා ගං වතුර අවදානමක් ද උද්ගත වී තිබේ. භූ ගත ජල තලයේ වර්ධනය සමග හා පසෙහි අඩු පාරගම්‍යතාව හේතු කොට ගෙන නිසියාකාරව ක්‍රියාත්මක නොවන පූතික ටැංකි වලින් හා පෙඟවුම් වලවල් වලින් පිට වන අපජලය දෙපස ඇති කාණු වල එකතු වන අතර අවසානයේදී එම අපජලය ඒ ආසන්නයේ පිහිටි මතු පිට ජල මාර්ගයන් හා එක් වී එහි අවසන් ප්‍රතිඵලය වශයෙන් භූ ගත ජල ප්‍රභවයන් දූෂිත වීම සිදු වේ. ඒ බැවින්, වැලිකඩ - රාජගිරිය ප්‍රදේශයේ මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා ප්‍රදේශයේ ද, ඊට යා බදව ඇති කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා මහරගම නගර සභා ප්‍රදේශයේ කොටස් තුළ ද සිදු වී ඇති වේගවත් සංවර්ධනය නිසා අදාල ප්‍රදේශයන් වෙත යෝග්‍ය අපජල බැහැර කිරීමේ ක්‍රමයක් සම්පාදනය කර දීම සඳහා මධ්‍යගත මල අපවහන පද්ධතියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වී තිබේ. ඒ අනුව ආසන්න වශයෙන් මල අපවහන සම්බන්ධතාවයන් 28000 ක් සැපැයීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රු. දස ලක්ෂ 40,542 ක් වේ.

ව්‍යාපෘතිය වෙනුවෙන් මෙම තාවකාලික පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කරන ලද්දේ 2012 වර්ෂයේදී වන හෙයින් නව රේට් ප්‍රමාණයන්ට ගැලපෙන සේ එකී තාවකාලික පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කළ යුතුව ඇත. පොම්පාගාරයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් 22 ක් හඳුනාගනු ලැබ ඇති අතර ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බල පෑම් තක්සේරු කිරීමේ අධ්‍යයනය දැනට සිදු කරනු ලබමින් පවතී. ව්‍යාපෘතිය පදනම් කර ගනිමින් කරනු ලබන ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනයේ අධ්‍යයනය දැනට ආරම්භ කරනු ලැබ ඇති අතර සාධ්‍යතා වාර්තාවක් පිළියෙල කිරීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. මුල් යෝජනාව වූ අපජලය මුහුදට මුදා හැරීම වෙනුවට ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම දැනට හඳුනා ගනු ලැබ ඇති අතර ඉඩම සහ ප්‍රතිකාර්ත අපවාහය දියවන්නා ඔය වෙත මුදා හැරීම සඳහා අනුමැතිය ලැබුණ හොත් ව්‍යාපෘතිය ආරම්භ කරනු ලබනවා ඇත.

**2. මීගමුව අපජල බැහැර කිරීමේ ක්‍රමය.**

මීගමුව යනු ශ්‍රී ලංකාවේ බටහිර වෙරළබඩව පිහිටා ඇති ප්‍රධාන නගරයක් වන අතර 2004 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ඇති වූ සුනාමි ව්‍යසනය නිසා එහි ක්‍රියාත්මක වන සනීපාරක්ෂණ යටිතල පහසුකමෙහි බොහෝ අංගයන් විනාශ වී මෙහෙයුම් කළ නොහැකි තත්ත්වයකට පත් විය. නගරයේ ජන ගහණය අඛන්ඩ ලෙස වර්ධනය වීමේ හේතුවෙන් ඉඩම් වලට ඇති ඉල්ලුම අධික වීම හා එහි විපාකයක් වශයෙන් ඇති වී තිබෙන ගොඩ නැගිලි ඉදි කිරීමේ භූමි එන්නට එන්නටම ප්‍රමාණයෙන් කුඩා වීම හේතු කොට ගෙන පූතික ටැංකි වලින් පිට වන අපවාහ ජලය බැහැර කිරීමේ ගැටළුව කාලයත් සමග උග්‍ර අතට හැරීමේ හැකියාව ඇත. මල අපවහන සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 15154 ක් සපයා දීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 16,477 ක් වේ.

පාරිසරික බල පෑම් තක්සේරු කිරීමේ අධ්‍යයනය දැනට බොහෝ සෙයින් නිම කරනු ලැබ ඇති අතර තක්සේරු කිරීමේ අධ්‍යයනය ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමට යෝග්‍ය ඉඩමක් හඳුනා ගැනීමේ අධ්‍යයනය දැනට සිදු කෙරෙමින් පවතී. පොම්පාගාර ඉදි කිරීම සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරමින් පවතින අතර පාරිසරික බල පෑම් අධ්‍යයනය කිරීමේ කටයුතු නිම වූ පසුව ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා ඉඩම අත් පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කරනු ලබනවා ඇත.

ශ්‍රී ලංකාවේ නිරිත දිග නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා (නගරයන් සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා මුල් පිරීම් - 1) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස යුරෝ දස ලක්ෂ 76 ක් ලබා ගැනීම සඳහා වූ ණය ගිවිසුම ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (AFD) සමග අත්සන් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද, ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ හා කැළණිය - පෑලියගොඩ ප්‍රදේශයන්හි අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ටෙන්ඩර් ලිපි ලේඛන සකස් කිරීම ද සිදු කරනු ලබනවා ඇත.

උපදෙස් ලබා ගැනීම හා සම්බන්ධ ප්‍රතිසම්පාදන කටයුතු දැනට කරගෙන යමින් පවතී. ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (AFD) වෙතින් ලැබෙන මූල්‍යාධාර පහසුකමට සමාන්තර ලෙස ව්‍යාපෘතියේ තාක්ෂණික සහාය සඳහා යුරෝපීය සංගමයෙන් යුරෝ දස ලක්ෂ 5.7 ක මුදලක් දැනටමත් ලැබී ඇත.

**3. මහරගම හා බොරලැස්ගමුව අපජල බැහැර කිරීමේ පද්ධතිය.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය, ජාතික අධ්‍යාපන ආයතනය හා ජාතික පිළිකා මධ්‍යස්ථානය වැනි වැදගත් ජාතික ආයතනයන් කිහිපයක් මහරගම ප්‍රදේශය තුළ පිහිටා තිබේ. මහරගම හා බොරලැස්ගමුව නාගරික ප්‍රදේශයන්හි ඇති වී තිබෙන වේගවත් සංවර්ධනයට සරි ලන පරිදි හා පරිසරය තව දුරටත් පිරිහී යාම වැලැක්වීම සඳහා මේ ප්‍රදේශයට මධ්‍යගත මල අපවහන පද්ධතියක් අත්‍යවශ්‍ය වී තිබේ.

මහරගම හා බොරලැස්ගමුව අපජල වහනය රත්මලාන - මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද රත්මලාන/මොරටුව ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ගෙන එනු ලබනවා ඇත. ආසන්න වශයෙන් මල අපවහන සම්බන්ධතාවයන් 5000 ක් සැපයීමට අපේක්ෂා කරනු ලබන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 5,125 ක් වනු ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2014 නොවැම්බර් 05 වැනි දින ප්‍රදානය කරන ලද අතර අරමුදල් සම්පාදනය කිරීමට යෝජිත බැංකුව මහජන චීනයේ අපනයන ආනයන බැංකුවයි. මහජන චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය අතර ණය ගිවිසුම අත්සන් කිරීමට නියමිතව ඇත. මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය මොරටුව විශ්ව විද්‍යාලයය විසින් කරනු ලබන අතර අවසාන කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කරනු ලබනවා ඇත. ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය සම්බන්ධ අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇත.

**4. දෙහිවල/ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

පිළිවෙලින් ශ්‍රී ලංකාවේ වාණිජ හා පරිපාලන අග නගරයන් වන කොළඹට හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේට යා බදව පිහිටා ඇති බැවින් දෙහිවල ගල්කිස්ස බොහෝ සෙයින් නාගරීකරණය වූ පදිංචියට යෝග්‍ය හා වාණිජ මහා නගරයක් බවට පත් වී තිබේ. එය පිහිටා ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කය තුළ වන අතර දෙහිවල සහ රත්මලාන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් එය සමන්විත වේ. දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 15 කින් සමන්විත වන අතර රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 13 කින් සමන්විත වේ.

1987 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන මල අපවහන බැහැර කිරීමේ පද්ධතියක් තිබෙන අතර ඒ මගින් දෙහිවල බටහිර සහ ජයතිලක ග්‍රාම නිලධාරී වසම් හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයට අයත් ගල්කිස්ස හන්දියේ සිට දෙහිවල ඇල හරහා ඇති පාලම දක්වා ගාළු පාරේ මුහුද දිශාවට ඇති කොටස ද ඇතුලත් ගාළු පාරේ කොටස ඇතුළු ගල්කිස්සේ ග්‍රාම නිලධාරී වසම් ද ආවරණය කරනු ලැබේ. සේවා සපයනු නොලබන ප්‍රදේශය තුළ යෝග්‍ය අපජල බැහැර කිරීමේ ක්‍රමයක් නොමැති හෙයින් නල මගින් මල අපවහන බැහැර කිරීමේ පද්ධතියක් සඳහා දැනට විශාල ඉල්ලුමක් පවතී. එම නිසා දෙහිවල ගල්කිස්ස සෙසු ප්‍රදේශයන් හා කැස්බෑව ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාසයට අයත් යා බද ග්‍රාම නිලධාරී වසම් 3 ක් ද යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළට ඇතුළු කර ගෙන තිබේ. මෙම යෝජිත ව්‍යාපෘතිය යටතේ ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලබන ඇස්තමේන්තු ගත මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් හෙක්ටෙයාර 919 ක් වන අතර 2040 වර්ෂය වන විට සේවා සපයා දෙනු ලැබීමට අපේක්ෂිත ජන ගහණය 138230 ක් වේ. එය 2040 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත ජන ගහණයෙන් 75% ක ප්‍රතිශතයකි. යෝජිත ව්‍යාපෘතිය ගුරුත්ව මල අපවහන ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර් 41.2 කින් ද, ගැඹුරු උමං මාර්ග ගුරුත්ව ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 4.1 කින් ද, අතුරු හා ශාඛා මල අපවහන නල මාර්ග කිලෝ මීටර 39 කින් ද, තෙත් ළිං පොම්ප කිරීමේ ස්ථානයන් 12 කින් ද, පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 6.5 කින් හා මිලි මීටර 1500 ක විෂ්කම්භයකින් හා කිලෝ මීටර 1.7 ක දිග ප්‍රමාණයකින් යුත් මුහුද කරා දිවෙන නල මාර්ගයකින් ආදී අංගයන්ගෙන් සමන්විත වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 28,523 ක් වේ.

මේ අවස්ථාව වන විට ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා පාරිසරික බල පෑම් තක්සේරුව අපේක්ෂාවෙන් සිටී. පොම්ප කිරීමේ ස්ථාන සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

**5. කැළණිය /පෑලියගොඩ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

කැළණිය ප්‍රාදේශීය සභාව හා පෑලියගොඩ සුළු නගර සභාව පිහිටා තිබෙන්නේ බස්නාහිර පලාතේ කොළඹ - නුවර මහා මාර්ග යේ රට ඇතුලට වන්නටය. ඒවා ශ්‍රී ලංකාවේ වාණිජ මධ්‍යස්ථානය වූ කොළඹට පැමිණෙන ද්වාරය වශයෙන් වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශයන් වේ. කැළණිය ප්‍රාදේශීය සභාව හා පෑලියගොඩ සුළු නගර සභාව යන දෙකම මල බැහැර කිරීම සඳහා යැපෙන්නේ පූතික ටැංකි හා වල වැසිකිලි මත වේ. ඇල මාර්ග හා වගුරු බිම් අසල පදිංචි වී සිටින ඇතැම් ජනයා තමන්ගේ අපවාහයන් පරිසරය දූෂණය කරමින් හා සෞඛ්‍ය උපද්‍රවයන්ට හේතු වෙමින් සෘජුවම ජල මාර්ග තුළට බැහැර කරති. එම නිසා මල අපවහන සේවාවන් සඳහා ප්‍රදේශය තුළ විභව ඉල්ලුමක් පවතී. මේ ප්‍රදේශයේ භූ ගත ජල මට්ටම ඉතා ඉහල අගයක පවතී.

යෝජිත ව්‍යාපෘතිය කිලෝ මීටර 12.5 ක දිගින් යුත් ගුරුත්ව මල අපවහන ප්‍රධාන නල මාර්ගයන්ගෙන් ද, කිලෝ මීටර 10.4 ක පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයන්ගෙන් ද, මල අපවහන අතුරු නල මාර්ග, ආංශික නල මාර්ග හා ශාඛා නල මාර්ග කිලෝ මීටර 50 කින් හා තෙත් ළිං පොම්ප කිරීමේ ස්ථානයන් 7 කින් ද සමන්විත වේ. යෝජිත අපජල බැහැර කිරීමේ පද්ධතිය තුළ කැළණිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ හා පෑලියගොඩ සුළු නගර සභා ප්‍රදේශය තුළ රැස් වන අපජලය පොම්ප කිරීමේ ස්ථාන මාලාවක් අතර ජාල ගත කොට 1 වැනි විකල්පය වශයෙන් මුහුද කරා දිවෙන දිග නල මාර්ගයක් මගින් මුහුද තුළට යවනු ලබන අතර 2 වැනි විකල්පය වශයෙන් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හරහා මුහුද කරා දිවෙන කෙටි නල මාර්ග යක් මගින් මුහුදට යැවීමට සිදු කරනු ලබනවා ඇත. පාරිසරික බල පෑම් තක්සේරුව හා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු මෙතෙක් ආරම්භ කරනු ලැබ නැත. 1.1% ක වර්ධන වේගයක් අනුව 2043 වර්ෂය වන විට කැළණිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ හා පෑලියගොඩ සුළු නගර සභා ප්‍රදේශය තුළ ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලබන ජන ගහණය 76279 කි. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති තාවකාලික පිරිවැය ඇස්තමේන්තුව රුපියල් දස ලක්ෂ 14,605 ක් වන අතර සපයා දීමට අපේක්ෂා කරනු ලබන සම්බන්ධතා සංඛ්‍යාව 14081 කි.

ශ්‍රී ලංකාවේ නිරිත දිග නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා (නගරයන් සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා මුල් පිරිම් - 1) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස යුරෝ දස ලක්ෂ 76 ක් ලබා ගැනීම සඳහා වූ ණය ගිවිසුම ප්‍රංශ සංවර්ධන ඒජන්සිය **(AFD)** සමග අත්සන් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කැළණිය - පෑලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ටෙන්ඩර් ලිපි ලේඛන සකස් කිරීම ද, ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ටෙන්ඩර් ලිපි ලේඛන සකස් කිරීම හා මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබනවා ඇත.

උපදෙස් ලබා ගැනීම හා සම්බන්ධ ප්‍රතිසම්පාදන කටයුතු දැනට කරගෙන යමින් පවතී. ප්‍රංශ සංවර්ධන ඒජන්සිය **(AFD)** වෙතින් ලැබෙන මූල්‍යාධාර පහසුකමට සමාන්තර ලෙස ව්‍යාපෘතියේ තාක්ෂණික සහාය සඳහා යුරෝපීය සංගමයෙන් යුරෝ දස ලක්ෂ 5.7 ක මුදලක් දැනටමත් ලැබී ඇත.

**6. ගම්පහ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශය වන්නේය. ගම්පහ නගරය බස්නාහිර පලාතේ පිහිටා ඇති නිසාත්, ශ්‍රී ලංකාවේ වාණිජ අග නගරය වූ කොළඹට යාබදව පිහිටා ඇති නිසාත් බෙහෙවින්ම නාගරීකරණය වූ හා වාණිජකරණය වූ නගරයක් බවට පත්ව ඇත්තේය.

ව්‍යාපෘතිය මගින් ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරී වසම් 33 අතුරින් ග්‍රාම නිලධාරී වසම් 21 ක් ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඊට ගම්පහ නගරය, මිරිස්වත්ත හා යක්කල ඇතුලත් වේ.

නව ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් ගත් කල 2045 වර්ෂයේදී සෘජු ලෙස සේවාවන් සපයා දීමට අපේක්ෂා කරනු ලබන ගෘහස්ත ජන ගහනය ග්‍රාම නිලධාරී වසම් 21 ක් තුළ ජීවත් වන 33601 ක ජනතාවක් වේ. ස්ථිර පදිංචි කරුවන්ට අමතර ලෙස 172175 ක පා වෙන ජන ගහණයක් වෙත ද යෝජිත ව්‍යාපෘතිය මගින් සෙත සලසනු ලබනවා ඇත. ව්‍යාපෘතියේ සැලැසුම්ගත තෙත් කාල ගුණික ප්‍රවාහය **(Design Wet Weather Flow)** ආසන්න වශයෙන් දිනකට ඝණ මීටර 15000 ක් වේ.

යෝජිත මල ජාලිත කිරීමේ පද්ධතිය **(sewer reticulation system)** කිලෝ මීටර් 30.4 ක දිගින් යුත් ගුරුත්ව ප්‍රධාන නල මාර්ග යන්ගෙන් ද, පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 6.4 කින් ද, කිලෝ මීටර 61 ක දිගින් යුත් අතුරු හා ශාඛා මල අපවහන නල මාර්ග ප්‍රමාණයකින් හා තෙත් ළිං පොම්ප කිරීමේ ස්ථාන 17 කින් ද සමන්විත වේ. යෝජිත අපජල ප්‍රතිකාරක පද්ධතිය නිර්මාණය කිරීමට අදහස් කරනු ලැබ ඇත්තේ සක්‍රිය කළ ගොහොදු දීර්ඝ වාතන **(Activated Sludge Extended Aeration)** ක්‍රමයට වන අතර ප්‍රතිකාර කරන ලද අපජලය කිලෝ මීටර 3.1 ක දිගින් යුත් නල මාර්ගයක් තුළින් අත්තනගළු ඔය වෙත මුදා හැරීමට යෝජිතය. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 18,442 කි.

මේ වන විට සාධ්‍යතා අධ්‍යයනය නිම කරනු ලැබ ඇති අතර ව්‍යාපෘති යෝජනාව අනුමැතිය සඳහා ව්‍යාපෘති අගැයීම් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

## වයඹ පලාත.

**1. හලාවත අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

හලාවත කිලෝ මීටර 75 ක් කොළඹට උතුරින් පිහිටා ඇති අතර පොල්, ඉස්සන් හා ධීවර කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන අධික ජන ගහණයකින් යුත් නගරයකි.

හලාවත භූ ලක්ෂණ අනුව පැතැලි ප්‍රදේශයක් වන හෙයින් ක්ෂණික ලෙස හඳුනා ගත හැකි ජලාපවහන රටාවක් නොමැති වුවද, සෘජුවම මුහුදට ජලය ගලා යන වැසි ජල අපවහන ඇලවල් සතරක් තිබේ. ඇලවල් වල ඇති මට්ටම් හා සම්බන්ධ දෝෂයන් හේතු කොට ගෙන ජල අපවහනය විශේෂ අභියෝගයන්ට මුහුණ දෙයි. කලපුවේ ජලය නාගරික ප්‍රදේශයේ ඇති ප්‍රධාන අපවහන මාර්ගයන් දිගේ ඉහලට ගලා එයි. වලවල් වලින් හා ටැංකි වලින් එකතු කර ගන්නා අපජලය හලාවත සුළු නගර සභාව විසින් කෙලින්ම භූමියේ මතු පිටට හිස් කරනු ලබයි. මූලික රෝහලේ අපජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල

මාර්ගයක් මගින් දුම්රිය මාර්ගය හා මුහුද අතර ඇති පොකුණක් වෙත කෙලින්ම යවනු ලබයි.

යෝජිත යෝජනා ක්‍රමය යටතේ මුහුද කරා දිවෙන මීටර 500 ක කෙටි නලයක් සහිත දිනකට ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කරනු ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් දස ලක්‍ෂ 3,776 ක් වන අතර නිවාස 1050 ක් යෝජනා ක්‍රමය හා සම්බන්ධ කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර අරමුදල් සැපැයීමට යෝජිත බැංකුව වන්නේ මහජන චීනයේ අපනයන ආනයන බැංකුවයි. මහජන චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය අතර ණය ගිවිසුම අත්සන් කරනු ලැබීමට තිබේ.

**2. පුත්තලම අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

පුත්තලම කොළඹට කිලෝ මීටර 125 ක් උතුරින් පිහිටා ඇති අතර එය කුඩා නගරයක් වුව ද ඉතාම ජනාකීර්ණ නගරයකි. එය ලුනු හා ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලයි. පුත්තලම කලපුව ශ්‍රී ලංකාවේ කලපු අතුරින් විශාලතම කලපුවකි. නොරොච්චෝලෙයි ගල් අඟුරු බලාගාරය පිහිටා ඇත්තේ පුත්තලමට කිලෝ මීටර 12 ක් දුරින් කල්පිටිය අර්ධ ද්වීපයේය.

යෝජිත යෝජනා ක්‍රමය යටතේ මුහුද කරා දිවෙන මීටර් 500 ක දිගින් යුත් නල මාර්ගයක් සහිතව දිනකට ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම යෝජිතව තිබේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 4,025 ක් වන අතර නිවාස 1250 ක් යෝජනා ක්‍රමය සමග සම්බන්ධ කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2014 නොවැම්බර් 05 වැනි දින ප්‍රදානය කරන ලද අතර අරමුදල් සැපැයීමට යෝජිත බැංකුව වන්නේ මහජන චීනයේ අපනයන ආනයන බැංකුවයි. මහජන චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය අතර ණය ගිවිසුම අත්සන් කරනු ලැබීමට තිබේ.

## දකුණු පලාත.

**1. ගාල්ල අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

ගාල්ල ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ පිහිටි ප්‍රධාන වෙරළාසන්න නගරයකි. එය පිහිටා ඇත්තේ කොළඹට දකුණු දෙසින් කොළඹ - හම්බන්තොට ප්‍රධාන මාර්ගයේ කිලෝ මීටර 117 ක දුරිනි. 2004 දෙසැම්බර් මාසයේ සිදු වූ සුනාමි ව්‍යසනය නිසා දැනට තිබෙන ස්ථානීය සනීපාරක්ෂණ යටිතල පහසු කම් වල බොහෝ අංගයන් විනාශ වී මෙහෙයුම් කළ නොහැකි තත්ත්වයකට පත් විය.

2030 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත ජන ගහණය ආසන්න වශයෙන් 120600 කි. මල අපවහන සම්බන්ධතාවයන් 11402 ක පමණ සංඛ්‍යාවක් සපයා දීමට අපේක්ෂා කරනු ලැබේ. පොම්ප කිරීමේ ස්ථානයන් 05 ක් ඉදි කිරීමට යෝජිත අතර ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. පාරිසරික බල පෑම් අධ්‍යයනය හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා වූ ඉඩම අත් පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය සඳහා වූ පිරිවැය රුපියල් දස ලක්‍ෂ 13,325 ක් වේ.

ශ්‍රී ලංකාවේ තිරිත දිග නගර සඳහා වූ සනීපාරක්‍ෂණ හා ස්වස්ථතා (නගරයන් සඳහා වූ සනීපාරක්‍ෂණ හා ස්වස්ථතා මුල් පිරීම් - 1) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස යුරෝ දස ලක්‍ෂ 76 ක් ලබා ගැනීම සඳහා වූ ණය ගිවිසුම ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (AFD) සමග අත්සන් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ටෙන්ඩර් ලිපි ලේඛන සකස් කිරීම ද, කැළණිය - පෑලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ටෙන්ඩර් ලිපි ලේඛන සකස් කිරීම හා මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබනවා ඇත.

දැනට උපදේශක සේවාවන් ප්‍රතිසම්පාදනය කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (AFD) වෙතින් ලැබෙන මෙම මූල්‍ය පහසුකමට සමාන්තර ලෙස මෙම ව්‍යාපෘතිය වෙත තාක්‍ෂණික සහාය ලබා දීම සඳහා යුරෝ දස ලක්‍ෂ 5.7 ක් වූ ප්‍රදානයක් යුරෝපා සංගමය වෙතින් දැනටමත් ලැබී තිබේ.

**2. හම්බන්තොට අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

ප්‍රධාන වශයෙන්ම ජාත්‍යන්තර මුහුදු තොටක් වශයෙන් සංවර්ධනය වීමේ අති විශාල විභව හැකියාවක් ඇති ස්වාභාවික වරාය සමග අන්තර් සම්බන්ධතාවය ඇති කරමින් හම්බන්තොට ආර්ථික කේන්ද්‍රයක් වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට නියමිතව ඇත. යෝජිත යටිතල පහසුකම් සංවර්ධන සැලැසුම් වලට තෙල් පිරිපහදුව, කර්මාන්ත කලාපය හා පරිපාලන කේන්ද්‍රය, ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය, උද්භිද උද්‍යානය, ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය හා ජාත්‍යන්තර ගුවන් තොටුපොල ඇතුලත් වේ. මල අපවහන සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 9034 ක් සම්පාදනය කර දීමට අපේක්‍ෂා කරනු ලැබේ. වරාය පරිශ්‍රය තුළ ස්ථානගත කරනු ලැබ ඇති කර්මාන්තයන් වෙත සේවා සැපැයීම සඳහා වරාය සංවර්ධන ප්‍රදේශය තුළ ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීමට කටයුතු කරනු ලබනවා ඇත. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්‍ෂ 11,519 ක් වේ. ව්‍යාපෘතියේ අංගයන් වන්නේ කිලෝ මීටර 41 ක දිගින් යුත් ප්‍රධාන ගුරුත්ව නල මාර්ගය, කිලෝ මීටර 41 ක දිගින් යුත් පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය, (කිලෝ මීටර 30 ක) ආරෝහකයන්, (කිලෝ මීටර 41 ක) ශාඛා මාර්ග, පොම්ප කිරීමේ ස්ථානයන් 12 ක් හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද වේ. ප්‍රතිකාරක පද්ධතිය අපජල ස්ථායිකරණීය පොකුණු පද්ධතියක් **(Waste Stabilization Pond System)** වන අතර ප්‍රතිකාරිත අපවාහය වාරි මාර්ග පරමාර්ථයන් සඳහා නැවත භාවිතා කරනු ලබනවා ඇත.

හම්බන්තොට අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර පාර්ශව දෙක අතර ගිවිසුමද අත්සන් කරනු ලැබ ඇත. පොම්පාගාර හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා අවශ්‍ය ඉඩම් දැනටමත් අත් පත් කර ගනු ලැබ ඇති අතර ඉදි කිරීම් ආරම්භ කිරීම සඳහා සූදානම් තත්ත්වයක පවතී. ප්‍රතිකාරිත අපවාහය වාරි මාර්ග පරමාර්ථයන් සඳහා නැවත භාවිතා කිරීමට සැලැසුම් කර තිබී හෙයින් අපවාහය බැහැර කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයක් සිදු වූ හෙයින් පාරිසරික බල පෑම් තක්සේරු ක්‍රියාවලියේ ප්‍රමාදයක් සිදු විය. ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇත.

## නැගෙනහිර පලාත.

**1. කාත්තන්කුඩි අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

කාත්තන්කුඩි යනු නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මඩකලපුව නගරයට කිලෝ මීටර 7.0 ක් දකුණු දෙසින් පිහිටා ඇති වෙරළබද නගරයක් වන අතර එය ග්‍රාම නිලධාරී වසම් 18 කින් සමන්විත වේ. එය වර්ග කිලෝ මීටර 3.89 ක ප්‍රදේශයක් පුරා පැතිර පවතී. ලෝක ප්‍රසිද්ධ සංචාරක ආකර්ෂණයක් වූ පාසිකුඩා වෙරළ පිහිටා ඇත්තේ ව්‍යාපෘති ප්‍රදේශයේ සිට එතරම් දුරකින් නොවේ. ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ස්ථානගත කරනු ලැබීමට යෝජිතව ඇත්තේ කාත්තන්කුඩි නගරය තුළ වන අතර ඒ සඳහා ඉඩම් හිමියන්ගේ එකඟත්වය මේ වසර තුළදී ලබා ගෙන ඇත. මල අපවහන සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 13308 ක් සම්පාදනය කර දීමට අපේක්‍ෂා කරනු ලැබේ. ඇස්තමේන්තුගත කරන ලද මුළු පිරිවැය රුපියල් දස ලක්‍ෂ 11,407 ක් වේ. ව්‍යාපෘතිය කිලෝ මීටර 17 ක දිගින් යුත් ප්‍රධාන ගුරුත්ව නල මාර්ගයන්ගෙන් ද, කිලෝ මීටර 9 ක දිගින් යුත් පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයකින් ද, (කිලෝ මීටර 9 ක) ආරෝහකයන්ගෙන් ද, (කිලෝ මීටර 14 ක) ශාඛා නල මාර්ගයන්ගෙන් ද, පොම්පාගාර 11 ක සංඛ්‍යාවකින් හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද සමන්විත වන අතර ප්‍රතිකාරිත අපවාහය කෙටි මුහුදු නල මාර්ගයක් මගින් මුහුද වෙත මුදා හරිනු ලැබීමට අපේක්‍ෂා කරනු ලැබේ.

කාත්තන්කුඩි අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර කොන්ත්‍රාත්කරු හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ගිවිසුමද අත්සන් කරනු ලැබ ඇත. ණය ගිවිසුම අත්සන් කිරීම නොබෝ කලකින් සිදු කරනු ලැබීමට නියමිත අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම 2017 වර්ෂයේදී සිදු කරනු ලැබීමට අපේක්ෂිතය. ආරම්භක පාරිසරික පිරික්සුම් අධ්‍යයනය පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් නිම කරනු ලැබ ඇති අතර අවසාන කෙටුම්පත් වාර්තාව අගැයීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. පොම්පාගාර හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

**2. මඩකලපුව අපජලය රැස් කිරීමේ, ප්‍රතිකාරිත කිරීමේ හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම සඳහා විය සතුව ඇති ඉහල විභව හැකියාව හේතු කොට ගෙන මඩකලපුව නගරය ධීවර කටයුතු හා සංචාරක කර්මාන්තය හා සම්බන්ධ නාගරික අභිපිණ්ඩයක් **(urban agglomeration)** වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට අපේක්ෂිත වේ. 2030 වර්ෂය වන විට මෙම නගරය යෝජිත නාගරික මධ්‍යස්ථාන ධෙරාවලිය **(hierarchy)** තුළ දෙවැනි මට්ටමේ සේවා මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට නියමිතව ඇත. මෙම ප්‍රදේශය පිහිටා ඇත්තේ මුහුද හා කලපු අතර ඇති පටු බිම් තීරුවක වේ. භූ ගත ජල ස්ථරය ඉතා නොගැඹුරු වන අතර ජන ගහණයේ ඝණත්වය ඉහල මට්ටමක පවත්නා හෙයින් මේ ප්‍රදේශය සඳහා ස්ථානගත සනීපාරක්ෂණය තිරසාර විසඳුමක් වන්නේ නැත. එසේ හෙයින් මඩකලපුවේ වාසය කරන ජනතාවගේ සෞඛ්‍යය හා යහජීවනය සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා සහ ධීවර කර්මාන්තය හා බද්ධ වූ කලපුව වෙත දූෂිත වූ ජලය සෘජුවම ගලා යාම අවම කිරීම සඳහා ඉවහල් වන සුදුසු මල අපවහන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම විශාලතම හා ඉතා කඩිනමින් සිදු කළ යුතුව ඇති කාර්යයක් වශයෙන් හඳුනාගනු ලැබ ඇත. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් දස ලක්ෂ 14,915 ක් වන්නේය. යෝජිත ව්‍යාපෘතිය කිලෝ මීටර 32 ක දිගින් යුත් ප්‍රධාන ගුරුත්ව නල මාර්ගයකින් ද, කිලෝ මීටර 19 ක දිගින් යුත් පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයන්ගෙන් ද, (කිලෝ මීටර 15 ක) ආරෝහකයන්ගෙන් ද, (කිලෝ මීටර 20 ක) ශාඛා නල මාර්ගයන්ගෙන් ද, පොම්පාගාර 11 ක සංඛ්‍යාවකින් හා ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් සහ එහි සිට මුහුද කරා දිවෙන කෙටි නල මාර්ගයකින් ද සමන්විත වේ.

මඩකලපුව අපජල බැහැර කිරීම් ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අගැයීම් කමිටුවේ හා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර ව්‍යාපෘති සංකල්ප ලිපිය අනුමැතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. පොම්පාගාර ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගනු ලැබ ඇති අතර ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරගෙන යමින් පවතී. පාරිසරික බල පෑම් තක්සේරු අධ්‍යයනය 2017 වර්ෂයේදී ආරම්භ කරනු ලැබීමට යෝජිතය.

## ඌව පලාත.

**1. බදුල්ල අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.**

බදුල්ල නගරය යනු ඌව පලාතට අයත්, නේවාසික වාණිජ නගරයක් වේ. මධ්‍යගත අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් නොමැති වීම නිසා බදුල්ල නගර සහා ප්‍රදේශය ඉහල මට්ටමක අප ජල ජනනයක් අත් විඳිමින් තිබෙන අතර එම තත්ත්වය නගර සීමාවන් ඇතුළත පරිසර දූෂණයට, විශේෂයෙන්ම බදුලු ඔයේ ජලයේ ගුණාත්මය වර්ෂයේ වියලි කාල සීමාව තුළ දී අඩු ප්‍රවාහ තත්ත්වයන් යටතේ දරුණු ලෙස පහල යාමට හේතු වී ඇත. ඊට අමතර වශයෙන් අතිශයින්ම තදබද තත්ත්වයක පවතින වාසස්ථාන ඒකක හා නාගරීකරණය හේතුවෙන් බදුලුපිටිය ප්‍රදේශයද එම දුෂ්කරතාවයටම මුහුණ දෙමින් පවතී.

මේ හේතුන් නිසා බදුලුපිටිය, බදුල්ල නැගෙනහිර හා බදුල්ල මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම් 3 න් සමන්විත වන බදුල්ල නාගරික ප්‍රදේශය වෙනුවෙන් අප ජලය එක් රැස් කිරීමේ හා බැහැර කිරීමේ පද්ධතියක් ඉදි කිරීමට යෝජනා කරනු ලැබේ.

එකී ග්‍රාම නිලධාරී වසම් 3 තුළ 2044 වර්ෂය වන විට සෘජුවම සේවා සපයනු ලැබීමට අපේක්ෂිත ජන ගහණය (ගෘහස්තයන් 3732 ක් තුළ) 16798 ක් වේ. මෙම ස්ථිර ජන ගහණයට අමතර වශයෙන් 27000 ක පාවෙන ජන ගහණයක් ද යෝජිත ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලබනු ඇත. ව්‍යාපෘතියේ සැලැසුම්ගත තෙත් කාල ගුණ ගලනය (DWWF) ආසන්න වශයෙන් දිනකට ඝණ මීටර 4000 ක් වනු ඇත.

යෝජිත මලාපවහන ජාලිත පද්ධතිය කිලෝ මීටර 16.9 ක දිගින් යුත් ගුරුත්ව මලාපවහන ප්‍රධාන නල මාර්ගයකින් ද, කිලෝ මීටර 5.3 ක දිගින් යුත් පොම්ප කිරීමේ නල මාර්ගයකින් ද, කිලෝ මීටර 10 ක දිගින් යුත් ආරෝහක නල මාර්ගයන්ගෙන් හා තෙත් ළිං පොම්ප කිරීමේ ස්ථානයන් 11 කින් ද සමන්විත වනු ඇත. අපජල ප්‍රතිකාරක පද්ධතිය යෝජනා කරනු ලැබ ඇත්තේ සක්‍රිය කළ බොර විස්තෘත වාතන ක්‍රමය හා අනුකූල වන ලෙස වන අතර ප්‍රතිකාර කරන ලද අපජලය බදුලු ඔයේ ශාඛා ඔයක් වූ කුඩා ඔය වෙත මුදා හරිනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත කරනු ලැබ ඇති පිරිවැය රුපියල් දස ලක්ෂ 7,473 ක් වේ.

මේ මොහොත වන විට ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය හා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර ව්‍යාපෘතියේ සංකල්ප ලිපිය අනුමැතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

# ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (මළ අපවහනය).

**2016 වර්ෂය තුළ කරන ලද ක්‍රම සම්පාදන හා සැලැසුම් කටයුතු.**

- ගම්පහ අපජල රැස් කිරීමේ හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම.

  මෙම යෝජිත ව්‍යාපෘතිය දිනකට ඝණ මීටර 15000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම හා කිලෝ මීටර 30 ක දිගින් යුත් ගුරුත්ව මළාපවහන නල මාර්ගයන්ගෙන් ද, කිලෝ මීටර 60 ක දිගින් යුත් ආරෝහක මළාපවහන නල මාර්ග යන්ගෙන් හා ශාඛා මළාපවහන නල මාර්ගයන්ගෙන් ද කිලෝ මීටර 6.3 ක දිගින් යුත් ප්‍රධාන බල නල මාර්ගයන්ගෙන් ද, තෙත් ළිං පොම්ප කිරීමේ ස්ථානයන් 17 ක සංඛ්‍යාවකින් ද, කිලෝ මීටර 3 ක දිගින් යුත් ගඟ දක්වා දිවෙන මෝය නල මාර්ගයකින් යුක්ත වන හා වෙනත් අදාල වැඩ කටයුතු වලින් සමන්විත වනු ඇත

- ඉටු කරන ලද සැලසුම් සමාලෝචන කටයුතු.

  කතරගම ශුද්ධ නගර ප්‍රදේශයේ මළාපවහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා යෝජිත අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා ගුරුත්ව නල මාර්ග, ප්‍රධාන බල නල මාර්ග හා අපජල පොම්ප කිරීමේ ස්ථානයන්ගෙන් සමන්විත මළාපවහන ජාලය වෙනුවෙන් වූ මූලික සැලසුම් හා සවිස්තරාත්මක සැලසුම් සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

- 2016 වර්ෂය තුළදී ඉටු කරන ලද සවිස්තරාත්මක සැලැසුම් කටයුතු මුලතිවු දිස්ත්‍රික්කය වෙනුවෙන් ඉදි කිරීමට යෝජිත දිනකට ඝණ මීටර 25 ක ධාරිතාවයකින් යුත් අපජල ස්ථාපිත කිරීමේ පොකුණු පද්ධතිය සැලැසුම් කිරීම (ලෝක බැංකු අරමුදල් යටතේ)

# විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව.

**කමිටුව ප්‍රස්තුත වර්ෂය තුළදී 5 වතාවක් රැස් වන ලදී.**

විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවන ලද්දේ 590 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද අංක 2965(බී) දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එකඟතාවය මත අංක පීඑෆ්/පීඊ/3 හා 1999 නොවැම්බර් 19 දින දරණ චක්‍ර ලේඛය අනුවය.

විගණන හා කළමනාකරණ කමිටුවේ පරමාර්ථය වන්නේ 2010/12/14 දින දරණ පීඊඞී 55 මග පෙන්වීම් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දීමයි.

**කමිටුව වෙත නියමිත භූමිකාවන් හා වග කීම් පහත දැක්වෙන පරිදි සඳහන් කරනු ලැබ ඇත:**

- අභ්‍යන්තර විගණක වරුන්ගේ අඛන්ඩ අපක්ෂපාතී භාවය හා ඔවුන්ගේ ඵලදායී තාවය සමාලෝචනයට භාජනය කිරීම විගණන හා කළමනාකරණ කමිටුවෙන් අපේක්ෂා කරනු ලැබේ.
- අදාල ශ්‍රී ලංකා ගිණුම් තැබීමේ ප්‍රමිතීන්ට හා අනිකුත් අදාල නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස මූල්‍ය වාර්තාකරණය සිදු කරනු ලබන බවට සහතික වීම සඳහා අභිප්‍රේක්ෂණය කිරීමේ කර්තව්‍යයේදී විගණන හා කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු වේ.
- රජය විසින් පණවනු ලබන සියළුම අදාල රීතීන්ට හා රෙගුලාසීන්ට ද, නිකුත් කරනු ලබන සියළුම චක්‍ර ලේඛයන්ට ද අනුකූල ලෙස සියළුම කටයුතු සිදු කරනු ලබන බවට සහතික කර ගැනීම සඳහා අඛන්ඩ ලෙස සමාලෝචනයේ හා පසු විපරමේ යෙදෙමින් හා අනනුකූල ලෙස කටයුතු කරනු ලබන අවස්ථා සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා හා නිර්දේශ ඉදිරිපත් කරමින් විගණන හා කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය දිය යුතු වේ.
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි ලේඛන හා පොදු ව්‍යවසාය පිළිබඳ කමිටුවේ (කෝප්) නිර්දේශයන් ද විගණන හා කළමනාකරණ කමිටුව විසින් සිය සමාලෝචනයට භාජනය කළ යුතු අතර පැන නැගෙන කාරණා සම්බන්ධයෙන් ප්‍රතිකාර්මික ක්‍රියා මාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය විය යුතුය.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු වේ.



## 2016 වර්ෂය තුළදී කමිටුව පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය :

| | | | |
|---|---|---|---|
| 1 | ජේ.එම්.යූ.පී.ජයමහ මහතා | - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | -කමිටුවේ සභාපති |
| 2 | ශාන්ත රත්නායක මහතා | - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික |
| 3 | කේ.ඒ.සුබද්‍රා වල්පොල මහත්මිය | - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික |
| 4 | බී.ඩබ්ලිව්.ආර්.බාලසූරිය මහතා | - සාමාන්‍යාධිකාරී | සාමාජික |
| 5 | ජී.ඒ. කුමාරරත්න මහතා | - සාමාන්‍යාධිකාරී | සාමාජික |
| 6 | ඩී. තොටවත්ත මහතා | - අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | සාමාජික |
| 7 | ජී. ආර්. ඉද්දමල්ගොඩ මහතා | අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ) | සාමාජික |
| 8 | ඩබ්ලිව්. බී. ජී. ප්‍රනාන්දු මහතා | - අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා) | සාමාජික |
| 9 | ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා. | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) | සාමාජික |
| 10 | එම්. ෂරීක් රාජබ්ඩීන් මහතා | - උප සභාපති | |
| 11 | බී. ඩබ්ලිව්. ඩී. ලසන්ත මහතා | - විගණන අධිකාරී | |
| 12 | එස්. ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය | - ප්‍රධාන අභ්‍යන්තර විගණක | |
| 13 | ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය | - අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් | -කමිටුවේ ලේකම් |

කමිටුව ප්‍රස්තුත වර්ෂය තුළදී 5 වතාවක් රැස් වන ලද අතර එහිදී පහත සඳහන් කාරණා වැදගත් හා නිරන්තරයෙන් සාකච්ඡාවට භාජනය කරන ලද න්‍යායපත්‍ර අයිතමයන් වශයෙන් කැපී පෙනිනි :

**i.** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2013, 2014 හා 2015 යන වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තාවන් සභාගත කිරීම.

**ii.** 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන.

**iii.** ජාලගත වට්ටෝරු පොත් කළමනාකරණ ක්‍රමය

**iv.** ව්‍යාපෘති මූල්‍ය පටිපාටි සංග්‍රහය

**v.** 2016 හා 2017 යන වර්ෂයන් වෙනුවෙන් වූ අභ්‍යන්තර විගණන සැලැසුම.

**vi.** සාකච්ඡාවට භාජනය කරමින් අවධානය යොමු කරන ලද ඇතැම් විෂය පථයන් වූයේ 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ අභ්‍යන්තර විගණන වාර්තාව හා 2016 ජනවාරි සිට ජුනි දක්වා වූ අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය කිරීම, මානව සම්පත් කළමනාකරණය හා අදාල ගැටළු, තාක්ෂණික විගණනය, ව්‍යාපෘති කළමනාකරණයෙහි අඩු පාඩු හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වත් කම් (ඉඩකඩම්) පිළිබඳ යාවත්කාලීන තොරතුරු ආදියයි.

**vii.** රජයේ විගණන දෙපාර්තමේන්තුව හා අභ්‍යන්තර විගණනයන්ගෙ න් පැන නැගුන ප්‍රශ්නයන්ට ප්‍රතිචාර දැක්වීම

**viii.** 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශය හා සම්බන්ධ විගණකාධිපති වාර්තාව හා අංක 14 (2) (සී) දරණ විගණන වාර්තාව පිළිබඳ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිචාර.

පිරිසිදු ජලය නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම, ආදායම් නොලැබෙන ජලය සහ විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්ගේ හා දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ආදී විෂය පථයන්ට අදාල කාර්ය සාධනය සමාලෝචනයට භාජනය කරන ලදි.

**ix.** පොදු ව්‍යවසාය පිළිබඳ කමිටුවේ (කෝප්) නිර්දේශයන් හා 2016 අප්‍රේල් 07 වැනි දින පවත්වන ලද පොදු ව්‍යවසාය පිළිබඳ කමිටු රැස්වීමේ වාර්තාව.

විගණන හා කළමනාකරණ කමිටුවේ සෑම නිර්දේශයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒවාට අදාල ඇතැම් කාරණා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී වැඩි දුරටත් සාකච්ඡාවට භාජනය කරන ලදි.

# මූල්‍ය ප්‍රකාශය


98 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

99 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

101 ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය

102 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

103 මූල්‍ය ප්‍රකාශවලට සටහන්

127 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව.





Rs

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
## 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු.<br>(යළිප්‍රකාශිත) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 15 | 162,279,272,064 | 140,105,846,568 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | 7,310,270 | 1,619,633 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 17 | 158,896,165,209 | 149,412,953,802 |
| වෙනත් මූල්‍ය වත්කම් | 18 | 11,023,063 | 16,487,237 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 321,193,770,607 | 289,536,907,241 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 19 | 6,686,377,835 | 6,406,277,320 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 20 | 6,659,799,411 | 6,034,674,947 |
| තැන්පතු සහ අත්තිකාරම් | 21 | 26,898,950,740 | 13,088,996,146 |
| ආයෝජන | 22 | 10,265,721,944 | 12,844,829,029 |
| මුදල් හා මුදල් සමාන දෑ | 23 | 12,097,670,911 | 3,876,918,395 |
| **මුළු ජංගම වත්කම්** | | 62,608,520,842 | 42,251,695,838 |
| **මුළු වත්කම්** | | 383,802,291,451 | 331,788,603,080 |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ස්කන්ධය** | | | |
| රජයේ දෙපාර්තමේන්තු වලින් පවරාගත් වත්කම් | 24 | 185,480,387 | 185,480,387 |
| රාජ්‍ය ප්‍රාග්ධනය | 25 | 68,810,126,839 | 63,736,423,921 |
| කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල | 26 | 17,228,139 | 16,506,484 |
| රඳවාගත් ඉපයුම් | | (9,462,770,056) | (11,847,217,278) |
| රජයේ ප්‍රදාන | 27 | 92,750,876,538 | 90,627,548,649 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 28 | 181,792,825,672 | 165,736,880,359 |
| **මුළු ස්කන්ධය** | | 334,093,767,519 | 308,455,622,521 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ගෙවිය යුතු ණය | 29 | 35,102,370,290 | 9,412,094,521 |
| වෙනත් විලම්බිත වගකීම් | 30 | 4,125,023,486 | 4,489,088,098 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 39,227,393,776 | 13,901,182,619 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 31 | 9,855,307,852 | 9,431,797,940 |
| ගෙවිය යුතු ණය ප්‍රාග්ධනය (සටහන් අංක 29) | | 625,822,304 | - |
| **මුළු ජංගම වගකීම්** | | 10,481,130,156 | 9,431,797,940 |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | 383,802,291,451 | 331,788,603,080 |

**ඩී.තොටවත්ත**
**අතිරේක සාමාන්‍යාධිකාරී ( මුදල්)**

**ඩී.යූ. සුමනසේකර**
**සාමාන්‍යාධිකාරී**

**පිටු අංක 08 සිට 15 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන ප්‍රතිපත්ති හා පිටු අංක 16 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යාවශ්‍ය අංගයකි. මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.**

**කේ.ඒ.අන්සාර්**
**සභාපති**

**එම්. එස්. රජබඩීන්**
**උප සභාපති**

***කොළඹ***
**2017 සැප්තැම්බර් සංශෝධිත**

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | අයවැයගත 2016 රු. | සත්‍ය 2016 රු. | සත්‍ය 2015 රු. (යළිප්‍රකාශිත) |
|---|---|---|---|---|
| අයභාරය | 7 | 22,004,495,400 | **23,584,727,487** | 20,252,452,471 |
| විකුණුම් පිරිවැය | 8 | (15,650,612,706) | **(13,485,727,343)** | (12,314,954,106) |
| **දළ ලාභය** | | 6,353,882,694 | **10,099,000,145** | 7,937,498,365 |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා ලාභ | 9 | 1,187,864,600 | **1,477,546,705** | 1,073,728,427 |
| පරිපාලන වියදම් | 10 | (10,893,276,294) | **(9,139,288,219)** | (8,505,524,577) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 11 | (590,000,000) | **(680,664,041)** | (540,121,046) |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | | **(3,941,529,000)** | **1,756,594,590** | (34,418,831) |
| මූල්‍ය ආදායම් | 12 | 750,000,000 | **1,236,278,724** | 1,186,883,970 |
| මූල්‍ය පිරිවැය | 13 | (6,837,000) | **(3,281,535)** | (2,866,777) |
| **බදු පෙර ලාභය / ( අලාභය)** | | (3,198,366,000) | **2,989,591,779** | 1,149,598,362 |
| බදු සඳහා වෙන් කිරීම | 14 | (60,000,000) | **(63,287,387)** | (53,881,978) |
| **වර්ෂය සඳහා ලාභය/ අලාභය** | | (3,258,366,000) | **2,926,304,392** | 1,095,716,384 |

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරන ආදායම් ප්‍රකාශය

| | අයවැයගත 2016 | සත්‍ය 2016 | සත්‍ය 2015 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා ලාභය/ අලාභය | (3,258,366,000) | 2,926,304,392 | 1,095,716,384 |
| **වෙනත් විස්තීරන ආදායම්** | | | |
| ආයුසණක අලාභ | - | - | (1,979,658,769) |
| භාන්ඩාගාර බැඳුම්කර මත හානිකරණ අලාභ | - | **(541,135,514)** | - |
| | (3,258,366,000) | **(541,135,514)** | (1,979,658,769) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරන ආදායම්** | (3,258,366,000) | **2,385,168,878** | (883,942,385) |

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | රජයේ දෙපාර්තමේන්තු වලින් ලද වත්කම් | රජයේ ප්‍රදාන | රාජ්‍ය ප්‍රාග්ධනය | ප්‍රාග්ධන ප්‍රදාන | කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල | සමුච්චිත ලාභය / පාඩුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | | රු. | රු. | රු. | රු. |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | | 185,480,387 | 88,161,757,133 | | 151,974,122,319 | 15,239,298 | (10,806,208,171) | 229,530,390,966 |
| පූර්ව වර්ෂ නිවැරදි කිරීම - | | | | | | | | - |
| වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම | 35.1 | | | | | | (176,470,304) | (176,470,304) |
| වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම සඳහා ක්ෂය ගැලපීම | 35.1 | | | | | | 107,225,254 | 107,225,254 |
| දිගුකල් පරිශේෂ අත්තිකාරම් ඉවත්කිරීම | 35.2 | | | | | | (542,671) | (542,671) |
| පුනරුත්ථාපන හා නිර්මාණ වැඩ | 35.2 | | | | | | (244,531,351) | (244,531,351) |
| විදේශ ප්‍රධාන ඉවත් කිරීම | 35.2 | | | | | | 219,422,130 | 219,422,130 |
| දේශීය ප්‍රධාන ඉවත් කිරීම | 35.2 | | | | | | 813,209 | 813,209 |
| තොග හා ආරම්භක ශේෂ නිවැරදි කිරීම | 35.2 | | | | | | 1,544,484 | 1,544,484 |
| අත්තිකාරම් ඉවත්කිරීම | 35.2 | | | | | | (6,838) | (6,838) |
| බැංකු ශේෂයන් නිවැරදි කිරීම | 35.2 | | | | | | (733,339) | (733,339) |
| ගෙවිය යුතු VAT හා විගණන ගාස්තු නිවැරදි කිරීම | 35.2 | | | | | | (664,603) | (664,603) |
| කල්පිරෙන තෙක් තබාගන්නා තැම්පතු නිවැරදි කිරීම | 35.2 | | | | | | 6,251,776 | 6,251,776 |
| අත්පංශ වත්කම් ක්‍රමක්ෂය නිවැරදි කිරීම | 35.2 | | | | | | (31,898,284) | (31,898,284) |
| **2015.01.01 දිනට යළි ප්‍රකාශිත ශේෂය** | | 185,480,387 | 88,161,757,133 | - | 151,974,122,319 | 15,239,298 | (10,925,798,708) | 229,410,800,429 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | - | - | | - | - | (883,942,385) | (883,942,385) |
| තොග ඉවත් කිරීම | | | | | | | 893,690 | 893,690 |
| වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම සඳහා ක්ෂය ගැලපීම | 35.2 | | | | | | (37,102,690) | (37,102,690) |
| වර්ෂය තුල ලැබීම් / මාරු කිරීම් | | - | 3,355,961,700 | | 12,872,587,856 | | | 16,228,549,555 |
| ණය, ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය | | | | 49,836,439,996 | | | | 49,836,439,996 |
| බැදුම්කර මඟින් කරන ලද රාජ්‍ය දායකත්වය | | | | 13,899,983,925 | | | | 13,899,983,925 |
| කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම් | | - | - | | - | 1,267,186 | (1,267,186) | - |
| **2015.12.31 දිනට යළි ප්‍රකාශිත ශේෂය** | | 185,480,387 | 91,517,718,832 | 63,736,423,921 | 164,846,710,175 | 16,506,484 | (11,847,217,278) | 308,455,622,521 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | | | | | | 2,385,168,878 | 2,385,168,878 |
| වර්ෂය තුල ලැබීම් / මාරු කිරීම් | | | 2,216,825,457 | | | | | 2,216,825,457 |
| ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය | | | | 5,073,702,918 | 15,962,447,745 | | | 21,036,150,663 |
| කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම් | | | | | | 721,655 | (721,655) | - |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 185,480,387 | 93,734,544,290 | 68,810,126,839 | 180,809,157,920 | 17,228,139 | (9,462,770,056) | 334,093,767,519 |

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| අවසන් වර්ෂය සඳහා | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ ) මුදල්** | | | |
| බදු වලට පෙර ශුද්ධ ලාභය / (අලාභය ) | | 2,989,591,779 | 1,083,926,097 |
| **ගැලපීම්** | | | |
| පොලී ආදායම් | 12 | (1,236,278,724) | (1,186,119,227) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය / අලාභය | | (13,600,051) | - |
| ක්ෂයවීම් | 10.2 | 2,724,963,394 | 2,237,159,613 |
| විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන | 29.1 | 394,618,174 | 391,422,596 |
| පූර්ව වර්ෂ ගැලපීම් | | | (733,339) |
| පොලී වියදම් | 13 | 3,281,535 | 1,736,845 |
| කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය | | 4,862,576,106 | 2,527,392,585 |
| තොග ( වැඩිවීම්) / අඩුවීම් | | (280,100,515) | (779,307,827) |
| ණයගැතියන් , ලැබිය යුතු සහ තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම | | (14,799,143,670) | (3,664,857,013) |
| ණය හිමියෝ සහ වෙන්කිරීම් වල වැඩිවීම් / ( අඩුවීම්) | | 423,509,912 | 2,351,534,289 |
| මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් | | (9,793,158,167) | 434,762,033 |
| ගෙවූ බදු | | (63,287,387) | (39,677,127) |
| පාරිතෝෂික ගෙවීම් | 11 | (394,618,174) | (391,422,596) |
| **මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල්** | | (10,251,063,729) | 3,662,309 |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්** | | | |
| ස්ථාවර වත්කම් වල හා කෙරිගෙන යන වැඩ වල ආයෝජනය | | (33,718,679,086) | (33,652,546,584) |
| මූල්‍ය වත්කම් | | 5,464,174 | 6,323,440 |
| අපහරණය කළ වත්කම් විකුණුම් වලින් ලැබීම් | | 27,083,204 | - |
| ආයෝජන ආදායම් ලැබීම් | | 1,236,278,724 | 1,186,119,227 |
| (ආයෝජන) / ආයෝජනය ඉවත් කිරීම් | | 2,037,971,571 | (4,950,000,000) |
| **ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (30,411,881,414) | (37,410,103,918) |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ / ( යෙදවූ ) මුදල්** | | | |
| කාල පරිච්ඡේදය තුළ රජයේ ප්‍රදාන | | 2,123,327,889 | 2,709,730,350 |
| කාල පරිච්ඡේදය තුළ වර්ෂය ප්‍රාග්ධන ප්‍රදාන | | 17,040,060,639 | 14,518,201,341 |
| අළුත් ණය මුදල් | | 31,391,418,876 | 15,180,696,992 |
| ණය ආපසු ගෙවීම් | | (896,230) | (498,375) |
| පොලී ගෙවීම් | | (1,670,213,515) | (137,722,880) |
| භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම් | | - | 6,256,433,925 |
| | | 48,883,697,659 | 38,526,841,354 |
| **මුදල් හා මුදල් සමාන ද‍ෑ වල ශුද්ධ වැඩිවීම** | | 8,220,752,516 | 1,120,399,745 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන ද‍ෑ | | 3,876,918,395 | 2,756,518,649 |
| **කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන ද‍ෑ** | | 12,097,670,911 | 3,876,918,395 |

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
## මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2016 දෙසැම්බර් 31

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2016 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සදහා

### සංස්ථාගත තොරතුරු

### 1.1 පොදු කරුණු

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩය සංස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය ගාලු පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම පරිශ්‍රයේ පිහිටුවා ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා.ජ.ජ.ප.ම ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

### 1.2 ප්‍රධාන කාර්යයන්

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ පිරිපහදු කරන ලද පානීය ජලය නිෂ්පාදනය කර හා ප්‍රජාවට විකිණීම වේ.

රටේ සෑම ප්‍රදේශයකම පිරිපහදු කරන ලද පානීය ජලය සංවර්ධනය කිරීම හා වඩා හොද රටක් ගොඩනැංවීම ජාතික ජලසම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ අරමුණු වේ.

### 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලවීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) වලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයද ඇතුළත්ව හා අදාල සෑම කාල පරිච්ඡේදයක් වෙනුවෙන්ම, ජා.ජ.ජ.ප.ම. එහි මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව පිළියෙල කර ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම වාර්තා ජා.ජ.ජ.ප.ම. ප්‍රථම වරට ශ්‍රී ලංකා නව ගණකාධිකරණ ප්‍රමිතවලට ( LKAS) අනුකූල වන පරිදි පිළියෙල කරන ලදී.

### 2.2 අගය කිරීමේ පදනම

මූල්‍ය උපකරණ හා සාධාරන වටිනාකමට අගය කරන ලද විකිනීම සඳහා පවතින අනෙකුත් මූල්‍ය වත්කම් හා වගකීම් හැර මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශ්‍රාම පාරිතෝෂිතය සඳහා බැදීම වර්ථමාන අගයට හඳුනාගෙන ඇත.

### 3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල , පිරියත හා උපකරණවල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ යම් සමුච්චිත හානි කරන අලාභයන් තිබේ නම් ඒවා අඩු කොට ශුද්ධ අගයට පෙන්නුම් කරනු ලැබේ. මෙම පිරිවැයෙහි දේපල හා උපකරණ ප්‍රතිසම්පාදන පිරිවැය සහ ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීත කළ හැකි නිර්නායකයන් සම්පූර්ණ කරනු ලබන , දීර්ඝ කාලීන ව්‍යාපෘති වල ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. දේපල පිරියත හා උපකරණ වල ප්‍රධාන කොටස් කාලීනව නැවත ප්‍රසම්පාදනය කළ යුතු නම්, ජා.ජ.ජ.ප.ම. එම කොටස් වෙන් වෙන් වශයෙන් වූ වත්කම් වශයෙන් හඳුනාගෙන එම වත්කම් වල නිශ්චිත ඵලදායී ජීවිත කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේම, පූර්ණ පරීක්ෂාවක් සිදුකළ විට, හඳුනා ගැනීම් නිර්ණායකයන් සම්පූර්ණ කරන්නේ නම්, එහි පිරිවැය පිරියත හා උපකරණ ඉදිරියට ගෙන යන ලබන මුදලක් ලෙස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියළුම අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලාභ හෝ අලාභ සඳහා දරන ලද වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව, යලි වත්කම් භාවිතයෙන් ඉවත් කිරීම සඳහා දැරීමට සිදුවේ යැයි අපේක්ෂිත පිරිවැයෙහි වර්තමාන අගය, වෙන් කිරීම් සිදුකිරීමට අදාල නිර්ණායකයන්ට අනුකූල වන්නේ නම්, අදාල වත්කම් පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

### 3.1.1 ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය පදනම් කර ගෙන අදාල වත්කම් පහත සඳහන් පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

| දේපල පිරියත හා උපකරණ | අනුපාතය |
|---|---|
| ගොඩනැඟිලි හා ව්‍යුහයන් | 1.67% - 2% |
| පිරියත හා පොම්ප උපකරණ | 5% |
| සේවා හා තොග ජල මනු | 10% |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් | 1.67% |
| උපකරණ | 10% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| පරිගණක උපාංග හා ජංගම දුරකථන | 20% - 33.3% |
| මෝටර් රථ | 10% - 20% |
| කල් බදු මෝටර් රථ | 14.3% |

### 3.1.2 ආයෝජන දේපල

දේපලක පරිහරණය අයිතිකරුගෙන් වෙනත් පාර්ශවයක් වෙත මාරුවන අවස්ථාවේදී ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කරනු ලබන අතර එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර අගය කරනු ලැබේ.

### 3.1.3 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍ර දිනට ප්‍රාග්ධනිත නොකරන ලද හා වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්නුම් කරනු ලබන අතර වර්ෂය තුළ ප්‍රාග්ධනිත කරන ලද හා භාවිතයට ගනු ලබන වත්කම් දේපල, පිරියත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

### 3.1.4 කල්බදු

කල්බද්ද ආරම්භයේදී නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතා කිරීමේ අයිතිය ප්‍රමාණවත් ලෙස පැවරීම සම්බන්ධව ඇතිකරගනු ලබන එකගතාවය හෝ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවකදී පවා වත්කම් භාවිතා කිරීමට එකගවීම මගින් කල් බද්දක් පවතීද නැද්ද යන්න තීරනය වේ

### 3.1.5 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගනු ලබන අස්පෘශ්‍ය වත්කම්වල අගය මූලිකව පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් වල අගය, සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයන් ඇත්නම් එම අගයන් අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ. අභ්‍යන්තරව ජනනය කරනු ලබන අස්පෘශ්‍ය වත්කම්, ප්‍රාග්ධනගත කරන ලද සංවර්ධන වියදම් හැර, ප්‍රාග්ධනික නොකරන අතර, එම වියදම්, වියදම් දරන ලද වර්ෂයේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ.

### 3.1.6 පර්යේෂණ හා සංවර්ධන පිරිවැය.

පර්යේෂණ පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි. ජා.ජ.ජ.ම. විසින් පහත දැ සම්පූර්න වන්නේ නම් පමනක්, තනි ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද සංවර්ධන පිරිවැය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි එසේ හදුනා ගනුයේ,

- වත්කමක් විකිණීමට හෝ භාවිතයට ගත හැකි වන පරිදි තාක්ෂණික ශක්‍යතා මට්ටමක් සම්පූර්ණ කර ඇති අස්පෘශ්‍ය වත්කම්.
- විකිණීමට හෝ භාවිතයට ගත හැකි බව පෙන්නුම් කර ඇති සහ සම්පූර්ණ කිරීමට අදහස් කර ඇති වත්කම්,
- අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ලබන්නේ කෙසේද යන බව පැහැදිලි වීම,
- වත්කම සම්පූර්ණ කිරීමට අවශ්‍ය සම්පත් පවතින බව,
- වත්කම් සංවර්ධනය කිරීමේදී දරන ලද වියදම් විශ්වාසවන්තව ගණනය කිරීමේ හැකියාව.

සංවර්ධන කටයුතු සඳහා දරන ලද මූලික වියදම් වත්කමක් ලෙස හඳුනාගත් පසුව, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර ඉදිරියට ගෙන යනු ලබයි. සංවර්ධන කටයුතු අවසන් කර අදාල වත්කම භාවිතයට ගන්නා අවස්ථාවේ සිට ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන අතර වත්කමේ ඵලදායි ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය විකුණුමේ පිරිවැය තුළ දක්වනු ලබන අතර වත්කම සංවර්ධනය කරනු ලබන කාලය තුළ අගය අඩුවීම් පිළිබඳ පරීක්ෂාවන්ට වාර්ෂිකව භාජනය කරනු ලබයි.

### 3.1.7 මූල්‍ය නොවන වත්කම්වල අගය අඩුවීම

ජා.ජ.ජ.ප.ම. වත්කම්වල අගය හානිවීමක් පෙන්නුම් කරන්නේ දැයි හඳුනා ගැනීම සඳහා සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරුවක් කරනු ලබයි. අගය අඩුවීමක් පෙන්නුම් කරනවිට හෝ වත්කම් සඳහා වාර්ෂික අගය අඩුවීම් පරීක්ෂාවක් අවශ්‍යවිට ජා.ජ.ජ.ප.ම විසින් අදාල වත්කම් අයකර ගත හැකි වටිනාකමට තක්සේරු කරනු ලැබේ. වත්කමකින් මුදල් ජනනය කිරීමක් සිදු නොවන්නේ නම්, එම වත්කම් අනෙකුත් වත්කම් හෝ වත්කම් වර්ගයකින් බොහෝ දුරට ස්වායීනව පවතින අවස්ථා වලදී හැර වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක (cash generating unit) අයකර ගත හැකි වටිනාකම අතිරික්ත වන විට එහි සාධාරණ අගයෙන් බැහැර කිරීමේ පිරිවැය අඩුකර එක් එක් වත්කමේ භාවිතා කිරීමේ අගය තීරණය කරනු ලබයි. වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම එහි අයකර ගත හැකි අගයට වඩා වැඩි වන විට, එය අගය අඩුවීමක් ලෙස සලකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා හරිනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තීරණය කිරීමේදී වත්කමක ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයෙහි වර්තමාන අගය , වර්තමාන වෙළඳපළ වටිනාකම තක්සේරු කළ හැකි මුදලේ කාල වටිනාකම සහ වත්කමට ආවේනික වූ අවදානම් තත්ත්වය පිළිබිඹු කරණ බදු පෙර වට්ටම් අනුපාතයත් මත වට්ටම් කර තීරණය කරනු ලබයි. සාධාරණ අගය ගණනය කිරීමේදී විකිණීම සඳහා දැරිය යුතු පිරිවැය අඩුකරනු ලබන අතර, විස්තර ඇත්නම් ඒ සඳහා මෑතකදී කරනලද ගනුදෙනු වල විස්තර පදනම් කර ගනු ලැබේ. එවැනි ගනුදෙනු වල විස්තර නොමැතිනම්, සුදුසු තක්සේරු කිරීමේ පදනමක් යොදා ගනු ලැබේ.

### 3.2.1 තොග

පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ ක්‍රමය මත සහ හානිවූ හා සෙමින් චලනය වන තොග සඳහා සාධාරණ වෙන්කිරීම් කළ පසු, තොග භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකින් වඩා .අඩු අගයට තක්සේරු කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකුණු ලබන මිලෙන්, එම භාණ්ඩ නිම කිරීමට ඇස්තමේන්තු කරන ලද පිරිවැය සහ විකිණීම සිදුකිරීම සඳහා දැරීමට සිදුවේයැයි ඇස්තමේන්තු කරන ලද පිරිවැය අඩුකර ශුද්ධ උපලබ්ධි අගය තීරණය කරනු ලැබේ.

**තොග මැනීම**

### 3.2.2 තොග පිරිවැය

**අමු ද්‍රව්‍ය**

ගැණුම් පිරිවැය හා යම්කිසි දැරීමට සිදුවිය හැකි පිරිවැය ඇතුළුව.

**අනෙකුත් තොග**

හරිත කළ සාමාන්‍ය මිල මත

### 3.3. මුදල් හා මුදලට සමාන වත්කම්

අතැති මුදල් , බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන වලින් ගෙවීමට ඇති බැංකු අයිරාවක් අඩුකළ පසු වටිනාකමින් මුදල් හා මුදලට සමාන වත්කම් සමන්විත වේ.

## 4. වගකීම්, වෙන්කිරීම් සහ ස්කන්ධය

### 4.1. විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම්

### 4.1.1 විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම් (ශ්‍රීලංගිප්‍ර 19)

**අ) ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS-19) අනුකූල වන පරිදි සෑම සේවකයෙකුගේම සේවා කාලයෙහි ආරම්භක වර්ෂයේ සිට පාරිතෝෂික සඳහා වෙන්කිරීම් කරනු ලැබේ.

ආ) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

ජා.ජ.ජ.ප.ම. නම් කරන ලද ප්‍රතිලාභ සැලසුමක් ක්‍රියාත්මක කරනු ලැබේ. නම් කරන ලද සැලසුම යටතේ කරනු ලබන වෙන්කිරීම් ඇස්තමේන්තුගත ඒකක බැර ක්‍රමය (Projected Unit Credit Method ) භාවිතා කරමින් තීරණය කරනු ලබයි. ප්‍රතිලාභ සැලසුමෙහි ආයුගණක (Actuarial ) ලාභ සහ පාඩු එය ඇතිවූ කාල පරිච්ඡේදයේදී අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ සම්පූර්ණයෙන් හඳුනා ගනු ලැබේ. මෙම ආයුගණක ලාභ සහ පාඩු වහාම රඳවාගත් ඉපයීම් වලින් හඳුනාගන්නා අතර පසු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස වර්ගීකරණය කරනු නොලැබේ.

ප්‍රතිලාභ සඳහා හිමිකම ලබන කාල පරිච්ඡේදය වෙනුවෙන් හිමිකම් නොලබන කාල පරිච්ඡේදයේදී දරන ලද ඉකුත් සේවා වියදම්, වියදම් ලෙස හඳුනාගෙන සරල මාර්ග ක්‍රමයකයට සාමාන්‍ය කාලය තුළ ලියා හරිනු ලැබේ. ප්‍රතිලාභ සඳහා දැනටමත් හිමිකම් ලබන්නේ නම්, ඉකුත් සේවා වියදම්, විශ්‍රාම සැලසුමේ සඳහන් පරිදි හෝ සැලසුමට කරන වෙනස් කිරීමක් ලෙස වහාම හඳුනාගත යුතුය.

නම් කරන ලද ප්‍රතිලාභ බැදීම්වල වර්තමාන අගයෙන් ( උසස් තත්ත්වයේ සංස්ථා බැඳුම්කර පදනම් කර ගත් මට්ටම් අනුපාතයක් යොදා ගණනය කරන ලද ) හඳුනා නොගත් ඉකුත් සේවා වියදම් හා සැලසුම්කරණය කරන ලද වත්කම් වල සාධාරණ අගයෙන් නිරවුල් කළ යුතු බැදීම් අඩු කළ පසු වටිනාකම් වලින්, නම් කරන ලද ප්‍රතිලාභ වත්කම් හා වගකීම් සමන්විත වේ.

ඇ) නම් කරන ලද දායකවීමේ සැලසුම් -සේ.අ.සා හා සේ.නි.භා.අ

සේවක අර්ථ සාධක සේවක භාරකාර අරමුදල දක්වා ඇති නියමයන්ට හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකවීම සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. දළ සේවක ඉපයීම් වලින් 12 % ක් හා 3% ක් මණ්ඩලය විසින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවනු ලබයි.

**4.2 වෙන්කිරීම**

පොදු කරුණු

අතීත සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස ජා.ජ.ජ.ම. වර්තමානයේදී මුහුණදීමට ඇති බැදීම් ( නීතිමය හෝ වටහාගත හැකි ආකාරයට ) සඳහා වෙන්කිරීම් කරනු ලබන අතර වෙන්කිරීම් සඳහා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ හා වගකීම් ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පවතී. ජා.ජ.ජ.ප.ම. වෙන් කිරීම් වලින් කොටසක් හෝ සම්පූර්ණ ප්‍රමාණයම ප්‍රතිපූරණය කිරීමට අදහස් කරන්නේ නම් (උදා:- රක්ෂණ ඔප්පුවක් මත ) ප්‍රතිපූර්ණය කරනු ලබන ප්‍රමාණය සත්‍ය වශයෙන්ම තහවුරු කර ගත හැකි නම්, වෙන්කිරීම් වලින් ප්‍රතිපූර්ණයන් අඩුකළ පසු අගය ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ.

**4.3 රජයේ ආධාර**

රාජ්‍ය ආධාර ලැබෙන බවට සාධාරණ තහවුරුවක් ඇතිවීම සහ ආධාර ලැබීමට අවශ්‍ය කොන්දේසි සපුරා ඇති විට අදාල රජයේ ආධාර හඳුනා ගනු ලැබේ. රජයේ ආධාර වියදම් අයිතම හා සම්බන්ධවීම එම වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාලව ක්‍රමානුකූල පදනමක් මත වියදමට විලම්භිත වන පරිදි ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. රජයේ ආධාර වත්කමක් හා සම්බන්ධ වන විට, අදාල වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ගණනය කරනු ලබන අගයකින් ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මූල්‍ය නොවන ආධාර ලැබුණු විට, අදාල වත්කම හා ආධාර නාමික අගය මත සටහන් කර, එම වත්කම උපයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ වත්කමේ අපේක්ෂිත ඵලදායි ජීවිත කාලය තුළදී සමාන වාරික වශයෙන් ලාභයට හෝ අලාභයට ගලපනු ලබයි. රජය විසින් හෝ රජයට සම්බන්ධ ආයතන විසින් ණය හෝ සමාන ආධාර ප්‍රදානය කළ විට ගෙවිය යුතු පොලී අනුපාතය වෙළඳපළ පොලී අනුපාතයට වඩා අඩුනම් වෙනස රජයේ ආධාරයක් ලෙස සලකනු ලැබේ.

**5. ආදායම් ප්‍රකාශය**

ජා.ජ.ජ.ප.ම. කාර්ය සාධනයේ මූලිකාංග ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කරන බැවින් කාර්යගත වියදම් ක්‍රමය ( Function of Expenses ) ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා යොදා ගන්නා ලදි.

### 5.1.1 ආදායම් හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන කාල පරිච්ඡේදය නොසලකා ජා.ජ.ජ.ප.ම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම් ලැබීම් විශ්වාසවන්තව මැනිය හැකි බව පදනම් කර ගෙන ආදායම් හඳුනාගනු ලැබේ. ගිවිසුම් මගින් තීරණය කර ඇති ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවන් වල සාධාරණ අගය මත ආදායම් හඳුනාගනු ලැබේ. ආදායම් හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ.

**භාණ්ඩ විකිණීම**

භාණ්ඩ වල අයිතියට අදාල අවදානම් හා ප්‍රතිලාභ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ගැණුම්කරුවට පවරා ඇති විට, සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදී ඇති විට භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනා ගනු ලැබේ.

**ජලය විකිණීම**

ජල මනු කියවා දින 30 ක කාලසීමාවක් තුල පාරිභෝගිකයකු විසින් පාරිභෝජනය කරනලද ජල ඒකක ප්‍රමානය පරිගනක පද්ධතියේ යාවත්කාලීනවූ පසු ජලය විකිණීම ආදායමක් ලෙස හඳුනා ගැනේ.

**අනෙකුත් ආදායම්**

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**පොලී ආදායම්**

සැම මූල්‍ය වත්කමක්ම ක්‍රමක්ෂය කළ වටිනාකම මත අගය කරන අතර පොලී ආදායම් හිමි මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ග කෙරේ. පොළී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් සටහන් කරන අතර මූල්‍ය වත්කමේ ඵලදායි ජීවිත කාලය තුළ හෝ උචිත වන පරිදි ඊට කෙටි කාලයක් තුළ වත්කමෙන් ඉපයීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රමානයන් මත ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රමානයන් නිශ්චය මට්ටම් කරනු ලබන අනුපාතය EIR ලෙස හැඳින්වේ. පොලී ආදායම මූල්‍ය ආදායම් ලෙස ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

**නැවත අයකළ හැකි වැඩ**

ස්ථාවර මිල කොන්ත්‍රාත් මගින් ලැබෙන ආදායම්, ප්‍රතිශත නිම කිරීම් ක්‍රමය පදනම් කර ගෙන කරන ලද වැඩ ප්‍රමාණය අනුව ගණනය කරනු ලැබේ.

### 5.1.2 වියදම්

වර්ෂයේ ලාභය හෝ අලාභය තීරණය කිරීම සඳහා ව්‍යාපාරය පවත්වාගෙන යාමට දරනු ලබන වියදම් ආදායමට ලියාහරිනු ලබයි. අළුත්වැඩියා හා අළුත් කිරීමේ ගාස්තු වියදම දරන ලද වර්ෂයේ ලාභයට හෝ අලාභයට ලියාහරනු ලබයි.

### 5.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පරමාර්ථයෙන් වාර්තා කරන දිනට වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන වටිනාකම හා එම වත්කම් හා වගකීම්වල බදු පදනම අතර ඇති වන තාවකාලික වෙනස්කම් වල බදු බලපෑම සඳහා වන වෙන්කිරීම්, වගකීම් ක්‍රමය ( Liability Method ) අනුව සිදුකරනු ලබයි. පහත අවස්ථා වලදී හැර බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා වන විලම්බිත බදු වගකීම් හඳුනා ගනු ලබයි. ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන අවස්ථාවලදී කීර්තිනාමය හෝ වත්කමක් හෝ වගකීමක් මත පැන නගින විලම්බිත බදු වගකීම් එම ගනුදෙනු සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට බලපෑමක් නොවන විට,

විලම්භිත බදු වත්කම් සැම අඩුකළ හැකි තාවකාලික වෙනස්කමක් මතම හඳුනා ගන්නා ආකාර භාවිතා නොකළ බදු බැර සහ භාවිතා නොකළ බදු අලාභ ඒවා ගැලපීමට අවශ්‍ය බදු අයකළ හැකි ආදායම් ඇති වන තුරු ඉදිරියට ගෙන යනු ලබයි. එසේ වුවත් පහත කරුණ අදාල නොවේ.

අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් පැනනගී ඇත්තේ ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවුණු වත්කමක් හෝ වගකීමක් මත සහ අදාල ගනුදෙනුව සිදුවන විට එය ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට බලපෑමක් නොවන විට.

පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන සහ බද්ධ ව්‍යාපාර වල පොලී යන විෂයන් මත ඇති වන අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් හා සම්බන්ධ විලම්භිත බදු එම තාවකාලික වෙනස්කම් පුරෝකථනය කළ හැකි අනාගත කාල පරිච්ඡේදයක් දක්වා

ඉදිරියට ගෙන යා හැකි විට සහ එම තාවකාලික වෙනස්කම් හිලව් කිරීම සඳහා බදු අයකළහැකි ලාභයක් ලැබේ නම් පමණක් විලම්භිත බදු ලෙස හඳුනා ගනු ලැබේ.

එක් එක් වාර්තාකරණ දිනයේදී ඉදිරියට ගෙන එනලද විලම්බිත බදු වලින් කොටසක් හෝ සම්පූර්ණයෙන් අයකර ගැනීමට ප්‍රමාණවත් බදු අයකළ හැකි ආදායමක් ආදායම් ලැබිය හැකි ප්‍රමාණය දක්වා විලම්භිත බදු වත්කම් අඩු කරනු ලැබේ. එක් එක් වාර්තා කරන දිනයේදී එළඹෙන හඳුනානොගත් බදු වත්කම් පිළිබඳ නැවත තක්සේරු කරන අතර, අනාගතයේදී ඉපයිය හැකි බදු අයකළ හැකි ආදායමෙන් අදාල විලම්බිත බදු වත්කම් හිලව් කළ හැකි ප්‍රමාණය අනුව විලම්භිත බදු වත්කම් අගය කරනු ලැබේ. විලම්බිත බදු වත්කම් වර්ෂය තුළදී උපලපබ්ධි වන විට හෝ වගකීම් නිරවුල් කරන විට අදාල කර ගැනීමට අපේක්ෂිත පනවා ඇති හෝ ප්‍රමාණවත්ව පනවා ඇති බදු අනුපාතයන් (බදු නීතිය ) අනුව විලම්බිත බදු වත්කම් හා වගකීම් හඳුනා ගනු ලැබේ.

බාහිර ලාභ හෝ අලාභ මත හඳුනාගත් විලම්බිත බදු, බාහිර ලාභ හෝ අලාභ ලෙස හඳුනාගනු ලබයි. අදාල වන ගනුදෙනුවලට ඇති සම්බන්ධතාවය මත විලම්බිත බදු අයිතමයන් විස්තිරණ ආදායම් ප්‍රකාශය තුළ හෝ සෘණ ස්කන්ධය යටතේ දක්වනු ලැබේ.
විලම්බිත බදු එකම ආයතනයට අදාල වන විට එකම බදු අධිකාරියක් යටතේ පවතින විට සහ වර්තමාන බදු වත්කම් වර්තමාන ආදායම් බදු වගකීම් සමඟ එකිනෙකට හිලව් කිරීමට නීතිමය බලයක් ඇති නම් එකිනෙකට හිලව් කළ හැක.

## 6. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම හා පසුව අගය කිරීම

### 6.1 මූල්‍ය වත්කම්

#### 6.1.1 මූලික හඳුනාගැනීම හා අගය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS-39) සඳහන් විෂය පථයට අදාලව ලාභ හෝ අලාභ මගින් ඇතිවන, සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතුදෑ, පරිනතවීම දක්වා තබාගෙන ඇති ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් උචිත වන පරිදි සාධාරණ අගය මත මූලිකව මූල්‍ය වත්කම් ලෙස වර්ගී කරණය කරනු ලබයි. වත්කම් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නොදැක්වෙන විට වත්කම්වල සාධාරණ අගයට වත්කම් හුවමාරු පිරිවැය ඇතුළත් කොට මූලික අවස්ථාවේදී හඳුනාගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මූල්‍ය වත්කම් වලට, මුදල් හා කෙටි කාලීන ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ, සේවක ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ ඇතුළත් වේ.

#### 6.1.2 පසුව අගය කිරීම

මූල්‍ය වත්කම් වල අගය පසුව හඳුනා ගැනීම පහත සඳහන් පරිදි එම වත්කම් වල වර්ගීකරණය මත තීරණය වේ.

##### 6.1.2.1 ලාභ හෝ අලාභ මගින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මගින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් වලට, විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මගින් ඇති වන සාධාරණ අගයට මූලිකව හඳුනාගත් සහ නම් කරනු ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. විකිණීමේ පරමාර්ථයෙන් හෝ අත්පත් කර ගත් සහ නුදුරු අනාගතයේදී නැවත මිලට ගනු ලබන මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. 2016 හා 2015 දෙසැම්බර් 31 දිනට ජා.ජ.ජ.ප.ම. සතුව ලාභ හෝ අලාභ මගින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් නොතිබුණි.

##### 6.1.2.2 ණය හා ලැබිය යුතු දෑ

සක්‍රිය වෙළඳපලකදී ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ගණයට ණය හා ලැබිය යුතු දේ අයත් වේ. මෙවැනි වත්කම් මූලිකව අගයකළ පසු, සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් අගය අඩුවීම් සඳහා ගැලපීම් කර, අයකරනු ලබන වටිනාකම තීරණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී දරන ලද වියදම් ලැබුණු වට්ටම් හෝ ගෙවූ අධිමිල සහ පිරිවැය හා ගාස්තු EIR හි මූලිකාංග වේ. EIR අගය මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායම යටතේ පෙන්නුම් කරනු ලබන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

##### 6.1.2.3 කල්පිරෙනතුරු තබා ගන්නා ආයෝජන

ජා.ජ.ජ.ප.ම. කල්පිරෙන තුරු තබා ගැනීමට ධනාත්මක ඇල්මක් හා හැකියාවක් තිබෙන විට, ව්‍යුත්පන්න නොවන ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කරන මූල්‍ය වත්කම් කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන ලෙස වර්ග කෙරේ.මූලික අගය කිරීමෙන් පසුව, කල්පිරීම දක්වා තබා ගන්නා ආයෝජන , එහි අගය අඩුවීම් ගලපා සඵල පොලිය පදනම් කර ගෙන ක්‍රමක්ෂය

වටිනාකමට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම්, ලැබුණු වට්ටම හෝ ගෙවූ අධි මිල සහ පිරිවැය හා ගාස්තු සඵල පොලී අනුපාතයෙහි මුලිකාංග වේ. EIR මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායමක් ලෙස පෙන්නුම් කරන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

### 6.1.2.4 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

ස්කන්ධය හා ණය සුරකුම් විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන වලට ඇතුළත් වේ. විකිණීම සඳහා නොවන සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට දක්වා නොමැති අයිතම ස්කන්ධ ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලබයි. ද්‍රවශීල අවශ්‍යතා සහ වෙළඳපොළ තත්ත්වයෙන් වෙනස්වීම් වලට අනුගතවීම සඳහා අවිනිශ්චිත කාලයක් තබා ගැනීමට අපේක්ෂා කරන ආයෝජන ණය සුරකුම් පත් ලෙස වර්ග කෙරේ. මූලික අගය කිරීමෙන් පසුව, විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන නැවත අගය කිරීම එම වත්කම් වල දක්වා සාධාරණ වටිනාකම මත සිදුකරයි. උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු විස්තිර්ණ ආදායම් ලෙස හඳුනා ගැනේ.

### 6.1.2.5 හඳුනාගැනීම් ඉවත් කිරීම ( Derecognition)

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක අදාල වන කොටස හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක අදාල වන කොටස් ) පහත අවස්ථාවලදී හඳුනා ගැනීම ඉවත් කරනු ලබයි. එනම්

(i) වත්කමක කාලය ඉකුත් වී මුදල් ප්‍රවාහයන් ලැබීම අයිතිය තිබෙන විට

(ii) ජා.ජ.ජ.ප.ම. වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය හෝ ලැබෙන මුදල් ප්‍රමාණයන් ප්‍රමාණාත්මක කාල පමාවකින් තොරව තුන්වන පාර්ශ්වයන් වෙත ප්‍රේෂණය කිරීම. (Pass Through ) ගිවිසුම් යටතේ කළ යුතු බවට උපකල්පනය කරන විට එසේත් නැත්නම්,

(අ) ජා.ජ.ජ.ප.ම. වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා ඇති විට, හෝ

(ආ) ජා.ජ.ජ.ප.ම. විසින් වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා නැති අවස්ථාවල අදාල වත්කම් වල පාලනය පවරා ඇතිවිට.

### 6.1.2.6 මූල්‍ය වත්කම් වල හානිකරණය

එක් එක් වාර්තාකරණ දිනට ඇති මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීම පිළිබඳ අරමුණු ගත සාක්ෂි තිබේ දැයි ජා.ජ.ජ.ප.ම. විසින් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය මූලික හඳුනාගැනීමෙන් පසුව, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය හෝ අනාගත මුදල් ප්‍රවාහයක අඩුවීම කෙරෙහි බලපාන එක් සිද්ධියක් හෝ සිද්ධීන් කිපයක් ඇති විය හැකි බව විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් එම වත්කම් වල අගය අඩුවන බව හා එසේ ඇතිවන බව නිගමනය කරනු ලබයි.

ණයගැතියන් හෝ ණයගැති කණ්ඩායම් වල ප්‍රමාණාත්මක මූල්‍ය දුෂ්කරතාවයන්, ණය ගෙවීම් පැහැර හැරීම හෝ යුතුකම් ඉටු නොකිරීම, වෙන්වීමට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයන් සිදුකිරීමට නියමිතව තිබීම, සහ ගෙවීම් පැහැර හැරීම හා සම්බන්ධතාවයක් ඇති ආර්ථික තත්ත්වයන් හා හිඟ ණය වාරික වැඩිවීම යනාදි සම්බන්ධිත කරනු මඟින් පෙන්නුම් කරන අනාගත ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය ප්‍රවාහයන් වල ගණනය කළ හැකි අඩුවීම් හානිකරණයට අයත් අගය අඩුවීම් හා සාක්ෂි වලට ඇතුළත් විය හැකිය.

### 6.1.2.7 ක්‍රමක්ෂය වටිනාකමට පෙන්නුම් කරනු ලබන මූල්‍ය වත්කම්

හානිකරණ අගය මත ඉදිරියට ගෙන ආ මූල්‍ය වත්කම් සම්බන්ධව, පවතින අගය අඩුවීමේ සාක්ෂි තනි තනි මූල්‍ය වත්කම් සම්බන්ධව සලකා ලබන විට ප්‍රමාණවත්ද යන බව හෝ තනි තනි මූල්‍ය වත්කම් සම්බන්ධව ප්‍රමාණවත් නොවන විට මූල්‍ය වත්කම් කාණ්ඩයක් හා සම්බන්ධව ප්‍රමාණාත්මක වේද යන බව ජා.ජ.ජ.ප.ම. තක්සේරු කරනු ලබයි. ජා.ජ.ජ.ප.ම. නිශ්චය කරන ලද තනිව අගය කරන ලද මූල්‍ය වත්කම් වල අගය අඩුවීම පිළිබඳ අරමුණුගත් සාක්ෂි නොමැති නම්, ඒවා ප්‍රමාණාත්මක වුවද ප්‍රමාණාත්මක නොවුවද , එම වත්කම් එක හා සමාන ණය අවදානම් සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය කර සාමුහිකව අගය අඩුවීම තක්සේරු කරනු ලබයි. අගය අඩුවීම පිළිබඳ තනිතනිව අගය කරන ලද වත්කම්වල අගය අඩුවීමේ අලාභයන් ඇතිවීම හෝ දිගින් දිගටම පවතී යයි. නිශ්චය කරන විට වත්කම් සාමුහිකව වර්ගීකරණය කර අගය අඩුවීමේ අලාභයක් ඇති විට හෝ දිගින් දිගටම පවතී යයි නිශ්චය කරන විට වත්කම් සාමුහිකව වර්ගීකරණය කර අගය අඩුවීම තක්සේරු නොකරයි .

අගය අඩුවීමේ අලාභයක් දරා ඇති බවට අරමුණුගත සාක්ෂි තිබේ නම්, වත්කමේ ඉදිරියට ගෙන ආ ශේෂය සහ වත්කමෙන් ඉපයීම අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහනයන්ගේ ශුද්ධ වර්තමාන අගය දැනටමත් දරා නොමැති අපේක්ෂිත බැර අලාභයන් ඇතුළත් නොකරන ලද අතර වෙනසක් පවතී නම් අගය අඩුවීම් අලාභයක් ලෙස හඳුනාගනු ලැබේ. අපේක්ෂිත අනාගත

**මූල්‍ය ප්‍රකාශන වලට සටහන්**
2016 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහයන්ගේ ශුද්ධ වර්තමාන අගය මුල්යල වත්කමට අදාලව මුලින් තිබුණු සඵල පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. එක් එක් ණය කණ්ඩයක් සඳහා නිශ්චිත අගය අඩුවීම් 2016 වර්ෂය තුළදී සාධනය කර ඇත.

## 6.2 මූල්‍ය වගකීම්

**මූලික හඳුනාගැනීම හා අගය කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි සඳහන් විෂය පථයට අනුව, මූල්‍ය වගකීම්, සාධාරණ අගය, ක්‍රමක්ෂය පිරිවැය හෝ ඵලදායී ලෙස සැලසුම් කරන ලද ව්‍යුණත්පන්න මෙවලම් අනුව සුදුසු පරිදි අගය කරනු ලබයි. ජා.ජ.ජ.ප .ම. මූල්‍ය වගකීම් එහි මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මුලිකව සාධාරණ අගය මත හඳුනාගනු ලබන අතර ණය හා ණය ගැනීම් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලබන අතර මෙයට ගනුදෙනු සඳහා සෘජුවම අදාල වන පිරිවැය ඇතුළත් කරනු ලබයි. ජා.ජ.ජ.ප.මණ්ඩලයෙහි මූල්‍ය වගකීම් වලට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වියදම් ඇතුළත් වේ.

**පසුව අගය කිරීම :**

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය අගයට පසුව අගයට කරනු ලබයි.

**හඳුනාගැනීම් ඉවත් කිරීම :**

මූල්‍ය වගකීම් ඒවායෙහි වගකීම් නිදහස් කල විට හෝ අවලංගු කල විට හෝ කල් ඉකුත් වූ විට හඳුනාගැනීම ඉවත් කරනු ලබයි.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **7. අයභාරය** | | | |
| මනුගත විකුණුම් | | **20,991,185,049** | 18,102,363,486 |
| තොග විකුණුම් | | **238,030,488** | 204,211,966 |
| බවුසර් සැපයුම් | | **88,515,542** | 66,967,315 |
| ප්‍රධාන මෙහෙයුමෙන් වූ ආදායම | 7.1 | **2,266,996,408** | 1,878,909,704 |
| | | **23,584,727,487** | 20,252,452,471 |
| **7.1 ප්‍රධාන මෙහෙයුම් ආදායම්** | | | |
| ජල සම්බන්ධන හා අනෙකුත් මෙහෙයුම් ආදායම් | | **2,628,868,117** | 2,185,668,708 |
| ප්‍රාග්ධන ආවරන ආදායම | | **766,302,051** | 668,431,101 |
| නව ජලසම්බන්ධන සඳහාවූ වියදම් | | **(1,128,173,760)** | (975,190,105) |
| | | **2,266,996,408** | 1,878,909,704 |
| **8. විකුණුම් පිරිවැය** | | | |
| සේවක පිරිස් පිරිවැය | | **6,215,488,662** | 5,824,762,465 |
| පොම්ප කිරීමේ පිරිවැය | | **3,833,788,962** | 3,511,913,535 |
| රසායනික ද්‍රව්‍ය | | **692,354,529** | 601,539,437 |
| අළුත් වැඩියා සහ නඩත්තු | | **1,270,587,139** | 1,046,395,799 |
| ආයතනික වියදම් | | **473,717,459** | 432,157,560 |
| ගෙවල් කුලී , වරිපනම් බදු, ආරක්ෂක හා අනෙකුත් වියදම් | | **908,910,549** | 782,394,641 |
| සහනාධාර | | **90,880,043** | 115,790,669 |
| | | **13,485,727,343** | 12,314,954,106 |
| **9. වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| වෙනත් ආදායම් | 9.1 | **1,428,167,676** | 1,037,111,108 |
| කාර්ය මණ්ඩල ණය ප්‍රතිලාභ | | **49,379,029** | 36,617,319 |
| | | **1,477,546,705** | 1,073,728,427 |
| **9.1 වෙනත් ආදායම්** | | | |
| මලාපවහන හා භූගත ජල ආදායම් | | **280,748,461** | 183,051,005 |
| අධිඅය හා දන්ඩන ආදායම් ඇතුළු අනෙකුත් | | **1,147,419,215** | 854,060,103 |
| | | **1,428,167,676** | 1,037,111,108 |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **10. පරිපාලන වියදම්** | | | |
| අළුත් වැඩියා සහ නඩත්තු | | 218,910,020 | 179,200,602 |
| ආයතනික වියදම් | | 635,852,111 | 586,981,952 |
| ගෙවල් කුලී , වරිපනම් බදු , ආරක්ෂක හා වෙනත් වියදම් | | 359,067,735 | 257,943,106 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 10.1 | 5,197,383,263 | 5,310,276,758 |
| ක්ෂය | 10.2 | 2,724,963,394 | 2,168,158,639 |
| විගණන ගාස්තු | | 3,111,696 | 2,963,520 |
| | | 9,139,288,219 | 8,505,524,577 |
| **10.1 කාර්ය මණ්ඩල පිරිවැය** | | | |
| ලබාදුන් සේවක ණය මත සේවක පිරිවැය | | 49,379,029 | 36,617,319 |
| පිරිස් පිරිවැය | | 5,148,004,234 | 5,273,659,439 |
| | | 5,197,383,263 | 5,310,276,758 |
| **10.2 ක්ෂය** | | | |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 948,013,836 | 747,962,228 |
| පිරියත හා යන්ත්‍ර | | 1,193,507,435 | 862,995,349 |
| උපකරණ | | 1,333,925,122 | 1,110,831,372 |
| ලී බඩු සහ සවිකිරීම් | | 39,508,591 | 30,624,548 |
| පරිගනක හා ආශ්‍රිත උපකරණ | | 53,439,105 | 69,851,973 |
| මොටර්වාහන | | 147,096,922 | 105,593,861 |
| | | 3,715,491,011 | 2,927,859,332 |
| අඩු කලා - ප්‍රදාන මගින් මූල්‍යනය වූ වත්කම් වල ක්ෂයවීම් | | (999,478,284) | (773,396,579) |
| අඩු කලා - නැවත අයකරනු ලබන වත්කම් වල ක්ෂයවීම් | | (7,292,317) | (2,547,097) |
| එකතු කලා: කල්බදු වත්කම් ක්‍රමක්ෂය (යලි ප්‍රකාශිත) | | 15,949,142 | 15,949,142 |
| එකතු කලා - අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | | 293,841 | 293,841 |
| | - | 2,724,963,394 | 2,168,158,639 |
| **11. වෙනත් මෙහෙයුම් වියදම්** | | | |
| බොල් හා අඩමාන ණය | | 125,257,676 | 90,254,064 |
| අයකළ නොහැකි සේවක ණය සඳහා වෙන්කිරීම | | 2,472,380 | 2,537,470 |
| කල් ඉකුත් වූ තොග සඳහා අඩි වෙන්කිරීම | | 22,459,422 | (20,344,015) |
| විශ්‍රාම පාරිතෝෂික | | 394,618,174 | 391,422,596 |
| අයභාර ප්‍රදාන | | 135,856,389 | 76,250,931 |
| | | 680,664,041 | 540,121,046 |
| **12. මූල්‍ය ආදායම්** | | | |
| ආයෝජන ආදායම් | | 1,236,278,724 | 1,186,883,970 |
| | | 1,236,278,724 | 1,186,119,227 |
| **13. මූල්‍ය වියදම්** | | | |
| ණය මත පොලිය | 35.2 | 1,670,213,515 | 138,852,812 |
| අඩු කලා - නිර්මාන ව්‍යාපෘතිවල ප්‍රාග්ධනිත කළ පොලිය | | (1,666,931,980) | (135,986,035) |
| | | 3,281,535 | 2,866,777 |
| **14. බදු** | | | |
| ආර්ථික සේවා ගාස්තු | | 63,287,387 | 53,881,978 |
| | | 63,287,387 | 53,881,978 |

## 15. දේපල පිරියත හා උපකරණ

### 15.1 දල ධාරණ අගය

| පිරිවැය | 2016.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය | ගැලපීම් වලට පසු එකතු කිරීම | මාරු කිරීම | ඉවත්කිරීම | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| සින්නක්කර ඉඩම් | 8,324,520,628 | 150,961,687 | (117,172,310) | | **8,358,310,005** |
| කල්බදු ඉඩම් | 589,990,351 | 1,670,000 | (2,120,000) | | **589,540,351** |
| යටිතල පහසුකම් | 5,303,935,498 | 577,519,147 | (167,475,138) | | **5,713,979,507** |
| සින්නක්කර ගොඩනැගිලි | 9,760,298,657 | 1,706,956,830 | (360,690,029) | | **11,106,565,457** |
| ව්‍යුහයන් | 37,879,021,763 | 5,447,871,038 | (120,441,426) | | **43,206,451,374** |
| පිරියත හා පොම්ප උපකරණ | 23,788,288,249 | 4,282,530,893 | 176,142,379 | | **28,246,961,522** |
| සේවා මනු | 18,724,254 | 3,143,323 | (2,428,000) | | **19,439,577** |
| තොග ජල මනු | 454,760,093 | 64,436,369 | (18,336) | | **519,178,126** |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් | 63,698,398,498 | 13,010,221,768 | 486,987 | | **76,709,107,252** |
| ජංගම උපකරණ | 374,525,729 | 93,370,382 | (17,225,703) | | **450,670,409** |
| මැනුම් උපකරණ | 25,412,931 | 7,172,900 | 150,000 | | **32,735,831** |
| රසායනාගාර උපකරණ | 497,385,727 | 93,728,864 | (5,416,991) | | **585,697,600** |
| වෙනත් උපකරණ | 1,438,299,686 | 663,625,285 | (41,149,818) | | **2,060,775,152** |
| ලී බඩු සහ සවි කිරීම් - පරිගණක | 390,055,029 | 132,057,040 | (48,509,686) | | **473,602,383** |
| පරිගණක හා පර්යන්ත උපකරන | 406,714,922 | 67,591,739 | (41,386,182) | | **432,920,480** |
| මෝටර් වාහන - කාර් රථ | 166,230,177 | 78,522,257 | (79,618,250) | (8,290,000) | **156,844,184** |
| වෑන්, බස් හා ජීප් රථ | 425,946,018 | 223,737,869 | (107,262,405) | (8,265,000) | **534,156,481** |
| ලොරි හා ට්‍රක් රථ | 1,482,559,727 | 702,014,158 | (194,551,075) | (10,975,000) | **1,979,047,810** |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | 84,076,211 | 13,396,535 | (7,296,535) | (1,100,000) | **89,076,211** |
| ජල බවුසර් හා බර වාහන | 903,527,677 | 350,670,713 | (120,535,258) | (7,500,000) | **1,126,163,133** |
| මෝටර් සයිකල් | 22,481,868 | 3,332,298 | (1,284,300) | (1,102,715) | **23,427,152** |
| ත්‍රී රෝද රථ | 1,787,620 | 3,000,000 | - | - | **4,787,620** |
| කල් බදු වාහන | 28,975,000 | - | - | - | **28,975,000** |
| **මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටිනාකම** | 156,065,916,314 | 27,677,531,094 | (1,257,802,077) | (37,232,715) | **182,448,412,617** |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| 15.2 ක්ෂය | 2016.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය | වර්ෂය සඳහා ක්ෂය | ගැලපීම් | ඉවත්කිරීම් | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **ක්ෂය** | | | | | |
| **සින්නක්කර වත්කම්** | | | | | |
| සින්නක්කර ඉඩම් - | | | | | **-** |
| කල්බදු ඉඩම් | | | | | **-** |
| යටිතල පහසුකම් | 454,847,936 | 100,337,495 | 20,755,596 | | **575,941,027** |
| සින්නක්කර ගොඩනැගිලි | 954,535,660 | 200,071,834 | 796,112 | | **1,155,403,606** |
| ව්‍යුහයන් | 2,816,345,600 | 647,604,507 | 222,947,939 | | **3,686,898,046** |
| පිරියත හා පොම්ප උපකරණ | 4,320,315,641 | 1,145,707,010 | 204,588,291 | | **5,670,610,943** |
| සේවා මනු | 2,527,821 | 1,824,867 | 9,956,728 | | **14,309,417** |
| තොග ජල මනු | 97,063,120 | 45,975,557 | - | | **143,038,676** |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් | 4,928,273,611 | 1,075,001,244 | 50,165,491 | | **6,053,440,346** |
| ජංගම උපකරණ | 137,747,282 | 36,482,438 | 208,173 | | **174,437,893** |
| මැනුම් උපකරණ | 4,574,440 | 2,728,685 | 54,379 | | **7,357,504** |
| රසායනාගාර | 200,218,868 | 52,711,497 | 12,664,449 | | **265,594,813** |
| වෙනත් උපකරණ | 516,604,703 | 167,001,259 | 1,069,611 | | **684,675,572** |
| ලී බඩු සහ සවි කිරීම් - පරිගණ | 186,338,752 | 39,508,591 | (4,380,412) | | **221,466,931** |
| පරිගණක හා පර්යන්ත උපක | 279,400,671 | 53,439,105 | 1,913,778 | | **334,753,554** |
| මෝටර් වාහන - කාර් රථ | 117,203,770 | 11,164,124 | 20,526,429 | (7,857,020) | **141,037,303** |
| වෑන්, බස් හා ජීප් රථ | 341,159,567 | 8,539,906 | (271,700) | (6,664,250) | **342,763,523** |
| ලොරි හා ට්‍රක් රථ | 343,001,382 | 68,061,023 | (3,145,611) | (5,226,187) | **402,690,607** |
| ට්‍රැක්ටර් සහ ටේලර් | 49,628,401 | 8,030,352 | 1,133,133 | (940,500) | **57,851,386** |
| ජල බවුසර් හා බර වාහන | 179,479,841 | 45,598,522 | (1,156,451) | (2,140,073) | **221,781,839** |
| මෝටර් සයිකල් | 8,286,605 | 1,823,712 | 62,421 | (921,532) | **9,251,206** |
| ත්‍රි රෝද රථ | 611,434 | 173,399 | - | - | **784,833** |
| කල් බදු වාහන | 21,904,640 | 3,705,886 | (20,559,000) | - | **5,051,526** |
| | 15,960,069,746 | 3,715,491,011 | 517,329,356 | (23,749,562) | **20,169,140,551** |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**15. දේපල පිරියත හා උපකරණ**

**15.3 ශුද්ධ පොත් අගය**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| **පිරිවැය** | | |
| සින්නක්කර ඉඩම් | **8,358,310,005** | 8,324,520,628 |
| කල්බදු ඉඩම් | **589,540,351** | 589,990,351 |
| යටිතල පහසුකම් | **5,138,038,479** | 4,849,087,562 |
| සින්නක්කර ගොඩනැගිලි | **9,951,161,851** | 8,805,762,997 |
| ව්‍යුහයන් | **39,519,553,329** | 35,062,676,163 |
| පිරියත හා පොම්ප උපකරණ | **22,576,350,580** | 19,467,972,608 |
| සේවා මනු | **5,130,160** | 16,196,433 |
| තොග ජල මනු | **376,139,450** | 357,696,973 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් | **70,655,666,906** | 58,770,124,887 |
| ජංගම උපකරණ | **276,232,515** | 236,778,447 |
| මැනුම් උපකරණ | **25,378,327** | 20,838,492 |
| රසායනාගාර | **320,102,787** | 297,166,859 |
| වෙනත් උපකරණ | **1,376,099,581** | 921,694,983 |
| ලී බඩු සහ සවි කිරීම් - පරිගණක | **252,135,452** | 203,716,277 |
| පරිගණක හා පර්යන්ත උපකරන | **98,166,925** | 127,314,251 |
| මෝටර් වාහන - කාර් රථ | **15,806,882** | 49,026,407 |
| වෑන්, බස් හා ජීප් රථ | **191,392,958** | 84,786,450 |
| ලොරි හා ට්‍රක් රථ | **1,576,357,201** | 1,139,558,344 |
| ට්‍රැක්ටර් සහ ටේලර් | **31,224,825** | 34,447,810 |
| ජල බවුසර් හා බර වාහන | **904,381,293** | 724,047,836 |
| මෝටර් සයිකල් | **14,175,945** | 14,195,263 |
| ත්‍රි රෝද රථ | **4,002,787** | 1,176,186 |
| කල් බදු වාහන | **23,923,474** | 7,070,360 |
| **දේපල පිරියත හා උපකරණ වල මුළු ධාරන අගය.** | **162,279,272,064** | 140,105,846,568 |

## 15. දේපල පිරියත හා උපකරණ

### 15.4 ආයෝජන දේපල

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය විසින් දැනට ප්‍රයෝජනයට ගෙන ඇති බත්තරමුල්ල සුනිල් මාවතේ ගොඩනැගිල්ල මණ්ඩලය විසින් ඉදිකර ඇති අතර එය ශ්‍රී.ල.ගි.ප්‍ර 40 අනුව ආයෝජන දේපලක් වශයෙන් හඳුනාගෙන ඇත.

මෙම ආයෝජන දේපල දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

| | ඉඩම් | ගොඩනැගිලි | එකතුව |
|---|---|---|---|
| **පිරිවැය** | | | |
| 2016.12.31 දිනට ශේෂය | 138,500,000 | 238,053,034 | 376,553,034 |
| | | | |
| **ක්ෂය** | | | |
| 2016.01.01 දිනට ශේෂය | - | 19,727,050 | 19,727,050 |
| කාලපරිච්ඡේදය සඳහා ක්ෂය | - | 4,761,061 | 4,761,061 |
| 2016.12.31 දිනට ශේෂය | - | 24,488,110 | 24,488,110 |
| **ශුද්ධ පොත් අගය** | **138,500,000** | **213,564,924** | **352,064,924** |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|---|
| **16.** | **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| | පරිගණක මෘදුකාංග | | **7,310,270** | 1,619,633 |
| | | | **7,310,270** | 1,619,633 |

වර්ෂය තුලදී ඉහත සඳහන් මෘදුකාංග සඳහා රු.1,335,127 ක් ක්‍රමක්ෂය ලෙස වෙන් කර ඇත.

| | | | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|---|
| **17.** | **කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ** | | | |
| | ඉදිකිරීම් වැඩ | 35.2 | **155,229,972,659** | 144,212,075,854 |
| | පුනරුත්ථාපන | 35.2 | **3,666,192,550** | 5,200,877,948 |
| | | | **158,896,165,209** | 149,412,953,802 |
| **18.** | **වෙනත් මූල්‍ය වත්කම්** | | | |
| | සේවක නිවාස ණය සඳහා HDFC හි ආයෝජනය. | | **9,810,535** | 15,322,302 |
| | ලංකා බැංකුව ඉතුරුම් - II | | **1,212,528** | 1,164,935 |
| | | | **11,023,063** | 16,487,237 |
| **19.** | **තොග** | | | |
| | පීවීසී වානේ පයිප්ප | | **3,793,823,910** | 3,392,095,366 |
| | ජලමනු හා පිත්තල අයිතම | | **568,961,667** | 743,331,981 |
| | රසායනික ද්‍රව්‍ය | | **122,602,755** | 117,617,218 |
| | විදුලි උපකරණ | | **477,733,511** | 382,799,033 |
| | ගොඩනැගිලි ද්‍රව්‍ය | | **31,037,997** | 49,937,381 |
| | පයිප්ප හා අමතර උපාංග | | **934,006,921** | 903,040,106 |
| | වාහන අමතර කොටස් | | **108,321,976** | 83,096,233 |
| | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | **44,572,040** | 44,692,449 |
| | වෙනත් අයිතම | | **507,209,517** | 420,441,774 |
| | මාර්ගස්ථ තොග | 35.2 | **443,569,646** | 560,028,604 |
| | තොග ගැලපුම් | | **2,555,749** | 2,651,389 |
| | | | **7,034,395,689** | **6,699,731,535** |
| | **අඩුකලා- ප්‍රධාන අමතර කොටස්** | | | |
| | ගබඩාවල තිබෙන දේපල පිරියත හා උපකරණ | | **(293,154,819)** | (261,050,602) |
| | කල් ඉකුත් වූ තොග සඳහා වෙන්කිරීම | | **(54,863,035)** | (32,403,613) |
| | | | **6,686,377,835** | 6,406,277,320 |

# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|---|
| **20.** | **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ** | | | |
| | වෙළඳ ණයගැතියෝ | | 4,607,789,723 | 3,895,171,826 |
| | වෙනත් ණයගැතියෝ | | 302,907,898 | 345,086,098 |
| | අඩුකළා : ණයගැති හානිකරණ | | (1,322,209,166) | (1,197,441,625) |
| | ණයගැති පාලන ගිණුම | | 591,158,421 | 453,509,342 |
| | ලැබිය යුතු එ.අ.බදු | | 331,450,527 | 378,901,522 |
| | ලැබිය යුතු රඳවා ගැනීම් බදු | | 46,931,199 | 34,144,822 |
| | සේවක අත්තිකාරම් | 35.2 | 15,624,539 | 32,660,720 |
| | සේවක ණය | | 1,713,412,289 | 1,788,580,352 |
| | ලැබිය යුතු පොලී හා වෙනත් | | 372,733,981 | 304,061,890 |
| | | | 6,659,799,411 | 6,034,674,947 |
| **21.** | **තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| | අයකරගත හැකි ව්‍යාපෘති වැඩ | | 114,010 | 90,578 |
| | කලින් ගෙවීම් | | 4,539,500 | 1,253,500 |
| | අත්තිකාරම් (යෙදවූ දෑ ඇතුලත්ව) | 35.2 | 26,659,765,475 | 13,005,663,835 |
| | තැන්පතු | | 234,531,755 | 81,988,233 |
| | | | 26,898,950,740 | 13,088,996,146 |
| **22.** | **ආයෝජන** | | | |
| | විකිනීම සඳහා පවතින භාන්ඩාගාර බැඳුම්කර | 7,643,550,000 | | |
| | අඩුකරා-හානිකරණය | (834,864,839) | 6,808,685,161 | 7,643,550,000 |
| | පරිණත දිනය දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර | 35.2 | 3,457,036,783 | 5,201,279,029 |
| | | | 10,265,721,944 | 12,844,829,029 |
| **23.** | **මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| | බැංකුවේ මුදල් | 35.2 | 1,869,822,259 | 2,316,830,961 |
| | ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලැබීම | | 6,529,848,750 | - |
| | ප්‍රධාන කාර්යාලයේ මුදල් අග්‍රිමය | | 2,363,785 | 1,290,751 |
| | ප්‍රාදේශීය මුදල් අග්‍රිමය | | 3,850,690 | 3,473,591 |
| | මාර්ගස්ථ මුදල් | | 344,259,084 | 294,470,231 |
| | නිවේදනිය තැන්පතු | | 3,108,519,601 | 968,700,192 |
| | ඉතිරි කිරිමේ ගිණුම් | | 239,006,742 | 292,152,669 |
| | | | 12,097,670,911 | 3,876,918,395 |
| **24.** | **රජයෙන් අත්පත් කරගත් වත්කම්** | | | |
| | රජයේ දෙපාර්තමේන්තු වලින් අත්පත් කර ගත් වත්කම් | | 185,480,387 | 185,480,387 |
| | | | 185,480,387 | 185,480,387 |
| **25.** | **රාජ්‍ය ස්කන්ධය** | | | |
| | ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය | | 54,910,142,914 | 49,836,439,996 |
| | රාජ්‍ය දායකත්වය (බැඳුම්කර) | | 13,899,983,925 | 13,899,983,925 |
| | | | 68,810,126,839 | 63,736,423,921 |

ප්‍රවර්ථන වර්ෂයට අදාල විදේශ ණය රාජ්‍ය ස්කන්ධයට මාරු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරනයතක් රජය ගන්නා ලදී.

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **26. සේවක සුභසාධන අරමුදල** | | | |
| ආරම්භක ශේෂය | | 16,506,484 | 15,239,298 |
| වර්ෂය තුළ ලැබීම් | | 721,655 | 1,267,186 |
| | | 17,228,139 | 16,506,484 |
| **27. රජයේ ප්‍රදාන** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | | 92,750,876,538 | 90,627,548,649 |
| | | 92,750,876,538 | 90,627,548,649 |
| **28. ප්‍රාග්ධන ප්‍රදාන** | | | |
| විදේශීය ප්‍රදාන | 35.2 | 180,809,157,920 | 164,846,710,175 |
| දේශීය ප්‍රදාන | 35.2 | 983,667,752 | 890,170,183 |
| | | 181,792,825,672 | 165,736,880,359 |
| **29. ගෙවිය යුතු ණය** | | | |
| භාණ්ඩාගාර හරහා ලබාගත්විදේශ ණය | | 15,335,301,002 | - |
| දේශීය ණය | | 20,392,891,592 | 9,412,094,521 |
| | | 35,728,192,594 | 9,412,094,521 |
| දිගුකාලීන ණය වල කෙටිකාලීන කොටස | | 625,822,304 | |
| දිගුකාලීන ණය වල දිගුකාලීන කොටස | | 35,102,370,290 | |
| **30. වෙනත් අසම්භාව්‍යය වගකීම්** | | | |
| විශ්‍රම ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් කිරීම | 29.1 | 4,076,428,515 | 4,076,428,515 |
| ගනුදෙනුකරු හා සේවක ආරක්ෂිත තැම්පතු | | 48,594,971 | 118,930,258 |
| භාන්ඩාගාර බැදුම්කර අත්තිකාරම් වට්ටම් ලැබීම් | | - | 293,729,325 |
| | | 4,125,023,486 | 4,489,088,098 |
| **30.1 විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙ වෙනස්වීම** | | | |
| කාලපරිච්ඡේදය ආරම්භක ශේෂය | | 4,076,428,515 | 2,096,769,746 |
| එකතු කළා - කාල පරිච්ඡේදය සඳහා වෙන්කිරීම් | | 394,618,174 | 2,371,081,365 |
| අඩුකලා - කාල පරිච්ඡේදය තුළ පාරිතෝෂික ගෙවීම | | (394,618,174) | (391,422,596) |
| | | 4,076,428,515 | 4,076,428,515 |
| **31. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ** | | | |
| නැවත අයකර ගත හැකි වැඩ සඳහා ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම් | | 4,039,297,939 | 3,013,472,388 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම් | | 3,666,057,746 | 3,497,975,058 |
| කල් බදු ණය හිමියෝ | | 26,164,355 | 33,822,215 |
| අඩුකලා - අවිනිශ්චිත පොලිය | | (4,382,302) | (8,413,409) |
| ණයහිමි පාලන ගිණුම | | 1,247,126,354 | 1,418,387,592 |
| වෙනත් ණයහිමියෝ | | 101,480,705 | 94,752,654 |
| උපචිත වියදම් | | 504,823,198 | 861,687,410 |
| තැන්පතු | | 72,954,077 | 101,391,187 |
| ගෙවීය යුතු එකතු කළ අගය මත බදු | 35.2 | - | 216,903,937 |
| රඳවා ගැනීම් බදු | | 54,667 | 2,972,264 |
| වැටුප් හා වෙනත් ගෙවිය යුතු දෑ | | 184,565,497 | 183,662,792 |
| කල් බදු මත ගෙවිය යුතු පොලිය | 35.2 | - | 1,129,932 |
| විගණන ගාස්තු | 35.2 | 17,165,616 | 14,053,920 |
| | | 9,855,307,852 | 9,431,797,940 |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 32. විලම්බිත බදු

පහත සඳහන් දෑ වලට අදාල විලම්බිත බදු වත්කම්, වගකීම් හා ආදායම්.

| | ශේෂ පත්‍රය | | ආදායම් ප්‍රකාශය | |
|---|---|---|---|---|
| | **2016** | 2015 | **2016** | 2015 |
| | රු. | රු. | රු. | රු. |
| **විලම්බිත බදු වගකීම** | | | | |
| ප්‍රාග්ධන දීමනා | **8,303,259,328** | 10,232,612,468 | **2,724,963,394** | 2,103,018,287 |
| අප්සෘශ්‍යාය වත්කම් | **293,841** | 453,497 | **(1,335,127)** | (14,376,428) |
| | **8,303,553,169** | 10,233,065,965 | **2,723,628,267** | 2,088,641,859 |
| **විලම්බිත බදු වත්කම** | | | | |
| ණයගැති හානිකරණය | **124,767,541** | 298,860,427 | **12,476,754** | 19,948,692 |
| | **124,767,541** | 298,860,427 | | |
| **විලම්බිත බදු වියදම /(මාරුකිරීම)** | | | **2,736,105,021** | 2,108,590,551 |
| **ශුද්ධ විලම්බිත බදු වගකීම/ (වත්කම)** | **8,178,785,629** | 9,934,205,538 | | |

භාවිතා නොකරන ලද බදු අලාභ පැවතීම අනාගතයේදී බදු අය හැකි ආදායම් නොතිබීම තහවුරු කරන ප්‍රබල සාක්ෂියක් වේ. ජා.ජ.ජ.ප. මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට පැවති සමුච්චිත බදු අලාභය රු.72,526,471,421 ක් විය. ජා.ජ.ජ.ප. මණ්ඩලය ආදායම් බදු ගෙවීම ඉතා අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම්වල විලම්භිත බදු වත්කම්/වගකීම් හඳුනා නොගනී.

**33. සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු**

**රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ ගනුදෙනු.**

මණ්ඩලය විසින් සිදුකරනු ලබන සාමාන්‍ය ගනුදෙනු සමඟ සම්බන්ධිත පාර්ශවයන් සමඟ ද ගනුදෙනු කරනු ලැබේ. ශ්‍රී ලංකා රජය (මණ්ඩලයේ අවසන් බලධාරිකාරිය ලෙස දැන්වෙනු ලබන) විවිධ වූ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සම්බන්ධිත පාර්ශව වලට අයත් වේ. රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන වලට අදාළ තනි තනි වශයෙන් වැදගත් වන සහ තනි තනි වශයෙන් වැදගත් නොවූවද සාමූහික වශයෙන් ගත්කළ වැදගත් වන, මණ්ඩලය විසින් සිදු කරන ලද ගනුදෙනු සහ විධිවිධානයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**34. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

සියලුම ප්‍රමාණාත්මක ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් අවශ්‍ය වන පරිදි මූල්‍ය වාර්තා වල සිදුකර ඒවා අනාවරණය කරනු ලබයි.

**35. පූර්ව වර්ෂ ගැලපීම්**

**35.1** 2007.12.31 දිනට පැවති මණ්ඩලය සතු වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙම ප්‍රත්‍යාගනිත අගයන් 2010 වර්ෂයේදී පොත් වලට ගන්නා ලද අතර මෙම අගයන් මේවන තෙක් ධාරණ අගය ලෙස පොත් වල පවතී. වත්කම් ප්‍රමානය අතිවිශාල වීම නිසා 2010 වර්ෂයේ සිදුවූ යම් අත්හැරීම් හා ද්විගණනය වීම් පූර්ව වර්ෂ ගැලපීම් යටතේ පෙර වර්ෂ වලට බලපාන පරිදි නිවැරදි කර ඇත. මේ අනුව දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගයට වන ශුද්ධ බලපෑම වන රු.මිලියන 176.5 ගලපන ලද අතර 2015.12.31 දිනට ක්ෂය වීම් ලෙස රු.මිලියන 107.2 ක් ගලපන ලදී. මෙයට අමතරව රු.මිලියන 37 ක්ෂයවීම් 2015 වර්ෂයට අදාල ක්ෂයවීම් ලෙස ගලපන ලදී.

**35.1.1 දල ධාරණ අගය**

| පිරිවැය<br>සින්නක්කර වත්කම | 2015.12.31 දිනට ශේෂය<br>රු. | පූර්ව වර්ෂ ගැලපීම<br>රු. | 2015.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය<br>රු. |
|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 8,324,867,378 | (346,750) | 8,324,520,628 |
| කල්බදූ ඉඩම් | 589,990,351 | | 589,990,351 |
| යටිතල පහසුකම් | 5,347,435,498 | (43,500,000) | 5,303,935,498 |
| සින්නක්කර ගොඩනැගිලි | 9,765,531,157 | (5,232,500) | 9,760,298,657 |
| ව්‍යුහයන් | 38,146,967,263 | (267,945,500) | 37,879,021,763 |
| පිරියත හා පොම්ප උපකරණ | 23,788,294,540 | (6,290) | 23,788,288,249 |
| සේවා මනු | 18,724,254 | - | 18,724,254 |
| තොග ජල මනු | 454,760,093 | - | 454,760,093 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් | 63,698,398,498 | - | 63,698,398,498 |
| ජංගම උපකරණ | 374,570,868 | (45,139) | 374,525,729 |
| මැනුම් උපකරණ | 25,412,931 | - | 25,412,931 |
| රසායනාගාර | 498,235,285 | (849,558) | 497,385,727 |
| වෙනත් උපකරණ | 1,438,581,332 | (281,646) | 1,438,299,686 |
| ලී බඩු සහ සවි කිරීම් - පරිගණක | 390,769,462 | (714,433) | 390,055,029 |
| පරිගණක හා පර්යන්ත උපකරන | 408,043,848 | (1,328,926) | 406,714,922 |
| මෝටර් වාහන - කාර් රථ | 157,608,566 | 8,621,611 | 166,230,177 |
| වෑන්, බස් හා ජීප් රථ | 371,276,016 | 54,670,002 | 425,946,018 |
| ලොරි හා ට්‍රක් රථ | 1,404,858,756 | 77,700,970 | 1,482,559,727 |
| ට්‍රැක්ටර් සහ ටේලර් | 83,051,746 | 1,024,465 | 84,076,211 |
| ජල බවුසර් හා බර වාහන | 905,242,049 | (1,714,371) | 903,527,677 |
| මෝටර් සයිකල් | 19,004,107 | 3,477,761 | 22,481,868 |
| ත්‍රී රෝද රථ | 1,787,620 | - | 1,787,620 |
| කල් බදු වාහන | 28,975,000 | - | 28,975,000 |
| **හැකි වත්කම් වල** | 156,242,386,618 | (176,470,304) | 156,065,916,314 |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 35.1.2 ක්ෂය

| සින්නක්කර වත්කම් | 2016.12.31 දිනට ශේෂය | පූර්ව වර්ෂ ගැලපීම් | 2016.12.31 දිනට යළි ප්‍රකාශිත ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සින්නක්කර ඉඩම් | - | | - |
| කල්බදු ඉඩම් | - | | - |
| යටිතල පහසුකම් | 462,397,136 | (7,549,200) | 454,847,936 |
| සින්නක්කර ගොඩනැඟිලි | 954,587,326 | (51,666) | 954,535,660 |
| ව්‍යුහයන් | 2,851,654,410 | (35,308,810) | 2,816,345,600 |
| පිරියත හා පොම්ප උපකරණ | 4,367,517,700 | (47,202,059) | 4,320,315,641 |
| සේවා මනු | 2,527,821 | - | 2,527,821 |
| තොග ජල මනු | 97,063,120 | - | 97,063,120 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් | 4,928,273,611 | - | 4,928,273,611 |
| ජංගම උපකරණ | 137,747,282 | - | 137,747,282 |
| මැනුම් උපකරණ | 4,574,440 | - | 4,574,440 |
| රසායනාගාර | 200,704,459 | (485,591) | 200,218,868 |
| වෙනත් උපකරණ | 521,549,659 | (4,944,956) | 516,604,703 |
| ලී බඩු සහ සවි කිරීම් - පරිගණක | 188,233,944 | (1,895,192) | 186,338,752 |
| පරිගණක හා පර්යන්ත උපකරන | 279,400,671 | - | 279,400,671 |
| මෝටර් වාහන - කාර් රථ | 118,159,199 | (955,429) | 117,203,770 |
| වෑන්, බස් හා ජීප් රථ | 342,924,667 | (1,765,100) | 341,159,567 |
| ලොරි හා ට්‍රක් රථ | 339,008,784 | 3,992,598 | 343,001,382 |
| ට්‍රැක්ටර් සහ ටේලර් | 50,150,782 | (522,381) | 49,628,401 |
| ජල බවුසර් හා බර වාහන | 190,036,214 | (10,556,373) | 179,479,841 |
| මෝටර් සයිකල් | 8,267,700 | 18,905 | 8,286,605 |
| ත්‍රි රෝද රථ | 611,434 | - | 611,434 |
| කල් බදු වාහන | 21,904,640 | - | 21,904,640 |
| **මුළු ක්ෂය වල වටිනාකම** | 16,067,294,999 | (107,225,254) | 15,960,069,746 |

35.2 දේපල පිරියත උපකරණ වලට අදාල පෙර වර්ෂ ගැලපීම් වලට අමතරව පහත සඳහන් අයිතමද පූර්ව වර්ෂ සඳහා බලපාන ලෙස ගලපා ඇත.

| | 2015.12.31 දිනට ශේෂය | පූර්ව වර්ෂ ගැලපීම් | 2015 වර්ෂයට අදාල ගැලපීම් | 2015.12.31 දිනට යළි ප්‍රකාශිත ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | | රු. |
| **කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ (සටහන් 17)** | | | | |
| නිර්මාන වැඩ | 144,446,281,802 | (234,205,948) | | 144,212,075,854 |
| පුනරුත්තාපන | 5,211,203,351 | (10,325,403) | | 5,200,877,948 |
| | 149,657,485,153 | (244,531,351) | | 149,412,953,802 |
| **තොග (සටහන් 19)** | | | | |
| මාර්ගස්ථ තොග | 557,590,430 | 2,438,174 | | 560,028,604 |
| **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන් 20)** | | | | |
| සේවක අත්තිකාරම් | 33,203,391 | (542,671) | | 32,660,720 |
| **තැන්පතු සහ අත්තිකාරම් (සටහන් 21)** | | | | |
| අත්තිකාරම් (යෙදවූ දෑ ඇතුලත්ව) | 13,005,670,673 | (6,838) | | 13,005,663,835 |
| **මුදල් හා මුදල් සමාන දෑ (සටහන් 23)** | | | | |
| බැංකු ශේෂ | 2,317,564,300 | (733,339) | | 2,316,830,961 |
| **ප්‍රාග්ධන ප්‍රදාන (සටහන් 28)** | | | | |
| විදේශීය ප්‍රදාන | 165,066,132,305 | (219,422,130) | | 164,846,710,175 |
| දේශීය ප්‍රදාන | 890,983,392 | (813,209) | | 890,170,183 |
| | 165,957,115,697 | (220,235,338) | | 165,736,880,359 |
| **වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (සටහන් 31)** | | | | |
| ගෙවිය යුතු VAT | 227,329,734 | (10,425,797) | | 216,903,937 |
| 2010-2014 ගෙවිය යුතු විගණන ගාස්තු | 2,963,520 | 11,090,400 | | 14,053,920 |
| | 230,293,254 | 664,603 | | 230,957,857 |
| ගෙවිය යුතු පොලිය | - | 1,129,932 | | 1,129,932 |
| පරිණත දිනය දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර | 5,194,262,510 | 6,251,776 | 764,743 | 5,201,279,029 |
| **කල්බදු වත්කම් ක්‍රමක්ෂය(සටහන් 10.2)** | 47,847,426 | | (31,898,284) | 15,949,142 |

**ක්‍රියාකාරී නොවන වත්කම් හා වගකීම්**

වර්ෂය තුලදී දිගුකල් පරිශේෂවූ ශේෂයන් සැසඳුම්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර සියලු ක්‍රියාකාරී නොවන ශේෂයන් හා දිගුකල් පරිශේෂවූ ඇතැම් ශේෂ වැඩිදුර සැසඳුම් කිරීම වෙනම ගිණුමකට මාරුකර ඇත. මෙහි ශුද්ධ බලපෑම ණය ගැතියන්ට ගලපා ඇති අතර ඊට අදාල පූර්ව වර්ෂ බලපෑම පෙර වර්ෂයට ගලපන ලදී.

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**36. 2016.12.31 දිනට මණ්ඩලය පහත පරිදි ණය සඳහා බැදී ඇත.**

| | Rs. |
|---|---|
| දේශීය බැංකු මූල්‍යනය කරන ලද ණය | 50,436,605,168 |
| විදේශීය බැංකු මූල්‍යනය කරන ලද ණය | 52,304,746,571 |
| **එකතුව** | 102,741,351,739 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඩබ්එස්එස්/ඒ/එන්ඩබ්ලිව්එස්ඩීබී/01/2016
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2018 අප්‍රේල් 11 දින

සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රීලංගිප්‍ර 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි.**

පිරිවැය රු. 391,105,000 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද මෝටර් රථ ඒවායේ ඵලදායී ජීවිත කාලය යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබයි. තවද, ඒ පිලිබඳ ඇස්තමේන්තුගත දෝෂය නිවැරිදි කිරීමට මණ්ඩලය අපොහොසත්ව තිබුණි.

**(ආ) ශ්‍රීලංගිප්‍ර 12 - ආදායම් බදු**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුල විලම්භිත බදු වත්කම් සහ වගකීම් හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට සියලුම අයකල හැකි බදු මත තාවකාලික වෙනස්කම් හා අඩුකල හැකි තාවකාලික වෙනස්කම් හඳුනාගැනීමකින් තොරව විලම්භිත බදු ගණනය කිරිම ට අදාල වූ හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයන් තුල සිදු කර තිබුණි.

**(ඇ) ශ්‍රීලංගිප්‍ර 19 - සේවක ප්‍රතිලාභ**

ජේද අංක 58 හි අවශ්‍යතා අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුල විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ( පාරිතෝෂික ප්‍රතිපාදන) සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි. ඒ වෙනුවට, සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික දීමනා වශයෙන් ගෙවන ලද රු. මිලියන 394.69 කට සමාන වටිනාකමක් වර්ෂයේ වෙන්කිරීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. මිලියන 545.91 කින් අධිප්‍රමාණය වී පාරිතෝෂික වෙන්කිරීම් රු. මිලියන 545.91 කින් අවප්‍රමාණය වී තිබුණි.

**(ඈ) ශ්‍රීලංගිප්‍ර 20 - රජයේ ප්‍රදාන ගිණුම් ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම**

(i) වර්ෂ 11 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවති ව්‍යාපෘති 28 කට අදාල එකතුව රු. මිලියන 9,453.27 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එම විදේශ ප්‍රදාන සම්බන්ධ තොරතුරු කිසිවක් නොමැතිවීම හේතුවෙන් , ක්‍රමක්ෂය නොකිරීම මත මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම විගණනයේදී තහවුරු කළ නොහැකිවිය.

(ii) විදේශ ප්‍රදාන ලෙස ගිණුම් ගත කරන ලද එකතුව රු.මිලියන 2,478.24 ක විශේෂිත ව්‍යාපෘති වලට අදාළ හඳුනානොගත් ගනුදෙනු 2016 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය කර නොතිබුණි.

**(ඉ) ශ්‍රීලංගිප්‍ර 40 - ආයෝජන දේපල**

ප්‍රමිතයේ ඡේද අංක 75 හා 79 අනුව රු. මිලියන 352.06 ක ධාරණ අගයක් සහිත ආයෝජන දේපල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල වෙනම දක්වා නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 12 ක් සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන එකතුව රු. 228,559,097 ක් වූ ශේෂයන්, මූල්‍ය ප්‍රකාශනවල අවශය ගැලපීම් සිදුකිරීම සඳහා විමර්ශනය කිරීමෙන් තොරව වර්ෂ තුනේ සිට දහය කට වැඩි කාල පරිච්ඡේදයක් නොවෙනස්ව පැවතුණි.

(ආ) රු.5,534,819,630 ක් වූ නිමකර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති හැට හතරක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව 2016 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩතුළ පැවතුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දින වූ DI පයිප්ප හා සවිකිරීම් තොගය ගණනය කිරීමේ දෝෂයන් හේතුවෙන් වටිනාකම පිළිවෙලින් රු. 6,878,121 කින් හා 7,246,655 කින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති යල්පැනගිය තොග සඳහා රු. 4,324,111 ක් වැඩිපුර ප්‍රතිපාදනය කර තිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන ලද මාර්ග ඉදිකිරීමේදී කාර්යාලය හානියට පත් වීම වෙනුවෙන් රු. 6,870,296 ක පිරිවැයකට ඉදිකරන ලද ප්‍රධාන කාර්යාලයේ මායිම් තාප්පය 2014 දී මණ්ඩලය වෙත භාරදී තිබුණි. කෙසේ වුවද, එයින් රු. 3,424,712 ක වටිනාකමක් පමණක් ප්‍රවර්තන වර්ෂය තුල මණ්ඩලය විසින් ප්‍රාග්ධනිත ගත කොට තිබුණි.

(ඊ) 2015 වර්ෂයේ සිට ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති පිරිවැය රු. 192,452,347 ක් වූ පුල්මුඩේ කුඩා නගර ජල සම්පාදන ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුල විදේශ ප්‍රදාන සහ නැවත අයකර ගැනීම් යෝජනාක්‍රම යටතේ දෙවරක් ක්‍රමක්ෂය කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 3,364,558 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) තොග ගැලපුම් ගිණුමේ දක්වා ඇති රු. 2,421,893 ක තොග ඌනතාවය නිවැරිදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) ප්‍රධාන කාර්යාලයේ ජපාන ව්‍යාපෘති අංශය විසින් භාවිතා කරනු ලබන රු. 631,049 ක් වූ මණ්ඩලයට අයත් ලී බඩු හා පරිගණක උපාංග, වත්කම් ගිණුම් වල ඇතුලත් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු. 63,287,387 ක ආර්ථික සේවා ගාස්තු ලැබිය යුතු දෑ ලෙස හදුනා නොගෙන වැරදි සහගත ලෙස 2016 වර්ෂයේ ආදායම් බදු වියදම ලෙස හදුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) ප්‍රතිපත්තියක් ලෙස මණ්ඩලය විසින් අඛන්ඩව සෑම වර්ෂයකම පෙර වර්ෂයේ ගැලපීම් වශයෙන් සමුච්චිත ලාභය / අලාභය ට සැලකිය යුතු ගැලපීම් සිදුකරන බව විගණනයට නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් ඒ ඒ වර්ෂයේ ලාභය සැලකිය යුතු ලෙස විකෘති වී තිබුණි. 2013 සිට 2015 කාලපරිච්ඡේදය සඳහා එවැනි පෙර වර්ෂයට අදාල ගැලපුම් හේතුවෙන් සමුච්චිත ලාභයට වූ බලපෑමෙහි එකතු වටිනාකම රු. මිලියන 345.9 ක් විය මෙවැනි පසුබිමක් තුල ඉදිරි වර්ෂය තුල සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් සිදුකිරීමේ හැකියාව පිළිබඳ විගණනයේදී බැහැර කල නොහැකිය ඒ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිලාභය පිළිබඳ විගණනයේදී සතුටුදායක ලෙස පිලිගත නොහැකිය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ දෙකතුල සිදුකරන ලද එවැනි ගැලපීම් පිලිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | හරකල වටිනාකම | බැරකල වටිනාකම | සමුච්චිත ලාභයට වූ ශුද්ධ බලපෑම |
|---|---|---|---|
| 2016 | (455,977,322) | 336,150,543 | (119,826,779) |
| 2015 | (184,251,720) | 192,301,771 | 8,050,051 |
| 2014 | (88,633,609) | 269,544,864 | 180,911,255 |

2.2.3 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිමැවුම් පාදක සඳහා වන ගෝලීය හවුල් ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට විදේශ ප්‍රදාන වටිනාකම රු. 212,666,110 ක් විය. කෙසේ වුවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 282,644,182 ක් විය. ඒ නිසා රු. 69,978,072 ක පැහැදිලි නොකල වෙනස්කමක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2016 මූල්‍ය ප්‍රකාශනයන් තුල දක්වා ඇති 2015 දෙසැම්බර් 31 දිනට ණය ගැතියන්ගේ සංසන්දනාත්මක අගය රු. 3,895,171,826 ක් වුවද 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල එම ශේෂය රු. 3,813,272,977 ක් ලෙස දක්වා තිබුණි. ඒ නිසා රු. 81,898,849 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 හඳුනා නොගත් ශේෂ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර ප්‍රාදේශීය සභාය මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන ජංගම ගිණුමට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශය තුල දීර්ඝ කාලයක සිට දක්වා ඇති රු. 179,347 ක හඳුනානොගත් ශේෂයට අදාලව ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) අභ්‍යන්තර මුදල් මාරුකිරීම් පාලන ගිණුම් වර්ෂය අවසානයට ශුන්‍ය අගයක් ගත යුතු වුවද, එකතුව රු. 2,434,907 ක බැර ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව මෙම පාලන ගිණුම තුල පැවතුණි.

(ඇ) නව සම්බන්ධතා පාලන ගිණුමේ වයස් විශ්ලේෂණය අනුව ත්‍රිකුණාමලය කලාපයට අයත් එකතු වටිනාකම රු. 1,155,154 ක් වූ ණය ගැති ශේෂ හඳුනාගෙන සැසඳුම් කිරීමකින් තොරව වර්ෂ 4 කට වැඩි කාලයක සිට ගිණුම් වලට ගෙන තිබුණි.

(ඈ) ත්‍රිකුණාමලය කලාපයට අදාලව රස් කිරීම් පාලන ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට හර ශේෂය රු. 8,677,004 ක් විය. එම වටිනාකමින් රු. 5,108,669 ක් සහ රු. 2,494,371 ක් සැසඳීමකින් තොරව පිලිවෙලින් වසර 4 ක් සහ වසර 2 ක කාලයකට වඩා හිහව පැවතුණි.

(ඉ) රු. 1,721,237 ක ශේෂයක් පුනුරුත්ථාපන බදු ලෙස වසර 3 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණද, මෙම ගිණුම ඇති කිරීමට හේතුව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

ශක්‍යතා අධ්‍යන වාර්තාව සහ විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල චලනය නොවන හා සෙමින් චලනය වන තොග වටිනාකම් පිළිවෙලින් රු. 614,524,704 ක් සහ රු. 474,096,453 ක විස්තරාත්මක උපලේඛනය විගණනය වෙත ඉදිරිපත් වී නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 282,919,175 ක් වූ වෙළඳ ණයගැතියන්, මලාපවහන ණයගැතියන් කොළඹ මහ නගර සභා ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන් හා වෙනත් ණයගැතියන් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 3 කට වැඩි කාලයක් පැවතුණි.

(ආ) රු. 10,529,933 ක් වූ විශේෂ ප්‍රසාද දීමනා අත්තිකාරම් වර්ෂ 17 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරියෙහි (RDA) සහ කොළඹ මහ නගර සභාවෙහි තබා තිබූ එකතු වටිනාකම රු. 26,624,610 ක කෙටි කාලීන තැන්පතු 2002 වර්ෂයේ සිට අයකර ගැනීමකින් තොරව පැවතුණි. තවද, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන විසින් මාර්ග සංවර්ධන අධිකාරිය හා මධ්‍යම පලාත් සභාවේ තබා තිබූ එකතුව රු. 2,801,222 ක කෙටිකාලීන තැන්පතු ශේෂය 2010 වර්ෂයේ සිට අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඈ) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යංශයට දෙන ලද රු. 4,378,829 ක අත්තිකාරම් වටිනාකම 2016 වර්ෂයේදී අවිනිශ්චිත ණය ගැතියන්ට මාරුකර තිබුණි. තවද, 2016 වර්ෂය අවසානයට අත්තිකාරම් ගිණුමේ පැවති රු. 15,227,491 ක වෙනත් ශේෂයක්ද කිසිදු හේතුවක් නොදක්වා මෙම ගිණුමට මාරුකර තිබුණි.

(ඉ) කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් එකතුව රු. 31,314,650 ක් හා රු. 13,121,877 ක් පිළිවෙලින් වර්ෂ අටකට වඩා වැඩි හා වර්ෂ තුනකට වඩා වැඩිකාලයක් දක්වා නිරවුල් නොකර පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) මිලදීගැනීම් සඳහා නිලධාරීන් හා ආයතනයන්ට 1997 සිට 2015 කාලපරිච්ඡේදය දක්වා ලබාදුන් වටිනාකම රු. 274,126 ක් වූ අත්තිකාරම් මේ දක්වා නිරවුල් කොට නොතිබුණි.

(උ) විශේෂ ව්‍යාපෘති සඳහා ලබා දෙන ලද එකතුව රු. 5,520,606 ක් වූ අත්තිකාරම් අදාල පාර්ශවයන් විසින් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි.

(ඌ) ඉඩම් අත්පත් කර ගෙන තිබුණද, එම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2009 දිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුල ලබාදෙන ලද රු. 94,276,927 ක් වූ අත්තිකාරම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) නැගෙනහිර මහනුවර ප්‍රාදේශිකය විසින් එකතුව රු. 27,182,581 ක් වූ ණයහිමියන් 2013 වර්ෂයේ සිට බේරුම් නොකොට පවත්වාගෙන ගොස් තිබුණි.

(ඒ) 2016 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපෑ වැටුප් හා වේතන ශේෂය රු. 5,419,070 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයට වූ මුළු ගෙවිය යුතු වටිනාකමින් සියයට 67 ක් නියෝජනය කර තිබුණි.

(ඔ) නාගරික සංවර්ධන ව්‍යාපෘතියට අදාලව දේශීය බැංකු වලට ගෙවිය යුතු රු. 20,713,131 ක දේශීය ණය ශේෂය 2011 වර්ෂයේ සිට නිරවුල් නොකර ගිණුම්තුල පැවතුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 395 (සී) | බැංකු සැසඳුම් ප්‍රකාශයන් ඊට පසු මාසයේ 15 වැනි දිනට පෙර පිළියෙල කලයුතු වුවත් 2016 දෙසැම්බර් මාසය සඳහා සියළුම බැංකු ගිණුම් සඳහා වන බැංකු සැසඳුම් ප්‍රකාශයන් 2017 ජනවාරි 15 දිනට පසුව පිළියෙල කොට තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 770 | වටිනාකම රු. 16,117,179 ක් වූ යල්පැන ගිය තොගය රෙගුලාසියේ විස්තර වන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව 2016 මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත්කොට තිබුණි. |
| ආ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛය | මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | (i) චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව මෝටර් වාහන එකොළහක් ක් රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර එම වාහනවල බලපත්‍ර හා රක්ෂණ ඔප්පු අළුත් කිරීම සඳහා රු. 1,666,150 ක මුදලක් මණ්ඩලය විසින් දරා තිබුණි. |

(ii) චක්‍රලේඛයේ විධි විධාන වලට පටහැනිව සේවකයින් තිස්නව දෙදෙකු සමාලෝචිත වර්ෂය තුල රේඛීය අමාත්‍යාංශයට හා අනෙකුත් අමාත්‍යාංශ වලට මුදාහැර තිබුණි. එම සේවකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් ගෙවු වැටුප් අදාල පාර්ශවයින් විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,989,591,779 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 1,149,598,362 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,839,993,417 ක වර්ධනයක් දැක්වුනි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් හා අනෙකුත් මෙහෙයුම් ආදායම් සහ ප්‍රතිලාභයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනය මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වසර 4 ක මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණයේදී 2012 වර්ෂයේ වු රු. 407,019,536 ක අතිරික්තය 2016 වර්ෂයේදී විචලයන් සහිතව රු. 2,989,591,779 දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමිකයන්, ජංගම නොවන වත්කම් ක්ෂය වීම් හා රජයට බදු ගෙවීම් සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ වු රු. 10,374,694,060 ක අතිරික්තය 2016 වර්ෂයේදී රු. 15,879,602,172 දක්වා විචලනයක් සහිතව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 ලාභදායීත්වය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභය සියයට 27 කින් ඉහල ගොස් තිබු අතර පරිපාලන වියදම් සියයට 7 කින් ඉහල ගොස් තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුල රු. 1,756,594,590 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කොට තිබු

අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 2870 කින් වර්ධනය වී තිබිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලාභයෙහි සිදුවූ සියයට 174 ක වැඩිවීම මෙම වර්ධනයට මූලික හේතුව වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ රු. 774,768 ක් වූ එක් සේවකයකුට දායකය 2016 වර්ෂයේදී සියයට 29.01 කින් වැඩිවී තිබුණු අතර, සියයට 178.06 ක වැඩිවීමක් නිරූපණය කරමින් 2015 වර්ෂයේදී එක් සේවකයකුට ශුද්ධ ලාභය වූ රු. 104,156 ක් 2016 වර්ෂයේදී රු. 281,505 ක් දක්වා වැඩිවී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී පාරිභෝජනය කරන ලද ජල ඒකකයකින් වූ රු. 40.99 ක ආදායම 2016 වර්ෂයේදී සියයට 5 කින් වැඩි වී තිබුණු අතර 2015 වර්ෂයේදී රු. 46.79 ක් වූ පරිභෝජනය කරන ලද ජල ඒකකයක නිෂ්පාදන පිරිවැය 2016 වර්ෂයේදී රු. 45.48 දක්වා සියයට 3 කින් අඩුවී තිබුණි.

### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| වර්ෂය | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 42.82 | 39.19 | 39.47 | 4 1.35 |
| ශුද්ධ ලාභ ආන්තිකය | 12.68 | 5.53 | 7.62 | 5.87 |
| ජංගම අනුපාතය | 5.97 | 4.48 | 1.76 | 1.29 |

ඉහත තොරතුරු අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පිළිවෙලින් සියයට 9.26 කින් හා සියයට 129.29 කින් ඉහළ ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ලඟා කර ගැනීමට අදාලව පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) **පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදාහැරීම**

2015 වර්ෂයේදී මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද පිරිසිදු ජලය ඝන මීටර් මිලියන 600 කට සාපේක්ෂව 2016 වර්ෂයේදී පිරිසිදු ජලය ඝන මීටර් මිලියන 649 ක් නිෂ්පාදනයක් තිබූ අතර එහි සියයට 8.16 ක පිරිසිදු ජලය නිෂ්පාදනයේ වැඩිවීමක් දැක්වුණි. 2012 සිට 2016 වර්ෂය දක්වා නිෂ්පාදන ඒකකයක පිරිවැය පහත සඳහන් පරිදි විය.

| වර්ෂය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| ඒකක පිරිවැය (රු.) | 45.27 | 46.79 | 43.96 | 44.39 | 41.22 |

ඉහත සඳහන් වගුව අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 9.82 කින් වැඩිවී තිබුණි. මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වුයේ 2012 සිට 2016 දක්වා වූ කාල පරිච්ඡේදය තුල සේවක පිරිවැය හා බලශක්ති පිරිවැය සැලකිය යුතු ලෙස වැඩිවීමයි.

සමාලෝචිත වර්ෂය අවසානයට ලබා දුන් ජල සම්බන්ධතා ගණන 138,795 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 13.91 ක වර්ධනයක් දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ඉලක්කය අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සම්බන්ධතා 140,676 ක් ලබාදීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයතුල නව සම්බන්ධතා 138,750 ක් පමණක් සපයා දී තිබුණි.

(ඇ) **ආදායම් නොලබන ජලය (NRW)**

ආදායම් නොලබන ජලය හේතුවෙන් මණ්ඩලය විසින් දරන ලද පාඩුව හඳුනාගෙන වෙනම ගිණුම්ගත කර නොතිබුණි. එහෙත් එය සාමාන්‍ය පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 ක් සඳහා ආදායම් නොලබන ජලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| ජලය නිෂ්පාදනය (ඝන මීටර්) | 649 | 600.14 | 575.00 | 547.0 | 525.6 |
| ජලය පරිභෝජනය (ඝන මීටර්) | 483 | 436.27 | 410.92 | 381.6 | 368.5 |
| ආදායම් නොලබන ජලය (ඝන මීටර්) | 166 | 163.87 | 137.07 | 165.4 | 157.1 |
| **ජලය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආදායම් නොලබන ජලය** | **25.58** | **27.30** | **28.53** | **30.24** | **29.89** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) කාන්දුවීම්, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා, නොමිලයේ සැපයීම හා පරිපාලන කරුණු ආදිය හේතුවෙන් 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද ජලය ප්‍රමාණයෙන් ආදායම් නොලබන ජලය සියයට 25.58 කින් නියෝජනය විය. 2016 වර්ෂයේදී කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය කොටස සියයට 44.25 ක් විය.

(ii) නීත්‍යානුකූල නොවන සම්බන්ධතා අඩුකිරීමට හා ජලය බෙදාහැරීම් නළවල තාවකාලික බිඳ වැටීම් අලුත්වැඩියා කිරීම කඩිනම් කිරීමට පසුගිය කාල පරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් ඇතැම් ක්‍රියාමාර්ග ගෙන තිබුණද, 2012 වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ ආදායම් නොලබන ජලය රේටය සියයට 5.66 කින් වැඩිවී තිබුණි.

(iii) වර්ෂ 75 කට වඩා පැරණි වූ කොළඹ නගරයේ ප්‍රධාන ජලය බෙදාහැරීම් පද්ධති නවීකරණය කිරීම සඳහා අවශ්‍යතාවයන් තිබීම හේතුවෙන් එම කාර්යය සඳහා සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කඩිනම් අවශ්‍යතාවය කෙරෙහි මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කර තිබුණි. දැනට මේ සම්බන්ධයෙන් විදේශ මූලායයන ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කරමින් තිබුණද, ප්‍රධාන ජල සැපයීම් නළ පිළිබඳ ප්‍රතිසංස්කරණය එයින් ප්‍රමාණවත්ව ඉටුකර ගෙන නොතිබුණි.

(iv) ජල කාන්දුවීම් හේතුවෙන් අලුත් කළ යුතු ප්‍රධාන ජල සැපයුම් නළ මේ දක්වා විශේෂිතව හඳුනාගෙන නොතිබුණි. ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කිහිපයක් කර තිබුණද, ඒවායේ ක්‍රියාත්මකවීම ඉතා මන්දගාමී තත්ත්වයක විය.

(v) කොළඹ නගරය හැර අනිකුත් ප්‍රදේශවල ආදායම් නොලබන ජලය අඩු කිරීම කෙරෙහිද මණ්ඩලයේ අවධානය ප්‍රමාණවත් නොවූ අතර සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන් තාත්වික නොවූ බවද නිරීක්ෂණය විය.

(vi) ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා රු.මිලියන 3,100.17 ක ඇස්තමේන්තු වියදමක් සහිත ව්‍යාපෘති 6 ක් ආරම්භ කර තිබුණද, සැලකිය යුතු අඩුකිරීමක් හඳුනාගත නොහැකි විය.

**(ඈ) මලාපවහන පද්ධතිය**

---

රටේ ආර්ථික සංවර්ධනයත් සමඟ ඇතිවූ නාගරිකරණය හේතුවෙන් නගරවල මලාපවහන අපහරණය සඳහා යටිතල පහසුකම් වෙනුවෙන් වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. එම පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීමක් වුවද, මෑත වර්ෂවලදී මෙම ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොතිබුණි. ජාතික ප්‍රතිපත්තියක් ලෙස ජනගහනයෙන් සියයට 7 කට මලාපවහන අපහරණ පහසුකම් සැපයීම අපේක්ෂා කර තිබුණද, ඉටුකර ගැනීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) ඉලක්කයන් ඉටුකර ගැනීම**

---

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන් සහ ඒවා ළඟාකර ගැනීමට අදාලව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආදායම් නොලබන ජලය ප්‍රතිශතය අඩුකර ගැනීම ඉලක්ක කර තිබුණද, ප්‍රාදේශීය සභාය මධ්‍යස්ථාන 12 න් පහකට පමණක් එම ඉලක්කය සපුරා ගැනීමට හැකිවී තිබුණි. කොළඹ නගරයේ මුළු ආදායම් නොලබන ජලය සියයට 44.25 දක්වා අඩුකර ගැනීමට ඉලක්ක කර තිබුණද, 2016 වර්ෂය අවසානයට තථ්‍ය අඩුකර ගැනීම සියයට 45.85 ක් විය.

(ii) මුළු නළ ජලය සැපයුම් ආවරණය හා මුළු මලාපවහන සම්බන්ධතා ආවරණය මුළු ජනගහනයෙන් පිළිවෙලින් සියයට 49.8 ක් හා සියයට 2.4 ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කර තිබුණද, 2016 වර්ෂය අවසානයට තථ්‍ය ආවරණය පිළිවෙලින් සියයට 47.7 ක් හා සියයට 2 ක් පමණක් විය.

## 4.2 විදේශ මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) විශාල පරිමාණයේ විදේශ මූල්‍යයන ව්‍යාපෘති බොහොමයක් නියමිත දිනයන්ට නිමකර නොතිබූ අතර ව්‍යාපෘති කාල පරිච්ඡේදය දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අතිරේක වැඩ සහ මිල ඉහළයාම් හේතුවෙන් පිරිවැය ඉතා විශාල ලෙස වැඩිවී තිබුණි.

(ආ) එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කර නොතිබුණි.

(ඇ) **යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද කාර්යයන්ගේ කෙරීගෙන යන වැඩ ශේෂ වටිනාකම රු. මිලියන 2,023 ක් විය. එසේ වුවද ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. මිලියන 2,236 ක් ලෙස දක්වා තිබුණි. රු. මිලියන 213 ක වෙනස සැසඳුම් කර නොතිබුණි.

(ii) 1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 ඡේදය ප්‍රකාරව ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කරගත් නිශ්චල දේපල මණ්ඩලය වෙත පැවරිය යුතු වේ. තවද, විශේෂයෙන්ම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය නිශ්චල දේපල මිලදීගැනීම තහනම් බව 2015 මාර්තු 11 දින නීතිපති විසින් මතයක් ලබාදී තිබුණි. කෙසේ වෙතත් නල්ලූර් හි ඉඩම් මිලදීගැනීම වෙනුවෙන් 2013 මාර්තු මාසයේදී ව්‍යාපෘතිය රු.මිලියන 2.5 ක් වැය දරා තිබුණි.

(ඈ) වියළි කලාපීය නාගරික ජලය හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහා භාණ්ඩාගාරය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ ඇතිකරගත් උපණය ගිවිසුම යටතේ 2014 දෙසැම්බර් 31 දක්වා අයකල පොලී වටිනාකම රු. මිලියන 68.50 ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ වටිනාකම තුල දක්වා තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද වටිනාකම රු. මිලියන 131.17 ක් වූ එකතු කල අගය මත බදු කෙරීගෙන යන වැඩ වටිනාකම යටතේ දක්වනවා වෙනුවට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ලද රාජ්‍ය දායකයේ ලැබීම් වලට එරෙහිව හිළව් කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයන් තුල දක්වා ඇති ශ්‍රී ලංකා ආණ්ඩුවේ දායකය හා කෙරීගෙනයන වටිනාකම ඒ සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) ණය ගිවිසුමේ 5 වන උපලේඛනයේ 15 වන ඡේදයට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ජල සම්පාදන ප්‍රතිපත්තිය හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කල යුතු වේ. ජල සම්පාදන ප්‍රතිපත්තිය 2010 මාර්තු 03 දින කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කර තිබු නමුදු සනීපාරක්ෂක ප්‍රතිපත්තිය 2016 දෙසැම්බර් 31 දින වන විටත් අනුමත කර නොතිබුණි.

(iv) ණය ගිවිසුමේ 5 වන උපලේඛනයේ 18 වැනි ඡේදය ප්‍රකාරව නගර සභා විසින් පිරියම් කල අපද්‍රව්‍යවල ප්‍රමාණය හා ගුණත්වය, අපද්‍රව්‍ය මුදාහරින ජලයේ ගුණත්වය සහ වියළි මලාපවහන අපද්‍රව්‍යවල අඩංගු බැක්ටීරියා වල ගුණත්වය නිරන්තරව අධීක්ෂණය කල යුතුය. කෙසේ වෙතත්, නගර සභා විසින් කාර්යක්ෂමව අපද්‍රව්‍ය කලමනාකරණය සඳහා වන අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන බවට කිසිදු තොරතුරක් නොලැබුණි.

(v) සනීපාරක්ෂක වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සහය වන නගර සභා විසින් අපද්‍රව්‍ය රැස්කිරීමේදී හා ඉවත් කිරීමේදී , මෙහෙයුම් හා නඩත්තු වියදම් ආවරණය වන පරිදි ගාස්තු ක්‍රමයක් හඳුන්වාදීම සහ නව දේපල සංවර්ධනයේදී අනිවාර්යයෙන්ම මලාපවහන ටැංකි භාවිතා කිරීම හඳුන්වාදීම සඳහා යෝජනා හා අතුරු විධාන සම්මත කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භක අවධියේදී ගත යුතුය. කෙසේ වුවත් නගර සභා විසින් එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(vi) ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පූර්ණ කාලීනව කාර්යයෙහි නොයෙදුනු අතර එම කරුණ ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලඟාකර ගැනීම කෙරෙහි අවාසිදායක ලෙස බලපා තිබුණි.

(vii) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඒකාබද්ධව ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කල යුතු බවට 2013 අප්‍රේල් 05 පැවති කැබිනට් අමාත්‍ය මණ්ඩල රැස්වීමක දී තීරණය කර තිබුණි. කෙසේ වුවත් 2016 දෙසැම්බර් 31 දින දක්වාත් සුදුසු යාන්ත්‍රණයක් දෙපාර්ශවය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(viii) වාරිමාර්ග ජලාශ 03 ක් නවීකරණය හා වී වගාව සඳහා පතියාකුලම් හා කට්කුලම් හි ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අවබෝධතා ගිවිසුමක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව 2014 වර්ෂයේදී අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් පරිපාලන දුර්වලතා හා දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණයක් ක්‍රියාත්මක නොකිරීමෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට කාර්යයන්හි භෞතික ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක පැවතුණි. පසුගිය විගණන වාර්තාවෙන්ද මෙම කරුණු පෙන්වා දී තිබුණද ව්‍යාපෘතිය විසින් ඒ සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 500 ට සමාන වන හෝ ඉක්මවන කොන්ත්‍රාත්තු රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් අත්සන් කල යුතුය. කෙසේ වෙතත් ඉහත අවශ්‍යතාවයට පටහැනි ලෙස පහත සඳහන් කොන්ත්‍රාත්තු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කොට තිබුණි.

| ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්තුවේ නම | වටිනාකම<br>රු. මිලියන |
|---|---|---|
| මහ කොළඹ ජලය හා අපජලය කලමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන | ආදායම් නොලබන ජල කලමණාකරනය, ඉදිකිරීම් සුපරීක්ෂණය හා උපදේශන කොන්ත්‍රාත්තුව | 216 |

| | | |
|---|---|---|
| - 01 ව්‍යාපෘතිය (ණය අංක 2947 සහ SRI 2948 SRI (SF) | | |
| මහ කොළඹ ජලය හා අපජලය කලමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතිය | කොළඹ නගරයේ දකුණු කොටසේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය සහ කොළඹ නගරයේ බටහිර කොටසේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනුරුත්ථාපනය | 6,991 සහ 6.555 |
| මහ කොළඹ ජලය හා අපජලය කලමණාකරනය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතිය (AFD) අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය | අඹතලේ සිට එලයිට් හවුස් ජලාශය දක්වා වූ කිලෝමීටර් 9 සඳහා DI පයිප්ප ( විශ්කම්භය මිලිමීටර් 1200 ) සැපයුම් කිරීම හා එළීම. | 2,565 |
| මහ කොළඹ ජලය හා අපජලය කලමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතිය (ණය අංක 2947 සහ SRI 2948 SRI (SF) | කොළඹ නගරයේ උතුරු කොටස් ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනුරුත්ථාපනය සහ කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනුරුත්ථාපනය | 1,041 සහ 5,001 |
| ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | කොන්ත්‍රාත් අංක P& P/ DB/ CHINA / EXIM / GAMIWSS/2013/01 | 33,060 |

(ඊ) මොණරාගල බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම යුරෝ මිලියන 19.67 ක් වූ නමුදු සියයට 21.91 ක ඉහලයාමකින් යුතුව යුරෝ මිලියන 23.98 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබුණි. තවද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (අ) මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර අයවැය ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කොට නොතිබුණි.

(උ) ජල සම්පාදන පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ලබුගම , කලටුවාව

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය විසින් ඩබල් කැබ් රථ හතරක් සහ වෑන් රථ දෙකක් ප්‍රසම්පාදනය ගැනීම සඳහා 2014 වර්ෂයේදී රු. 66,017,868 ක මුදලක් වැය දරා තිබුණි. පිරිවිතරයන් හා නිෂ්පාදිත රට නිශ්චිතව සඳහන් නොවීම මත රු. 38,089,103 ක අමතර පිරිවැයක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුව තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ii) නව කාර්යාල ගොඩනැගිල්ලක් හා නිල නිවාස 04 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු වෙත රු. 119,391,800 ක මුදලක් ගෙවා තිබුණි. අන්තර් ගෙවීම් සහතික පත්‍රය අනුව නව කාර්යාල ගොඩනැගිල්ලේ සහ නිල නිවාසයන්හි වර්ග අඩියක් සඳහා වන පිරිවැය පිලිවෙලින් රු. 27,758 ක් සහ රු. 10,416 ක් විය. රාජ්‍ය ආයතන කිහිපයක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව ඒ හා සමාන කාර්යාල ගොඩනැගිලි සහ නිල නිවාසයන්හි වර්ග අඩියක් සඳහා වන වෙළඳපොල අනුපාතය පිලිවෙලින් රු. 5,570 ක් සහ 4,997 ක් විය. කොන්ත්‍රාත්කරු විසින් හිමිකම් පෑ අනුපාතය වෙළඳපොල පැවති අනුපාතයට වඩා වැඩිවූ හෙයින් ප්‍රමාණය පිලිවෙලින් වර්ග අඩි 2,500 ක් හා වර්ග අඩි 1,200 ක් වූ ලබුගම ව්‍යාපෘතිය යටතේ කාර්යාල ගොඩනැගිලි සහ නිල නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් රු. 81,481,200 ක අලාභයක් රජයට දැරීමට සිදුව තිබුණි.

ඒ හා සමානව කලටුවාව ව්‍යාපෘතිය යටතේ නිල නිවාස ඉදිකිරීම සඳහා වූ පිරිවැය වර්ග මීටරයකට රු. 71,320 ක් විය. ඒ අනුව නිල නිවාස 5 ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 35,659,900 ක් විය. කෙසේ වෙතත් රාජ්‍ය ආයතන

කිහිපයක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව ඒ සමාන වර්ගයේ නිල නිවාස ඉදිකිරීම සඳහා වන වෙළඳපොල රේටය වර්ග මීටරයට රු. 53,787 ක් විය. ඒ නිසා කොන්ත්‍රාත්කරු විසින් හිමිකම් පෑ අනුපාතය වෙළඳපොල පැවති අනුපාතයට වඩා වැඩි වූ හෙයින් හා එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණය වර්ග මීටර් 500 ක් වන නිල නිවාස 5 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘතිය විසින් රු. 8,766,500 ක අමතර පිරිවැයක් දරා තිබුණි

(iii) කලටුවාව ජල පවිත්‍රාගාරය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අළුත්වැඩියා කිරීමේ කාලපරිච්ඡේදයේදී මණ්ඩි බැසීමේ ටැංකි වල තිබූ ආස්තරණ තහඩු ඉවත් කර තිබූ අතර ඊට පසුව නව ආස්තරණ තහඩු සවිකොට නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රොන්මඩ ඝන තට්ටුවක් ටැංකි තුල තැන්පත්ව තිබූ අතර එයින් ජලය ක්‍රමවත් ලෙස පවිත්‍ර කල නොහැකිව තිබුණි.

- තාක්ෂණික අවශ්‍යතාවයට අනුව දෛනිකව අවසන් ජල සාම්පලයේ පරාමිතීන් 8 ක් පරීක්ෂා කල යුතුවේ. කෙසේ වෙතත් සත්‍ය වර්ණය,මුළු මැංගනීස් , THM යනාදී පරාමිතීන් කලටුවාව රසායනාගාරය විසින් පරීක්ෂාවට ලක්කොට නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 8.3.5.1.4 ඡේදයට අනුව කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුල කොන්ත්‍රාත්කරු විසින් අවසන් ජල සාම්පලයන්හි පරාමිතීන් 08 ක් පරීක්ෂා කල යුතුව තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුල එය පරීක්ෂාකොට නොතිබුණි.

(ඌ) විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

---

මෙම ව්‍යාපෘතියේ ආරම්භක දිනය 2012 මාර්තු 06 වූ අතර 2014 සැප්තැම්බර් 05 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ගිවිසගත් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුල කොන්ත්‍රාත්තුව නිමකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි. අනතුරුව කොන්ත්‍රාත්කරු විසින් ඇතැම් වැඩ ආරම්භ නොකිරීම , ප්‍රමාණවත් මානව සම්පත් අනුයුක්ත කිරීමට අපොහොසත්වීම, උපකොන්ත්‍රාත්කරුවන් විසින් විවිධ හේතූන් මත ඉදි කිරීම් වැඩ අතහැර දැමීම, ව්‍යාපෘති කාර්යයන් සඳහා යෝග්‍ය අදියරයන්හිදී අවශ්‍ය අමුද්‍රව්‍යන් නොතිබීම යනාදිය නිසා මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2017 මැයි 31 දක්වා අවස්ථා 4 කදී දීර්ඝ කොට තිබුණි. තවද, ජූනි 20 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 88.6 ක් හා සියයට 85 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

මෙම ව්‍යාපෘතියේ කාර්යයන් නියමිත කාලයේදී නිමකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවද ඇ.ඩො. මිලියන 108 ක් වටිනා පොල්ගහවෙල , පොතුහැර සහ අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනාක්‍රමයද ඇ.ඩො මිලියන 91.36 ක් වන පන්නල , මාකඳුර, කුලියාපිටිය ජල සම්පාදන යෝජනාක්‍රමද පිළිවෙලින් 2014 අප්‍රේල් 08 සහ 2015 දෙසැම්බර් 02 වැනි දින දී මෙම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කොට තිබුණි.

## 4.3 දේශීය බැංකු ණයවලින් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති

### 4.3.1 කන්දෙකැටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

2013 වර්ෂයේ සිට ව්‍යාපෘති කාර්යයන් සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදනයන් ආරම්භ කොට තිබුණද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 වැනි මාර්ගෝපදේශය අනුව 2017 ජනවාරි 31 දක්වා කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 4.3.2 අම්පාර බෙදාහැරීමේ ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කැමැත්ත ප්‍රකාශ කිරීමට ආරාධනා කරමින් 2013 දෙසැම්බර් 11 දින පල කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 3,000 ක් විය. කෙසේ වෙතත් ලංසු ආරාධනා කැඳවීමේදී එම අගය රු. මිලියන 5,184.66 දක්වා වැඩිවී තිබුණි. මෙම ඉහලයාමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) කොන්ත්‍රාත්තුවේ ආවරණ වාර්තාව අනුව කොන්ත්‍රාත්කරු විසින් කැමැත්ත ප්‍රකාශ කිරීම 2013 මැයි මාසයේ ( දැන්වීම පලකිරීමට පෙර) ඉදිරිපත් කර තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබූ මූල්‍ය ශක්‍යතාවයන් සම්පූර්ණ කොට නොතිබූ හෙයින් මෙම කාර්ය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබා නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.16 ඡේදය අනුව ලංසුකරුවන් විකල්ප ලංසුවන් ඉදිරිපත් කිරීමට අවසර ලබන්නේ නම් එය ලංසු ලියවිලි වල පැහැදිලිව දැක්විය යුතුය. මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ලංසු ලියවිලි වල ඒ බව සඳහන්ව නොතිබුණද කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද විකල්ප ලංසුපත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක්කොට රු. මිලියන 6,848.06 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නිර්දේශ කොට තිබුණි.

## 4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

සමාලෝචිත වර්ෂය තුල මධ්‍යම පළාතෙහි ක්‍රියාත්මක කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන හා අපවහන ව්‍යාපෘතීන් සඳහා රු. මිලියන 162.75 ක් වෙන් කොට තිබුණද, 2016 ඔක්තෝම්බර් 30 වනවිට මිලියන 65.13 ක මුදලක් පමණක් උපයෝජනය කොට තිබුණි.

## 4.5 නිෂ්කාර්යය හා උපයෝජිත වත්කම්

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.1,542,951 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් සෙමින් චලනය අයිතමයන් යටතේ දීර්ඝ කාලයක සිට පැවතුණි.

(ආ) විගණන නියැදි පරීක්ෂණයට අනුව ජල සම්පාදන යෝජනා ක්‍රම 19 කට අදාලව එකතුව රු.මිලියන 328,937,648 ක් වූ සෙමින් චලනය වන තොග නිසි ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව දිගු කාලයක සිට පැවතුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට තොග වල රු. 614,524,704 ක් වටිනා චලන නොවන තොග හා රු. 474,096,453 ක් වටිනා සෙමින් චලනය වන තොග පැවති බව නිරීක්ෂණය වූ අතර මණ්ඩලයේ මුළු තොග වටිනාකමින් පිළිවෙලින් එය සියයට 9 ක් හා සියයට 7 කින් නියෝජනය විය. තවද, එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 54 ක හා සියයට 37 ක වැඩි වීමක් විය.

(ඈ) මඩකලපුව ප්‍රාදේශීය කලමණාකරන කාර්යාලයේ මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා රු. 1,944,929 ක් වැය දැරීමෙන් පසු ව්‍යාපෘතියේ අරමුණ කරා ලඟා වීමකින් තොරව අතහැර දමා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයතුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පාරිභෝජනය කරන ලද වටිනාකම රු. මිලියන 109 ක් වන ජලය 1,686,348 $cum^2$ ක ප්‍රමාණයක් සඳහා බිල්පත්‍ර නිකුත් කර නොතිබුණි.

## 4.6 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වූ රු. 21,034,473 ක් වූ මාර්ගස්ථ තොග වටිනාකමින් රු. 4,223,879 ක් වටිනා තොග වර්ෂ එකේ සිට තුන දක්වා වූ කාලයක සිට විමර්ශනය කිරීමකින් තොරව නෙවෙනස්ව පැවතුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති රු. 128,121,224 ක් වටිනා තොගයෙන් රු. 40,885,545 ක් වටිනා තොග වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් මාර්ගස්ථ තොග වශයෙන් දක්වා තිබුණි.

(ආ) තොග සත්‍යාපන කාල පරිච්ඡේදයට පෙර ලැබුණු තොග හා නිකුත් කල තොග, තොග ශේෂයට ගැලපිය යුතු වුවද, තොග පොත් යාවත් කාලීන නොකිරීම හේතුවෙන් එකතුව රු. 852,503,970 ක් වූ ශුද්ධ හර ශේෂයන් හා එකතුව රු. 377,300,265 ක් වූ ශුද්ධ බැර ශේෂයන් තොග සත්‍යාපන කාල පරිච්ඡේදයට පසුව තොග ශේෂයට ගලපා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් වැඩ දාහතරක් ගිවිසගත් කාල පරිච්ඡේදය තුල සම්පූර්ණ කර නොතිබුණු අතර කිසිදු හේතුවක් නොදන්වා ඒවා වර්ෂ එකේ සිට දෙක දක්වා ප්‍රමාදව පැවතුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව අදාල ඇවර කිරීමේ අලාභයන් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2015 සැප්තැම්බර් සිට 2016 සැප්තැම්බර් දක්වා වාහන 11 ක් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. කෙසේ වෙතත් එම වාහන එකොළහ අතරින් PB-3978 , KC-2312 , KA-7558 සහ KL-7787 අංක දරණ වාහන 04 අමාත්‍යාංශය වෙත බාර නොගත් බව අමාත්‍යාංශ ලේකම් මා වෙත දැනුම් දී තිබුණි.

(ඉ) ගාල්ල ප්‍රදේශයේ අපජලය අපහරණ ව්‍යාපෘතිය යටතේ අපජලය පිරිසිදු කිරීමේ පිරියත ඉදිකිරීම සඳහා 2014 වර්ෂය තුල ඉඩමක් මිලදීගැනීමට තීරණය කොට තිබූ අතර තක්සේරු දෙපාර්තමේන්තුව මෙම ඉඩම රු. මිලියන 71.5 කට අගය කර තිබුණි. ඉඩමේ වටිනාකමින් සියයට 30 ක් වන රු. මිලියන 21.45 ක අත්තිකාරම් ගෙවීමක් ඉඩම් අයිතිකරුට 2014 අප්‍රේල් මාසයේ ගෙවා තිබුණි. දැනටමත් පවුල් කිහිපයක් එම ඉඩමේ පදිංචි වී සිටින අතර අත්තිකාරම් ගෙවීමෙන් පසුවද ඉඩමේ අයිතිකරු විසින් එයින් පස් ඉවත් කර ගෙන තිබුණි. මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් කඩිනමින්

පියවර ගෙන නොතිබුණි. තවද, 1974 අංක 02 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ ඡේද අංක 92 ප්‍රකාරව නිශ්චල දේපල මිලදී ගැනීම තහනම් කරමින් 2015 මාර්තු 11 දින නීතිපති විසින් මතයක් ලබාදී තිබුණි. කෙසේ වෙතත් මණ්ඩලය මේ සම්බන්ධයෙන් 1974 අංක 02 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නීතියේ ප්‍රතිපාදනයන්ට අනුකූල වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) ඇලුමිනියම් සල්ෆේට් මෙට්‍රික් ටොන් 3,000 ක් මිලදීගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 පෙබරවාරි 18 දින ඇමෙරිකානු ඩොලර් 420,000 කට සහ රු. 7,500,000 කට ඉන්දියානු සමාගමකට පිරිනමා තිබු අතර 2016 මාර්තු 03 දින විධිමත් ගිවිසුමක් අත්සන් කොට තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව ඇලුමිනියම් සල්ෆේට් මෙට්‍රික් ටොන් 3,000 ක වටිනාකම රු. 95,385,000 ක් විය. කෙසේ වෙතත් රු. 68,517,600 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබූ අතර එය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 28.17 ක අඩුවීමකි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට පෙර ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මිල විචලනයන් පිලිබඳව සලකා නොතිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ii) මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනකු විසින් ඉන්දියාවේ සැපයුම්කරුගේ කර්මාන්තශාලාවේදී පැවැත්වූ පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණය සඳහා සහභාගී වී තිබූ අතර 2016 මැයි 30 දින ඔවුන් විසින් ගනු ලැබූ සාම්පලයන් රසායනාගාරය වෙත භාරදී තිබුණි. කෙසේ වෙතත් පරීක්ෂණය සඳහා සහභාගී වූ නිලධාරීන් සාම්පල එකතු කිරීමට තරම් ප්‍රමාණවත් සුදුසුකමකින් යුතු බවට සනාථ කිරීමට සාක්ෂීන් නොවුණි.

(iii) පලමු නැව්ගත තොගයෙන් එකතුකරගත් සාම්පලය 2016 ජුනි 24 දින රත්මලාන රසායනාගාරයේදී පරීක්ෂා කොට තිබුණි. 2016 ජුනි 30 දින නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව සාම්පලයන් ඇලුමිනියම් සල්ෆේට් සඳහා නියම කර ඇති SLS 701 – 1985 පිරිවිතයන් සමග එකඟ විය. පරීක්ෂණ වාර්තාව මත පදනම්ව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම් හා ද්‍රව්‍ය කලමනාකරණ ) විසින් මෙම ඇලුමිනියම් සල්ෆේට් ජලය පිරිපහදු කිරීම සඳහා භාවිතා කරන ලෙස ප්‍රධාන ගබඩාවට හා ප්‍රාදේශීය ජල පිරිපහදු කිරීමේ මධ්‍යස්ථාන වෙත දැනුම් දී තිබුණි. කෙසේ වෙතත් කඳන ජලය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයෙන් රැස්කරගත් සාම්පලයන්ට අදාල 2016 ජුනි 11 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව සාම්පලයන් ඇලුමිනියම් සල්ෆේට් සඳහා වූ පිරිවිතයන්ට

අනුකූල නොවන බව අනාවරණය විය. තවද, පලමු නැව්ගත තොගයෙන් හා කඳන ජල පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයෙන් එකතු කරගත් සාම්පල දෙකම 2016 ජූලි 25 දින අඹතලේ රසායනාගාරයේදී පරීක්ෂා කල අතර එම සාම්පලයන් පිරිවිතරයන් සමඟ අනුකූල නොවන බව තහවුරු විය.

(iv) සැපයුම්කරු සමඟ 2016 ඔක්තෝම්බර් 07 දින පැවති සාකච්ඡාවට අනුව ඇලුමිනියම් සල්ෆේට් මෙට්‍රික් ටොන් 274.1 කුඩුකර මණ්ඩලය වෙත බෙදාහැරීම සඳහා සැපයුම්කරු එකඟ විය. කෙසේ වෙතත් එකඟවූ පරිදි අමුද්‍රව්‍ය භාරදීමට සැපයුම්කරු අපොහොසත් විය. කොන්ත්‍රාත්කරු විසින් ප්‍රධාන ගබඩාවේ ඇලුමිනියම් සල්ෆේට් කුඩු කිරීම සඳහා කම්පැක්ටර් යන්ත්‍රයක් භාවිතා කර තිබූ බව විගණනයට අනාවරණය විය.

(v) 2016 දෙසැම්බර් 16 දින වන විට මණ්ඩලය විසින් සැපයුම්කරුට රු. 14,006,437 ක මුදලක් ගෙවා තිබූ නමුදු, සැපයුම්කරු විසින් සපයා තිබූ කාර්ය සාධන සුරක්ෂණය මඟින් රු. 6,861,000 ක මුදලක් පමණක් පියවාගෙන තිබුණි. එනිසා මෙම ගනුදෙනුව හේතුවෙන් රු. 7,205, 437 ක මූල්‍ය අලාභයක් මණ්ඩලයට දැරීමට සිදුවිය.

(vi) ඇලුමිනියම් සල්ෆේට් වල වූ බාල ගුණත්වය හේතුවෙන් අමතර පිරිවැයක් දරා පෙර සැපයුම්කරුවන්ගෙන් ඇලුමිනියම් සල්ෆේට් ප්‍රසම්පාදනය කර ගැනීමට මණ්ඩලයට සිදුවී තිබුණි.

(vii) 2012 වර්ෂයේදී හපුගල ජල පිරිපහදු පිරියත ඉදිකිරීම සඳහා විසල් ගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් රු. මිලියන 16 ක් වැය කරමින් ඉඩමක් අත්පත් කරගෙන තිබුණු අතර අත්පත් කරගැනීමෙන් පසුව එහි ඉදිකිරීම් සඳහා විමර්ෂණයක් සිදුකරන අතරතුර විශාල ගලක් මතුවීම හේතුවෙන් එම ඉඩම අරමුණු කල කාර්යය සඳහා උපයෝගී කර නොතිබුණි.

## 4.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරුවන් / ඉංජිනේරු (යාන්ත්‍රික) , ඉංජිනේරු (විදුලි) , ඉංජිනේරු (සිවිල්) , මධ්‍යම මට්ටමේ තාක්ෂණික ( එම් එල් - T) , ලිපිකරුවන් හා සමාන්තර ශ්‍රේණි වර්ගයන් සහ වෙනත් පුහුණු ශ්‍රේණි ආදි ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරු වල

පැවති පුරප්පාඩු 729 ක් පිරවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කලමණාකරන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) මහනුවර නැගෙනහිර, මහනුවර දකුණ හා මහනුවර උතර යන ප්‍රා දේශීය සභය සේවා මධ්‍යස්ථානයන්හි පැවති පුරප්පාඩු 224 පිරවීම සඳහා මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබු අතර එය අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 30 ක් නියෝජනය කරයි.

(ඈ) ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 729 ක් තිබු නමුදු මණ්ඩලය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2007 ඔක්තෝබර් සිට 2016 දෙසැම්බර් 31 දක්වා වු කාලපරිච්ඡේදය තුල විවිධ ශ්‍රේණියන්ට අයත් සේවකයින් 113 දෙනෙකු විදේශ මුල්‍යාන ව්‍යාපෘතීන් සඳහා නිදහස් කොට තිබුණි. මණ්ඩලය විසින් ගෙවන ලද වේතන හා අනෙකුත් දීමනා එම ව්‍යාපෘතීන් විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කොට තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් 02 ක් , සහකාර සාමාන්‍යාධිකාරීන් 13 ක්, ප්‍රධාන ඉංජිනේරුවන් 33 ක් , ඉංජිනේරු 25 ක්, සහකාර ඉංජිනේරු 24 ක් සහ සමාජ විද්‍යාඥ 08 දෙනෙකු ඒ අතර විය.

**4.8 ද්‍රවශීල අක්‍රමිකතා**

-----------------

ත්‍රිකුණාමලය, කැළණිය, අම්පාර, කලාපවල 1999 සිට 2006 දක්වා කාල පරිච්ඡේදය තුළ කරන ලද රු.මිලියන 246.66 ක මුදල් වංචාවන් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීම සඳහා 2016 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

----------------------

දේශීය සහ විදේශීය අරමුදල් භාවිතා කරන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරමින් පැවතියද, මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශය සඳහා ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් අනුයුක්ත කොට නොතිබුණි.

5.2 අයවැය පාලනය

---

අයවැය ඵලදායී කලමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබූ බව පෙන්වාදෙමින් අයවැය ගත හා සත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 2 සිට සියයට 75 දක්වා වූ සැලකිය යුතු විචල්‍යතාවන් නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | පාලන ගිණුම් හා කෙරීගෙන යන වැඩ ශේෂයන් සැසඳීමට අපොහොසත් වීම. |
| | | (ii) | ලෙජරය හා ජර්නල් වවුචරයන් හිදී ජර්නල වවුචර් අංකනය කිරීම් නොගැලපීම. |
| | | (iii) | ඇතැම් ජර්නල් වවුචරයන්හි සංලක්ෂය ඇතුලත් නොකිරීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | (i) | විවිධ කලාපවල එකම ස්ථාවර වත්කම දෙවරක් සටහන් කිරීම. |
| | | (ii) | අස්පෘශ්‍ය වත්කම් වටිනාකම සමාලෝචනය හා නැවත දැක්වීම, නොකිරීම. |
| | | (iii) | ව්‍යාපෘති නිමකර තිබුණද, ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| | | (iv) | දිගු කාලයක් සඳහා නොවෙනස්ව පැවති කෙරිගෙන යන වැඩ ශේෂ විමර්ශනය කිරීමට අපොහොසත් වීම. |
| (ඇ) | තොග පාලනය | (i) | භෞතික සත්‍යාපනය කරන ලද ශේෂ ලෙජර ශේෂයන් සමඟ සංසන්දනය නොකිරීම. |
| | | (ii) | දීර්ඝ කාලීනව පවතින මාර්ගස්ථ තොග ශේෂ. |
| | | (iii) | ගබඩාවල දිගු කාලීන චලනය නොවන හා සෙමින් චලනය වන තොග පැවතීම. |
| (ඈ) | ව්‍යාපෘති පරිපාලනය හා කාර්යසාධන සමාලෝචනය | (i) | අපේක්ෂිත පරිච්ජේදය තුල ව්‍යාපෘති නිමකිරීමට අපොහොසත්වීම සහ වලංගු හේතූන් නොමැතිව ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීම. |
| | | (ii) | ශක්‍යතා අධ්‍යයනයන් ක්‍රමවත්ව සිදුකර යාමේ නොහැකියාව. |
| | | (iii) | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම. |
| | | (iv) | කාලය දීර්ඝ කිරීම හා අරමුදල් උපයෝජනයේදී දුර්වලතා හේතුවෙන් පිරිවැය අධික ලෙස ඉහල යාම. |

| | | |
|---|---|---|
| (ඊ) | නැවත අයකළ හැකි යෝජනාක්‍රම ගිණුම්කරණය | නැවත අයකළ හැකි යෝජනා ක්‍රම සඳහා ලද අත්තිකාරම් අදාළ වියදමට එරෙහිව කපා දැමීමෙන් තොරව දීර්ඝ කාලයක හාරයේ තබාගැනීම. |
| (උ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | (i) අවශ්‍ය කරන අධිකාරීන් නොමැතිව මානව සම්පත් වෙනත් ආයතන වෙත නිදහස් කිරීම.<br>(ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම. |

ජ/සඳ එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AAT | ගණකාධිකරණ තාක්ෂණිකයින්ගේ සංගමය |
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| ADSL | අසම්මිතික සංඛ්‍යාංක ග්‍රාහක මාර්ගය |
| AE | ප්‍රාදේශීය ඉංජිනේරු |
| AFD | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |
| AGM | සහකාර සාමාන්‍යාධිකාරී |
| AIT | තාක්ෂණවේදය පිළිබඳ ආසියානු ආයතනය |
| ANZ | ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය |
| AT | උචිත තාක්ෂණ වේදය |
| BMICH | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සමුළු ශාලාව |
| BOC | ලංකා බැංකුව |
| BOQ | ප්‍රමාණ පත්‍රය |
| BOI | ආයෝජන මණ්ඩලය |
| CBI | ප්‍රජාව පදනම් කරගත් උපදේශය |
| CBO | ප්‍රජා මූල සංවිධානය |
| CCN | කොළඹ නගරය උතුර |
| CCOEC | විදේශීය ආර්ථික සහයෝගිතාවය සඳහා වූ චීන ජාතික සංස්ථාව |
| CCS | කොළඹ නගරය දකුණ |
| CCTV | සංවෘත පරිපථ රූපවාහිනිය |
| CD | සංගත තැටිය |
| CFL | සංගත ප්‍රතිදීප්ත පහන් |
| CIDA | ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| CKDu | නොදන්නා හේතු නිසා ඇති වන නිධන්ගත වකුගඩු රෝගය |
| CMC | කොළඹ මහ නගර සභාව |
| CMEC | චීන යන්ත්‍ර සූත්‍ර ඉංජිනේරු සංස්ථාව |
| CSI | ගණුදෙනුකාර තෘප්ති මට්ටම් දර්ශකය |
| Cu.m | ඝණ මීටර |
| DEWATS | විමධ්‍යගත අපජල ප්‍රතිකාරක හා බැහැර කිරීමේ පද්ධතිය |
| DFCC | ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව |
| DGM | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| DI | මෘදු යකඩ |
| DMAs | දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් |
| DMAS | වෛද්‍ය සහාය සේවා දෙපාර්තමේන්තුව |
| DMC | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| DNCWS | ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| DSD | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| DWWF | සැලැසුම් තෙත් කාලගුණික ගලනය |
| DZUWP | වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය |
| EAA | සමතුල්‍ය වාර්ෂික දීමනාව |
| EBARA | එබාරා සංස්ථාව |
| EDC | කැනේඩියානු අපනයන සංවර්ධනය |
| EDCF | කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල |
| EFI | විදුලි ඉන්ධන ආක්ෂේපණය |
| EFIC | අපනයන මූල්‍ය හා රක්ෂණ සංස්ථාව |
| EIA | පාරිසරික බලපෑම් තක්සේරුව |
| ERD | බාහිර සම්පත් දෙපාර්තමේන්තුව |
| FIDIC | උපදේශක ඉංජිනේරු වරුන්ගේ ජාත්‍යන්තර සන්ධියනය |
| GCS | මහ කොළඹ මලාපවහනය |
| GCWWMIIP | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන |
| GIS | භූගෝලීය තොරතුරු පද්ධතිය |
| GM | සාමාන්‍යාධිකාරී |
| GN | ග්‍රාම නිලධාරී |
| GND | ග්‍රාම නිලධාරී වසම |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| GPOBA | නිමැවුම පදනම් වූ ආධාර පිළිබඳ ගෝලීය හවුල්කාරිත්වය |
| GPS | ගෝලීය ස්ථානගත කිරීම් ක්‍රමය |
| GR | භූමි ජලාශය |
| GSE | ස්වර්ණ රාජ්‍ය පරිසරය |
| GW | භූ ගත ජලය |
| HDPE | ඉහල ඝණත්වයේ පොලි එතිලින් |
| HH | ගෘහස්තයන් |
| HNDE | තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව |
| HRM | මානව සම්පත් කළමනාකරණය |
| IA | බලපෑම් තක්සේරුව |
| ICT | තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදය |
| 1CTA | තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේද ඒජන්සිය |
| 1CTAD | ඉදිකිරීම් පුහුණුකිරීම් හා සංවර්ධන ආයතනය |

| | |
|---|---|
| ICWG | තොරතුරු හා සංනිවේදන කාර්ය කණ්ඩායම |
| IEE | ආරම්භක පාරිසරික පරීක්ෂණය |
| IESL | ශ්‍රී ලංකා ඉංජිනේරු වරුන්ගේ ආයතනය |
| IET | ඉංජිනේරු තාක්ෂණවේද ආයතනය |
| IIESL | ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු වරුන්ගේ ආයතනය |
| IMS | භාණ්ඩ ලේඛන කළමනාකරණ ක්‍රමය |
| IORA | ඉන්දීය සාගර රිම් සංගමය |
| ISO | ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය |
| IT | තොරතුරු තාක්ෂණය |
| ITEC | ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය |
| JBIC | ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වූ ජපන් බැංකුව |
| JICA | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| JJ | ඒකාබද්ධ ජපන් ලෝක බැංකුව |
| JPy | ජපන් යෙන් |
| JWRM | යාපනයේ ජල සම්පත් කළමනාකරණය |
| km | කිලෝ මීටර |
| KOICA | කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| LA | පලාත් පාලන අධිකාරීන් |
| LED | ආලෝක විමෝචන ඩයෝඩය |
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| M&E | යාන්ත්‍රික හා විද්‍යුත් |
| MC | මහ නගර සභාව |
| MCM | ඝණ මීටර දස ලක්ෂ |
| MD&T | මානව  බල සංවර්ධනය හා පුහුණු කිරීම |
| MDTM | මානව බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය |
| MICP | කළමනාකරුගේ අභ්‍යන්තර පාලන වැඩ සටහන |
| MIS | කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| MOU | අවබෝධතා ගිවිසුම |
| MPC | අමාත්‍යංශ ප්‍රතිසම්පාදන කමිටුව |
| MPDT | ආදර්ශ නිෂ්පාදන හා භාරදීම් වගුව |
| MS | මයික්‍රෝසොෆ්ට් |
| NAITA | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය |
| NC | උතුරු මැද |
| NDB | ජාතික සංවර්ධන බැංකුව |
| NDT | ජාතික තාක්ෂණවේද ඩිප්ලෝමාව |
| NHDA | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| NICD | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය |
| NPD | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව |
| NRW | ආදායම් රහිත ජලය |
| NSB | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| NUFFIC | උසස් අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිතාවය වෙනුවෙන් වූ නෙදර්ලන්ත සංවිධානය |
| NVQ | ජාතික වෘත්තීය සුදුසුකම |
| NW | වයඹ |
| NWSDB | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. |
| O&M | මෙහෙයුම් හා නඩත්තු |
| ODA | නිල සංවර්ධන සහාය |
| OIC | ස්ථානය භාර නිලධාරියා |
| P&D | ක්‍රම සම්පාදන හා සැලසුම් |
| PAC | ව්‍යාපෘති අගැයීම් කමිටුව |
| PD | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PDMRC | ක්‍රම සම්පාදන හා සැලසුම් ශාරීර සමාලෝචන කමිටුව |
| PE | පොලි එතිලින් |
| PHDT | වතු මානව සංවර්ධන භාරය |
| PQ | පෙර - සුදුසුකම |
| PLC | ක්‍රමලේඛන ගත කළ හැකි න්‍යාය පාලකය |
| PVC | පොලිවිනිල් ක්ලෝරයිඩ් |
| PWD | මහජන වැඩ දෙපාර්තමේන්තුව |
| PWTP | පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර |
| R&D | පර්යේෂණ හා සංවර්ධන |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| RFP | යෝජනා කැඳවීම |
| RM | කලාපීය කළමනාකරු |
| RO | විලෝම ආශ්‍රැති |
| RSC | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය |
| RSC (WN) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය - බටහිර උතුර |
| RSC (WS) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය - බටහිර දකුණ |
| RSC ( NC) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය - උතුරු මධ්‍යම |
| RSC (WC) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය - බටහිර මධ්‍යම |
| RSC (N) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය - උතුර |
| RWS | ග්‍රාමීය ජල සම්පාදනය |
| SCADA | අධීක්ෂණාත්මක පාලනය හා දත්ත ප්‍රතිග්‍රහණය |
| S&D | සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී |

| | |
|---|---|
| SACOSAN | සනීපාරක්ෂණය සම්බන්ධයෙන් වූ දකුණු ආසියානු සමුහය |
| SCAPC | ඇමති මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රතිසම්පාදන කමිටුව |
| SHIFT | නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා මුල පිරීම |
| SI | සමාජ බලපෑම් තක්සේරුව |
| SIDA | ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය |
| SLS | ශ්‍රී ලංකා ප්‍රමිති |
| SMS | කෙටි පණිවුඩ සේවය |
| SQL | ව්‍යුහගත විමසුම් භාෂාව |
| TCE | මුළු පිරිවැය ඇස්තමේන්තුව |
| TEC | කොළඹට නැගෙනහිරින් පිහිටි නගර |
| TFWLP | ටෙමැසෙක් පදනමේ ජල නායකත්ව වැඩ සටහන |
| UC | නගර සභාව |
| UNICEF | එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අධ්‍යාපන අරමුදල |
| UOC | කොළඹ විශ්ව විද්‍යාලයය |
| UPVC | ප්ලාස්ටික් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් |
| USA | ඇමෙරිකා එක්සත් ජනපදය |
| USD | ඇමෙරිකානු ඩොලර් |
| USS | ඌනසේවිත ජනපද ජල සම්පාදනය |
| VAT | අගය එකතු කළ බද්ද |
| VPN | අතථ්‍ය පෞද්ගලික ජාලය |
| VLE | අතථ්‍ය ඉගෙනුම් පරිසරය |
| VSD | විචල්‍ය වේග ධාවකය |
| WASSIP | ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| WBGSP | ලෝක බැංකු උපාධිධාරී ශිෂ්‍යත්ව වැඩ සටහන |
| WHO | ලෝක සෞඛ්‍ය සංවිධානය |
| WQS | ජල ගුණාත්ම ප්‍රවීක්ෂණය |
| WS | ජල සම්පාදනය |
| WS&S | ජල සම්පාදනය හා සනීපාරක්ෂණය |
| WSP | ජල සම්පාදන ව්‍යාපෘතිය / ජල සුරක්ෂිතතා සැලැසුම |
| WSS | ජල සම්පාදන යෝජනා ක්‍රමය |
| WTP | ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය |
| WWDS | අපජල බැහැර කිරීම් පද්ධතිය / ක්‍රමය |
| WWTP | අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය |

# සංස්ථානික තොරතුරු.

**සංවිධානයේ නාමය:**
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**නෛතික ආකෘතිය:**
රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලය

**ස්ථාපිත කළ දිනය:**
1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය නම් පාර්ලිමේන්තු පණත මගින් 1974. 03. 01 වැනි දින ස්ථාපිත කරන ලදි.
1992 අංක 13 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන (සංශෝධිත) පණත මගින් 1992. 03. 11 වැනි දින පණත සංශෝධනය කරන ලදි.

**බදු හඳුනාගැනීමේ අංකය:**
4090 31820

**අගය එකතු කළ බදු ලියාපදිංචි අංකය:**
4090 31820 7000

**සම්බන්ධතා - ප්‍රධාන කාර්යාලය:**
ගාලු පාර, රත්මලාන, ශ්‍රී ලංකාව
දුර කථන අංක ( + 94 11 263899 (නිසැරුම්)
+ 94 11 2637194, + 94 11 2611589
ෆැක්ස් :+ 94 11 2636449
විද්‍යුත් තැපෑල : gm@waterboard.lk
වෙබ් අඩවිය : www.waterboard.lk

**රේඛීය අමාත්‍යාංශය**
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය

**ඇමතුම් මධ්‍යස්ථානය**
1939 (පැය 24 පුරා)

**ගණුදෙනුකාර සේවා ඒකකය - ප්‍රධාන කාර්යාලය**
+ 94 11 2623623 (කාර්යාල වේලාවන් තුළ)

**බැංකු කරු**
ලංකා බැංකුව

**විගණක වරුන්**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
රජයේ විගණන ඒකකය.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
ඉංජිනේරු කේ. ඒ. අන්සාර් - සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
එම්. ෂරීක් රාජබ්ඩීන් මහතා - උප සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
පී. අයි. ටී. මහිලාල් සිල්වා මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
වෛද්‍ය පී. ජී. මහීපාල - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය
ජේ. එම්. යූ. පී. ජයමහ මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව
ශාන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
කේ. ඒ. සුබද්‍රා වල්පොල මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පලාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය.

**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය :**
ඉංජිනේරු බී.ඩබ්ලිව්.ආර්. බාලසූරිය - සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු ජී.ඒ.කුමාරරත්න - අතිරේක සාමාන්‍යාධිකාරී (මලාපවහන)
ඉංජිනේරු ඩී එස් ඩී ජයසිරිවර්ධන - අතිරේක සාමාන්‍යාධිකාරී (දකුණු / නැගෙනහිර)
ඉංජිනේරු ඩී යූ සුමනසේකර - අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන ව්‍යාපෘති)
ඉංජිනේරු ආර් එස් සී ජෝර්ජ් - අතිරේක සාමාන්‍යාධිකාරී (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)
ඉංජිනේරු ඩබ්ලිව්. බී. ජී. ප්‍රනාන්දු - අතිරේක සාමාන්‍යාධිකාරී (සංස්ථානික සේවා)
ඉංජිනේරු ජේ. ආර්. බී. නැදුරන - අතිරේක සාමාන්‍යාධිකාරී (උතුරු / මධ්‍යම)
ඉංජිනේරු එල්. එල්. ඒ. පීරිස් - අතිරේක සාමාන්‍යාධිකාරී (බටහිර)
ඩී. තොටවත්ත මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණය)
**අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**
ඉංජිනේරු තිලින එස් විජේතුංග (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය)
ඉංජිනේරු යූ. රත්නපාල (ව්‍යාපෘති සමායෝජනය)
ඉංජිනේරු එස්. ජී. ජයවර්ධන (මලාපවහන)
ඉංජිනේරු කේ. ඩබ්ලිව්. ප්‍රේමසිරි (ක්‍රම සම්පාදන හා සැලසුම්)
ඉංජිනේරු එස්. ජී. ජේ. රාජ්කුමාර් (සංවර්ධන)
ඉංජිනේරු එස්. සුමනවීර (නිෂ්පාදන - බටහිර)
ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්දන (සංස්ථානික ක්‍රම සම්පාදනය)
ඉංජිනේරු බී. එල්. ගුණරත්න (යාන්ත්‍රික හා විද්‍යුත්)
එස් ජී ජී රාජ්කුමාර් (වාණිජ)
ඉංජිනේරු දුලිප් ගුණවර්ධන (ග්‍රාමීය ජල සම්පාදන සේවා)
ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණය)
එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මූල්‍ය)
ඒ. පී. එස් ද සිල්වා මහත්මිය (පිරිවැයකරණය)
ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා (අභ්‍යන්තර විගණන)
එන්. වයි. එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයුම්)
පලාත්/කලාපීය සේවා මධ්‍යස්ථාන භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්.
ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා (බටහිර - මධ්‍යම)
ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු (බටහිර - දකුණ)
ඉංජිනේරු එස් ඒ රෂීඩ් (නැගෙනහිර)
ඉංජිනේරු ආර්. ඒ. බී. එස්. මෙන්ඩිස් (බටහිර - උතුර)
ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (මධ්‍යම)
ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (ඌව)
ඉංජිනේරු ජී. ඒ. විජේරත්න (උතුරු මැද)
ඉංජිනේරු අයි. එම්. ඩබ්ලිව්. කේ. ඉලංගසිංහ මහත්මිය (වයඹ)
ඉංජිනේරු එම් එම් උමා ලෙබ්බෙ (උතුර)
ඉංජිනේරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ලියනගේ (සබරගමුව)
ඉංජිනේරු ජේ කේ එස් පතිරණ (දකුණු)
**ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් ලෙස කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**
ඉංජිනේරු ආර්. කුලනාථ - රත්මලාන මොරටුව හා ජා ඇල / ඒකල ප්‍රදේශ සඳහා අපජල බැහැර කිරීමේ වැඩ පිළිවෙල
ඉංජිනේරු බී. එස්. විජේමාන්න - මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතිය
ඉංජිනේරු කේ. ජේ. ඒ. ඒ. පෙරේරා - ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය.
ඉංජිනේරු ආර්. ඒ. බී. එස්. මෙන්ඩිස් - 5 වැනි ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය.
ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ - ලබුගම කලටුවාව ජල සම්පාදන ව්‍යාපෘතිය හා කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය
ඉංජිනේරු එස්. ඒ. රෂීඩ් - කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය.
ඉංජිනේරු පී. ජී. කහඳුව - රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය
ඉංජිනේරු ආර්. එස්. ලියනගේ - මහියංගනය ජල සම්පාදන ව්‍යාපෘතිය හා බදුල්ල හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතිය.